# අ.පො.ස (උ.පෙළ) විභාගය - 2016

# ඇගයීම් වාර්තාව

# 23 - දේශපාලන විද්‍යාව

Curriculum
Assessment
&
Evaluation
Teaching
Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව.

# අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2016

## ඇගයීම් වාර්තාව

# 23 - දේශපාලන විද්‍යාව

Curriculum
Assessment
&
Evaluation
Teaching Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

සියලු ම හිමිකම් ඇවිරිණි.

**දේශපාලන විද්‍යාව**

ඇගයීම් වාර්තාව - අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2016

මූල්‍ය අනුග්‍රහය

අනාගත දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස පාසල් පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය (TSEP-WB) මගිනි.

# හැඳින්වීම

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය, ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනයේ අවසාන සහතිකකරණ විභාගය යි. ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය අවසානයේ සිසුන්ගේ සාධන මට්ටම සහතික කිරීම මෙම විභාගයේ ප්‍රධාන අරමුණ වුව ද ජාතික විශ්වවිද්‍යාලවලට, වෙනත් උසස් අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ආයතනවලට මෙන් ම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට සුදුස්සන් තෝරා ගැනීම ද මෙම විභාගයේ ප්‍රතිඵල මත සිදු කෙරෙන බැවින් සාධන පරීක්ෂණයක් වශයෙන් මෙන් ම තේරීමේ පරීක්ෂණයක් වශයෙන් ද අ.පො.ස.(උ.පෙළ) විභාගය, ඉතා වැදගත් තත්ත්වයක් උසුලයි. එමෙන් ම තෘතීයික මට්ටමේ රැකියා සඳහා ප්‍රවේශ සුදුසුකම් සහතික කෙරෙන විභාගයක් වශයෙන් ද මෙය පිළිගැනේ. 2016 වර්ෂයේ දී මෙම විභාගය සඳහා 211865ක් පාසල් අයදුම්කරුවෝ ද 46328ක් පෞද්ගලික අයදුම්කරුවෝ ද පෙනී සිටිය හ.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා සිසුහු ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා ගුරුවරු හා දෙමව්පියෝ ද දැඩි වෙහෙසක් දරති. මෙම ඇගයීම් වාර්තාව සකස්කර ඇත්තේ ඔවුන්ගේ එම අපේක්ෂා ඉටුකරගැනීම පිණිස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සහාය දීමක් වශයෙනි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයින්ට, ගුරු භවතුන්ට, විදුහල්පතිවරුන්ට, ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට, විෂය භාර අධ්‍යක්ෂවරුන්ට, දෙගුරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එක සේ ප්‍රයෝජනවත් වනු නොඅනුමාන ය. එබැවින් මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව, I, II හා III යනුවෙන් කොටස් තුනකින් සමන්විත වේ.

අ.පො.ස.(උ.පෙළ) දේශපාලන විද්‍යාව විෂයයෙහි විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ I කොටසෙහි අඩංගු වේ. ඒ යටතේ විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව, ඔවුන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, දිස්ත්‍රික් මට්ටමින් පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ව්‍යාප්තිය යන විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු ද දේශපාලන විද්‍යාව විෂයයේ I හා II පත්‍රවල ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය, එම ප්‍රශ්නවලට හා එම එක් එක් ප්‍රශ්නයෙහි කොටස්වලට ලකුණු ලබාගෙන ඇති ආකාරය සවිස්තරාත්මකව දැක්වෙන විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණයක් ද අන්තර්ගත වේ. අ.පො.ස.(උ.පෙළ) 2016 විභාගයේ දේශපාලන විද්‍යාව විෂයයෙහි I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න හා එම ප්‍රශ්නවලට අයදුම්කරුවන් පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ II කොටසෙහි අඩංගු වෙයි. ඒ යටතේ I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා සංවර්ධනාත්මක යෝජනා අන්තර්ගත වේ.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව මගින් උත්තර පත්‍ර ඇගයීමේ නිරත වූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන හා සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු, නිරීක්ෂණ, අදහස් හා යෝජනා ද සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) හා අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) යොදාගනිමින් අයදුම්කරුවන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය මගින් ලබාගත් තොරතුරු ද මෙම ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා පදනම් කරගෙන ඇත.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් සැලකිලිමත් විය යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි III කොටසෙහි ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව මෙයින් මහත් පිටිවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

ඉදිරියේ දී සම්පාදනය කරනු ලබන ඇගයීම් වාර්තාවල ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස කාරුණික ව ඉල්ලමි.

මෙම වාර්තාව සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන්ට හා සහකාර පරීක්ෂකවරුන්ටත්, උනන්දුවෙන් හා සක්‍රීයව දායක වූ සැකසුම් කමිටු සාමාජිකයින්ටත්, වගකීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට හා මෙම කාර්ය සඳහා මූල්‍ය අනුග්‍රහය දැක්වූ අනාගත දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස පාසල් පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය (TSEP-WB)ටත් මාගේ හෘදයාංගම ස්තූතිය පළ කරමි.

බී. සනත් පූජිත
විභාග කොමසාරිස් ජනරාල්

2017 දෙසැම්බර් 01
පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල.

| | | |
|---|---|---|
| **උපදේශකත්වය** | : | බී. සනත් පූජිත<br>විභාග කොමසාරිස් ජනරාල් |
| **මෙහෙයවීම හා සංවිධානය** | : | ගයාත්‍රි අබේගුණසේකර<br>විභාග කොමසාරිස්<br>(පර්යේෂණ/සංවර්ධන හා ඇගයීම්) |
| **සම්බන්ධීකරණය** | : | එල්. ජී. එස්. සමරකෝන්<br>සහකාර විභාග කොමසාරිස් |
| **සංස්කරණය** | : | එම්.ඕ.ජ්.ද සොයිසා (විශ්‍රාමික මහාචාර්ය)<br>පේරාදෙණිය විශ්ව විද්‍යාලය<br><br>ටෙරන්ස් පුරසිංහ<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය |
| **සැකසුම් කමිටුව** | : | චන්දිමාල් විජේරත්න<br>ගුරු සේවය<br>මධ්‍ය මහා විද්‍යාලය<br>ඇහැලියගොඩ<br><br>ජී.ඩී. නිරූපා මානෙල්<br>ගුරු සේවය<br>ර/ සුමන බාලිකා විද්‍යාලය<br>රත්නපුර<br><br>සමන් ඌරුවැල්ල<br>ගුරු සේවය<br>මප/ ග/ මධ්‍ය මහා විද්‍යාලය<br>ගලේවෙල<br><br>සුනිල් සුදසිංහ<br>ගුරු සේවය<br>ආනන්ද ශාස්ත්‍රාලය (ජාතික පාසල)<br>මතුගම |
| **පරිගණක පිටපත සැකසුම** | : | කේ.ඒ.ඩී. තිලානි ලක්මාලි<br>රාජ්‍ය කළමනාකරණ සහකාර<br><br>ටී. දර්ශිකා නිලුපුලී<br>දත්ත සටහන් ක්‍රියාකරු |
| **පිටකවරය නිර්මාණය** | : | වයි.එස්. අනුරාධි<br>සංවර්ධන නිලධාරී |

# ඇතුළත පිටු

පිටු අංකය


**I කොටස**

1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.1 විෂය අභිමතාර්ථ 1

1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

1.2.1 විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව 2

1.2.2 අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 2

1.2.3 ප්‍රථමවරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 3

1.2.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 4

1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

1.3.1 I පත්‍රය සඳහා සාධනය 5

1.3.2 II පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 6

1.3.3 II පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 6

1.3.4 II පත්‍රය සඳහා සාධනය 7

**II කොටස**

2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1 I පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1.1 I පත්‍රයේ ව්‍යුහය 9

2.1.2 I පත්‍රය 10

2.1.3 I පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 18

2.1.4 I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ (විෂය ක්ෂේත්‍රය අනුව) 19

2.1.5. I පත්‍රයේ එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශත ලෙස 22

2.1.6 I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 23

2.2 II පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.2.1 II පත්‍රයේ ව්‍යුහය 27

2.2.2 II පත්‍රය, අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා 28

2.2.3 II පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 100

**III කොටස**

3. පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා

3.1 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු 101

3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා 103

# I කොටස

## 1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

### 1.1 විෂය අභිමතාර්ථ

මෙම පාඨමාලාව අවසානයේදී ශිෂ්‍යයා,

1. තාර්කික දේශපාලන පුරවැසියෙකු බවට පත්වීමට ප්‍රමාණවත් දැනුම හා අවබෝධය ලබා ගනියි.
2. තමා ජීවත් වන දේශපාලන පරිසරය පිළිබඳ අවබෝධ කර ගැනීමට හා හඳුනා ගැනීමට සමත් වේ.
3. වගකීම් හා යුතුකම් අවබෝධ කරගත් හොඳ පුරවැසියකු බවට පත්වීමට අදාළ හැකියා හා කුසලතා වර්ධනය කර ගනියි.
4. සමාජ සහ දේශපාලන සංසිද්ධීන් විචාරශීලීව විමසීමේ හැකියාව වර්ධනය කර ගැනීමට අවශ්‍ය දැනුම ලබා ගනියි.
5. දේශපාලන ක්‍රමයේ විවිධ වෘත්තීන් දැරීම සඳහා අවශ්‍ය කුසලතා වර්ධනය කර ගනියි.
6. අන්තර් ජාතික දේශපාලනය පිළිබඳ අවබෝධ කර ගැනීම හා ඒ පිළිබඳ දක්වන උනන්දුව වැඩි කර ගනියි.
7. රාජ්‍ය තාන්ත්‍රිකයන් වීමට අවශ්‍ය මූලික දැනුම දියුණු කර ගනියි.

මෙම අරමුණු ඉටු කරගැනීම සඳහා විෂය නිර්දේශය ප්‍රධාන නිපුණතා 16ක් ඔස්සේ ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ අනුව විෂය නිර්දේශය කොටස් දෙකකට බෙදා දක්වා ඇත.

- **විෂය නිර්දේශයේ I වන කොටස**

  දේශපාලන විද්‍යාව විෂය තුළ අන්තර්ගත වන න්‍යායන් සහ ඒවායේ ප්‍රායෝගික භාවිතය පිළිබඳ ව අපේක්ෂකයින්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීම මෙම කොටසේ අභිමතාර්ථය වේ. මේ අනුව සමහර ප්‍රශ්න මඟින් න්‍යායාත්මක සංකල්ප පිළිබඳව සෘජුව ම අපේක්ෂකයින්ගේ දැනුම පරීක්ෂාවට භාජනය කෙරෙන අතර තවත් සමහර ප්‍රශ්න මඟින් තෝරාගත් රටවල් කිහිපයක් ආශ්‍රයෙන් න්‍යාය හා භාවිතය අතර පවතින සම්බන්ධතාව පිළිබඳව අපේක්ෂකයින්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කෙරේ. මෙයට අමතරව රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාවට නැංවීම, අන්තර්ජාතික දේශපාලනයේ මූලිකාංග, ගැටුම් සහ ගැටුම් කළමනාකරණය පිළිබඳ දැනුම පරීක්ෂා කර බැලීමද අපේක්ෂා කෙරේ.

- **විෂය නිර්දේශයේ II වන කොටස**

  මෙම කොටසේ අභිමතාර්ථය වන්නේ ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය යටත් විජිතයක්ව පැවති යුගයේ බ්‍රිතාන්‍ය පාලකයින් විසින් ක්‍රියාවට නැංවූ දේශපාලන, ආර්ථික හා සමාජ ප්‍රතිසංස්කරණවල බලපෑම හා එහි ප්‍රතිඵල පිළිබඳවත්, නිදහසින් පසු යුගයේ ශ්‍රී ලංකාවේ දේශපාලන හා ආණ්ඩුක්‍රම වර්ධනය පිළිබඳවත් අපේක්ෂකයින්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂාවට ලක් කිරීම ය. මෙයට අමතරව ශ්‍රී ලංකාව සහ අන්තර්ජාතික සමාජය අතර පවත්නා සම්බන්ධතාවන්හි ස්වරූපය පිළිබඳව ද අපේක්ෂකයින්ගේ දැනුම පරීක්ෂා කෙරේ.

## 1.2. විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

### 1.2.1 විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව

| මාධ්‍යය | පාසල් | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 27682 | 7037 | 34719 |
| දෙමළ | 8185 | 3775 | 11960 |
| ඉංග්‍රීසි | 51 | 13 | 64 |
| එකතුව | **35918** | **10825** | **46743** |

වගුව 1

### 1.2.2 අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

| ශ්‍රේණිය | පාසල් අයදුම්කරුවන් | | පෞද්ගලික අයදුම්කරුවන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 2243 | 6.24 | 408 | 3.77 | 2651 | 5.67 |
| B | 3845 | 10.70 | 824 | 7.61 | 4669 | 9.99 |
| C | 7632 | 21.25 | 1558 | 14.39 | 9190 | 19.66 |
| S | 13223 | 36.81 | 3362 | 31.06 | 16585 | 35.48 |
| F | 8975 | 24.99 | 4673 | 43.17 | 13648 | 29.20 |
| එකතුව | **35918** | **100.00** | **10825** | **23.16** | **46743** | **100.00** |

වගුව 2

1.2.3 ප්‍රථමවරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | අසමත් (F) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 1780 | 130 | 7.30 | 152 | 8.54 | 306 | 17.19 | 705 | 39.61 | 1293 | 72.64 | 487 | 27.36 |
| 2. ගම්පහ | 2068 | 164 | 7.93 | 191 | 9.24 | 361 | 17.46 | 729 | 35.25 | 1445 | 69.87 | 623 | 30.13 |
| 3. කළුතර | 1452 | 103 | 7.09 | 164 | 11.29 | 319 | 21.97 | 477 | 32.85 | 1063 | 73.21 | 389 | 26.79 |
| 4. මහනුවර | 1904 | 72 | 3.78 | 147 | 7.72 | 357 | 18.75 | 759 | 39.86 | 1335 | 70.12 | 569 | 29.88 |
| 5. මාතලේ | 653 | 26 | 3.98 | 46 | 7.04 | 149 | 22.82 | 231 | 35.38 | 452 | 69.22 | 201 | 30.78 |
| 6. නුවරඑළිය | 1318 | 49 | 3.72 | 108 | 8.19 | 309 | 23.44 | 558 | 42.34 | 1024 | 77.69 | 294 | 22.31 |
| 7. ගාල්ල | 1862 | 151 | 8.11 | 197 | 10.58 | 330 | 17.72 | 642 | 34.48 | 1320 | 70.89 | 542 | 29.11 |
| 8. මාතර | 1072 | 54 | 5.04 | 102 | 9.51 | 184 | 17.16 | 368 | 34.33 | 708 | 66.04 | 364 | 33.96 |
| 9. හම්බන්තොට | 850 | 49 | 5.76 | 75 | 8.82 | 147 | 17.29 | 315 | 37.06 | 586 | 68.94 | 264 | 31.06 |
| 10. යාපනය | 856 | 18 | 2.10 | 39 | 4.56 | 153 | 17.87 | 334 | 39.02 | 544 | 63.55 | 312 | 36.45 |
| 11. කිලිනොච්චි | 19 | 1 | 5.26 | 0 | 0.00 | 3 | 15.79 | 9 | 47.37 | 13 | 68.42 | 6 | 31.58 |
| 12. මන්නාරම | 134 | 6 | 4.48 | 11 | 8.21 | 25 | 18.66 | 54 | 40.30 | 96 | 71.64 | 38 | 28.36 |
| 13. වව්නියාව | 164 | 4 | 2.44 | 9 | 5.49 | 32 | 19.51 | 61 | 37.20 | 106 | 64.63 | 58 | 35.37 |
| 14. මුලතිව් | 7 | 1 | 14.29 | 1 | 14.29 | 1 | 14.29 | 0 | 0.00 | 3 | 42.86 | 4 | 57.14 |
| 15. මඩකලපුව | 929 | 45 | 4.84 | 91 | 9.80 | 205 | 22.07 | 369 | 39.72 | 710 | 76.43 | 219 | 23.57 |
| 16. අම්පාර | 1346 | 62 | 4.61 | 149 | 11.07 | 292 | 21.69 | 505 | 37.52 | 1008 | 74.89 | 338 | 25.11 |
| 17. ත්‍රිකුණාමලය | 417 | 35 | 8.39 | 45 | 10.79 | 90 | 21.58 | 135 | 32.37 | 305 | 73.14 | 112 | 26.86 |
| 18. කුරුණෑගල | 2234 | 120 | 5.37 | 175 | 7.83 | 369 | 16.52 | 842 | 37.69 | 1506 | 67.41 | 728 | 32.59 |
| 19. පුත්තලම | 1201 | 100 | 8.33 | 157 | 13.07 | 272 | 22.65 | 423 | 35.22 | 952 | 79.27 | 249 | 20.73 |
| 20. අනුරාධපුරය | 1037 | 53 | 5.11 | 102 | 9.84 | 193 | 18.61 | 398 | 38.38 | 746 | 71.94 | 291 | 28.06 |
| 21. පොළොන්නරුව | 488 | 44 | 9.02 | 50 | 10.25 | 93 | 19.06 | 167 | 34.22 | 354 | 72.54 | 134 | 27.46 |
| 22. බදුල්ල | 1588 | 78 | 4.91 | 138 | 8.69 | 359 | 22.61 | 618 | 38.92 | 1193 | 75.13 | 395 | 24.87 |
| 23. මොනරාගල | 609 | 37 | 6.08 | 52 | 8.54 | 106 | 17.41 | 263 | 43.19 | 458 | 75.21 | 151 | 24.79 |
| 24. රත්නපුරය | 1624 | 75 | 4.62 | 164 | 10.10 | 330 | 20.32 | 644 | 39.66 | 1213 | 74.69 | 411 | 25.31 |
| 25. කෑගල්ල | 862 | 43 | 4.99 | 98 | 11.37 | 206 | 23.90 | 293 | 33.99 | 640 | 74.25 | 222 | 25.75 |
| **සමස්ත දිවයින** | **26474** | **1520** | **5.74** | **2463** | **9.30** | **5191** | **19.61** | **9899** | **37.39** | **19073** | **72.04** | **7401** | **27.96** |

වගුව 3

### 1.2.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව

| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91 - 100 | 5 | 0.01 | 46743 | 100.00 |
| 81 - 90 | 383 | 0.82 | 46738 | 99.99 |
| 71 - 80 | 2638 | 5.64 | 46355 | 99.17 |
| 61 - 70 | 5160 | 11.04 | 43717 | 93.53 |
| 51 - 60 | 7098 | 15.19 | 38557 | 82.49 |
| 41 - 50 | 8838 | 18.91 | 31459 | 67.30 |
| 31 - 40 | 9940 | 21.27 | 22621 | 48.39 |
| 21 - 30 | 8711 | 18.64 | 12681 | 27.13 |
| 11 - 20 | 3754 | 8.03 | 3970 | 8.49 |
| 01 - 10 | 216 | 0.46 | 216 | 0.46 |
| 00 - 00 | 0 | 0.00 | 0 | 0.00 |

වගුව 4

ඉහත වගුවෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.
උදා:- (31 - 40 පංති ප්‍රාන්තරය ගතහොත්)
මෙම විෂයය සඳහා 31 - 40 ප්‍රාන්තරය තුළ ලකුණු ලබාගත් සංඛ්‍යාව 9940කි. එය ප්‍රතිශතයක් වශයෙන් 21.27% කි. ලකුණු 40 හෝ ඊට අඩුවෙන් ලබා ඇති අයදුම්කරුවන් සංඛ්‍යාව 22621ක් වන අතර, එය ප්‍රතිශතයක් වශයෙන් 48.39%කි.

## 1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

### 1.3.1 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




ප්‍රස්තාරය 1 (RD/16/05/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- මෙහි අයදුම්කරුවන් වැඩිම සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 6 වන ප්‍රශ්නයට ය. එහි ප්‍රතිශතය 88%කි. එමෙන් ම අයදුම්කරුවන් අඩු ම සංඛ්‍යාවක් නිවැරදි ව පිළිතුරු සපයා ඇත්තේ 46වන ප්‍රශ්නයට ය. එහි ප්‍රතිශතය 23%කි. ප්‍රශ්න අංක 28 සඳහා පහසුතා දර්ශකය 100% වී ඇත. එයට හේතුව අදාල ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර දක්වා නොතිබීමයි. මේ අනුව විභාග අපේක්ෂකයින් විසින් සටහන් කළ ඕනෑම පිළිතුරක් නිවැරදි පිළිතුර ලෙස සැලකීමට තීරණය කෙරිණි.

### 1.3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය




ප්‍රස්තාරය 2 (RD/16/02/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- මෙහි A කොටසෙහි 1 - 20 දක්වා ප්‍රශ්න අනිවාර්ය වන අතර සියල්ලටම කෙටි පිළිතුරු සැපයීම අපේක්ෂා කෙරේ. ඒ සඳහා එක් ප්‍රශ්නයකට එක් ලකුණ බැගින් ලකුණු 20ක් හිමි වේ. මෙම කොටසේ ප්‍රශ්නවලට මුළු අපේක්ෂකයින් අතුරින් 99% ක් පමණ පිළිතුරු සපයා තිබිණි.

### 1.3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය




ප්‍රස්තාරය 3 (RD/16/02/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- මෙහි B කොටසේ 1 ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 20 කි. එම ලකුණුවලින් 76% - 100% ප්‍රාන්තරයේ එනම් ලකුණු 16 - 20 තෙක් ලබා ගත් ප්‍රතිශතය 11% කි. එමෙන්ම වෙන් කර ඇති ලකුණු 0% - 25% ප්‍රාන්තරයේ එනම් ලකුණු 00 - 05 තෙක් ලබා ගත් ප්‍රතිශතය 38% කි.

1.3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




ප්‍රස්තාරය 4.1 (RD/16/04/AL) පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- 16- I වන ප්‍රශ්නය පහසුතාව වැඩිම ප්‍රශ්නය වන අතර එහි පහසුතාව 80%කි. එමෙන්ම 4 - I වන ප්‍රශ්නය පහසුතාව අඩුම ප්‍රශ්නය වන අතර එහි පහසුතාව 9%කි.

## අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2016
## 23 - දේශපාලන විද්‍යාව - II පත්‍රය (B හා C කොටස)
## ප්‍රශ්නවල පහසුතා දර්ශකය




ප්‍රස්තාරය 4.1 (RD/16/04/AL) පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- එසේම මෙම කොටසෙහි පහසුතාව වැඩිම ප්‍රශ්නය 6 ප්‍රශ්නයේ (I) කොටස වන අතර එහි පහසුතාව 44% කි. පහසුතාව අඩුම වන්නේ 8 ප්‍රශ්නයේ (III) කොටස වන අතර එහි පහසුතාව 16% ක් වේ.

# II කොටස

## 2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

#### 2.1.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය

- ⋆ කාලය පැය 02කි.
- ⋆ වරණ 5 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 50කි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.
- ⋆ එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100කි.

## 2.1.2. I ප්‍රශ්න පත්‍රය

- අංක **1** සිට **15** තෙක් ඇති ප්‍රශ්න සඳහා ඒ ඒ ප්‍රශ්නයේ මාතෘකාවට අදාළ ව ප්‍රකාශ පහක් දක්වා ඇත. එම ප්‍රකාශ අතුරෙන් **එකක්** සාවද්‍ය වේ. **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

**1.** දේශපාලන විද්‍යාව සැලකිලිමත් වන අධ්‍යයන කරුණු වන්නේ:
(1) සීමාවන්ට යටත් කරන ලද සමාජ බලය ක්‍රියාවට නංවන ආකාරය
(2) සමාජ බලයේ ස්වභාවය සහ ඒ කෙරෙහි බලපාන සීමා උත්පාදනය වන මූලාශ්‍ර
(3) සමාජ බලය ක්‍රියාවට නැංවීමේ උපකරණ සහ විධික්‍රම
(4) සමාජ බලය ක්‍රියාවට නැංවීම හා සම්බන්ධ ක්‍රියාකාරීන් සහ බලධාරී ආයතන
(5) සමාජ බලය ක්‍රියාවට නංවන ක්‍රියාකාරිකයින්ගේ පෞද්ගලික චර්යාව

**2.** දේශපාලනය:
(1) දේශපාලන බලය හා එහි භාවිතය පිළිබඳ ගැටුම හෙවත් තරගකාරීත්වය
(2) කවුරුන්, කුමක්, කුමන අවස්ථාවක දී, කෙලෙස හිමිකර ගන්නවා ද යන්න හා සම්බන්ධ ක්‍රියාදාමය
(3) පොදු කරුණු හා සම්බන්ධව පැන නගින ගැටුම්කාරී අදහස්වල අවසාන ප්‍රතිඵලය
(4) තම පවිකාර ජීවිතයෙන් මිදීමට මිනිසුන්ට ඇති මාවත
(5) උණ්ඩයෙන් හෝ ඡන්දයෙන් ක්‍රියාවට නැංවෙන බල අරගලය

**3.** දේශපාලන විද්‍යාව, විද්‍යාවකට වඩා කලාවක් ලෙස සලකනු ලබන්නේ:
(1) අවුරුදු 2500ක් පමණ වූ දිගු ඉතිහාසය
(2) පර්යේෂණ පැවැත්වීම සඳහා විද්‍යාගාර ශිල්පක්‍රම භාවිත කිරීමට ඇති නොහැකියාව
(3) විෂය අධ්‍යයනය කිරීම සඳහා ඒකීය විධික්‍රම හා මූලධර්ම නොමැති වීම
(4) නිශ්චිත අවසාන නිගමනවලට එළඹිය හැකි නොවරදින සුළු භෞතික පදනමක් නොමැති වීම
(5) හේතුව සහ ප්‍රතිඵලය අතර නිශ්චිත සම්බන්ධතාවක් නොමැති වීම

**4.** රාජ්‍යය:
(1) විශේෂිත දේශපාලන ව්‍යුහයන්ගෙන් සමන්විත දේශපාලන සංවිධානයක් වේ.
(2) සෑම සමාජ විද්‍යාවක ම පදනම් සංකල්පය වේ.
(3) පොදු ආශාවන් යන ආවරණය යටතේ අනෙක් සෑම සමාජ සංවිධානයකටම ඉහළින් සිටින උත්තරීතර දේශපාලන සංවිධානය වේ.
(4) ජාත්‍යන්තර දේශපාලනයේ ප්‍රධාන ක්‍රියාකාරිකයා වේ.
(5) ප්‍රභවය සහ ස්වභාවය විවිධ දේශපාලන ගුරුකුල විසින් විවිධාකාරයට දැක ඇත.

**5.** ස්වාධිපති බලය:
(1) රාජ්‍යයට පමණක් හිමිකම් කිවහැකි උත්තරීතර බලය වේ.
(2) අසහාය මෙන් ම අසීමිත බලයක් ලෙස සැලකේ.
(3) මිනිස් සමාජයක් රාජ්‍ය ලෙස සැලකීම සඳහා අවශ්‍යයෙන් ම තිබිය යුතු මූලිකාංගය වේ.
(4) 1648 වෙස්ට්ෆේලියා සාම සමථය විසින් රාජ්‍යයන්ට පවරන ලද බලය වේ.
(5) රාජ්‍ය වීම නිසා ම රාජ්‍යයට හිමිවන සුවිශේෂී බලය වේ.

**6.** ආණ්ඩුව:
(1) රාජ්‍යයේ පොදු ආශාවන් ක්‍රියාවට පරිවර්තනය කරන රාජ්‍ය හස්තය වේ.
(2) ව්‍යවස්ථාදායකය, විධායකය හා අධිකරණය යනුවෙන් හැඳින්වෙන අංශ තුනෙන් සමන්විත වේ.
(3) රාජ්‍ය බලය ක්‍රියාවට නංවන පුද්ගල කණ්ඩායම වේ.
(4) එහි කාර්ය වෙනුවෙන් ජනතාවට වගකීමට බැඳී සිටින බව පොදුවේ පිළිගනී.
(5) වෙනස් කළ නොහැකි ස්ථාවර දෙයක් වේ.

**7.** ව්‍යවස්ථාදායකය:
(1) ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ අත්‍යවශ්‍ය අංගයක් වේ.
(2) ඒකමාණ්ඩලික හෝ ද්විමාණ්ඩලික පදනම මත සංවිධානය වී ඇත.
(3) ආණ්ඩුවට සුජාතභාවය සපයන ප්‍රධාන ආණ්ඩුක්‍රම ආයතනය වේ.
(4) දේශපාලන පක්ෂ විසින් තෝරා පත්කරන සාමාජිකයින්ගෙන් පමණක් සමන්විත වේ.
(5) තත්ත්වයෙන් හා වරප්‍රසාදවලින් එක හා සමාන සාමාජිකයින්ගෙන් යුක්ත වේ.

**8.** විධායකය:
(1) ආණ්ඩු යාන්ත්‍රණය මෙහෙය වන ප්‍රධාන ධාවකයා වේ.
(2) රාජ්‍යයේ ප්‍රධානියාගෙන් සහ අමාත්‍යවරුන්ගෙන් සමන්විත වේ.
(3) ඕනෑම දේශපාලන ක්‍රමයක දේශපාලන පිරමිඩයේ ඉහළ ම නිලය වේ.
(4) ප්‍රජාතන්ත්‍රවාදය යටතේ සංවිධානය කරන්නේ ජනාධිපති, අර්ධ ජනාධිපති සහ කැබිනට් වශයෙනි.
(5) රාජ්‍යයේ උත්තරීතර නීති සම්පාදනය කරන ආණ්ඩුවේ බලධාරී අංශය වේ.

**9.** අධිකරණය:
(1) රාජ්‍යයේ නීති ක්‍රියාවට නැංවීම සඳහා ආණ්ඩුව විසින් යොදා ගැනෙන උපකරණය වේ.
(2) දේශපාලන ක්‍රමයක පවතින උසාවි පද්ධතිය වේ.
(3) රාජ්‍ය නීති අර්ථකථනය කරන ආයතනය වේ.
(4) සාමාන්‍යයෙන් ඉහළ උසාවි හා පහළ උසාවි වශයෙන් මට්ටම් දෙකක් අනුව සංවිධානය කෙරේ.
(5) පුද්ගල අයිතිවාසිකම්වල භාරකරුවා සහ ආරක්ෂකයා ලෙස සැලකේ.

**10.** නීතිය:
(1) රාජ්‍ය විසින් එහි සාමාජිකයින්ගේ හැසිරීම පිළිබඳ ව දක්වන සාමාන්‍ය නියම වේ.
(2) යම් පිළිවෙතකට අනුව සෑමවිට ම ලේඛනගත කිරීම සහ වාර්තාගත කිරීම කරනු ලැබේ.
(3) සිවිල් සමාජයේ කැමැත්ත සහ අනුමැතිය සහිත ව රාජ්‍ය විසින් බලාත්මක කරනු ලැබේ.
(4) සුවිශේෂී අවස්ථාවන්හි දී හැරුන විට සියලු දෙනාට ම සමාන ව යෙදවේ.
(5) කඩකළ විට දඬුවමට යටත් වේ.

**11.** බලතල බෙදීමේ න්‍යාය මගින් අවධාරණය කරන්නේ:
(1) ව්‍යවස්ථාදායකය, විධායකය සහ අධිකරණ වශයෙන් ආණ්ඩුවේ කාර්ය ත්‍රිවිධාකාර වන බව ය.
(2) ආණ්ඩුවේ කාර්ය ක්‍රියාවට නැංවීම එකිනෙකට වෙනස් පුද්ගලයින්ගෙන් සමන්විත ආයතන විසින් කළ යුතු බව ය.
(3) ඒ ඒ අංශයේ ක්‍රියාකාරිත්වය ඒවාට පැවරී ඇති විෂය පථයට පමණක් සීමා විය යුතු බව ය.
(4) ජනතාවගේ නිදහස ආරක්ෂා කිරීමට නම් බලතල බෙදීම අවශ්‍ය ම දෙයක් වන බව ය.
(5) බලතල බෙදීම හා ජනතා නිදහස එකට ගමන් නොකරන බව ය.

**12.** මානව අයිතිවාසිකම්:
(1) මානවයන් වීම නිසාම මිනිසුන්ට හිමිවන අයිතිවාසිකම් වේ.
(2) විශ්වීය, මූලික හා අසහාය වේ.
(3) අර්ථවත් වීමට නම් ගරු කිරීම අවශ්‍ය වේ.
(4) රාජ්‍යයේ පුරවැසියන්ට පමණක් භුක්ති විඳිය හැකි වේ.
(5) දුගීභාවය සහ අවවරප්‍රසාදිත තත්ත්ව යටතේ අර්ථ විරහිත වේ.

**13.** නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය:
(1) සාමාන්‍ය ජනතාව දේශපාලනයෙන් ඈත් කිරීම මගින් ආණ්ඩුවේ ස්ථාවරභාවය පවත්වා ගෙන යාමට උපකාරී වේ.
(2) ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාවට නැංවීම සඳහා ප්‍රායෝගික ආදර්ශයක් සපයනු ලැබේ.
(3) ආණ්ඩුකරණය පිළිබඳ තීරණ ගැනීමේ වගකීමෙන් සාමාන්‍ය පුරවැසියන් මුදාහැරේ.
(4) විශේෂඥ දැනුම සහිත අය මත ආණ්ඩුකරණය පවත්වා ගෙන යාමට ඉඩ සලසා දේ.
(5) පාලක-පාලිත දුරස්ථභාවය නැති කෙරේ.

**14.** සන්ධීය ආණ්ඩුක්‍රමය:
(1) තවත් ආකාරයක බලය බෙදීමේ ආදර්ශයක් වේ.
(2) ඒකීයත්වයේ සහ විවිධත්වයේ වාසි එක්තැන් කරන්නක් වේ.
(3) අධි මධ්‍යගත මධ්‍යම ආණ්ඩුවක් පැන නැගීමට මාර්ගය පාදනු ලැබේ.
(4) ප්‍රාදේශීය වශයෙන් ස්ථානගත වී ඇති සුළු ජන කොටස්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට උපකාරී වේ.
(5) භූමි ප්‍රමාණයෙන් විශාල රාජ්‍යයන්ට වඩාත් සුදුසු වේ.

**15.** ඒකීය ආණ්ඩුක්‍රමය:
(1) බල විරහිත මධ්‍යම ආණ්ඩුවක් ඇතිවීම කෙරෙහි මග පාදනු ලැබේ.
(2) කුඩා රාජ්‍යයන්ට හෝ සජාතීය ලක්ෂණ සහිත පළාත්වලින් යුත් රාජ්‍යයන්ට වඩාත් සුදුසු වේ.
(3) සමස්ථ රට පුරා ඒකීය නීති ක්‍රමයක් හා පරිපාලන ක්‍රමයක් පවත්වා ගෙන යාමට උපකාරී වේ.
(4) ආණ්ඩුවේ වැඩකටයුතු දෙවරක් කිරීමෙන් සිදුවන නාස්තිය වළක්වා ගැනීමට උපකාරී වේ.
(5) ආණ්ඩුවේ වගකීම හා වගවීම පැහැදිලි ව හඳුනාගැනීමට උපකාරී වේ.

- අංක **16** සිට **35** තෙක් ඇති ප්‍රශ්න සඳහා ඒ ඒ ප්‍රශ්නයේ මාතෘකාවට අදාළ ව ප්‍රකාශ පහක් සපයා ඇත. ඒවායින් නිවැරදි වන්නේ ප්‍රකාශ හතරක් පමණි. **නිවැරදි** ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

**16.** කැබිනට් ආණ්ඩුක්‍රමය:
A - නාමික හා සත්‍ය යනුවෙන් විධායක දෙකකින් සමන්විත වේ.
B - සාමූහික හා පුද්ගලික වගකීම යන මූලධර්ම දෙක මත ක්‍රියාත්මක වේ.
C - සාර්ථක ක්‍රියාකාරිත්වය සඳහා දේශපාලන සජාතිකභාවය අවශ්‍ය වේ.
D - ආණ්ඩුව තුළ කැබිනට් මණ්ඩලයේ ඒකාධිපතිත්වයක් බිහිවීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කෙරේ.
E - හොඳින් සංවිධානය වූ ද්විපක්ෂ ක්‍රමයක් යටතේ සාර්ථක ව ක්‍රියාත්මක වේ.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**17.** ජනාධිපති ආණ්ඩුක්‍රමය:
A - ආණ්ඩුවේ ස්ථාවරභාවය කැබිනට් ක්‍රමයට වඩා සහතික කෙරේ.
B - දේශපාලන පක්ෂවල බලපෑම අවම කෙරේ.
C - සමාජ බහුවිධතාව සහිත රටවල්වලට වඩාත් යෝග්‍ය වේ.
D - ප්‍රජාතාන්ත්‍රික ආණ්ඩුකරණය යම් ප්‍රමාණයකින් දුර්වල කෙරේ.
E - බලතල බෙදීමේ පදනම මත ක්‍රියාත්මක වේ.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**18.** ඇමෙරිකා එක්සත් ජනපදයේ සන්ධීය ආණ්ඩුක්‍රමය:
A - මධ්‍යම ආණ්ඩුවකින් සහ ප්‍රාන්ත රාජ්‍ය පනහකින් සමන්විත වේ.
B - බලතල බෙදීම සහ සංවරණ හා තුලන න්‍යායන් මත ගොඩනගා ඇත.
C - ස්වකැමැත්ත මත ප්‍රාන්ත රාජ්‍යයන්ට ඉවත් වීමේ අයිතිය සහිත ප්‍රාන්ත රාජ්‍ය එකතුවක් වේ.
D - දුර්වල මධ්‍යම ආණ්ඩුවක් සහ ශක්තිමත් ප්‍රාන්ත රාජ්‍ය සහිත හැඩහුරුවකින් යුක්ත වේ.
E - සම්භාව්‍ය සන්ධීයවාදය සඳහා දිය හැකි හොඳම නිදසුන ලෙස සැලකේ.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**19.** බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකය:
A - පාර්ලිමේන්තුව නමින් හැඳින්වේ.
B - මණ්ඩල දෙකකින් සමන්විත වේ.
C - පාර්ලිමේන්තු ස්වාධිපති න්‍යාය මත ක්‍රියාත්මක වේ.
D - ව්‍යවස්ථාදායක කාර්ය සම්බන්ධයෙන් රජිනට වගකිව යුතු වේ.
E - දේශපාලන ක්‍රමය තුළ නීති සම්පාදනය කරන උත්තරීතර ආයතනය වේ.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**20.** 1958 ඩිගෝල් ව්‍යවස්ථාව යටතේ ප්‍රංශය තුළ පිහිටුවන ලද ආණ්ඩුක්‍රමය:
A - සිව්වන සමූහාණ්ඩුව ලෙස ද සැලකේ.
B - ජනාධිපති සහ කැබිනට් මූලධර්මවලින් යුත් දෙමුහුන් ආණ්ඩුක්‍රමයක් වේ.
C - ශක්තිමත් විධායකයක් සහ දුර්වල ව්‍යවස්ථාදායකයක් යන පදනම මත ගොඩනගා ඇත.
D - අවුරුදු පහක නිල කාලයක් සඳහා ජනතාව විසින් තෝරාපත් කරන ජනාධිපතිවරයකු නායකත්වය දරනු ලැබේ.
E - 1789 න් පසුව පිහිටුවන ලද වඩාත් ම සාර්ථක ආණ්ඩුක්‍රමය ලෙස සැලකේ.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**21.** ඉන්දියාවේ සන්ධීය ආණ්ඩුක්‍රමය:
A - 1950 දී ස්ථාපිත කළ ව්‍යවස්ථාව යටතේ හඳුන්වා දුන්නේ ය.
B - අර්ධ සන්ධීය ක්‍රමයක් ලෙස සැලකේ.
C - ද්විත්ව පුරවැසිභාවය මත ගොඩනගා ඇත.
D - මධ්‍යම ආණ්ඩුවකින් සහ ප්‍රාන්ත ආණ්ඩු විසිනවයකින් සමන්විත වේ.
E - බලවත් මධ්‍යම ආණ්ඩුවක් සහ දුර්වල ප්‍රාන්ත ආණ්ඩු යන පදනම මත ගොඩනගා ඇත.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

22. ස්විට්සර්ලන්ත සන්ධීය ආණ්ඩුක්‍රමයේ සන්ධීය සභාව:
A - සමාන බලැති මණ්ඩල දෙකකින් සමන්විත වේ.
B - මණ්ඩල දෙක එකට රැස්වන විට එක්සත් සන්ධීය සභාව ලෙස හැඳින්වේ.
C - සන්ධීය ආණ්ඩු ක්‍රමයේ උත්තරීතර නීති සම්පාදනය කරන්නා වේ.
D - සන්ධීය කවුන්සිලය, චාන්සලර්වරයා සහ සන්ධීය විනිශ්චයකරුවන් පත්කිරීමේ වගකීම දරනු ලැබේ.
E - කැන්ටන් මගින් චක්‍ර ආකාරයෙන් පත් කරන නියෝජිතයින්ගෙන් සමන්විත වේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

23. අන්තර්ජාතික දේශපාලනය:
A - අන්තර්ජාතික සමාජය තුළ රාජ්‍යයන් විසින් කරන බල අරගලය වේ.
B - රාජ්‍යයන්ගේ ජාතික ආශාවන් වර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම අරමුණ වේ.
C - ඡන්දයට වඩා උණ්ඩයෙන් කෙරෙන අරගලයක් වේ.
D - මහා බලවතුන් අතර කෙරෙන්නා වූ බල අරගලය වේ.
E - 'ආණ්ඩුවක් නොමැති දේශපාලනය' ලෙස ද හැඳින්වේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

24. රාජ්‍ය ප්‍රතිපත්ති:
A - විශේෂිත ඉලක්ක සපුරා ගැනීම උදෙසා ආණ්ඩුව විසින් සැලසුම් කරන ප්‍රතිපත්ති වේ.
B - ආණ්ඩුව කිරීමට හෝ නොකිරීමට අදහස් කරන දෑ නිරූපණය කරන ප්‍රතිපත්ති වේ.
C - මැතිවරණ ජයග්‍රහණය කිරීම ඉලක්ක කොටගෙන දේශපාලන පක්ෂ ඉදිරිපත් කරන ප්‍රතිපත්ති වේ.
D - ජනතා ප්‍රශ්න විසඳීම හෝ නැතිනම් අවම කිරීම ඉලක්ක කරගත් ප්‍රතිපත්ති වේ.
E - ජනතා ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීම සඳහා ආණ්ඩුව සැලසුම් කරන ප්‍රතිපත්ති වේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

25. සමාජ ගැටුම් ඇතිවීම කෙරෙහි බලපාන හේතු කාරක වන්නේ :
A - සමාජ පන්ති අතර බලය සහ සම්පත් අසමාන අයුරින් බෙදීයාම
B - මිනිසුන්ගේ සමාජ හැසිරීම කෙරෙහි බලපාන සමාජ ආචාරධර්ම ගැන ඇති නොඑකඟතාවයන්
C - තමන්ගේ ආශාවන් ප්‍රවර්ධනය කිරීමට සමාජ පන්ති අතර පවතින අරගලය
D - සමාජ බලය හා සම්පත් පාලනය කිරීම සඳහා සමාජ පන්ති අතර පවතින තරගකාරිත්වය
E - තම මතය විරුද්ධ කණ්ඩායම් මත පතිත කිරීම සඳහා සමාජ කණ්ඩායම් විසින් සවිඥානිකවම කරන උත්සහයන්

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

26. 1833 කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණවල මූලික අරමුණු වූයේ:
A - ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ වර්ධනයට දොර විවෘත කිරීම
B - රටේ ආර්ථිකය වැඩවසම් ක්‍රමයෙන් ධනවාදයට පරිවර්තනය කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම
C - බුද්ධාගම රාජ්‍ය ආගම ලෙස ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම
D - රට එක්සත් රාජ්‍ය ක්‍රමයක් යටතට ගෙන ඒම
E - සිවිල් සේවයට ඇතුල්වීමට ලාංකිකයින්ට ඉඩ සැපයීම මගින් ආණ්ඩුවේ වියදම් කපා හැරීම.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

27. 1833 කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණවල **අයහපත්** ප්‍රතිඵල සමහරක් වන්නේ:
A - ලංකාව එක්සත් රාජ්‍යයක් බවට පත් වීම
B - වාර්ගික නියෝජනය හඳුන්වා දීම හේතුවෙන් ජන කොටස් අතර වර්ගවාදය පැතිරීම
C - ස්වයංපෝෂිත ග්‍රාමීය ආර්ථිකය විනාශ වීම
D - වාණිජ වතු වගාව හඳුන්වා දීම හේතුවෙන් උඩරට ප්‍රදේශවල ඇති වූ ඉඩම් ප්‍රශ්නය
E - වාණිජ වතු වගාව සඳහා ඉන්දීය ශ්‍රමය ආයාත කිරීම හේතුවෙන් පැන නැගුණු ඉන්දියානු ද්‍රවිඩ ප්‍රශ්නය

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**28.** 1911 - 1924 කාලය තුළ ක්‍රියාවට නැංවූ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ හේතුවෙන් ලංකාවේ ආණ්ඩුකරණය හා සම්බන්ධ ව ඇති වූ වැදගත් වෙනස්වීම් කිහිපයක් වන්නේ:

A - ආණ්ඩුකාරවරයාගේ තත්ත්වය නාමමාත්‍ර විධායක මට්ටමට පහත දැමීම
B - මුදල් කාරක සභාව පිහිටු වීම
C - වැඩි කරන ලද බලය සමග ව්‍යවස්ථාදායක සභාවේ නිල නොලත් මන්ත්‍රී සංඛ්‍යාව වැඩි කිරීම
D - සීමිත ඡන්ද බලය හඳුන්වා දීම
E - මැතිවරණ දේශපාලනය මගින් ආණ්ඩුකරණයට ජනතාව සහභාගි වීම ආරම්භ වීම

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**29.** බ්‍රිතාන්‍ය පාලනය යටතේ ලංකාව තුළ ඇති වූ වැදගත් දේශපාලන, ආර්ථික හා සමාජීය වර්ධන කිහිපයක් වන්නේ:

A - දේශීය ධනපති පංතිය බිහිවීම
B - වාමාංශික ව්‍යාපාරයේ වර්ධනය
C - දේශපාලනය කෙරෙහි උගත් මධ්‍යම පන්තියේ බලපෑම ඉහළ යාම
D - වැඩවසම් රදළයින්ගේ බලය සහ තත්ත්වය අනුක්‍රමයෙන් පහත වැටීම
E - යටත්විජිත ආණ්ඩුවේ සහාය සහිත ව පිරිවෙන් අධ්‍යාපනය යළි නැගී ඒම

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**30.** ලංකාවේ ජාතික ව්‍යාපාරය:

A - පුළුල් ජනතා ව්‍යාපාරයක් විය.
B - ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයක් විය.
C - ඉන්දියානු ජාතික ව්‍යාපාරය මෙන් බලවත් එකක් නොවී ය.
D - බටහිරකරණය වූ සමාජ ප්‍රභූන් විසින් මෙහෙය වූ ව්‍යාපාරයක් විය.
E - ලාංකිකයින්ට වඩාත් වගකීම් සහිත ආණ්ඩු ක්‍රමයක් ලබා ගැනීම උදෙසා මෙහෙය වූ ව්‍යාපාරයක් විය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**31.** 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව:

A - විධායක කාර්යයන් කිරීම සඳහා ආණ්ඩුකාරවරයා, අමාත්‍ය මණ්ඩලය සහ විධායක කාරකසභා සහිත යාන්ත්‍රණය හඳුන්වා දුන්නේ ය.
B - ආණ්ඩුකාරවරයාගේ තත්ත්වය නාමික විධායක මට්ටමට පහත දැමී ය.
C - අමාත්‍ය මණ්ඩලය වාර්ෂික අයවැය සම්බන්ධයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවට වගකීමට යටත් කළේ ය.
D - ඇතැම් කොන්දේසිවලට යටත්ව අවුරුදු 21ට වැඩි සියලු දෙනාට ඡන්ද බලය ප්‍රදානය කළේ ය.
E - ව්‍යවස්ථාදායක හා විධායක කාර්යයන් දෙක ම පැවරුණු රාජ්‍ය මන්ත්‍රණ සභාව නමින් හැඳින්වූ නියෝජන සභාවක පිහිටුවිය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**32.** 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ රාජ්‍ය නිලධාරීන් තිදෙනා:

A - නිල බලයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සහ අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකත්වය හිමි වූ යටත්විජිත ආණ්ඩුවේ නියෝජිතයින් විය.
B - රාජ්‍ය මන්ත්‍රණ සභාවට සාමූහික ව වගකීමට යටත් කළේ ය.
C - ලාංකික අමාත්‍යවරුන්ට උපදෙස් දෙන්නන් ලෙස ක්‍රියා කරනු ඇතැයි අපේක්ෂා කළේ ය.
D - ආණ්ඩුකාරවරයා සමග එක්ව වෙනම විධායක මණ්ඩලයක් ලෙස ක්‍රියා කරන ආකාරය දැකිය හැකි විය.
E - ව්‍යවස්ථාවේ 'මුර බල්ලන්' ලෙස හඳුනාගනු ලැබී ය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**33.** 1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව:

A - බ්‍රිතාන්‍ය පාලකයින් විසින් නිදහස සමග ප්‍රදානය කළ නිදහස් ලංකාවේ ප්‍රථම ව්‍යවස්ථාව විය.
B - සමාන බලැති මණ්ඩල දෙකක් සහිත ව්‍යවස්ථාදායක සභාවක් සැපයුවේ ය.
C - 1944 ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල කෙටුම්පත මත මූලික වශයෙන් පදනම් විය.
D - සුළු ජන කොටස්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කළේ ය.
E - 1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ස්ථාපිත කිරීමත් සමග අහෝසි විය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**34.** 1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව:

A - බ්‍රිතාන්‍ය වෙස්ට්මින්ස්ටර් ආණ්ඩුක්‍රම ආකෘතියට සමාන ආණ්ඩුක්‍රමයක් ප්‍රදානය කළේ ය.
B - සත්‍ය විධායකය නමින් හැඳින්වුණු කැබිනට් මණ්ඩලයට විධායක බලතල පැවරී ය.
C - සීමිත ව්‍යවස්ථාදායක බලයක් සහිත පාර්ලිමේන්තුව නමින් හැඳින්වුණු ව්‍යවස්ථාදායක සභාවක් පිහිටු වීය.
D - සුළු ජන කොටස්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා විශේෂ ආරක්ෂණ විධිවිධාන සැපයුවේ ය.
E - අගමැතිවරයා විසින් පත්කළ නාමික විධායක තනතුරක් හඳුන්වා දුන්නේ ය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**35.** 1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව:
A - මහා බ්‍රිතාන්‍ය සමග පැවති සියලු ව්‍යවස්ථා සම්බන්ධතා අත්හැරීමේ සන්ධිස්ථානය සනිටුහන් කළේ ය.
B - ලංකාවේ නිල නාමය 'ශ්‍රී ලංකාව' ලෙස වෙනස් කළේ ය.
C - සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ ක්‍රියාත්මක වූ කැබිනට් ක්‍රමය තවදුරටත් පවත්වාගෙන ගියේ ය.
D - රට තුළ ජීවත් වූ සියලු ම ඉන්දියානු ද්‍රවිඩයින්ට පුරවැසිකම ප්‍රදානය කළේ ය.
E - අධිකරණ සේවය හා සිවිල් සේවය දේශපාලන විධායකය යටතට පත් කළේ ය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

- අංක **36** සිට **40** තෙක් ඇති ප්‍රශ්න සඳහා ඒ ඒ මාතෘකාවට අදාළ ව ප්‍රකාශ පහක් සපයා ඇත. ඒවායින් ප්‍රකාශ **හතරක්** සාවද්‍ය වේ. **සාවද්‍ය** ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

**36.** 1972 ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද ජාතික රාජ්‍ය සභාව:
A - සෝල්බරි ව්‍යවස්ථාව යටතේ තිබූ ව්‍යවස්ථාදායකයට සමාන විය.
B - ඡන්දයෙන් හා නාමකරණයෙන් තේරී පත් වූ මන්ත්‍රීවරු දෙවර්ගයෙන් ම සමන්විත විය.
C - පාර්ලිමේන්තු ස්වාධිපති න්‍යාය මත ස්ථාපිත කළ ආයතනයක් විය.
D - යටත් පිරිසෙයින් මාසයකට වරක්වත් සැසිවාර පැවැත්විය යුතු විය.
E - ජනාධිපති නමින් හැඳින් වූ නාමමාත්‍ර විධායකය මුලසුන දැරී ය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**37.** 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කළ ආණ්ඩුක්‍රමය:
A - ජනාධිපති ආණ්ඩුක්‍රමයට ආවරණය වූ රාජාණ්ඩු පාලන ක්‍රමයක් ය.
B - ප්‍රජාතන්ත්‍රවාදී ලෙස තෝරා ගන්නා ජනාධිපතිවරයකුගෙන් ආවරණය වූ ඒකාධිපති ක්‍රමයක් ය.
C - ප්‍රංශ ජනාධිපති ක්‍රමයට සමාන ව යන දෙමුහුන් විධායක ක්‍රමයක් ය.
D - ඇමෙරිකානු ජනාධිපති ක්‍රමයට සමාන ජනාධිපති ක්‍රමයක් ය.
E - ජනාධිපතිවරයකු විසින් විධායකයේ නායකත්වය දරන පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් ය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**38.** 1978 මුල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද පාර්ලිමේන්තුව:
A - පාර්ලිමේන්තු ස්වාධිපති මූලධර්මය මත ගොඩනගා ඇත.
B - සමන්විත වන්නේ ජනතාව විසින් තෝරා පත්කරන නියෝජිතයින්ගෙන් පමණි.
C - වසර පහක නිල කාලයක් සඳහා තේරී පත්වන ඒක මණ්ඩල ව්‍යවස්ථාදායකයක් වේ.
D - අගමැතිවරයාගේ උපදෙස් මත ජනාධිපතිවරයාට විසුරුවා හැරිය හැක.
E - නීති සම්පාදනය සම්බන්ධයෙන් පූර්ණ ව්‍යවස්ථාදායක බලයක් හිමි කරගෙන නැත.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**39.** 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනය යටතේ පිහිටුවන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ කාර්ය වන්නේ:
A - උසස් රාජ්‍ය නිලධාරීන් පත්කිරීම සම්බන්ධයෙන් ජනාධිපතිට හා කැබිනට් මණ්ඩලයට සහාය වීම
B - යහපාලන ආණ්ඩුකරණය හා සම්බන්ධ කරුණු පිළිබඳ ව කටයුතු කිරීමට ජනාධිපතිට සහාය වීම
C - සමහර ස්වාධීන කොමිෂන් සභාවලට පත්කිරීම් කිරීම සඳහා ජනාධිපතිට නිර්දේශ සැපයීම
D - රාජ්‍ය සේවකයින්ගේ වංචා සහ දූෂණ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට ජනාධිපතිට සහාය වීම
E - අමාත්‍යාංශ ලේකම්වරුන් පත්කිරීම සඳහා ජනාධිපතිට සහාය වීම
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**40.** 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අන්තර්ගත මූලික අයිතිවාසිකම්:
A - මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ සඳහන් අයිතිවාසිකම්වලට කිසිසේත් ම සමාන නැත.
B - භුක්ති විඳිය හැක්කේ පුරවැසියන්ට පමණි.
C - අධිකරණ විනිශ්චයකට යොමු කළ හැක්කේ උල්ලංඝනය වීම විධායක ක්‍රියාවක් මගින් සිදු වුවහොත් පමණි.
D - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රකාශිත මහජන ස්වාධිපතිත්වයේ නොබිඳිය හැකි කොටසක් වේ.
E - රාජ්‍ය සහ අධිකරණය අතර ගැටුම් ඇතිවීම කෙරෙහි බලපා ඇති ප්‍රධාන මූලාශ්‍රය ලෙස සැලකේ.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

- අංක **41** සිට **50** දක්වා ඇති ප්‍රශ්න සඳහා ඒ ඒ ප්‍රශ්නයේ මාතෘකාවට අදාළ ව ප්‍රකාශ පහක් ඉදිරිපත් කර ඇත. ඒවායින් නිවැරදි වන්නේ **හතරක්** පමණි. **නිවැරදි** ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

**41.** 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද 19 වන සංශෝධනය යටතේ:

A - ජනාධිපතිගේ ධූර කාලය වසර 6 සිට 5 දක්වා අඩු කළේ ය.

B - ජනාධිපති ධූර අපේක්ෂකයින්ගේ අවම වයස් සීමාව අවුරුදු 30 සිට 35 දක්වා වැඩි කළේ ය.

C - එක් පුද්ගලයකුට ජනාධිපති ධූරය දැරිය හැක්කේ දෙවතාවක් පමණි යන කොන්දේසිය නැවත පැනවී ය.

D - පාර්ලිමේන්තුව විසින් ප්‍රතික්ෂේප කරන පනත් කෙටුම්පත් ජනමත විචාරණයට තැබීමේ ජනාධිපති සතු බලය වෙනස් නොකළේ ය.

E - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගරු කරමින් එය පිළිපදින බවට සහතික වීම ජනාධිපතිවරයාගේ වගකීමක් බවට පත් කළේ ය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**42.** ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ වන්නේ:

A - ප්‍රධාන පක්ෂ දෙකකින් හා කුඩා පක්ෂ රාශියකින් යුත් බහු පක්ෂ ක්‍රමයක පැවැත්ම

B - ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක විසින් පක්ෂ ක්‍රමය අභිභවනය කිරීම

C - ප්‍රධාන පක්ෂ දෙක වටා එක්රැස් වූ කුඩා පක්ෂ පදනම් කරගෙන ගොඩනැගුන ද්විසභාග පක්ෂ ක්‍රමය

D - වාර්ගික පදනම මත පක්ෂ පිහිටුවීමේ ප්‍රවණතාව ඉහළ යාම

E - දේශපාලන පක්ෂ ක්‍රමයේ තුන්වන බලවේගය ලෙස පැරණි වම යළි හිස එසවීම

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**43.** 1978 ව්‍යවස්ථාව යටතේ හඳුන්වා දුන් සමානුපාතික නියෝජන ක්‍රමය:

A - බහු මන්ත්‍රී දිස්ත්‍රික්ක කොට්ඨාස ක්‍රමය පදනම් කරගෙන ක්‍රියාත්මක වේ.

B - මැතිවරණයක දී එක් ඡන්දදායකයකුට මනාප තුනක් ප්‍රකාශ කිරීමේ අවස්ථාව හිමි වේ.

C - ද්විපක්ෂ ක්‍රමයක් වර්ධනය වීම කෙරෙහි අනුබලය සැපයේ.

D - පක්ෂ නායකත්වයේ කතිපයාධිකාරී බලය වර්ධනය වීම කෙරෙහි දායකත්වය සැපයේ.

E - පාර්ලිමේන්තුව තුළ 2/3 බහුතරයක් හිමිකර ගැනීමට කිසිදු පක්ෂයකට පහසුකම් නොසැපයේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**44.** ශ්‍රී ලංකාවේ පළාත් සභා:

A - පිහිටුවා තිබෙන්නේ රටේ මූලික නීතියෙනි.

B - හඳුන්වා දුන්නේ රටේ වාර්ගික ප්‍රශ්නයට දේශපාලන විසඳුමක් ලෙස ය.

C - ප්‍රඥප්ති සෑදීමේ බලය භුක්ති විඳී.

D - පිහිටුවා ඇත්තේ දිස්ත්‍රික්කයකට එකක් වන පරිදි ය.

E - පිහිටුවයේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද 13 වන සංශෝධනය මගිනි.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**45.** එක්සත් ජාතීන්ගේ සංවිධානය:

A - වර්තමාන ලෝකය තුළ පවතින විශාල ම අන්තර් රාජ්‍ය සංවිධානය වේ.

B - මහ බලවතුන් පස්දෙනාගෙන් සැදුම්ලත් කමිටුවක් මගින් පාලනය කෙරේ.

C - ප්‍රධාන ආයතන හයකින් සමන්විත වේ.

D - ලෝක සාමය හා සුරක්ෂිතතාව පවත්වා ගෙනයාමේ වගකීම දරන ප්‍රධාන අන්තර්ජාතික රාජ්‍ය සංවිධානය වේ.

E - ක්‍රියා කරන්නේ සාමාජික රාජ්‍යයන්ගේ අභ්‍යන්තර කටයුතුවලට මැදිහත් නොවීමේ ප්‍රතිපත්තිය මත ය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**46.** එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් කවුන්සිලය:

A - 2006 වර්ෂයේ මහා මණ්ඩලය විසින් පිහිටුවන ලදී.

B - සමන්විත වන්නේ මහා මණ්ඩලය විසින් පත් කරන සාමාජිකයින් 47 දෙනෙකුගෙනි.

C - සෑම ආකාරයක ම මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීමේ හා ආරක්ෂා කිරීමේ වගකීම පැවරී ඇත.

D - මානව හිමිකම් පිළිබඳ විෂයානුබද්ධ ප්‍රශ්න හා තත්ත්වයන් අවුරුද්ද පුරාම සාකච්ඡා කිරීමේ බලය සහිත වේ.

E - තම කාර්ය සම්බන්ධයෙන් මහලේකම්වරයාට වගකීමට බැඳී සිටී.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**47.** කලාපීය සහයෝගිතාව සඳහා වූ දකුණු ආසියාතික සංවිධානය:

A - රාජ්‍ය නොවන සංවිධානයක් වේ.

B - දකුණු ආසියාතික රාජ්‍යයන් අටකින් සමන්විත වේ.

C - කලාපීය ආර්ථික හා සමාජීය සහයෝගිතාව වර්ධනය කිරීම ගැන සැලකිලිමත් වේ.

D - පිහිටුවා තිබෙන්නේ 1985 ඪකා ප්‍රකාශනයේ අන්තර්ගත මූලධර්ම පදනම් කරගෙන ය.

E - අන්තර්ජාතික සමාජයේ ප්‍රසිද්ධියට පත්ව ඇත්තේ 'දුප්පතුන්ගේ සමාජය' ලෙස ය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**48.** පොදු රාජ්‍ය මණ්ඩලය:

A - ව්‍යවස්ථාවක් පදනම් කරගෙන පිහිටුවා නැති එකම රාජ්‍ය සංවිධානය වේ.

B - වර්තමානයේ සමන්විත වන්නේ සාමාජිකයින් 53 දෙනෙකුගෙනි.

C - මහලේකම්වරයාගේ නායකත්වය යටතේ ක්‍රියාත්මක වේ.

D - ක්‍රියාත්මක වන්නේ සාමාජික රාජ්‍යයන්ගේ අන්තර් ආණ්ඩු එකඟතා මත ය.

E - සමන්විත වන්නේ සර්වාධිපති රාජ්‍යයන්ගෙන් වන අතර ඒවායින් බහුතරය පැරණි බ්‍රිතාන්‍ය යටත්විජිත වේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**49.** අන්තර්ජාතික ක්ෂමා ආයතනය:

A - 1961 වර්ෂයේ දී පිහිටූ රාජ්‍ය නොවන සංවිධානයක් වේ.

B - 'ලෝකයේ සියලු දෙනාට ම මානව අයිතීන්' යන තේමාව ප්‍රචාරණය කිරීමේ යෙදී සිටින ව්‍යාපාරයක් වේ.

C - යුධ සිරකරුවන්ගේ සුභසාධනය ගැන අවධානය දක්වන අන්තර් රාජ්‍ය සංවිධානයක් වේ.

D - ජාත්‍යන්තර සමාජය තුළ පොදුවේ හඳුන්වන්නේ 'AMNESTY' හෝ 'AI' ලෙස ය.

E - නීති උපදෙස්, මාධ්‍ය අවධානය, මානව හිමිකම් පිළිබඳ ව ප්‍රචාරණය හා පර්යේෂණ පැවැත්වීම යන ක්ෂේත්‍ර හා සම්බන්ධ ව ක්‍රියාත්මක වේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**50.** අන්තර්ජාතික රතු කුරුස කමිටුව:

A - ස්විට්සර්ලන්තයේ ජිනීවා නගරය මූලස්ථානය කරගෙන ක්‍රියාත්මක වන මානව දයාවාදී සංවිධානයක් වේ.

B - අන්තර්ජාතික මානව හිතවාදී නීතිය වර්ධනය කිරීම හා බැඳී සිටින ප්‍රධාන අන්තර්ජාතික සංවිධානය වේ.

C - ක්‍රියාත්මක වන්නේ මානව හිතවාදය, අපක්ෂපාතීභාවය, ස්වාධීනත්වය, ස්වේච්ඡාත්මකභාවය, විශ්වීයභාවය යන මූලධර්ම පදනම් කරගෙන ය.

D - ප්‍රධාන වශයෙන් සැලකිලිමත් වන්නේ සන්නද්ධ ගැටුම්වල දී පීඩාවට පත්වන අයට සහන සැලසීම ගැන ය.

E - එක්සත් ජාතීන්ගේ පවුලේ අනුබද්ධිත ආයතනයක් වේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

2.1.3 I පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01 | 5 | 26 | 3 |
| 02 | 4 | 27 | 2 |
| 03 | 1 | 28 | සියල්ලම |
| 04 | 2 | 29 | 1 |
| 05 | 4 | 30 | 2 |
| 06 | 5 | 31 | 4 |
| 07 | 4 | 32 | 4 |
| 08 | 5 | 33 | 4 |
| 09 | 1 | 34 | 1 |
| 10 | 3 | 35 | 5 |
| 11 | 5 | 36 | 3 |
| 12 | 4 | 37 | 3 |
| 13 | 1 | 38 | 1 |
| 14 | 3 | 39 | 3 |
| 15 | 1 | 40 | 5 |
| 16 | 5 | 41 | 5 |
| 17 | 3 | 42 | 1 |
| 18 | 3 | 43 | 3 |
| 19 | 5 | 44 | 5 |
| 20 | 2 | 45 | 4 |
| 21 | 3 | 46 | 1 |
| 22 | 1 | 47 | 2 |
| 23 | 5 | 48 | 3 |
| 24 | 3 | 49 | 3 |
| 25 | 4 | 50 | 1 |

නිවැරදි එක් පිළිතුරකට ලකුණු **02** බැගින් මුළු ලකුණු **100** කි.

2.1.4 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, විෂය ක්ෂේත්‍රය අනුව :



| විෂය ඒකකය | ප්‍රශ්න සංඛ්‍යාව (ප්‍රශ්න අංක) | පහසුතාව වැඩිම | | පහසුතාව අඩුම | |
|---|---|---|---|---|---|
| | | ප්‍රශ්නය | පහසුතාව | ප්‍රශ්නය | පහසුතාව |
| 1. දේශපාලන විද්‍යාවේ ස්වභාවය | 3 (1, 2, 3) | 2 | 85% | 3 | 58% |
| 3. රාජ්‍යයේ ස්වභාවය | 2 (4, 5) | 5 | 67% | 4 | 52% |
| 4. ආණ්ඩුවේ ස්වභාවය, ආණ්ඩුක්‍රම ආකෘති සහ කාර්යයන් | 9 (6, 7, 8, 9, 11, 14, 15, 16, 17) | 6 | 88% | 17 | 29% |
| 5. ආණ්ඩුකරණයට ජනතාව සම්බන්ධ වන විධි ක්‍රම | 1 (13) | | 52% | | |
| 6. ප්‍රජාතන්ත්‍රවාදය හා යහපාලනය අතර පවත්නා සම්බන්ධතාව | 2 (10, 12) | 12 | 34% | 10 | 27% |
| 7. ශ්‍රී ලංකාවේ පැවති යටත් විජිත පාලනයේ ස්වභාවය | 7 (26, 27, 28, 29, 30, 31, 32) | 27 | 82% | 31 | 43% |
| 8. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පාදනයේ පසුබිම | 4 (33, 34, 35, 36) | 34 | 47% | 36 | 41% |
| 9. රාජ්‍ය පරිපාලනය, රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සහ කළමනාකරණය | 1 (24) | | 61% | | |
| 10. ගැටුම් හා ගැටුම් නිරාකරණය | 1 (25) | | 31% | | |
| 11. අන්තර්ජාතික දේශපාලනය | 1 (23) | | 24% | | |
| 12. තෝරා ගත් රටවල ආණ්ඩුක්‍රම ආකෘති | 5 (18, 19, 20, 21, 22) | 19 | 46% | 21 | 31% |
| 13. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවල විශේෂිත විධි විධාන සහ ආයතන | 4 (39, 40, 41, 44) | 44 | 49% | 39 | 25% |
| 14. 1978 ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයාගේ බලතල හා කාර්යයන් | 3 (37, 38, 43) | 37 | 32% | 38 | 24% |
| 15. සමාජය තුළ ක්‍රියාත්මක වන දේශපාලනයේ ස්වරූපය | 1 (42) | | 59% | | |
| 16. ගෝලීය හා කලාපීය දේශපාලනය තුළ ශ්‍රී ලංකාව | 6 (45, 46, 47, 48, 49, 50) | 50 | 54% | 46 | 23% |




I ප්‍රශ්න පත්‍රයට ඇතුළත් ඒකක අතුරින් පහසුතාව සැලකූ විට වැඩිම පහසුතාව, 76% ලබාගෙන ඇත්තේ “දේශපාලන විද්‍යාවේ ස්වභාවය” යන ඒකකයටයි. මෙහි 1, 2 හා 3වන ප්‍රශ්න එම ඒකකයෙන් අසා ඇති අතර එය ඉතා සරල මෙන්ම සිසුන්ට ඉතා හුරු පුරුදු ප්‍රශ්න වීම පහසුතාව ඉහළ අගයක් ගැනීමට හේතු වී ඇත.

ප්‍රශ්න 09ක් වූ වැඩිම ප්‍රමාණයක් අසා ඇති “ආණ්ඩුවේ ස්වභාවය, ආණ්ඩුක්‍රම ආකෘති සහ කාර්යයන්” යන ඒකකය සඳහා 54%ක පහසුතාව ලබා ඇති අතර වැඩිම පහසුතාව වන 88% ලබා ඇත්තේ 6වන ප්‍රශ්නයට ය. 29%ක් වන අඩුම පහසුතාව 17වන ප්‍රශ්නයට ලබා ඇත.

“ආණ්ඩුකරණයට ජනතාව සම්බන්ධ වන විධි ක්‍රම”, “රාජ්‍ය පරිපාලනය, රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සහ කළමනාකරණය”, “ගැටුම් හා ගැටුම් නිරාකරණය”, “අන්තර්ජාතික දේශපාලනය” හා “සමාජය තුළ පවතින ප්‍රායෝගික දේශපාලනයේ ස්වරූපය” යන ඒකකවලින් එක් ප්‍රශ්නය බැගින් අසා ඇත.

අවම පහසුතාව වන 24%ක් “අන්තර්ජාතික දේශපාලනය” යන ඒකකයට හිමි වී ඇති අතර එම ඒකකය යටතේ අසා ඇති ප්‍රශ්න සංඛ්‍යාව එකකි.

## 2.1.5 I ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශත ලෙස

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | 5 | MISSING |
| 1 | 5 | 7.06 | 3.58 | 2.92 | 3.03 | 83.3 | 0.1 |
| 2 | 4 | 2.43 | 3.83 | 3.37 | 85.39 | 4.87 | 0.1 |
| 3 | 1 | 58.47 | 9.46 | 12.66 | 8.83 | 10.33 | 0.24 |
| 4 | 2 | 10.19 | 52.38 | 9.25 | 15.58 | 12.42 | 0.17 |
| 5 | 4 | 5.6 | 10.09 | 9.6 | 67.41 | 7.1 | 0.21 |
| 6 | 5 | 2.57 | 3.86 | 2.33 | 2.92 | 88.24 | 0.07 |
| 7 | 4 | 2.33 | 4.66 | 5.15 | 42.12 | 45.63 | 0.1 |
| 8 | 5 | 3.48 | 9.57 | 13.15 | 21.11 | 52.59 | 0.1 |
| 9 | 1 | 45.39 | 17.08 | 15.83 | 8.45 | 12.97 | 0.28 |
| 10 | 3 | 14.05 | 11.97 | 26.85 | 42.78 | 4.14 | 0.21 |
| 11 | 5 | 4.1 | 8.24 | 7.58 | 10.3 | 69.57 | 0.21 |
| 12 | 4 | 4.28 | 9.77 | 6.3 | 33.57 | 45.95 | 0.14 |
| 13 | 1 | 51.93 | 5.7 | 16.07 | 10.09 | 16.07 | 0.14 |
| 14 | 3 | 8.49 | 20.77 | 51.03 | 12.9 | 6.64 | 0.17 |
| 15 | 1 | 68.87 | 6.78 | 6.16 | 11.27 | 6.78 | 0.14 |
| 16 | 5 | 15.83 | 6.78 | 17.6 | 18.16 | 41.39 | 0.24 |
| 17 | 3 | 24.45 | 6.54 | 29.53 | 19.13 | 20.14 | 0.21 |
| 18 | 3 | 12.14 | 4.94 | 35.93 | 4.97 | 41.77 | 0.24 |
| 19 | 5 | 12.45 | 13.63 | 18.92 | 8.42 | 46.4 | 0.17 |
| 20 | 2 | 15.97 | 40 | 29.11 | 7.34 | 7.44 | 0.14 |
| 21 | 3 | 27.23 | 13.57 | 30.89 | 13.6 | 14.47 | 0.24 |
| 22 | 1 | 33.81 | 21.11 | 15.86 | 13.98 | 14.99 | 0.24 |
| 23 | 5 | 12.35 | 3.17 | 49.57 | 10.82 | 23.93 | 0.17 |
| 24 | 3 | 5.91 | 5.46 | 61.11 | 23.2 | 4.24 | 0.07 |
| 25 | 4 | 38.05 | 6.96 | 10.71 | 30.85 | 13.08 | 0.35 |
| 26 | 3 | 6.64 | 5.88 | 79.69 | 3.44 | 4.21 | 0.14 |
| 27 | 2 | 5.81 | 82.61 | 5.29 | 4.07 | 2.12 | 0.1 |
| 28 | All | 18.3 | 50.09 | 6.92 | 16.52 | 7.72 | 0.45 |
| 29 | 1 | 61.81 | 6.4 | 4.9 | 11.69 | 15.1 | 0.1 |
| 30 | 2 | 8.56 | 46.26 | 14.33 | 12.66 | 18.12 | 0.07 |
| 31 | 4 | 13.46 | 9.22 | 14.64 | 42.96 | 19.55 | 0.17 |
| 32 | 4 | 7.34 | 6.64 | 17.57 | 50.09 | 18.19 | 0.17 |
| 33 | 4 | 9.32 | 19.72 | 22.12 | 44.59 | 3.9 | 0.35 |
| 34 | 1 | 47.1 | 11.93 | 21.11 | 13.08 | 6.3 | 0.49 |
| 35 | 5 | 14.92 | 12.1 | 16.49 | 12.8 | 43.41 | 0.28 |
| 36 | 3 | 20.14 | 11.72 | 41.11 | 17.84 | 8.9 | 0.28 |
| 37 | 3 | 31.79 | 8.17 | 32.42 | 16.03 | 11.27 | 0.31 |
| 38 | 1 | 24.28 | 18.3 | 29.18 | 14.09 | 13.91 | 0.24 |
| 39 | 3 | 8.73 | 23.17 | 24.9 | 30.64 | 12.24 | 0.31 |
| 40 | 5 | 9.11 | 8.63 | 7.48 | 31.79 | 42.85 | 0.14 |
| 41 | 5 | 20 | 8.83 | 10.16 | 25.39 | 35.3 | 0.31 |
| 42 | 1 | 59.3 | 5.5 | 11.2 | 10.99 | 12.77 | 0.24 |
| 43 | 3 | 32.28 | 6.64 | 31.48 | 5.7 | 23.51 | 0.38 |
| 44 | 5 | 8.31 | 8.9 | 20.03 | 13.63 | 48.83 | 0.28 |
| 45 | 4 | 35.83 | 4.21 | 19.13 | 36.42 | 4.24 | 0.17 |
| 46 | 1 | 23.44 | 28.9 | 7.17 | 18.33 | 21.74 | 0.42 |
| 47 | 2 | 17.22 | 52.28 | 6.71 | 9.57 | 14.09 | 0.14 |
| 48 | 3 | 12.52 | 16.87 | 42.92 | 13.81 | 13.57 | 0.31 |
| 49 | 3 | 9.77 | 20.7 | 42.23 | 10.82 | 15.9 | 0.59 |
| 50 | 1 | 53.7 | 13.77 | 5.25 | 17.22 | 9.74 | 0.31 |

එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය අඳුරු කර දක්වා ඇත.

### 2.1.6 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා

දේශපාලන විද්‍යාව I ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. එහි 70%කට වැඩි පහසුතාවක් සහිත ප්‍රශ්න 06ක් හඳුනාගත හැකිය. එම ප්‍රශ්න වන්නේ 1, 2, 6, 11, 26 හා 27 යන ප්‍රශ්නයන් ය. එසේම පහසුතාව 40%ට අඩු ප්‍රශ්න ගණන 15කි. එනම් 10, 12, 17, 18, 21, 22, 23, 25, 37, 38, 39, 41, 43, 45 හා 46 යන ප්‍රශ්නයන් ය. එයින් අවම පහසුතාව දක්වා ඇත්තේ අංක 46 ප්‍රශ්නය යි. එහි පහසුතාව 23%කි. මේ නිසා සමස්තයක් ලෙස පළමු ප්‍රශ්න පත්‍රයේ අඩු පහසුතාවක් දැක් වූ ප්‍රශ්න පිළිබඳව අවධානය යොමු කිරීම වැදගත්ය.

10 වන ප්‍රශ්නය ගොඩනගා තිබෙන්නේ නීතියේ ස්වභාවය හා භාවිතය පිළිබඳව අපේක්ෂකයින්ගේ දැනුම පරීක්ෂා කර බැලීම සඳහා ය. ප්‍රශ්නයෙන් අසා තිබෙන්නේ සාවද්‍ය ප්‍රකාශය තෝරන ලෙස ය. ඒ අනුව සාවද්‍ය ප්‍රකාශනය වන්නේ අංක 03 ය. එම ප්‍රකාශනයේ අන්තර්ගත වන්නේ නීතිය සිවිල් සමාජයේ කැමැත්තට හා අනුමැතියට යටත්ව රාජ්‍ය විසින් ක්‍රියාවට නංවන දෙයක් වන බව ය. නීති නිර්මාණය කිරීම සහ ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් මෙම ප්‍රකාශය මුළුමනින්ම සාවද්‍ය වේ. එම නිසා එය නිවැරදි ප්‍රකාශය ලෙස තේරිය යුත්තේ ය. නමුත් මුළු අපේක්ෂක සංඛ්‍යාවෙන් මෙම ප්‍රශ්නයට නිවැරදි පිළිතුර සපයා තිබුනේ 27%ක් පමණි. 43%ක්ම දක්වා තිබුනේ 4වන ප්‍රකාශය සාවද්‍ය වන බව ය. මෙයින් පැහැදිලිවම පෙනී යන්නේ නීතිය උත්පාදනය වීම හා ප්‍රායෝගික වශයෙන් භාවිතා වීම පිළිබඳ අපේක්ෂකයින්ගේ දැනුම අතිශයින් පහළ මට්ටමක පවතින බව ය.

අවම පහසුතා මට්ටමක් පෙන්නුම් කරන මීළඟ ප්‍රශ්නය ප්‍රශ්න අංක 12 වේ. ප්‍රශ්නය ගොඩනගා තිබෙන්නේ මානව අයිතිවාසිකම් පදනම් කරගෙන ය. ප්‍රශ්නයේ පෙන්නුම් කරන්නේ මානව අයිතිවාසිකම් යනු මොනවා ද?, ඒවා භුක්ති විඳිය හැක්කේ කාටද? සහ මිනිසාගේ සමාජ පැවැත්ම සඳහා මානව අයිතිවාසිකම්වල අවශ්‍යතාව පිළිබඳව ය. සපයා ඇති ප්‍රකාශ පහෙන් සාවද්‍ය ප්‍රකාශය තේරීම අපේක්ෂකයන් විසින් කළ යුතු විය. සාවද්‍ය ප්‍රකාශය වූයේ 4 වන ප්‍රකාශයයි. එනම් "මානව අයිතිවාසිකම් රාජ්‍යයේ පුරවැසියන්ට පමණක් භුක්ති විඳිය හැකි දෙයක් ය." යන ප්‍රකාශයයි. මෙහි නිවැරදි පිළිතුර තෝරාගෙන තිබුනේ මුළු අපේක්ෂකයන්ගෙන් 34%ක් පමණි. පිළිතුරු සපයා තිබූ මුළු අපේක්ෂකයින් සංඛ්‍යාවෙන් 46%ක් ම සාවද්‍ය ප්‍රකාශය ලෙස තෝරාගෙන තිබුනේ 5 වන ප්‍රකාශය යි. මෙසේ අවුල් සහගත පිළිතුරු සැපයීමට ප්‍රධාන ම හේතුව ලෙස පෙනී ගියේ මානව අයිතිවාසිකම් හා මූලික අයිතිවාසිකම් යන ද්වෛර්ගය පිළිබඳවත්, එම ද්වෛර්ගය තුළ ඇති මූලික වෙනස්කම් පිළිබඳවත් අපේක්ෂකයින්ට පැහැදිලි හා නිශ්චිත දැනුම හා අවබෝධය නොමැති බවයි.

අඩු පහසුතා මට්ටමක් පෙන්නුම් කරන මීළඟ ප්‍රශ්නය 17 වන ප්‍රශ්නයයි. ප්‍රශ්නය ගොඩ නගා තිබෙන්නේ ජනාධිපති ආණ්ඩුක්‍රමය පිළිබඳවයි. අවධානය යොමු කර තිබෙන්නේ ජනාධිපති ආණ්ඩුක්‍රමයේ න්‍යායාත්මක හා ප්‍රායෝගික කරුණු පිළිබඳව ය. ප්‍රකාශ පහක් සපයා ඇති අතර එයින් එකක් සාවද්‍ය ප්‍රකාශයක් වේ. නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරා දැක්වීම අපේක්ෂකයන් විසින් කළ යුතුය. නිවැරදි ප්‍රකාශ කාණ්ඩයට අයත් වන්නේ ABDE යන ප්‍රකාශ හතර ය. ඒ අනුව C ප්‍රකාශය සාවද්‍ය ප්‍රකාශය වේ. නමුත් නිවැරදි ප්‍රකාශ කාණ්ඩය අන්තර්ගත පිළිතුරු අංක 3 දක්වා තිබුනේ මුළු අපේක්ෂකයින්ගෙන් 30%ක් පමණි. මෙයින් පැහැදිලිව ම පෙනී ගිය කරුණ වූයේ අතිශයින්ම සරල ගණයේ ප්‍රශ්නයක් වුවද අදාළ නිවැරදි පිළිතුර සැපයීමට තරම් ජනාධිපති ආණ්ඩුක්‍රමයේ න්‍යායාත්මක පදනම හා ප්‍රායෝගික කරුණු පිළිබඳ අපේක්ෂකයින්ගේ දැනුම ඉතාමත් ම පහළ මට්ටමක පැවති බව ය.

අවම පහසුතා මට්ටමක් පෙන්නුම් කරන මීළඟ ප්‍රශ්නය වන්නේ තෝරාගත් රටවල ආණ්ඩුක්‍රම ආකෘති ආශ්‍රයෙන් අසා ඇති ප්‍රශ්න අංක 18, 21, සහ 22 යන ප්‍රශ්නයන් ය. මෙම ප්‍රශ්නය මගින් අවධානය යොමු කර ඇත්තේ තෝරාගත් රටවල ආණ්ඩුක්‍රම ආයතන හා ආයතනවල ක්‍රියාකාරිත්වය, බලතල, ආයතනික ව්‍යුහාත්මක පදනම පිළිබඳව පරීක්ෂා කිරීම ය. මෙම සෑම ප්‍රශ්නයක් සඳහා ම ප්‍රකාශ 5ක් සපයා ඇති අතර අපේක්ෂකයන් විසින් කළ යුත්තේ ඒවා අතරින් නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තේරීමයි. 18 වන ප්‍රශ්නයේ C ප්‍රකාශය ද, 21 වන ප්‍රශ්නයේ C ප්‍රකාශය ද, 22 වන ප්‍රශ්නයේ E ප්‍රකාශය ද සාවද්‍ය වේ.

මෙහි 18 වන ප්‍රශ්නයට අදාල නිවැරදි පිළිතුර ABDE යන ප්‍රකාශය වේ. එම ප්‍රශ්නයට නිවැරදි පිළිතුර සපයා ඇත්තේ 36%ක් වූ අපේක්ෂකයන් ප්‍රමාණයක් පමණි. 21 වන ප්‍රශ්නයට අදාල නිවැරදි පිළිතුර වූයේ ABDE යන 3 වන පිළිතුර වන අතර, එයට නිවැරදි පිළිතුර සපයා තිබුනේ අපේක්ෂකයන්ගෙන් 31%කි. 22 වන ප්‍රශ්නයට අදාල නිවැරදි පිළිතුරු වන්නේ ABCD යන ප්‍රකාශයන්ය. එම පිළිතුර සපයා තිබුනේ අපේක්ෂකයන්ගෙන් 34%ක් පමණි.

මේ අනුව 18 වන ප්‍රශ්නයට නිවැරදි ප්‍රකාශ කාණ්ඩය 3 වන පිළිතුරේ ද, 21 වන ප්‍රශ්නයේ 3 වන පිළිතුරේ ද 22 වන ප්‍රශ්නයේ 1 වන පිළිතුරේ ද අන්තර්ගත වේ. නමුත් මෙම ප්‍රශ්න 3ට නිවැරදි පිළිතුරු සපයා තිබුනේ පිළිවෙළින් 36%, 31% සහ 34% වේ. මෙම අඩු පහසුතා මට්ටම්වලින් පෙන්නුම් කරන්නේ නිර්දිෂ්ට රටවල ආණ්ඩුක්‍රම ආකෘති ඒවායේ ක්‍රියාකාරිත්වය අපේක්ෂකයන්ගේ දැනුම හා අවබෝධය පහළ මට්ටමක පවතින බව ය.

මේවා විෂය නිර්දේශයේ අන්තර්ගත මාතෘකා වන අතර සෑම වර්ෂයකම ප්‍රධාන ඇගයීමට යොදා ගත් මාතෘකා වේ. මෙවැනි තත්ත්වයක් තුළ මෙයාකාර අවම පහසුතා මට්ටමක් දැක්වීම මඟින් පෙන්නුම් කරන්නේ මෙම විෂය මාතෘකාවල පාඨශාලා පන්ති කාමරය තුළ ගුරු භවතුන් සම්ප්‍රේෂණය කරන දැනුම ප්‍රමාණවත් නොවීම පමණක් නොව රට පුරා විහිදී ඇති පෞද්ගලික උපකාරක පන්ති මගින් මෙම ද මාතෘකා පිළිබඳව දැනුම හා අවබෝධය නොලැබී ඇති බවයි. මෙම මාතෘකා පිළිබඳ ස්ව භාෂාවෙන් ලියවී ඇති පාඨ ග්‍රන්ථ ඇති අතර, ඒවා විධිමත්ව පරිශීලනය කිරීම සහ පසුගිය ප්‍රශ්න පත්‍රවල අඩංගු ඒ හා සමාන ප්‍රශ්න අධ්‍යයනය කිරීමෙන් ද, පසුගිය වසරවල අ.පො.ස. (උ.පෙළ) දේශපාලන විද්‍යාව පිළිතුරු පත්‍ර ඇගයීම් කිරීම සඳහා ලකුණු දීමේ පටිපාටිය සහ සපයා ඇති ආදර්ශ පිළිතුරු අධ්‍යයනය කිරීම මගින් ද, මෙම ඌනතාවය මග හැර ගත හැකි බව අපේක්ෂා කළ හැකි ය.

අඩු පහසුතා මට්ටමක් ප්‍රකාශ වන තවත් ප්‍රශ්නයක් ලෙස ප්‍රශ්න අංක 23 දැක්විය හැකිය. මෙම ප්‍රශ්නයේ අරමුණ වන්නේ අන්තර්ජාතික දේශපාලනයේ ස්වභාවය පිළිබඳව අපේක්ෂකයින්ගේ දැනුම පරීක්ෂා කිරීමයි. ඒ සඳහා සපයා ඇති ප්‍රකාශ පහෙන් නිවැරදි ප්‍රකාශ හතර අන්තර්ගත කාණ්ඩය අපේක්ෂකයින් විසින් තේරිය යුතු ය. නිවැරදි ප්‍රකාශ කාණ්ඩය 5 වන පිළිතුර වන අතර එයට ඇතුලත් වන්නේ ABCE ප්‍රකාශ හතරය. නිවැරදි පිළිතුර දක්වා තිබුනේ මුළු අපේක්ෂක සංඛ්‍යාවෙන් 24%ක් පමණි. මෙයින් පෙනී යන්නේ අන්තර්ජාතික දේශපාලනය උසස් පෙළ විෂය නිර්දේශයේ ඉතාම වැදගත් මාතෘකාවක් වුවද, එය පාඨශාලා මට්ටමෙන් ඉගැන්වීමේ වැදගත්කම පසුගිය වසර දහයකට ආසන්න කාලයක් තුළ අවධාරණය කළ ද ඒ පිළිබඳව සිසුන් තුළ ප්‍රමාණවත් දැනුමක් නොමැති බව ය.

අඩු පහසුතා මට්ටමක් ප්‍රකාශ කරන මීළඟ ප්‍රශ්නය ලෙස ප්‍රශ්න අංක 25 දැක්විය හැකි ය. ප්‍රශ්නය ගොඩ නඟා තිබෙන්නේ සමාජ ගැටුම උත්පාදනය වීම කෙරෙහි බල පෑ හැකි හේතු කාරක මොනවා ද? යන්න පිළිබඳව අපේක්ෂකයින්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීම සඳහාය. මෙම ප්‍රශ්නය සම්බන්ධයෙන් අපේක්ෂකයාගෙන් බලාපොරොත්තු වන්නේ සපයා ඇති ප්‍රකාශ පහෙන් නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තේරීම ය. නිවැරදි ප්‍රකාශ කාණ්ඩය අයත් වන්නේ පිළිතුරු අංක 4 තුළය. නිවැරදි පිළිතුර සපයා තිබුනේ මුළු අපේක්ෂක සංඛ්‍යාවෙන් 31%ක් පමණි. යලිත් වරක් මෙම අසාර්ථක භාවයන් පෙන්නුම් කරන්නේ ප්‍රස්තෘත මාතෘකා සම්බන්ධයෙන් අපේක්ෂකයා තුළ දැනුම පහළ මට්ටමක පවතින බවයි.

මෙම මාතෘකා සම්බන්ධයෙන් මේ වන විට ස්ව භාෂාවෙන් ලියා ඇති පාඨ ග්‍රන්ථ කිහිපයක් තිබෙන අතර, මීට ඉහතින් දැක්වූ ආකාරයට එම පාඨ ග්‍රන්ථ පරිශීලනය වැදගත් ය. පාඨ ග්‍රන්ථ පරිශීලනය, පසුගිය ප්‍රශ්න පරිශීලනය, ලකුණු දීමේ පටිපාටිය අධ්‍යයනය කිරීම ඔවුන්ගේ අවම පහසුතා මට්ටම නිරාකරණය කර ගැනීමේ උපකාරක මාර්ගය ලෙස දැක්විය හැක.

ප්‍රශ්න අංක 37 අවධානය යොමු කරන්නේ 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රමය යටතේ ස්ථාපිත කළ පාලන ක්‍රමයේ ස්වභාවය පිළිබඳව ය. අපේක්ෂකයින් විසින් කළ යුතු වූයේ සපයා ඇති ප්‍රකාශ පහෙන් සාවද්‍ය ප්‍රකාශ කාණ්ඩය තේරීමයි. එහි සාවද්‍ය ප්‍රකාශ කාණ්ඩය වන්නේ ABDE යන ප්‍රකාශ හතර ඇතුලත් තුන්වන පිළිතුරයි. එය තෝරාගත් විභාග අපේක්ෂකයන් සංඛ්‍යාව 32%ක් පමණි. එයින් පැහැදිලි වන්නේ දෙවන ජනරජ ව්‍යවස්ථාව යටතේ වන පාලන ක්‍රමයේ ස්වභාවය පිළිබඳ විභාග අපේක්ෂකයන් තුළ ප්‍රමාණවත් දැනුමක් නොතිබෙන බව ය.

අඩු පහසුතා මට්ටමක් පෙන්නුම් කරන මීළඟ ප්‍රශ්නය 38 වන ප්‍රශ්නයයි. මෙම ප්‍රශ්නය ගොඩ නගා තිබෙන්නේ 1978 මුල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ව්‍යවස්ථාදායකය පිළිබඳ අපේක්ෂකයන්ගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා වේ. මෙම මාතෘකාවට අදාල ප්‍රකාශ සපයා ඇති අතර එයින් ප්‍රකාශ හතරක් සාවද්‍ය වේ. සාවද්‍ය ප්‍රකාශ කාණ්ඩය තෝරා දැක්වීම අපේක්ෂකයන් විසින් කළ යුතු ය. සාවද්‍ය ප්‍රකාශ කාණ්ඩයට අයත් වන්නේ ABCD යන ප්‍රකාශ හතරයි. මේ අනුව ‘E’ ප්‍රකාශය නිවැරදි ප්‍රකාශය වේ. නමුත් සාවද්‍ය ප්‍රකාශ කාණ්ඩය අන්තර්ගත පිළිතුරු අංක 1 දක්වා තිබුනේ මුළු අපේක්ෂකයන්ගෙන් 24%ක් පමණි. මෙයින් පැහැදිලිව පෙනී ගිය කරුණක් වූයේ මෙම ප්‍රශ්නය අතිශයින් ම සරල ගණයේ ප්‍රශ්නයක් වුවද, එයට අදාල නිවැරදි පිළිතුර සැපයීමට තරම් පාර්ලිමේන්තුව, එහි බලතල හා ස්වභාවය පිළිබඳව අපේක්ෂකයින් සතු දැනුම හා අවබෝධය ඉතා දුර්වල මට්ටමක පවතින බවයි.

අවම පහසුතා මට්ටමක් පෙන්නුම් කරන මීළඟ ප්‍රශ්නය වන්නේ 39 වන ප්‍රශ්නයයි. මෙම ප්‍රශ්නය මගින් අවධානය යොමු කරන්නේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනය මගින් පිහිටුවන ලද ව්‍යවස්ථාමය ආයතන හා විශේෂ විධි විධානයන් පිළිබඳව අපේක්ෂකයන්ගේ දැනුම පරීක්ෂා කිරීම වේ. මෙහි නිවැරදි පිළිතුර වූයේ ABDE ප්‍රකාශ ඇතුළත් තුන්වන පිළිතුරයි. මෙම පිළිතුර නිවැරදිව තෝරාගෙන තිබුනේ අපේක්ෂකයන්ගෙන් 25%ක් පමණි. අපේක්ෂකයන් 75%කටම නිවැරදි වරණය තෝරා ගැනීමට නොහැකි වීමෙන් පෙනී යන්නේ ප්‍රස්තුත මාතෘකාව පිළිබඳව විශේෂිත නව දැනුම හා අවබෝධය පහළ මට්ටමක පවතින බවයි. අපේක්ෂකයන් බුද්ධිමය සාකච්ඡා හා පුවත්පත් පරිශීලනය කිරීම, විද්වත් දේශපාලන සාකච්ඡා ආදිය කෙරෙහි යොමු කිරීමෙන් මෙම ගැටළුව මග හරවා ගත හැකි බව අපේක්ෂා කළ හැක.

ප්‍රශ්න අංක 41 ද අඩු පහසුතා දර්ශකයක් සහිත වූ ප්‍රශ්නයකි. එම ප්‍රශ්නයෙන් අපේක්ෂා කරන ලද්දේ ලබා දී ඇති ප්‍රකාශ පහ අතරින් නිවැරදි ප්‍රකාශ හතර තේරීමයි. එහි නිවැරදි ප්‍රකාශයන් වූයේ ABCE ප්‍රකාශයන් ඇතුලත් 5 වන පිළිතුරයි. එම පිළිතුර සැපයූ ශිෂ්‍ය සංඛ්‍යාව 35%කි. මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කරන ලද්දේ දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඉදිරිපත් කරන ලද 19 වන සංශෝධනය මගින් සිදු කරන ලද වෙනස්කම් පිළිබඳව විභාග අපේක්ෂකයන්ගේ දැනුම හා අවබෝධය මැනීම ය. නමුත් ඔවුන් වැඩි දෙනෙකු තුළ ඒ පිළිබඳ දැනුමක් හා අවබෝධයක් නොවූ බව වැරදි පිළිතුරු සංඛ්‍යාව 65%ක් තරම් වූ ඉහළ මට්ටමක පැවතීමෙන් පැහැදිලි වේ.

අඩු පහසුතා දර්ශකයක් දැක්වූ තවත් ප්‍රශ්නයක් වන්නේ 43 වන ප්‍රශ්නයයි. මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කරනු ලැබුවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ක්‍රියාත්මක වන සමානුපාතික නියෝජන ක්‍රමයේ ප්‍රායෝගික භාවිතය, එම ක්‍රමයේ යහපත් හා අයහපත් ලක්ෂණ පිළිබඳව මැනීම ය. මෙම ප්‍රශ්නය මගින් විමසා ඇත්තේ ලබා දී ඇති ප්‍රකාශ පහ අතරින් නිවැරදි ප්‍රකාශ කාණ්ඩය කුමක් ද? යන්න ය. මෙම ප්‍රකාශ කාණ්ඩය වන්නේ ABDE ප්‍රකාශ ඇතුළත් 3 වන පිළිතුරයි. එම නිවැරදි පිළිතුර සැපයූ අපේක්ෂකයන් සංඛ්‍යාව 31%ක් වීමෙන් පැහැදිලි වන්නේ ප්‍රශ්නයෙන් අපේක්ෂිත ආකාරයට වර්තමානයේ ක්‍රියාත්මක වන සමානුපාතික නියෝජන ක්‍රමයේ ක්‍රියාකාරිත්වය පිළිබඳව හා එය දේශපාලන ක්‍රමයට සිදු කරන බලපෑම පිළිබඳව විභාග අපේක්ෂකයන්ගේ දැනුම හා අවබෝධය ප්‍රමාණවත් නොවන බව ය.

අවම පහසුතා මට්ටමක් දක්වන මීළඟ ප්‍රශ්න වන්නේ 45 හා 46 ප්‍රශ්නයන් ය. මෙම ප්‍රශ්න ගොඩ නගා තිබෙන්නේ එක්සත් ජාතීන්ගේ සංවිධානය පිළිබඳව අපේක්ෂකයින්ගේ දැනුම පරීක්ෂා කිරීම වේ. මෙම මාතෘකාවට අදාල ප්‍රකාශ පහක් සපයා ඇති අතර එයින් ප්‍රකාශ හතරක් නිවැරදි වේ. නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරා දැක්වීම අපේක්ෂකයන් විසින් කළ යුතු ය. නිවැරදි ප්‍රකාශ කාණ්ඩය අයත් 45 වන ප්‍රශ්නයට අදාළ පිළිතුර වන්නේ ACDE යන ප්‍රකාශ හතරයි. 46 වන ප්‍රශ්නයට අදාල පිළිතුර වන්නේ ABCD යන ප්‍රකාශ හතරයි. 45 වන ප්‍රශ්නයට අදාළ අංක 4 දක්වා තිබුනේ මුළු අපේක්ෂකයන්ගෙන් 36%කි. 46 වන ප්‍රශ්නයට අදාළ අංක 1 දක්වා තිබුනේ මුළු අපේක්ෂකයින්ගෙන් 23%කි. මෙයින් පැහැදිලිව පෙනී ගිය කරුණක් වූයේ “ගෝලීය හා කලාපීය දේශපාලනය තුළ ශ්‍රී ලංකාව” යන මාතෘකා පිළිබඳව අපේක්ෂකයින්ගේ දැනුම ඉතාම අඩු මට්ටමක පැවතීමයි.

ඉහතින් දැක්වූයේ 2016 අ.පො.ස (උ.පෙළ) විභාගයේ දේශපාලන විද්‍යාව I ප්‍රශ්න පත්‍රයේ සමහර බහුවරණ ප්‍රශ්නවල පහසුතා මට්ටම පහළ යාම කෙරෙහි බලපා ඇති හේතු සාධකයන් ය. එම දුර්වලතා මග හරවා ගැනීම සඳහා ඒ ඒ ප්‍රශ්න යටතේ දක්වා ඇති විධි ක්‍රම අනුගමනය කිරීමට අමතරව පහත දැක්වෙන අධ්‍යයන ක්‍රියාමාර්ග යොදා ගැනීම ද සුදුසු බව කරුණු විමසීමේදී පෙනී ගියේය.

(1) විෂයේ විශේෂඥවරුන්ගේ සහභාගිත්වයෙන් සාකච්ඡා, සම්මන්ත්‍රණ, වැඩමුළු පැවැත්වීම. මෙය ජාතික, ප්‍රාදේශීය හා කලාපීය මට්ටමෙන් පැවැත්වීමට අදාළ බලධාරීන් පියවර ගැනීම.

(2) විෂය පිළිබඳ විශේෂඥ පුහුණුව ලත් ගුරු උපදේශකවරු පත් කිරීමට පියවර ගැනීම හා නිරන්තරයෙන් අධීක්ෂණය කිරීම හා පසු විපරම් කිරීම.

(3) විෂය නිර්දේශයට අදාල පාඨ ග්‍රන්ථ සම්පාදනය කිරීම සඳහා සුදුසු විශේෂඥයින්ගෙන් සැදුම්ලත් කමිටු පත් කිරීම හා ඔවුන්ට සහය දැක්වීම.

(4) විෂය උගන්වන ගුරුවරුන් සඳහා විශේෂ පුහුණු පාඨමාලා සකස් කිරීම.

(5) ශිෂ්‍යයන්ගේ දැනුම, අවබෝධය, උනන්දුව වර්ධනය කිරීම සඳහා පහත දැක්වෙන ක්‍රියාමාර්ග අනුගමනය කිරීම.

- කණ්ඩායම් ක්‍රියාකාරකම්
- පැවරුම්
- බුද්ධි කලම්භන
- විවෘත ග්‍රන්ථ පරීක්ෂණ
- කෙටි ලිඛිත
- බිත්ති පුවත්පත් නිර්මාණය කිරීම
- විවාද
- කථනය

## 2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

කාලය පැය 03කි.
මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** සමන්විත ය.

A කොටස - කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්න 20 කි. ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 1 බැගින් ලකුණු 20 කි.

B කොටස - අර්ධ ව්‍යුහගත හා රචනා වර්ගයේ ප්‍රශ්න 4 කි. ප්‍රශ්න **දෙකකට** පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලකුණු 40 කි.

C කොටස - අර්ධ ව්‍යුහගත හා රචනා වර්ගයේ ප්‍රශ්න 4 කි. ප්‍රශ්න **දෙකකට** පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලකුණු 40 කි.

II පත්‍රය සඳහා මුළු ලකුණු 20 + 40 + 40 = 100

**2.2.2. II ප්‍රශ්න පත්‍රය, අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා**

> **II පත්‍රය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ ප්‍රස්තාර 2 හා 3 ඇසුරෙන් ඉදිරිපත් කර ඇත. ප්‍රශ්නයට අදාළ ප්‍රස්තාර කොටස ඒ ඒ ප්‍රශ්නයේ නිරීක්ෂණ හා නිගමන සමඟ දක්වා ඇත.**

## A කොටස

## 1 සිට 20 දක්වා ප්‍රශ්න

1. පහත දැක්වෙන ප්‍රකාශ දෙකෙන් පැහැදිලි කරන්නේ දේශපාලන ක්‍රම දෙකක රාජ්‍යය සහ පුරවැසියන් අතර පවතින සම්බන්ධතාව පාලනය වන ආකාරය යි. එම ක්‍රම **දෙක** හඳුනාගෙන පිළිවෙළින් නම් කරන්න.

   (i) "මෙම දේශපාලන ක්‍රමය තුළ ආණ්ඩුවේ තනතුරුවලට පත්වීම සඳහා තරඟකාරිත්වයක් පවතී. තේරීම කරන්නේ බලය යෙදවීමෙන් තොර, එමෙන් ම කිසිදු සමාජ කණ්ඩායමක් පිටමං නොකළ, කාලීනව පවත්වන සාධාරණ මැතිවරණ මගිනි. තම නායකයින් තේරීමට මෙන් ම රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයට ද පුරවැසියන්ට සහභාගී විය හැක. දේශපාලන ක්‍රමය මගින් සහතික කර ඇති සිවිල් හා දේශපාලන නිදහස යටතේ තරඟකාරීභාවයේ සහ සහභාගීවීමේ ඒකාග්‍රතාව ආරක්ෂා කෙරේ.

   (ii) "මෙම දේශපාලන ක්‍රමය තුළ පුරවැසි ජීවිතයේ පෞද්ගලික වුව ද, පොදු වුව ද, සෑම අංශයක්ම පාලනය කිරීමට හා මෙහෙයවීමට රාජ්‍යය මැදිහත් වේ. එයින් අදහස් වන්නේ රාජ්‍යය මගින් තීරණය කරන ලද සමහර අරමුණු සපුරා ගැනීම ඉලක්ක කොටගෙන ජනතාවගේ දේශපාලන, ආර්ථික, සමාජීය - සංස්කෘතික සහ බුද්ධිමය ජීවිතය රාජ්‍යය මගින් මෙහෙයවීම ය. රාජ්‍යයට විරුද්ධ වීමට හෝ එය විවේචනය කිරීමට හෝ නව අරමුණක් ඉදිරිපත් කිරීමට හෝ පුරවැසියන්ට අයිතිය නොමැත."

   1. ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමය
   2. ඒකාධිපති දේශපාලන ක්‍රමය

2. පහත දැක්වෙන ප්‍රකාශ දෙකෙන් පෙන්නුම් කරන දේශපාලන සංවිධාන **දෙක** පිළිවෙළින් නම් කරන්න.

   (i) "මෙම දේශපාලන සංවිධානය සමන්විත වන්නේ දේශසීමාව තුළ වාසය කරන සියලු ම පුරවැසියන්ගෙනි."

   (ii) "මෙම දේශපාලන සංවිධානය සමන්විත වන්නේ දේශසීමාව තුළ වාසය කරන පුරවැසියන් කොටසකගෙන් පමණි."

   1. රාජ්‍යය
   2. ආණ්ඩුව

3. පහත දැක්වෙන ප්‍රකාශ දෙකෙන් පෙන්නුම් කරන සමාජ සංවිධාන **දෙක** පිළිවෙළින් නම් කරන්න.

(i) "එය දේශසීමා සහිත සංවිධානයක් වේ. එය නිශ්චිත දේශ සීමාවන්ගෙන් යුක්ත වූවක් වේ."

(ii) "එය විශ්වීය වේ. එයට දේශසීමාවක් නොමැත."

1. රාජ්‍යය

2. සමාජය

4. පහත දැක්වෙන පළමු ප්‍රකාශය මගින් විස්තර කෙරෙන සමාජ සංවිධානය සහ දෙවන ප්‍රකාශය මගින් විස්තර කෙරෙන දේශපාලන සංවිධානය පිළිවෙළින් නම් කරන්න.

(i) "එය ගොඩනැගී තිබෙන්නේ පොදු වාර්ගිකත්වයකින්, පොදු ආගමකින්, පොදු වාසස්ථානයකින්, පොදු භාෂාවකින්, පොදු ඓතිහාසික සම්ප්‍රදායන්ගෙන්, පොදු ආශාවන්ගෙන්, පොදු පාලනයකින් සහ භූගෝලීය එක්සත්භාවයෙනි."

(ii) "එය භූමිය, ජනගහනය, ආණ්ඩුව සහ ස්වාධිපතිත්වය යන අත්‍යවශ්‍ය සාධක හතරෙන් සමන්විත වේ. එම සාධක හතර පවතින විට එහි පැවැත්ම සිදු වේ."

1. ජාතිය

2. රාජ්‍යය

5. පහත දැක්වෙන ප්‍රකාශ දෙකෙන් අවධාරණය කරන දේශපාලන දාර්ශනිකයින් **දෙදෙනා** පිළිවෙළින් නම් කරන්න.

(i) "දේශපාලන හා සමාජ චින්තන ඉතිහාසයේ ප්‍රථම විඥානවාදී දේශපාලන දාර්ශනිකයා."

(ii) "දේශපාලන හා සමාජ චින්තන ඉතිහාසයේ ප්‍රථම යථාර්ථවාදී දේශපාලන දාර්ශනිකයා."

1. ප්ලේටෝ

2. ඇරිස්ටෝටල්

6. පහත දැක්වෙන ප්‍රකාශ දෙකෙන් විස්තර කරන්නේ අන්තර්සම්බන්ධතාවන් සහිත විෂය **දෙකක** විෂය කරුණු වේ. ඒවා හඳුනාගෙන පිළිවෙළින් නම් කරන්න.

(i) "එය දේශපාලන විද්‍යාවේ විෂයීගත කරුණක් වේ. එය සම්පාදනය කරන්නේ සහ බලාත්මක කරන්නේ රාජ්‍ය විසිනි. එය කඩකිරීම වරදක් වන අතර දඬුවමට යටත් විය හැක. එය විශ්වීය වන අතර සියලු ම දෙනා කෙරෙහි යෙදවේ. එය පැහැදිලි මෙන්ම නිශ්චිත වේ. එය සැලකිලිමත් වන්නේ මිනිසාගේ බාහිර ක්‍රියාවන් ගැන පමණි."

(ii) "එය සදාචාර විද්‍යාවේ විෂයීගත කරුණක් වේ. එය ක්‍රියාවට නැංවෙන්නේ මිනිසුන්ගේ හෘදය සාක්ෂිය මගින් වන නිසා එය තීරණය වන්නේ ද මිනිසුන්ගේ හෘදය සාක්ෂිය මගිනි. එමගින් මිනිසුන්ගේ සිතුම් පැතුම් මෙන් ම ක්‍රියාවන් ද අන්තර්ගත සමස්ත ජීවිතය ම නිරූපණය වේ. එමගින් ජීවිතයේ අභ්‍යන්තර මෙන් ම බාහිර ක්‍රියාවන් ද නිරූපණය වේ. එය කඩ කිරීම නීතිමය වරදක් නොවන බැවින් භෞතික දඬුවමකට යටත් වීමක් ද සිදු නොවේ."

1. නීතිය

2. සදාචාරය

7. පහත දැක්වෙන අර්ථකථන දෙකෙන් නිරූපණය වන ආණ්ඩුක්‍රම **දෙක** පිළිවෙළින් දක්වන්න.

(i) "එය පාලන ක්‍රමයක් ලෙස අර්ථකථනය කර ඇති අතර, එම ක්‍රමය තුළ රාජ්‍යයේ කැමැත්ත ජනතාවගේ ඍජු සහභාගිත්වය හරහා ප්‍රකාශ වේ."

(ii) "එය ආණ්ඩුක්‍රමයක් වන අතර, එය පැන නගින්නේ නීතිමය සර්වාධිපති වන ඡන්දදායකයින් ඍජුවම ආණ්ඩුක්‍රම යාන්ත්‍රණයේ නායකත්වය ගෙන ක්‍රියා කරනවා වෙනුවට තමන් නියෝජනය කරමින් තමන් වෙනුවෙන් ක්‍රියා කිරීමට ධාරිතාව සහිත ආණ්ඩුකරණ ආයතනයක් හෝ ආයතන පිහිටුවීම සමඟ ය."

1. ඍජු ප්‍රජාතන්ත්‍රවාදය ..............................

2. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ..............................

8. පහතින් දක්වා ඇත්තේ ආණ්ඩුවේ කාර්ය ක්‍රියාවට නැංවීම සහ රාජ්‍ය බලයේ ස්වභාවය පිළිබඳ ව දේශපාලන න්‍යායන් දෙකක් මගින් ඉදිරිපත් කර ඇති අර්ථකථනයන් ය. එම න්‍යාය **දෙක** හඳුනාගෙන ඒවා පිළිවෙළින් නම් කරන්න.

(i) "මෙම න්‍යායය මගින් දැක්වෙන්නේ ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණ යන ආණ්ඩුවේ කාර්යයන් තුන එකිනෙකට වෙනස් පුද්ගලයින්ගේ සමන්විත ආයතන තුනක් මගින් ක්‍රියාවට නැංවිය යුතු බවත්, ඒ ඒ ආයතනයට පැවරී ඇති විෂය පථයට පමණක් ඒ ඒ ආයතනයේ කාර්ය සීමාවිය යුතු බවත්, ඒ ඒ ආයතනය තම විෂය ක්ෂේත්‍රය තුළ නිදහස් හා උත්තරීතර විය යුතු බවත්ය."

(ii) "එය නීතියෙන් සීමා නොවුන පුරවැසියන් හා යටත්වැසියන් කෙරෙහි යෙදවිය හැකි රාජ්‍යයේ උත්තරීතර බලය වේ. එය ඒකීය, අසහාය, උත්තරීතර, බෙදිය නොහැකි, පැවරිය නොහැකි සහ ස්ථාවර දෙයක් වේ. එය අවසාන අධිකාරී බලය වන අතර අභ්‍යන්තර හා බාහිර වශයෙන් දෙයාකාර වේ."

1. බලතල බෙදීම ..............................

2. ස්වාධිපති න්‍යාය ..............................

9. පහතින් දක්වා ඇත්තේ එකිනෙකට වෙනස් ආණ්ඩුක්‍රම දෙකක විධායක - ව්‍යවස්ථාදායක සම්බන්ධතාවන්හි ස්වරූපය යි. එම ආණ්ඩුක්‍රම **දෙක** හඳුනාගෙන ඒවා පිළිවෙළින් නම් කරන්න.

(i) "විධායකය හා ව්‍යවස්ථාදායකය වෙන් වෙන් ව තෝරා පත් කරන අතර, ඒවාට ව්‍යවස්ථාව මගින්ම ස්වාධීන කාර්ය ක්ෂේත්‍රයක් පවරා ඇත. විධායක හා ව්‍යවස්ථාදායක අංශයන් හි පුද්ගලයින් නිල වශයෙන් වෙන් කර ඇත. විධායකය ව්‍යවස්ථානුකූලව ව්‍යවස්ථාදායකයට වගකීමට බැඳී නැති අතර අති විශේෂ ක්‍රියාදාමයක් වූ දෝෂාභියෝගයකින් තොරව විධායකය තනතුරින් ඉවත් කළ නොහැක."

(ii) "විධායකය නාමික හා සත්‍ය යනුවෙන් කොටස් දෙකකින් යුක්ත වන අතර සත්‍ය විධායකය සමන්විත වන්නේ ව්‍යවස්ථාදායකය නියෝජනය කරන දේශපාලන පක්ෂවල ශක්තිය මත ඒවායින් තෝරාගත් පුද්ගලයින්ගෙනි. එබැවින් වෙනම තේරී පත් වූ විධායකයක් නොමැත. සත්‍ය විධායකය, ව්‍යවස්ථාදායකයෙන් තෝරාපත් කර ගැනීම හේතුවෙන් එය ව්‍යවස්ථාදායකයට වගකීමට බැඳී සිටී. මේ අනුව විධායකය - ව්‍යවස්ථාදායකයේ විශ්වාසය මත රඳා පවතින අතර එම විශ්වාසය නැති වී ගිය විට විධායකය නිලයෙන් ඉවත් කළ හැක."

1. ජනාධිපති ආණ්ඩුක්‍රමය ..............................

2. පාර්ලිමේන්තු/ කැබිනට් ආණ්ඩුක්‍රමය ..............................

10. පහතින් දක්වා ඇත්තේ සෘජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාවට නැංවීම සඳහා භාවිතයට ගැනෙන විධික්‍රම **දෙකකි**. ඒවා පිළිවෙළින් නම් කරන්න.

(i) "පනත් කෙටුම්පත් නීති ලෙස බලාත්මක කිරීමට ප්‍රථමයෙන් ජනතාවගේ තීන්දුව ලබා ගැනීම සඳහා භාවිතයට ගැනෙන ජනතා මතය විමසීමේ උපකරණයක් වේ. ඒ අනුව ව්‍යවස්ථාදායකය සම්මත කරන පනත්, නීති බවට පත්වන්නේ ඡන්දදායකයින්ගෙන් බහුතරය අනුමත කරන්නේ නම් පමණි."

(ii) "තේරී පත්වුන නියෝජිතයකු තමන්ට දී ඇති ජනවරම කඩකළ විටක එම නියෝජිතයා තනතුරින් ඉවත් කිරීමට යොදා ගැනෙන තවත් උපකරණයක් වේ. මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන පෙත්සමක් සඳහා ඡන්ද කොට්ඨාශයේ ඡන්දදායකයින්ගෙන් බහුතරය අනුමත කරන්නේ නම් නියෝජිතයා තනතුරින් ඉවත් කළ හැක."

1. ජනමත විචාරණය
2. නැවත කැඳවීම

11. (i) ලංකාව එක්සත් රාජ්‍යයක් බවට පත් කළේ කුමන ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය මගින් ද?

(ii) ශ්‍රී ලංකාව ඒකීය රාජ්‍යයක් ලෙස ප්‍රථම වරට ප්‍රකාශයට පත් කලේ කුමන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ද?

1. 1833 කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ
2. 1972 පළමුවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

12. (i) නිදහසට පෙර ලංකාවට බ්‍රිතාන්‍ය යටත් විජිත පාලකයින් විසින් හඳුන්වා දුන් අවසාන ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය කුමක් ද?

(ii) එම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය මගින් ලංකාවට හඳුන්වා දුන් ආණ්ඩුක්‍රමය කුමක් ද?

1. 1947 - සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
2. පාර්ලිමේන්තු/ කැබිනට් ආණ්ඩුක්‍රමය

13. (i) සෝල්බරි ව්‍යවස්ථාව යටතේ සෙනෙට් මණ්ඩලයට වෙන් කළ යුතු යැයි සැලකුණු අවම අමාත්‍ය ධූර සංඛ්‍යාව කොපමණ ද?

(ii) සෝල්බරි ව්‍යවස්ථාවෙන් සෙනෙට් මණ්ඩලයට දිය යුතු යැයි නියම කළ අනිවාර්ය ඇමති ධූරය කුමක් ද?

1. 02 යි
2. 01 යි. අධිකරණ ඇමති ධූරය

14. නාමික විධායක තනතුර පවත්වාගෙන ගිය නිදහස් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා **දෙක** නම් කරන්න.

1. 1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
2. 1972 පළමුවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

15. (i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු පිළිබඳ ව ක්‍රියා කිරීම සඳහා පූර්ව අධිකරණ විවරණ බලය සහිත වෙනම අධිකරණයක් ස්ථාපිත කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නම් කරන්න.

(ii) පූර්ව අධිකරණ විවරණ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට පවරා දුන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නම් කරන්න.

1. 1972 පළමුවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

2. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

16. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ ;

(i) ජනාධිපතිගේ නිල කාලය සහ

(ii) එක් පුද්ගලයකුට එම නිලය දැරිය හැකි වාර ගණන සම්බන්ධයෙන් ඇති කළ වෙනස්කම් මොනවා ද?

1. අවුරුදු 05

2. වාර 02 යි

17. (i) 19 වන ව්‍යවස්ථා සංශෝධනයට අනුව පාර්ලිමේන්තුවේ නිල කාලය පිළිබඳව ඇති කළ වෙනස කුමක් ද?

(ii) පාර්ලිමේන්තුව විසුරුවා හැරීම සම්බන්ධයෙන් 19 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් දැමූ සීමාව කුමක් ද?

1. 06 සිට 05 දක්වා අඩු කිරීම

2. අලුතින් තෝරා ගත් පාර්ලිමේන්තුවක් වසර හතරහමාරක් ගතවන තෙක් විසුරුවා හැරීමට ජනාධිපතිට බලය නොමැත.

18. (i) 1978 ව්‍යවස්ථාව මගින් මූලික අයිතිවාසිකම් කඩකිරීම පිළිබඳ කරුණු විනිශ්චය කිරීම සඳහා අධිකරණ බලය පවරා ඇති අධිකරණය කුමක් ද?

(ii) 1978 ව්‍යවස්ථාව මගින් රිට් ආඥා නිකුත් කිරීමේ අධිකරණ බලය පවරා ඇති අධිකරණය කුමක් ද?

1. ශ්‍රේෂ්ඨාධිකරණය

2. අභියාචනාධිකරණය

19. (i) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධාන ආයතන ගණන සඳහන් කරන්න.

(ii) සියලු ම ආකාර මානව හිමිකම් හා සම්බන්ධ කරුණු පිළිබඳව ක්‍රියා කරන, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආයතනය නම් කරන්න.

1. 06

2. අන්තර්ජාතික මානව හිමිකම් කොමිෂන් සභාව

20. (i) කලාපීය සහයෝගීතාව සඳහා වූ දකුණු ආසියාතික සංවිධානයේ (SAARC) සාමාජිකත්වය ලබාගත් අවසාන රාජ්‍යය නම් කරන්න.

(ii) කලාපීය සහයෝගීතාව සඳහා වූ දකුණු ආසියාතික සංවිධානයේ තීරණ ගැනීමේ ඉහළම ආයතනය නම් කරන්න.

1. ඇෆ්ගනිස්ථානය ..........................................................................................

2. රාජ්‍ය නායක සමුළුව ..................................................................................

**A කොටසට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




A කොටස අනිවාර්ය වුවත් ඊට පිළිතුරු සපයා ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 99%ක් පමණි. මෙම කොටසට ව්‍යුහගත කෙටි ප්‍රශ්න 20ක් ඇති අතර ඒ සඳහා ලකුණු 20ක් හිමි වේ.
ඉන් ලකුණු 00 - 5 ප්‍රාන්තරයේ 24%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 40%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 31%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 5%ක් ද
ලබාගෙන ඇත. මෙම ප්‍රශ්න සඳහා ලකුණු 11 හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 31%ක් වන අතර ලකුණු 10ක් හෝ ඊට අඩුවෙන් ලබාගත් පිරිස 40%කි. එමෙන්ම අයදුම්කරුවන්ගෙන් 24%ක්ම ලබා ගෙන ඇත්තේ ලකුණු 5 හෝ ඊට අඩුවෙනි.




A කොටසට ප්‍රශ්න 20ක් ඇති අතර ඉන් ප්‍රශ්න 13ක පහසුතාව 50% හෝ ඊට වඩා වැඩිය. 16 (i) ප්‍රශ්නය පහසුතාව වැඩිම ප්‍රශ්නය වන අතර එහි පහසුතාව 80%කි. එසේම පහසුතාව අඩුම ප්‍රශ්නය 4(i) වේ. එහි පහසුතාව 9%කි.

**A කොටසට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්‍ෂණ, නිගමන හා යෝජනා :**

දෙවන ප්‍රශ්න පත්‍රයේ A කොටසේ ප්‍රශ්න 20 අතරින් ප්‍රශ්න අංක 4හි I කොටස සඳහා ඇති පිළිතුරෙහි පහසුතාව පමණක් 10%ට අඩු වී ඇත. පහසුතාව 40%ට අඩු වන්නේ 1, 4 (i), 5, 7, 10 (ii), 11 (i), 13, 17 (ii), 19 (ii), 20 පිළිතුරු සඳහා ය.

පළමුවන ප්‍රශ්නයෙන් අපේක්ෂිත පිළිතුරු වන්නේ දේශපාලන ක්‍රම දෙකක රාජ්‍යය හා පුරවැසියා අතර ඇති සබඳතාවේ ස්වරූපය ඇසුරින් එම දේශපාලන ක්‍රම දෙක හඳුනා ගැනීමයි. එම පිළිතුර සඳහා පහසුතාවය 30%ට අඩු වේ. එයින් පැහැදිලි වන්නේ විවිධ දේශපාලන ක්‍රමයන් හි රාජ්‍යය හා පුරවැසියන් අතර පවතින දේශපාලන, ආර්ථික, සමාජීය, සංස්කෘතික සහ බුද්ධිමය ජීවිත යන සාධකවල ක්‍රියාකාරිත්වය පිළිබඳ ප්‍රමාණවත් වැටහීමක් නොමැති බවයි. මේ තත්ත්වය වළකා ගැනීමට ගත හැකි එක් පියවරක් වන්නේ එක් එක් දේශපාලන ක්‍රමයන්හි රාජ්‍යය හා පුරවැසියන් අතර සම්බන්ධතාවයේ ස්වරූපය හා අන්තර්ගත ලක්ෂණයන් වෙන වෙනම වගු ගත කිරීම හා ඒවා එකිනෙක සැසඳීම යි.

ප්‍රශ්න පත්‍රයේ පහසුතාව ඉතාම අවම මට්ටමක පැවතියේ 4 (i) ප්‍රශ්නය සඳහා ය. එය 10%ට වඩා අඩු ය. එහි 4 (ii) කොටසේ වූ පහසුතාව 70%ක්ද ඉක්මවා ඇත. එයින් පැහැදිලි වන්නේ සමාජ සංවිධාන පිළිබඳ දැනුම සහ අවබෝධය ප්‍රමාණවත් නොවන බව හා දේශපාලන සංවිධානය වන "රාජ්‍යය" පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් අපේක්ෂකයන් තුළ පැවති බවයි. 4 (i) ප්‍රශ්නයට ඉතා අවම පහසුතාවක් ලැබීමෙන් පැහැදිලි වූයේ විභාග අපේක්ෂකයන් තුළ "ජාතිය" පිළිබඳව පවතින අනවබෝධය යි. මෙය මග හරවා ගත හැක්කේ "ජාතිය" නම් වූ දේශපාලන සංකල්පය විධිමත්ව සාකච්ඡාවට භාජනය කිරීම මගිනි.

දේශපාලන දාර්ශනිකයන්ගේ දර්ශනයන් හි ස්වභාවයන් පිළිබඳ දැනුම පරීක්ෂා කිරීමේ අභිලාෂයෙන් ඉදිරිපත් කර ඇති 5 ප්‍රශ්නයේ කොටස් දෙක සඳහාම වූ පහසුතාව 30%ට අඩු විය. එයින් පැහැදිලි වන්නේ දේශපාලන චින්තකයින්, දේශපාලන දර්ශන, චින්තන න්‍යාය හා මතවාද පිළිබඳව නිශ්චිත දැනුම හා අවබෝධය නොමැති බවයි. මෙම තත්ත්වය වළකා ගැනීම සඳහා ගතහැකි මූලික පියවරක් වන්නේ දේශපාලන දර්ශනයන් පිළිබඳ පොත පත පරිශීලනය කිරීමයි.

ප්‍රජාතන්ත්‍රවාදයේ ස්වරූපයන් දෙක පිළිබඳ දැනුම හා අවබෝධය මැනීමේ ප්‍රශ්නයක් වූ 7 ප්‍රශ්නය සඳහා වූ පහසුතාව ද 30%- 40% අතර විය. පන්ති කාමරය තුළ විවිධ දේශපාලන දර්ශන පිළිබඳ ඉගෙනුම් - ඉගැන්වීම් කාර්යයන් සිදු වුවද, විෂය නිර්දේශයේ "ප්‍රජාතන්ත්‍රවාදය" යනුවෙන් නිශ්චිත මාතෘකාවක් දක්වා නොමැති හෙයින් ඒ පිළිබඳව නිශ්චිත සාකච්ඡාවක් සිදු නොවීම මෙම තත්ත්වයට හේතු වී ඇතැයි සැළකිය හැකිය. එබැවින් "ප්‍රජාතන්ත්‍රවාදය" පිළිබඳව පන්ති කාමරය තුළ නිශ්චිතව සාකච්ඡා කිරීම මගින් මෙම තත්ත්වය වෙනස් කරගත හැකි වනු ඇත.

සෝල්බරි ආණ්ඩුක්‍රමයේ සෙනෙට් සභාව සහ කැබිනට් මණ්ඩලය පිළිබඳ දැනුම හා අවබෝධය පිරික්සීමේ ප්‍රශ්නයක් වන 13 ප්‍රශ්නය සඳහා වන පහසුතාව ද 30%ට අඩු වීමෙන් පැහැදිලි වන්නේ ඒ පිළිබඳ දැනුම හා අවබෝධය ප්‍රමාණවත් නැති බවයි. සෝල්බරි ව්‍යවස්ථාව යටතේ පිහිට වූ ආණ්ඩුකරණ ආයතන හා ඒවායේ ව්‍යුහය, සංයුතිය, එම ආයතනයන්ට පත් කිරීමේ ස්වරූපය ආදිය පිළිබඳව දැනුම, අවබෝධය හා භාවිතය පිළිබඳව පන්ති කාමරය තුළ ක්‍රියාකාරකම් සංවිධානය කිරීමෙන් මෙම තත්ත්වය වළකා ගත හැක.

දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනය ඇසුරින් 17 ප්‍රශ්නය සකසා ඇත. එහි පහසුතාව පහළ මට්ටමක පැවතීමට මූලික හේතුව වී ඇත්තේ එම සංශෝධනය පිළිබඳ ලියවුන පොතපත නොමැති වීම යි. ඒ පිළිබඳව ඇති එකම ලේඛනය වන "19 වන ව්‍යවස්ථා සංශෝධනය" පවා දුර්ලභ ය. මෙම තත්ත්වය වැළැක්වීමට ගතහැකි මූලික පියවර දෙකකි. එනම් "19 වන ව්‍යවස්ථා සංශෝධනය" පිළිබඳ වැඩමුළු පැවැත්වීමත්, එම සංශෝධනයේ පිටපත් පාසල් පුස්තකාලවලට සැපයීමත් ය.

ප්‍රශ්න අංක 19 (ii), 20 සකසා තිබුනේ "ගෝලීය කලාපීය දේශපාලනය තුළ ශ්‍රී ලංකාව" යන මාතෘකාව ඇසුරිනි. දේශපාලන විද්‍යාව විෂය නිර්දේශයේ අවසාන මාතෘකාව මෙය වන හෙයින් පන්ති කාමරය තුළ වැඩි අවධානයක් නොමැති වීම හා ඒ පිළිබඳව ලියවුනු පොත පත නොමැති වීම නිසා පහසුතාව 40%ට අඩු වී තිබේ. මේ නිසා ඒ පිළිබඳ පාසල් විභාග අපේක්ෂකයින්ගේ අවධානය යොමු කිරීම පිණිස මෙම මාතෘකාව අදාල කරගෙන 12 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන අවධියේම ඔවුන් අතර ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන් දියත් කිරීම සුදුසුය. ඊට අමතරව ජාත්‍යන්තර දේශපාලනය හා ආයතන පිළිබඳ කාලීන සංවාද හා සාකච්ඡා පිළිබඳවත් සන්නිවේදන මාධ්‍යයන්හි ප්‍රචාරණය වන දිනපතා ප්‍රවෘත්ති වැඩසටහන් පිළිබඳවත් අවධානය යොමු කිරීම සුදුසුය.

## B කොටස

### 1 ප්‍රශ්නය

1. දේශපාලන විද්‍යාව ස්වභාවික විද්‍යාවකට වඩා සමාජ විද්‍යාවක් ලෙස සැලකේ. ඔබ එකග වන්නේද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

**අරමුණ : දේශපාලන විද්‍යාවේ ස්වභාවය පිළිබඳව අපේක්ෂකයන්ගේ අවබෝධය පරීක්ෂා කර බැලීම**

**පිළිතුරෙහි අන්තර්ගත විය යුතු වැදගත් කරුණු**

(1) ස්වාභාවික විද්‍යාවන් හා සමාජ විද්‍යාවන්ගේ ස්වභාවය පිළිබඳව කරුණු දැක්වීම **(ලකුණු 05)**
(2) ස්වාභාවික විද්‍යාවන් හා සමාජ විද්‍යාවන් අධ්‍යයනය කිරීම සඳහා යොදා ගත හැකි ප්‍රවේශ මොනවාද යන්න **(ලකුණු 05)**
(3) මේ පදනම මත කරන ලද සංසන්දනයකින් පසුව දේශපාලන විද්‍යාව පිළිබඳව එළඹිය හැකි නිගමන **(ලකුණු 05)**
(4) නිගමනය : දේශපාලන විද්‍යාව සමාජ විද්‍යාවක් වන බව **(ලකුණු 05)**

**ආදර්ශ පිළිතුර (ආධාර කර ගැනීම හැර මේ මතම පිළිතුරු පරීක්ෂා කර බැලීම නොකරන්න)**

දේශපාලන විද්‍යාව ස්වභාවික විද්‍යාවක් ද නැතිනම් සමාජ විද්‍යාවක් ද යන ප්‍රශ්නය තවමත් විසඳී නැත. ස්වභාවික විද්‍යාවක් වනවාය යන අදහස දරන අය තර්ක කරන ආකාරයට ස්වභාවික විද්‍යාවන් හැදෑරීම සඳහා විද්‍යාත්මක විධි ක්‍රම යොදා ගත හැකි අතර ඒ අනුව විද්‍යාත්මක අවසන් නිගමනවලට පැමිණිය හැකිය. සමහරු තර්ක කරන ආකාරයට දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීම සඳහා ද විද්‍යාත්මක විධි ක්‍රම යොදා ගත හැකි ය. ඒ අනුව දේශපාලන විද්‍යාව ස්වභාවික විද්‍යාවක් ලෙස සැලකීම නිවැරදි වන බව ඔවුන් තවදුරටත් තර්ක කරන ආකාරය දැකිය හැක. මේ පදනම මත දේශපාලන විද්‍යාව ස්වභාවික විද්‍යාවක් ලෙස සැලකිය හැකි බව ඔවුන් තවදුරටත් තර්ක කරනු ලැබේ. මේ අදහස පිළිනොගන්නා අයගේ මතය වන්නේ දේශපාලන විද්‍යාව විද්‍යාත්මකව හැදෑරිය නොහැකි බවත් සහ ඒ නිසා ම එය ස්වභාවික විද්‍යාවක් ලෙස පිළිගත නොහැකි බවත් ය.

මේ ප්‍රශ්නය නිරාකරණය කර ගැනීම සඳහා ප්‍රථමයෙන් කළ යුත්තේ දේශපාලන විද්‍යාවේ විෂය අන්තර්ගතයේ ස්වභාවය සලකා බැලීම ය. දෙවනුව එම විෂය අන්තර්ගතය විද්‍යාත්මකව අධ්‍යයනය කිරීමට හැකිද යන්න සොයා බැලීම ය. දේශපාලන විද්‍යාවේ විෂය අන්තර්ගතය ගොඩ නැගී තිබෙන්නේ මිනිසා, රාජ්‍ය සහ ආණ්ඩුව යන විචල්‍යයන් තුන පදනම් කරගෙන ය. වෙනත් ආකාරයකට කියනවා නම් මිනිසා, රාජ්‍ය සහ ආණ්ඩුව යන විචල්‍යයන් තුන ක්‍රියාත්මක වන්නේ කෙසේද? එම විචල්‍යයන් තුන අතර ගොඩ නැගී ඇති අන්තර් සම්බන්ධතා ජාලාවේ ස්වරූපය කුමක්ද? එම අන්තර් සම්බන්ධතා අනුව ක්‍රියාත්මක වීමේ දී එම විචල්‍යයන් එකිනෙකට කරන බලපෑම් සහ ප්‍රතිචාර මොනවා ද? සහ මෙම ක්‍රියාදාමය හරහා දේශපාලන ක්‍රම ඉදිරියට ගමන් කරන්නේ කෙසේද? යන කරුණු අධ්‍යයනය

කිරීම මත දේශපාලන විද්‍යාව ගොඩ නැගී තිබෙන බව ය. වඩාත්ම සරල ආකාරයකට කියනවා නම් දේශපාලන විද්‍යාවේ විෂය අන්තර්ගතය ගොඩනැගී තිබෙන්නේ සමාජ ජීවියෙකු වූ මිනිසා දේශපාලන ජීවියෙකු බවට පත්වූයේ කෙසේද? ඒ කෙරෙහි බලපෑ හේතු සාධක මොනවා ද? මිනිසුන්ගේ දේශපාලන අරමුණු මොනවා ද? එම අරමුණු ඉටු කරගැනීම සඳහා මිනිසුන් ගොඩ නගා ඇති දේශපාලන සංවිධාන මොනවා ද? ඒවායේ ක්‍රියාකාරිත්වය මගින් මිනිසාගේ භෞතික ජීවිතයට වන බලපෑම් මොනවා ද? සහ එම බලපෑම්වලට මිනිසා දක්වන ප්‍රතිචාර මගින් දේශපාලන ආයතනවල ක්‍රියාකාරිත්වයේ සිදුවන වෙනස්වීම් මොනවාද? යන කරුණු පදනම් කරගෙන ය.

මෙම විෂයීගත කරුණු සියල්ල ම පාහේ ගොඩ නැගී තිබෙන්නේ මිනිසාගේ දේශපාලන හැසිරීම සහ ක්‍රියාකාරකම් කෙරෙහි බලපාන සදාචාර මූලධර්ම, නීති මූලධර්ම, මානසික සාධක, ඓතිහාසික සාධක, පරිසර සාධක, ප්‍රත්‍යක්ෂමූලක සාධක, සිතා ගැනීම්, සමපේක්ෂණය කිරීම් සහ නිරීක්ෂණය කිරීම් යන කරුණු කාරණා රාශියක සම්මිශ්‍රණයෙනි. මෙවැනි පදනමක් මත ගොඩනැගී ඇති දේශපාලන විද්‍යාව විද්‍යාත්මකව අධ්‍යයනය කළ හැකි ද යන ප්‍රශ්නය මීළඟට මතු වේ. සමහරුන්ගේ මතය වන්නේ එය කළ නොහැකි බව ය. තවත් අයගේ අදහස වන්නේ එය විද්‍යාත්මකව අධ්‍යයනය කළ හැකි බව ය. මෙයින් පළමු මතය දරන අයගේ අදහස වන්නේ දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීම සඳහා භාවිතයට ගැනෙන මූලධර්මවල ඒකීයභාවයක් නොමැති වීම, හේතුඵලවාදය මත පිහිටා නිශ්චිත අනාවැකි කීමට නොහැකි වීම, අධ්‍යයනය කිරීම සඳහා පර්යේෂණාගාර විධික්‍රම යොදා ගැනීමට නොහැකි වීම සහ ස්වාභාවික විද්‍යාවන් තුළ මෙන් දේශපාලන විද්‍යාව තුළ ස්ථාවර නියතිවාද ගොඩ නැගීමට නොහැකි වීම යන හේතූන් නිසා දේශපාලන විද්‍යාව විද්‍යාත්මකව අධ්‍යයනය කළ නොහැකි බව ය. නමුත් මෙම මතය පිළිනොගන්නා අයගේ මතය වන්නේ විද්‍යාත්මක ශිල්පීය ක්‍රමය ලෙස අදහස් කරන්නේ යම් සංසිද්ධියක් විග්‍රහ කිරීම සඳහා සංසිද්ධිය ආශ්‍රිත දත්ත එකතු කිරීම, ඒවා පිළිවෙළකට පෙළගැස්වීම, වර්ග කිරීම, නිරීක්ෂණය කිරීම සහ විශ්ලේෂණය කිරීම යන ක්‍රියාදාමය පදනම් කරගෙන අවසාන නිගමනවලට එළඹීම නම් එම විධි ක්‍රමය පදනම් කොටගෙන දේශපාලන විද්‍යාව විද්‍යාත්මකව අධ්‍යයනය කළ හැකි බව ය.

මේ මත දෙකම තර්කානුකූලව නිවැරදි වේ. නමුත් ප්‍රශ්නය වන්නේ විද්‍යාත්මක විධික්‍රම භාවිත කරමින් ස්වාභාවික විද්‍යාවන් අධ්‍යයනය කොට අවසානයේ දී ගොඩ නගන ස්ථාවර නියතිවාදවලට සමාන නියතිවාද එම විධික්‍රම භාවිත කරමින් දේශපාලන විද්‍යාව වැනි සමාජ විද්‍යාවක් අධ්‍යයනය කරමින් ගොඩ නැගිය හැකිද යන්න ය. දේශපාලන විද්‍යාවේ පදනම වන්නේ මිනිසුන්ගේ දේශපාලන හැසිරීම සහ දේශපාලන ක්‍රියාකාරකම් ය. මේ හා සම්බන්ධව දැකිය හැකි විශේෂ ලක්ෂණය වන්නේ එම ගුණාංග අතිශයින්ම අවිනිශ්චිත, අස්ථාවර සහ ඒකීයභාවයකින් තොර දේවල් වන බව ය. මෙවැනි මූලධාතු පදනම් කරගත් දේශපාලන විද්‍යාව කුමන විධික්‍රමයක් භාවිතා කරමින් අධ්‍යයනය කළද අවසානයේ දී එළඹිය හැක්කේ සාමාන්‍යකරණය කළ අවසාන නිගමනවලට විනා ස්ථාවර නියතිවාදවලට නොවේ. අවසාන නිගමන හා ස්ථාවර නියතිවාද වූ කලී මුළුමනින්ම එකිනෙකට වෙනස් ප්‍රපංච දෙකක් වේ. ස්ථාවර නියතිවාද ගොඩ නගන්නේ හේතුඵලවාදය මතය. සාමාන්‍යකරණය කරන ලද අවසාන නිගමන ගොඩ නගන්නේ සමාන මෙන්ම අසමාන තත්ත්වයන්ද එකට ගෙන විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව ය. ස්ථාවර නියතිවාද පොදු වුවද සාමාන්‍යකරණය කරන ලද අවසාන නිගමන පාර්ශ්වීය වේ.

මෙයින් පෙනී යන්නේ මිනිසා පදනම් කරගෙන ගොඩනැගී ඇති දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීම සඳහා විද්‍යාත්මක විධි ක්‍රම යොදා ගැනීමේ හැකියාව අතිශයින් ම සීමිත වන බව ය. යොදා ගත්ත ද ස්ථාවර නියතිවාදවලට එළඹිය නොහැකි බව ය. මිනිසා පදනම් කරගෙන ගොඩනැගී ඇති සමාජ විද්‍යාව, ආර්ථික විද්‍යාව, දර්ශනය, නීතිය, ඉතිහාසය, ආචාර විද්‍යාව වැනි සෑම විෂයයක් ආශ්‍රිතව ම දැකිය හැක්කේ මෙවැනි තත්ත්වයක් ය. මෙයින් එළඹිය හැකි අවසාන නිගමනය වන්නේ දේශපාලන විද්‍යාව සැලකිය හැක්කේ ස්වාභාවික විද්‍යාවකට වඩා සමාජ විද්‍යාවක් ලෙස බව ය.

1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා ෘ




B කොටසේ පළමුවන ප්‍රශ්නය 56% ක් පමණක් තෝරාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20 ක් හිමි වේ.
ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 37%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 27%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 25%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 11%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 16 හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 11%ක් වන අතර ලකුණු 05 හෝ ඊට අඩුවෙන් ලබාගත් පිරිස 37% කි. එමෙන්ම අයදුම්කරුවන්ගෙන් 52%ක් ම 06 - 15 අතර ලකුණු ලබා ගෙන ඇත.




මෙම ප්‍රශ්නයට එක් කොටසක් ඇති අතර එහි පහසුතාව 39% බැගින් වේ.

දේශපාලන විද්‍යාව II ප්‍රශ්න පත්‍රයේ B කොටසේ 1 ප්‍රශ්නයේ පහසුතාව 39%කි. මෙය ලකුණු 20ක් හිමි තනි ප්‍රශ්නයකි. එයින් ලකුණු 16 - 20 අතර ප්‍රමාණයක් ලබා ගත් අපේක්ෂකයින් ප්‍රමාණය 11%ක් වූ අතර ලකුණු 10ට වැඩියෙන් ලබා ගත් අපේක්ෂකයින් ප්‍රමාණය 36%ක් විය.

මෙම ප්‍රශ්නයේ අරමුණ දේශපාලන විද්‍යාවේ ස්වභාවය පිළිබඳව විභාග අපේක්ෂකයින්ගේ දැනුම හා අවබෝධය මැනීමය. “දේශපාලන විද්‍යාව ස්වභාවික විද්‍යාවක් නොව සමාජ විද්‍යාවක් වන්නේ ය.” යන මතය පිළිබඳව විභාග අපේක්ෂකයින්ගේ දැනුම, අවබෝධය සහ ඔවුන් පෞද්ගලිකව ඒ පිළිබඳ දරන මතය පරීක්ෂා කර බැලීම ය. ඒ අනුව දේශපාලන විද්‍යාව ස්වභාවික විද්‍යාවක් නොවන්නේ ඇයි? සමාජ විද්‍යාවක් වන්නේ කෙසේද? යන බව විභාග අපේක්ෂකයින් විසින් පැහැදිලි කරනු ඇතැයි අපේක්ෂා කෙරිණි.

දේශපාලන විද්‍යාව විෂය නිර්දේශයේ පළමුවන මාතෘකාව වන මෙයට අදාළව නිරන්තරයෙන් ම “දේශපාලන විද්‍යාවේ ස්වභාවය” අදාල කර ගනිමින් ප්‍රශ්න ඉදිරිපත් කර තිබිණ. විභාග අපේක්ෂකයින්ගෙන් 50%කටත් වැඩි පිරිසක් ප්‍රශ්නයට හිමි මුළු ලකුණු සංඛ්‍යාවෙන් 50%කට වඩා හිමි කර ගැනීම සඳහා මෙම තත්ත්වය හේතු පාදක වී තිබේ. සාධන මට්ටම අඩුවීම වැළැක්වීම සඳහා ගත හැකි එක් පියවරක් වන්නේ දේශපාලන විද්‍යාවේ ස්වභාවය ආශ්‍රයෙන් ඉදිරිපත් කළ හැකි විවිධ ප්‍රශ්න සකසා පන්ති කාමරය තුළදී නිශ්චිත කාලයක් තුළ පිළිතුරු සැපයීමට විභාග අපේක්ෂකයින් පුහුණු කිරීම ය.

## 2 ප්‍රශ්නය

2. පහත දැක්වෙන දෙකක් ගැන අදහස් දක්වන්න.

(i) ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කාර්යභාරය
(ii) නූතන ආණ්ඩුක්‍රම තුළ විධායකයේ කාර්යභාරය
(iii) නූතන ආණ්ඩුක්‍රම තුළ ව්‍යවස්ථාදායකයේ කාර්යභාරය
(iv) ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමය තුළ අධිකරණයේ කාර්යභාරය

**(i) ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කාර්යභාරය**

**අරමුණ : ප්‍රජාතන්ත්‍රවාදය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අතර පවතින සම්බන්ධතාවයේ ස්වරූපය පිළිබඳව අපේක්ෂකයන්ගේ දැනුම පරීක්ෂා කර බැලීම**

**පිළිතුරෙහි අන්තර්ගත විය යුතු වැදගත් කරුණු**

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? **(ලකුණු 01)**
(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක කාර්යභාරය කුමක්ද? **(ලකුණු 08)**
(අදාළ කරුණු අනුව ලකුණු බෙදා වෙන් කිරීමට පරීක්ෂකවරයා වගබලාගත යුතුය)

**(ඇ) නිගමනය : ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ ප්‍රජාතන්ත්‍රවාදය එකිනෙකින් වෙන් කළ නොහැකි එකම කාසියක දෙපැත්ත හා සමාන බව (ලකුණු 01)**

දේශපාලන ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදී එකක් වන්නේ නම් එහි අත්‍යවශ්‍යම කොන්දේසියක් වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් තිබීම ය. ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයක් තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සලකනු ලබන්නේ රටේ උත්තරීතර නීතිය ලෙස ය. එමගිනුයි, පාලන තන්ත්‍රයේ ව්‍යුහයන්, ඒවාට පැවරී ඇති කාර්යයන්, ඒවායේ බලතල, ඒවාට ඇති සීමාවන් රාජ්‍ය සහ මහජනතාව අතර පවත්නා සම්බන්ධතාවයේ ස්වරූපය, ජනතාව භුක්ති විඳින අයිතිවාසිකම්වල ස්වරූපය යනාදිය පෙන්වා දෙන්නේ. මේ අනුව පෙනී යනවා ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයක් තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අතිශය වැදගත් කාර්යභාරයක් ඉටු කරන බව. ඒවා පහත සඳහන් ආකාරයට දැක්විය හැක.

**(1) ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයට පදනම සැපයීම**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ආණ්ඩුකරණයට ප්‍රජාතන්ත්‍රවාදී පදනම සපයනු ලැබේ. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ මූලික ලක්ෂණයක් වනුයේ ජනතා කැමැත්ත අනුව පාලකයින් කලින් කලට වෙනස් වීම ය. ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයක් තුළ මෙම වෙනස් කිරීමේ ක්‍රියාදාමය කුමක් ද යන්න පෙන්වා දෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගිනි. එමෙන්ම රාජ්‍ය පාලන බලතල ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම අනුව ක්‍රියාවට නංවන්නේ කෙසේද යන්න ද ව්‍යවස්ථාව මගින් පෙන්වා දෙයි.

**(2) රටේ මූලික නීතිය ලෙස ක්‍රියාත්මක වීම**

රටක උත්තරීතර හා මූලික නීතිය ලෙස සලකන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතියයි. සෑම නීතියකම මූලාශ්‍රය ලෙස සලකන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය යි. නීතියේ ආධිපතිත්වය පිළිබඳ සංකල්පය ගොඩ නැඟී තිබෙන්නේ මෙම පදනම මත ය.

**(3) රාජ්‍යයේ ස්වභාවය පෙන්නුම් කිරීම**

රාජ්‍යයේ දේශපාලන, ආර්ථික හා සමාජ මුහුණුවර කුමක් ද යන්න නිරූපණය කිරීම මෙයින් අදහස් වේ. නිදසුන් ලෙස ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් ද, නැතිනම් කොමියුනිස්ට් රාජ්‍යයක් ද, එසේත් නැතිනම් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් ද යන්න පෙන්නුම් කිරීම ය. ව්‍යවස්ථානුකූල දර්ශනය ලෙස සලකන්නේ මෙයයි.

**(4) දේශපාලන ක්‍රීඩාවේ නියමයන් පෙන්වා දීම**

ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයක් තුළ දේශපාලන ක්‍රීඩාවට අදාළ නියමයන් පෙන්වා දෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගිනි. ඡන්ද බලය හිමි වන්නේ කාටද? නියෝජිතයන් ලෙස ඉදිරිපත් විය හැක්කේ කාටද? තේරී පත්වන අයට හිමිවන බලතල මොනවාද? ඒ වෙනුවෙන් වග කියන්නේ කෙසේද? යනාදී නීතිරීති මෙයට අයත් වේ. මෙම නීතිරීතිවලින් තොරව කරන දේශපාලන ක්‍රීඩාව නියත ලෙසම හිතුවක්කාරී සහ අත්තනෝමතික පාලනයකට මගපාදනු ලැබේ.

**(5) ආණ්ඩුවේ ස්වභාවය පෙන්නුම් කිරීම**

ආණ්ඩුක්‍රමය ඒකීය ද?, නැතිනම් සන්ධීය ද?, රාජ්‍ය බලය ක්‍රියාවට නංවන්නේ කැබිනට් ආණ්ඩුක්‍රමයක් මගින් ද? නැතිනම් ජනාධිපති ආණ්ඩුක්‍රමයක් මගින් ද?, ආණ්ඩුවේ ව්‍යුහයන් සහ කාර්යයන් සංවිධානය කර තිබෙන්නේ කෙසේද? ඒවාට බලතල පවරා දී තිබෙන්නේ කුමන ආකාරයකට ද? ආයතන අතර සම්බන්ධතා ගොඩනගා තිබෙන්නේ කුමන ආකාරයකට ද? යන කරුණු පැහැදිලිව දැක්වීම ව්‍යවස්ථාවක තවත් මූලික කාර්යයක් වේ.

**(6) පුරවැසියන්ගේ අයිතිවාසිකම් හා නිදහස පෙන්වා දී ඒවා ආරක්ෂා කිරීම**

රාජ්‍ය විසින් පුරවැසියන්ට ප්‍රදානය කරන අයිතිවාසිකම් හා නිදහස මොනවා ද? ඒවා සුරක්ෂිතව භුක්ති විඳිය හැක්කේ කෙසේද? ඒ වෙනුවෙන් පුරවැසියන් ඉටුකළ යුතු යුතුකම් මොනවාද? පැහැදිලි ලෙස දක්වා තිබීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක තවත් කාර්යයක් වේ.

**(7) බහුවාර්ගික ජන සමාජයක ජාතිය ගොඩ නැංවීමේ කාර්යය**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක තවත් කාර්යයක් වේ. මේ සඳහා ව්‍යවස්ථාව මගින් ඒකීය දේශපාලන හා ආර්ථික දර්ශනයක් සපයනවාට අමතරව සමාන පුරවැසියන් - සමාන ඉඩ ප්‍රස්තාවන් යන සිද්ධාන්තය ද ක්‍රියාවට නැංවිය යුතුය. එමෙන් ම එක් ආගමකට හෝ එක් භාෂාවකට විශේෂීකරණය කිරීමෙන් වැළකී රාජ්‍ය අපක්ෂපාත බේරුම්කරුවකුගේ තත්ත්වයට පත්කළ යුතුය.

**(8) ආඥාදායක පාලනයකින් ජනතාව බේරා ගැනීම**

මෙය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් මගින් කෙරෙන ඉතාම වැදගත් කාර්යයකි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ඉහත දැක්වූ කාර්යය කරන විට ඒකාධිපතිත්වයක් ඇතිවීමේ ඉඩකඩ නිතැතින්ම ඇහිරේ.

**(ii)** නූතන ආණ්ඩුක්‍රම තුළ විධායකයේ කාර්යභාරය

අරමුණ : ආණ්ඩුකරණ ක්‍රියාදාමය තුළ විධායකය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? සහ එමගින් කරනු ලබන කාර්යභාරය පිළිබඳ අපේක්ෂකයින්ගේ දැනුම පරීක්ෂා කර බැලීම

**පිළිතුරෙහි අන්තර්ගත විය යුතු වැදගත් කරුණු**

(අ) විධායකය අර්ථකථනය කිරීම (ලකුණු **01**)
(ආ) විධායකයේ කාර්යයන් (ලකුණු **08**)
(ආදර්ශ පිළිතුරෙහි දක්වා ඇති කාර්යයන් ලකුණු ප්‍රදානය කිරීමේ දී සැලකිල්ලට ගන්න)

(ඇ) නිගමනය : විධායකය ආණ්ඩුකරණය තුළ අඛණ්ඩව ම බලවත් වෙමින් සහ ශක්තිමත් ලෙස ඉදිරියට ගමන් කරන බව (ලකුණු **01**)

නූතන ආණ්ඩුක්‍රම තුළ විධායකයේ කාර්යභාරය ගැන පොදු අදහසක් දැක්විය නොහැක. හේතුව ආණ්ඩුක්‍රමයේ ස්වභාවය අනුව මෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලය දී ඇති ආකාරය අනුව ද විධායකයේ කාර්යයන් වෙනස් වීම ය. නිදසුන් ලෙස ජනාධිපති ආණ්ඩුක්‍රමයක විධායකය වන ජනාධිපතිවරයාගේ සහ කැබිනට් ආණ්ඩුක්‍රමයක විධායකය වන අගමැති සහ කැබිනට් මණ්ඩලයේ විධායක කාර්යයන් වෙනස්වන ආකාරය පෙන්වාදිය හැක. එමෙන්ම ජනාධිපති ආණ්ඩුක්‍රමයක් වුවද ඇමරිකාවේ සහ ලංකාවේ ජනාධිපතිවරුන්ගේ විධායක කාර්යයන් වෙනස්වන ආකාරය පෙන්වා දිය හැක. එසේ වුවද සෑම ආණ්ඩුක්‍රමයක් තුළ ම විධායකයට පොදුවේ හිමිවන බලතල කිහිපයක් හඳුනාගත හැක. ඒවා පහත සඳහන් පරිදි වේ.

**(1)** රාජ්‍ය සේවය පාලනය කිරීම

ආණ්ඩුවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අනෙකුත් රාජ්‍ය ආයතන පාලනය කිරීම, මෙහෙයවීම, අධීක්ෂණය කිරීම, රාජ්‍ය සේවයේ ඉහළ නිලධාරීන් පත් කිරීම, මාරු කිරීම සහ සේවයෙන් පහ කිරීම මෙයට අයත් වේ.

**(2)** ව්‍යවස්ථාදායක කාර්යයන්

ව්‍යවස්ථාදායකය කැඳවීම, කල් තැබීම, විසුරුවා හැරීම, හදිසි අවස්ථාවලදී ව්‍යවස්ථාදායකය ඇමතීම, පණිවිඩ හා සංදේශ යැවීම, පනත් කෙටුම්පත් ඉදිරිපත් කිරීම සහ පනත්වලට අවසාන අනුමැතිය දීම මෙයට අයත් වේ.

**(3)** අධිකරණ කාර්යයන්

ඉහළ උසාවිවලට විනිශ්චයකරුවන් පත් කිරීම, ව්‍යවස්ථාපිත විධි විධාන අනුව ඔවුන් ඉවත් කිරීම, වරදකරුවන්ට සමාව දීම සහ රාජ නීතීඥවරුන් පත් කිරීම මෙයට අයත් වේ.

**(4)** රාජ්‍ය ආරක්ෂාව තහවුරු කිරීම

ත්‍රිවිධ හමුදාව සහ පොලීසිය පාලනය කිරීම, පොලීසියේ සහ ත්‍රිවිධ හමුදාවේ අධිකාරී තනතුරුවලට පත් කිරීම, ඉවත් කිරීම, හදිසි අවස්ථා සහ ඇඳිරි නීතිය ප්‍රකාශ කිරීම සහ යුද්ධය හා සාමය ප්‍රකාශ කිරීම යනාදී කාර්යයන් මෙයට අයත් වේ.

**(5)** රාජ්‍ය මූල්‍ය පාලනය කිරීම

අයවැය පනත සහ අනෙකුත් මූල්‍ය පනත් සකස් කිරීම, ඒවා ව්‍යවස්ථාදායකයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම සහ අනුමැතිය ලැබීමෙන් පසු ඒවා ක්‍රියාවට නැංවීම යනාදිය මෙයට අයත් වේ.

**(6)** විදේශ සම්බන්ධතා මෙහෙයවීම

විදේශ ප්‍රතිපත්තිය තීරණය කිරීම හා එය ක්‍රියාවට නැංවීම, විදේශයන්හි තම රට නියෝජනය කිරීම, රාජ්‍ය උපාය නිලධාරීන් පත් කිරීම හා පිළිගැනීම සහ විදේශ ගිවිසුම්වලට එළඹීම මෙයට අයත් වේ.

**(7)** උත්සවාත්මක කාර්යයන්

රාජ්‍ය උත්සවවල මුලසුන දැරීම, නම්බුනාම ප්‍රදානය කිරීම සහ රාජ්‍ය මුද්‍රාව පරිහරණය කිරීම වැනි කාර්යයන් මෙයට අයත් වේ.

**(8)** නියෝග සහ ආඥා නිකුත් කිරීම

රාජ්‍ය ප්‍රතිපත්ති තීරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහ වෙනත් වැඩසටහන් ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය නියෝග සහ ආඥා නිකුත් කිරීම මෙයට අයත් වේ.

**(9)** අවධාරිත බලතල ක්‍රියාවට නැංවීම

යම් යම් අවශ්‍යතා හා තත්ත්වයන් අනුව ව්‍යවස්ථාදායකය විසින් විධායකයට අවධාරිත කරන ලද බලතල ක්‍රියාවට නැංවීම මෙයින් අදහස් වේ.
නූතන ආණ්ඩුක්‍රම තුළ විධායකයේ කාර්යභාරය දෙස බලන විට විශ්ව ව්‍යාප්තව දැකිය හැකි පොදු ලක්ෂණය වන්නේ ආණ්ඩුවේ සෙසු ආයතන දෙකට වඩා විධායකයේ වැදගත්කම සහ ප්‍රමුඛත්වය නොකඩවාම වැඩි වෙමින් තිබෙන බව ය.

**(iii)** නූතන ආණ්ඩුක්‍රම තුළ ව්‍යවස්ථාදායකයේ කාර්යභාරය

අරමුණ : **ආණ්ඩුකරණ ක්‍රියාදාමය තුළ ව්‍යවස්ථාදායකය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? සහ එමගින් කෙරෙන කාර්යයන් මොනවාද යන්න පිළිබඳව අපේක්ෂකයන්ගේ දැනුම පරීක්ෂා කර බැලීම**

**පිළිතුරෙහි අන්තර්ගත විය යුතු වැදගත් කරුණු**

(අ) ව්‍යවස්ථාදායකය අර්ථකථනය කිරීම **(ලකුණු 01)**
(ආ) ව්‍යවස්ථාදායකයේ කාර්යයන් **(ලකුණු 08)**
(ලකුණු ප්‍රදානය කිරීමේ දී ආදර්ශ පිළිතුරෙහි දක්වා ඇති කරුණු සැලකිල්ලට ගන්න)

(ඇ) නිගමනය : **ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ කොටසක් ලෙස ව්‍යවස්ථාදායකයේ වැදගත්කම හා එහි අවශ්‍යතාව හුවා දැක්වීම** **(ලකුණු 01)**

ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය තුළ ව්‍යවස්ථාදායකයට හිමි වන්නේ සුවිශේෂී තත්ත්වයක් ය. හේතුව ව්‍යවස්ථාදායකය නොමැතිව ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමය තුළ විධායකයට හෝ අධිකරණයට පැවැත්මක් නොමැති වීම ය. මෙයින් අදහස් කරන්නේ ව්‍යවස්ථාදායකය නීති පනවන්නේ නැතිනම් විධායකයට ක්‍රියාවට නැංවීමට හෝ අධිකරණයට අර්ථකථනය කිරීමට දෙයක් නොමැති බව ය. ව්‍යවස්ථාදායකයේ ප්‍රධාන කාර්යය නීති පැනවීම වුවද, ඊට අමතරව එය තවත් කාර්යයන් කිහිපයක් ම කරන ආකාරය නූතන ආණ්ඩුක්‍රම තුළ ව්‍යවස්ථාදායක සභා දෙස බැලීමේ දී පෙනී යන්නේ ය.

**(1) නීති සම්පාදනය**

මෙය ව්‍යවස්ථාදායකය විසින් කරන වැදගත්ම හා ප්‍රමුඛ කාර්ය ලෙස හඳුන්වා දිය හැක. මෙයට නීති පැනවීම පමණක් නොව නීති සංශෝධනය කිරීම සහ අවලංගු කිරීම ද අයත් වේ.

**(2) විධායකය පාලනය කිරීම**

විධායකය විසින් ඉදිරිපත් කරන අණපනත් සම්මත නොකිරීම, විවේචනය කිරීම, ප්‍රශ්න ඇසීම සහ විධායකයට එරෙහිව දෝෂාභියෝජනා සහ විශ්වාසභංග යෝජනා සම්මත කිරීම මගින් මෙම කාර්යයන් ඉටු කරනු ලැබේ.

**(3) විධායකයට අවශ්‍ය බහුතරය සැපයීම**

මෙයින් අදහස් කරන්නේ ආණ්ඩුව ස්ථාවරව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය බහුතර සහය ලබා දීම ය.

**(4) රාජ්‍ය මූල්‍ය පාලනය**

රාජ්‍ය වියදම් සඳහා අවශ්‍ය මුදල් අයකර ගැනීම හා වියපැහැදම් කිරීම අනුමත කිරීම මෙයට අයත් වේ. ව්‍යවස්ථාදායකයේ අනුමැතියෙන් තොරව බදු පැනවීමට විධායකයට නොහැක.

**(5) අධිකරණ කාර්යයන්**

විධායකයට සහ ඉහළ අධිකරණ විනිශ්චයකරුවන්ට එරෙහිව ගැනෙන දෝෂාභියෝජනා විනිශ්චය කිරීම සහ පාර්ලිමේන්තු වරප්‍රසාද කඩ කිරීම්, විනිශ්චය කිරීම වැනි කාර්යයන් මෙයට අයත් වේ.

**(6) තෝරා පත් කිරීමේ කාර්යයන්**

සමහර රටවල්වල ව්‍යවස්ථාදායකය විසින් රාජ්‍යයේ විවිධ තනතුරු සඳහා තෝරාපත් කිරීම් කරන ආකාරය දැකිය හැක. නිදසුන් ලෙස ඉන්දියාවේ ජනාධිපතිවරයා පත් කිරීම, ස්විට්සර්ලන්තයේ සන්ධීය කවුන්සිලයට සාමාජිකයන් පත් කිරීම, ඇමරිකාවේ ජනාධිපතිවරයා සමග එක්ව ෆෙඩරල් අධිකරණයේ විනිශ්චයකරුවන් සහ සමහර උසස් රාජ්‍ය නිලධාරීන් පත් කිරීම පෙන්වා දිය හැක.

**(7) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම**

මෙය ව්‍යවස්ථාදායකයේ තනි සහ අනන්‍ය කාර්යයක් වේ.

**(8) අනාගත දේශපාලන නායකයින් පුහුණු කිරීම**

ව්‍යවස්ථාදායකයට අලුතෙන් තේරී පත්වන සාමාජිකයින් අනාගත දේශපාලන නායකයින් ලෙස ක්‍රියා කිරීම සඳහා පුරුදු පුහුණු කිරීම මෙයින් අදහස් වේ.

**(9) ජනතා දුක් ගැනවිලි පිළිබඳ සැලකිලිමත් වීමෙන්**

කාලීනව ජනතාව විසින් ඉදිරිපත් කරන දුක් ගැනවිලි විසඳීම සඳහා ක්‍රියා කිරීම මෙයින් අදහස් වේ.

**(10) විභාග කිරීම සහ විමර්ශනය කිරීම**

කාලීනව පැන නගින සමාජ ප්‍රශ්න සහ ගැටලු විභාග කිරීම සහ විමර්ශනය කිරීම මෙයින් අදහස් වේ.

**(iv) ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමය තුළ අධිකරණයේ කාර්යභාරය**

**අරමුණ : ආණ්ඩුකරණ ක්‍රියාදාමය තුළ අධිකරණයට හිමි තැන සහ එහි වැදගත්කම පිළිබඳව අපේක්ෂකයින්ගේ අවබෝධය පරීක්ෂා කර බැලීම**

**පිළිතුරෙහි අන්තර්ගත විය යුතු වැදගත් කරුණු**

(අ) අධිකරණය අර්ථකථනය කිරීම **(ලකුණු 02)**

(ආ) අධිකරණයේ කාර්යභාරය ලකුණු ප්‍රදානය කිරීමේ දී ආදර්ශ පිළිතුරෙහි දක්වා ඇති කරුණු පිළිබඳව සැලකිලිමත් වන්න. **(ලකුණු 06)**

(ආදර්ශ පිළිතුරෙහි දක්වා ඇති කාර්යයන් ලකුණු ප්‍රදානය කිරීමේ දී සැලකිල්ලට ගන්න)

(ඇ) නිගමනය : **ඉහත දැක්වූ කාර්යයන් කිරීමට නම් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය තුළ අධිකරණය ස්වාධීන නිදහස් හා අපක්ෂපාතී ආයතනයක් වශයෙන් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය යි.** **(ලකුණු 02)**

**(1) නීතිය විවරණය කිරීම**

යම් කරුණක් සම්බන්ධයෙන් පවතින නීතිය අපහැදිලි හෝ නිශ්ශබ්ද වූ විට අදාල නීතිමය තත්ත්වය පැහැදිලි කිරීම මෙමගින් අදහස් කෙරේ. මේ යටතේ අධිකරණය මගින් අලුතින් නීති නිර්මාණය කරනු ලැබේ.

**(2) යුක්තිය පසිඳලීම**

අධිකරණයේ ප්‍රධානතම සහ ප්‍රමුඛතම කාර්යභාරය යුක්තිය පසිඳලීම ය. රාජ්‍යය හා පුරවැසියන් අතරත්, පුරවැසියන් අතරමත් පවතින සිවිල් හා අපරාධ ආරවුල් සහ ගැටුම් සහ ව්‍යවස්ථාමය නඩු විනිශ්චය කර යුක්තිය පසිඳලීමේ කාර්යභාරය අධිකරණය මගින් කරනු ලැබේ.

**(3) මානව අයිතිවාසිකම්වල ආරක්ෂකයා ලෙස ක්‍රියා කිරීම**

රාජ්‍ය තම පුරවැසියන්ට ප්‍රදානය කර ඇති අයිතිවාසිකම් හා නිදහස උල්ලංඝනය වනවිට ඒවා ආරක්ෂා කර තහවුරු කිරීම අධිකරණයේ කාර්යභාරය වේ.

**(4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ආරක්ෂකයා ලෙස ක්‍රියා කිරීම**

මෙයින් අදහස් කරන්නේ විධායකය හා ව්‍යවස්ථාදායකය මගින් පනවනු ලබන අණපනත් ව්‍යවස්ථානුකූල ද නැද්ද යන්න සොයා බැලීම යි. මෙම කාර්යභාරය ඉටු කළ හැක්කේ අධිකරණ විවරණ බලය අධිකරණයට හිමි වේ නම් පමණි.

**(5) උපදේශන කාර්යභාරයන්**

නීතිමය හා ව්‍යවස්ථාමය කරුණු සම්බන්ධයෙන් ගැටලු සහගත තත්ත්වයක් ඇති වූ විට විධායකය ඒ පිළිබඳව අධිකරණයේ උපදෙස් ඉල්ලා සිටියහොත් එසේ උපදෙස් සැපයීමේ කාර්යය අධිකරණය ඉටු කළ යුතුය. සාමාන්‍යයෙන් මෙම කාර්යභාරය ඉටු කරනු ලබන්නේ ශ්‍රේෂ්ඨාධිකරණය මගිනි.

**(6) මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත රාජ්‍යයන් අතර ඇතිවන ගැටලු විනිශ්චය කිරීම**

මෙම කාර්ය සන්ධීය ආණ්ඩුවක අධිකරණය මත පැවරී ඇති විශේෂ අධිකරණ කටයුත්තක් වේ.

**(7) වෙනත් කාර්යයන්**

බාල වයස්කාරයන් වෙනුවෙන් භාරකරුවන් පත් කිරීම, බංකොලොත්භාවය ප්‍රකාශයට පත් කිරීම, මැතිවරණ පෙත්සම් විභාග කිරීම, පාර්ලිමේන්තු වරප්‍රසාද කඩකිරීමේ චෝදනා විභාග කිරීම, රිට් ආඥා නිකුත් කිරීම සහ විවාහ සහතික සහ ප්‍රජා අයිතිවාසිකම් ප්‍රදානය කිරීම යන කාර්යභාරයන් මෙයට අයත් වේ.

**2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




2 ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ අයදුම්කරුවන් 42%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20 ක් හිමි වේ.
ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 37%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 29%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 24%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 10%ක් ද,
ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 16 හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 10% ක් වන අතර ලකුණු 05 හෝ ඊට අඩුවෙන් ලබාගත් පිරිස 37% කි. එමෙන්ම අයදුම්කරුවන්ගෙන් 53%ක් ම 06 - 15 අතර ලකුණු ලබා ගෙන ඇත.




මෙම ප්‍රශ්නයට කොටස් 4 ක් ඇති අතර ඉන් පහසුතාව වැඩි ම කොටස (i) වේ. එහි පහසුතාව 40%කි. අඩු ම පහසුතාව ලබා ඇති (iv) වන කොටස් සඳහා ලබා ඇති පහසුතාව 34%ට වඩා අඩු මට්ටමක පවතී.

මෙම ප්‍රශ්නය කොටස් හතරකින් යුක්ත ය. ඕනෑම කොටස් දෙකක් තෝරා ගෙන පිළිතුරු ලිවිය යුතු ය. ඉන් එක් කොටසකට ලකුණු 10 බැගින් කොටස් දෙක සඳහා ලකුණු 20ක් හිමි වේ. විභාග අපේක්ෂකයන්ගෙන් 42%ක් මෙම ප්‍රශ්නය තෝරා ගෙන තිබුණත්, ඉහළම ලකුණු එනම් 16 - 20 අතර ලකුණු ලබා ඇත්තේ 10%ක් වැනි සංඛ්‍යාවකි. වැඩිම පිරිසක් එනම් 37%ක් ලකුණු 0 - 5 අතර සංඛ්‍යාවක් ලබා ඇත.

**I කොටස**

මෙම ප්‍රශ්නයේ පළමුවන කොටස සඳහා 40%ක් වූ වැඩිම පහසුතාව දක්වා ඇත. ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කාර්යභාරය පිළිබඳව කරුණු දැක්වීමේ දී එය රටේ උත්තරීතර නීතිය ලෙස පිළිගැනීම පිළිබඳව කරුණු දක්වා නොතිබීමත්, ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයට පදනම සැපයීම, රාජ්‍යයේ ස්වභාවය, ආණ්ඩුවේ ස්වභාවය, පුරවැසියන්ගේ අයිතිවාසිකම් හා නිදහස පෙන්වා දී ඒවා ආරක්ෂා කිරීම යනාදි කරුණු පිළිතුරු මගින් අනාවරණය කර නොතිබීම නිසා ඉහළ ලකුණු ලබා ගැනීමට අපහසු වී ඇත. ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කාර්යභාරය මගින් ඒකාධිපති පාලනයක් ඇතිවීම වැළැක්වීමට හැකිවීම නිසා ඒ පිළිබඳව පන්ති කාමරය තුළ සුවිශේෂී දැනුවත් කිරීමක් අවශ්‍ය බව අවධාරණය කළ හැකි ය.

**II කොටස**

දෙවන කොටස සඳහා 38%ක් වූ පහසුතාවක් දක්වා ඇත. මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමේ අරමුණ වූයේ විධායකය සහ එහි කාර්යභාරය පිළිබඳ අපේක්ෂකයින්ගේ දැනුම පරීක්ෂා කිරීමයි. එහෙත් නූතන ආණ්ඩුක්‍රමය තුළ විධායකයේ කාර්යය පිළිබඳව කරුණු ඉදිරිපත් කර නොතිබුණි. නූතන ආණ්ඩුක්‍රම තුළ විධායකයේ කාර්යභාරය පිළිබඳව පොදු අදහසක් දැක්විය නොහැකි වුවද පොදුවේ බලතල කිහිපයක් හඳුනාගත හැකි වේ. එසේම ආණ්ඩුවේ සෙසු ආයතන දෙකට වඩා විධායකයේ වැදගත්කම හා ප්‍රමුඛත්වය නොකඩවාම වැඩි වෙමින් පවතින බව දක්වා නොතිබීම හා ඒ සම්බන්ධයෙන් ඉදිරිපත්ව ඇති විවේචන ප්‍රමාණවත් නොවීය. ඒ නිසා ඉහළ ලකුණු ලබා ගැනීමට අසමත්ව ඇත. විධායකයේ කාර්යභාරයට අමතරව වර්තමානයේ විධායකයේ වැදගත්කම හා ප්‍රමුඛත්වය පිළිබඳව පන්ති කාමරයේ දී සාකච්ඡා කළ යුතුය.

**III කොටස**

තෙවන කොටස සඳහා 37%ක් වූ පහසුතාවක් දක්වා ඇත. මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමේ අරමුණ වූයේ ද ව්‍යවස්ථාදායකය යනු කුමක් ද යන්න සහ එහි කාර්යභාරය පිළිබඳව අපේක්ෂකයින්ගේ දැනුම පරීක්ෂා කර බැලීමයි. එහෙත් ව්‍යවස්ථාදායකය යනු කුමක් දැයි පැහැදිලි කිරීමක් සිදු නොකෙරුණු තරම් ය. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ කොටසක් ලෙස එහි කාර්යයන් දක්වා තිබුනද එයට හිමිවන සුවිශේෂී තත්ත්වය පිළිබඳව අවධාරණය කර නොතිබීම ඉහළ පහසුතාවක් ලබා ගැනීමට අසමත් වූ බව නිගමනය කළ හැකි වේ. මෙම තත්ත්වය ගුරුවරයා විසින් පන්ති කාමරය තුළ පෙන්වා දීම කළ යුතු ය.

**IV කොටස**

අඩුම පහසුතාවයක් පෙන්නුම් කරන්නේ මෙම කොටසට ය. එනම් 34%කි. ආණ්ඩුකරණ ක්‍රියාදාමය තුළ අධිකරණයට හිමි තැන හා අපක්ෂපාති ආයතනයක් වශයෙන් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය හා ඊට අමතරව උපදේශන කාර්යයන් හා වෙනත් කාර්යයන් දක්වා නොතිබීම නිසා අපේක්ෂකයන්ගේ පහසුතාව අවම මට්ටමකට පැමිණීමට හේතු වී ඇතැයි නිගමනය කළ හැකි ය.

## 3 ප්‍රශ්නය

3. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය තුළ පහත දැක්වෙන ඒවායින් දෙකක කාර්යභාරය විමසන්න.

(i) සිවිල් සමාජය
(ii) යහ පාලනය
(iii) ජන මාධ්‍ය
(iv) දේශපාලන පක්ෂ

**(i) සිවිල් සමාජය**

අරමුණ : **ආණ්ඩු බලය හිතුවක්කාරි සහ අත්තනෝමතික ලෙස ක්‍රියාවට නැංවීමට එරෙහිව පවතින සංරෝධකයක් වශයෙන් සිවිල් සමාජයේ ක්‍රියාකාරිත්වය පිළිබඳව අපේක්ෂකයන්ගේ දැනුම පරීක්ෂා කර බැලීම**

**පිළිතුරෙහි අන්තර්ගත විය යුතු වැදගත් කරුණු**

(අ) සිවිල් සමාජය අර්ථකථනය (ලකුණු **02**)
(ආ) කාර්යභාරය (ලකුණු **06**)

(ඇ) නිගමනය : **අත්තනෝමතික ආණ්ඩුකරණයට එරෙහිව සංරෝධකයක් ලෙස සමාජයේ වැදගත්කම අවධාරණය කිරීම** (ලකුණු **02**)

සිවිල් සමාජය යනුවෙන් හඳුන්වන්නේ සංවිධිත සමාජය යි. සිවිල් සමාජය දේශපාලන විද්‍යාවේ ඉපැරණි ම සංකල්පයකි. එය විධිමත් ලෙස ඉදිරිපත් කරනු ලැබුවේ 17 වන සහ 18 වන සියවස්වලදී තෝමස් හොබ්ස්, ජෝන් ලොක් සහ රූසෝ යන දේශපාලන චින්තකයින් විසිනි. එම සංකල්පය දේශපාලන ක්ෂේත්‍රයේ වඩාත් අවධානයට ලක්වන්නේ විසිවන සියවසේ දෙවන භාගයේ දී ය. එයට හේතුව වූයේ තුන්වන ලෝකයේ රටවල ප්‍රජාතන්ත්‍රවාදය හා යහ පාලනය සම්බන්ධයෙන් මතුවන ගැටළුකාරී තත්ත්වය යි.

දෙවන ලෝක යුද්ධයෙන් පසුව නිදහස ලැබූ ආසියා, අප්‍රිකා හා ලතින් අමෙරිකානු රටවල ප්‍රජාතන්ත්‍රවාදය දුර්වල වීමත්, ඒ වෙනුවට එම රටවල පාලකයින් ප්‍රජාතන්ත්‍රවාදයේ නාමයෙන් ඒකතන්ත්‍ර පාලන ක්‍රම පිහිටුවා ගැනීමත්, අනික් අතට භෞතික හා මානව සම්පත් එම රටවල පැවතිය ද ආර්ථික සංවර්ධනය ලඟා කර ගැනීමට අසමත් වීමත්, දූෂණය, වංචාව, අල්ලස, නාස්තිය, අකාර්යක්ෂමතා, ඥාති සංග්‍රහය, වගකීමෙන් තොරවීම යන ආදී ප්‍රජාතන්ත්‍ර විරෝධී ගුණාංග එම දේශපාලන ක්‍රමවල මූලික අංග ලක්ෂණ විය.

යථෝක්ත රටවල මෙබඳු තත්ත්වයක් නිර්මාණය වීමට ප්‍රධාන හේතුව වූයේ ජනතාවගේ දේශපාලන දැනුම හා අවබෝධය දුර්වල මට්ටමක පැවතීමත්, ඔවුන් දේශපාලන වශයෙන් නවීකරණය වූ ජනතාවක් නොවීමත්, එම හේතුවෙන් ඔවුන් පසුගාමී දේශපාලන මතවාද කරපින්නාගෙන සිටීමත් සහ එහි ප්‍රතිඵලයක් ලෙස ඔවුන් තුළ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ අවබෝධයක් නොමැති වීමත් ය.

මෙම තත්ත්වයෙන් එම රටවල ජනතාව ගලවාගෙන ඔවුන් දේශපාලන වශයෙන් සවිබල ගැන්වීම මගින් පමණක් යහ පාලනය ගොඩ නැංවීමට හැකිබව ප්‍රජාතාන්ත්‍රික ලෝකයේ බොහෝ දෙනා කල්පනා කළහ. මේ සඳහා සිවිල් සමාජයට වැදගත් කාර්යයක් ඉටුකළ හැකි බව පෙනී ගියේ ය. මෙම හේතුව නිසයි, සිවිල් සමාජය පිළිබඳ සංකල්පය බලපෑම් සහගත ලෙස ඉදිරියට පැමිණෙන්නේ. Almond සහ Verba ඔවුන්ගේ The Civic Culture නම් කෘතිය මගින් ප්‍රකාශ කළේ "සිවිල් සමාජ සංවිධාන මගින් ඡන්දදායකයා වඩාත් දැනුවත් හා අවබෝධයෙන් යුක්ත පුද්ගලයෙකු කළ හැකි බවත්, එහි ප්‍රතිඵලයක් ලෙස ඡන්දදායකයා ඡන්දය පාවිච්චි කිරීමේ දී වඩාත් තාර්කික වී දේශපාලන ක්‍රියාදාමයට වැඩියෙන් සහභාගි විය හැකි බවත් සහ එසේ වන විට පාලකයින් වඩාත් වගකීමෙන් යුතුව ක්‍රියා කිරීමට පෙළඹෙන බවත් ය."

මෙවන් කාර්ය භාරයක් ඉටුකළ හැකි සිවිල් සමාජය හඳුනා ගන්නේ කෙසේද? ආණ්ඩුව, පවුල සහ වෙළෙඳපොළ හැර සමාජයේ ක්‍රියාත්මක වන අනෙක් සියලුම ප්‍රජා හා සමාජ සංවිධාන සමූහයේ එකතුව සිවිල් සමාජය ලෙස සලකනු ලැබේ.

London School of Economics මගින් සිවිල් සමාජය අර්ථ දක්වා ඇති ආකාරයට "බෙදා ගත් ආශාවන් අරමුණු සහ අගය කිරීම් උදෙසා බලය යෙදීමෙන් තොරව සාමූහිකව ක්‍රියාත්මක වන සමාජ ක්ෂේත්‍රය සිවිල් සමාජ වේ." මේ අනුව පවුල, ආණ්ඩුව හා වෙළෙඳපොළ යන ආයතන තුනට වඩා සිවිල් සමාජය වෙනස් වේ. එහෙත් ප්‍රායෝගිකව සලකා බලන විට එම ආයතන තුන හා සිවිල් සමාජය අතර නිශ්චිත බෙදුම් රේඛා පෙන්වාදිය නොහැක.

සිවිල් සමාජය විවිධ පුද්ගලයින්ගෙන් ද, ආයතනවලින් ද යුක්ත වේ. එම ආයතන ජාලයට දානපති සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන, කාන්තා සංවිධාන, ආගමික සංවිධාන, වෘත්තීය සමිති, ව්‍යාපාරික සංවිධාන, ආදී විවිධ සංවිධාන ඇතුළත් වේ.

සිවිල් සමාජය ආශ්‍රිතව ප්‍රධාන අංග ලක්ෂණ හතරක් හඳුනාගත හැක.

(1) සාමූහික ක්‍රියාවන්

සිවිල් සමාජය පෞද්ගලික අරමුණු හෝ ආශාවන් වෙනුවෙන් ක්‍රියාත්මක නොවේ. එය ක්‍රියාත්මක වන්නේ පොදු අරමුණු හා ආශාවන් වෙනුවෙනි.

(2) බලය යෙදීමෙන් තොරවීම

සිවිල් සමාජය ක්‍රියාත්මක වන්නේ ස්වේච්ඡාවෙනි. එමෙන්ම තම පෞද්ගලික කැමැත්ත මත එයින් ඉවත් වීමට ද පුළුවන.

(3) අනන්‍යතාව

එය පවුල, ආණ්ඩුව හා වෙළෙඳපොළින් වෙන් වූ වෙනමම ඒකකයකි.

(4) දේශසීමා නිශ්චිත ලෙස හඳුනාගත නොහැකි වීම

සිවිල් සමාජය පවුල, ආණ්ඩුව හා වෙළෙඳපොළෙන් නිශ්චිතව වෙනස් වන්නේ කුමන සීමා මායිම්වලින්ද යන්න නිශ්චිතව හඳුනාගෙන නැත.

මෙබඳු අංග ලක්ෂණවලින් යුත් සිවිල් සමාජයේ ක්‍රියාකාරිත්වය ලෝකයේ රාජ්‍යවල යහ පාලනය ගොඩනැගීමට අත්‍යවශ්‍යම අංගයක් යැයි මෑත කාලයේ තහවුරු වූ මතයකි. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සහශ්‍රක වාර්තාවේ කාර්යක්ෂම ආණ්ඩුකරණයකට සිවිල් සමාජය අත්‍යවශ්‍යම යැයි දැක්වීමෙන් ඒ බව තහවුරු වේ. Ausaid නමින් ඕස්ට්‍රේලියානු ආණ්ඩුව සකස් කළ වාර්තාවක දැක්වෙන්නේ යහපාලනය ගොඩ නැගීමට නම් අත්‍යවශ්‍යම වන බවය.

යහපාලනය ගොඩනැගීමටත් එය පවත්වාගෙන යාමටත් සිවිල් සමාජයට කළ හැකි ප්‍රධාන කාර්යයන් දෙකකි. එනම්,

- **ප්‍රතිරෝධක බලවේගයක් ලෙස ක්‍රියා කිරීම**

දේශපාලන අධිකාරියේ අත්තනෝමතික ක්‍රියාවන්ට එරෙහිව පුද්ගලයින්ට හුදකලාව මුහුණදිය නොහැකි බැවින් පුරවැසියන් සංවිධානාත්මකව දේශපාලන අධිකාරියට එරෙහිව මෙම පෙළ ගැස්වීම. මෙම පෙළ ගැසීම වෙළෙඳපොළ කතිපයාධිකාරයන්ට එරෙහිව ද, සමාජ දූෂණයන්ට එරෙහිව ද සිදු කළ හැක.

● **ආණ්ඩුකරණය පිළිබඳ මුරබල්ලෙකු ලෙස කටයුතු කිරීම**

ආණ්ඩු පාලනය පිළිබඳ විමසිලිමත් වීම සහ දූෂිත දේශපාලනඥයින්ට හා රාජ්‍ය නිලධාරීන්ට බලය අයථා ලෙස යොදා ගැනීමට, එනම් හිමිකම් කඩ කිරීමට හා පීඩාකාරී නීති පැනවීමට එරෙහිව නැගී සිටීම මඟින් සිවිල් සමාජයට ආණ්ඩුකරණය පිළිබඳ මුරබල්ලෙකු බවට පත්විය හැක. මීට අමතරව පුරවැසියන් සාමූහික සමාජ ජීවිතයකට හුරුපුරුදු කිරීම ද සිවිල් සමාජයේ කාර්යයකි.

අඩු සංවර්ධිත රාජ්‍යයන්හි සමාජය බලගැන්වී ඇති ප්‍රමාණය පහළ මට්ටමක පවතින බැවින් සිවිල් සමාජයේ ක්‍රියාකාරිත්වය ද ප්‍රබල තත්ත්වයක නොපවතී. එසේ වුවද සිවිල් සමාජයේ බලගැන්වෙන ප්‍රමාණයට අනුව දේශපාලන සමාජයේ අධිකාරි බලය ක්‍රියාත්මක වීම මර්දනය වේ.

**(ii)** යහ පාලනය

අරමුණ : **ආණ්ඩුකරණ සංකල්පයක් ලෙස යහපාලනය සංකල්පය පිළිබඳව අපේක්ෂකයන්ගේ දැනුම පරීක්ෂා කර බැලීම**

**පිළිතුරෙහි අන්තර්ගත විය යුතු වැදගත් කරුණු**

(අ) යහපාලන සංකල්පය ආරම්භය හා විකාශය **(ලකුණු 02)**
(ආ) යහපාලන සංකල්පයේ අන්තර්ගත මූලිකාංග **(ලකුණු 06)**

**(ඇ) නිගමනය : ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය අත්‍යවශ්‍යම අංගයක් ලෙස යහපාලනයේ වැදගත්කම (ලකුණු 02)**

නූතන ප්‍රජාතන්ත්‍රවාදයේ මූලිකාංගයක් බවට වර්තමානයේ දී පත්ව ඇති යහපාලනය පිළිබඳ සංකල්පය දෙවන ලෝක යුද්ධයෙන් පසු කාලයේ නිදහස ලැබූ ආසියානු, අප්‍රිකානු හා ලතින් ඇමරිකානු යටත් විජිත රටවල් ඉලක්ක කරගෙන ඉදිරිපත් වූ සංකල්පයකි. ඒවායින් සමහර රාජ්‍යයන් භෞතික හා මානව සම්පත්වලින් පොහොසත් වුවද ඒවායේ ආර්ථික වර්ධනය මන්දගාමී තත්ත්වයක පැවතුණි. එහෙයින් එම රාජ්‍යයන්හි සමාජ සංවර්ධනය ද පහළ මට්ටමක පැවතුණි. මෙහි එක් ප්‍රතිඵලයක් වූයේ යථෝක්ත රාජ්‍යයන්හි සමාජ සාධාරණත්වය බිඳ වැටීම ය.

1980 දශකයෙන් පසු මේ පිළිබඳව හේතු පරීක්ෂා කිරීම ඇරඹුණු අතර එහිදී විශ්ලේෂකයන් විසින් එයට හේතු ගණනාවක් සොයා ගන්නා ලදි. ඒවා නම් අනවශ්‍ය ලෙස බලය මධ්‍යගතවීම, පාලනයේ අකාර්යක්ෂමතාව, රාජ්‍ය සේවය දේශපාලනීකරණය වීම, රාජ්‍ය ප්‍රතිපත්ති තීරණයට හා ඒවා ක්‍රියාවට නැංවීමට හා සහභාගිත්වය නොවීම, අල්ලස හා දූෂණය ඉහළ මට්ටමක පැවතීම, පාලකයන් වගකීමෙන් තොරව කටයුතු කිරීම යනාදිය වේ.

ඉහත සඳහන් තත්ත්වය තුළ නිදහස ලැබූ යටත් විජිත රාජ්‍යයන් හි ආර්ථික සංවර්ධනය ඇති කිරීමටත්, එමගින් සමාජ සාධාරණත්වය තහවුරු කිරීමටත් ගතයුතු ක්‍රියාමාර්ග හඳුන්වා දීම සඳහා විවිධ ජාත්‍යන්තර සංවිධාන ගත් උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස "යහ පාලනය" නම් සංකල්පය ප්‍රචලිත වන්නට විය. එම සංකල්පයේ මූලිකාංග වන්නේ,

(1) සහභාගීත්වය

ආණ්ඩුව ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ දී හා එම ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේ දී ජනතා සහභාගිත්වය වර්ධනය කිරීමට අවශ්‍ය සමාජ දේශපාලන වටපිටාව නිර්මාණය කළ යුතුය යන්න මෙයින් අදහස් වේ. වෙනත් ආකාරයකට කියනවා නම් එයින් අදහස් කරන්නේ ජනතාවට මෙන්ම සිවිල් සංවිධානවලට ද ප්‍රතිපත්ති සම්පාදනයේ දී සක්‍රීය ලෙස මැදිහත් වීමට අවකාශය පැවතිය යුතුය යන්න ය. ඒ සඳහා බලය විමධ්‍යගත කිරීම අත්‍යවශ්‍ය දෙයක් වන බව එමගින් තවදුරටත් අවධාරණය කෙරේ.

(2) නීතියේ ආධිපත්‍යය

සමාජයේ සෑම පුද්ගලයෙකුට මෙන්ම සෑම සංවිධානයකටම වඩා නීතිය උත්තරීතර වීම සහ නීතිය ඉදිරියේ පාලකයා මෙන්ම පාලිතයා ද සමාන වීම නීතියේ ආධිපත්‍යය ලෙස හඳුන්වනු ලැබේ. සමාජයේ කිසිවෙකුට නීතිය මගින් විශේෂ වරප්‍රසාද හෝ අවරප්‍රසාද හෝ හිමි නොවිය යුතුය. එමෙන්ම නීතිය කඩ කරන ඕනෑම පුද්ගලයෙකුට හෝ ඕනෑම සමාජ සංවිධානයකට නීතිය මගින් නියමිත දඬුවම් ලබාදිය යුතු ය.

(3) වගකීම හා වගවීම

වගකීම යනු රාජ්‍ය පාලකයන් විසින් ජනතාවට දෙන ලද පොරොන්දු ඉටු කිරීමට බැඳී සිටීම හා රාජ්‍ය සේවකයන් විසින් රාජ්‍ය සේවය නියමාකාරයෙන් ඉටු කිරීමට බැඳී සිටීම වේ. මෙහිදී ජනතාවගේ ප්‍රශ්නවලට පිළිතුරු දීම පමණක් නොව දේශපාලනඥයින් ජනතාවට දුන් පොරොන්දු නිසි පරිදි ඉටු කිරීමට අපොහොසත් වුවහොත් ස්වකීය ධුරවලින් ඉල්ලා අස්වීම මෙන්ම රාජ්‍ය සේවකයින් තමන් වෙත පැවරී ඇති කාර්යභාරය නිසි පරිදි ඉටු නොකළහොත් ඔවුන් එම ධුරවලින් ඉවත් කිරීමේ යාන්ත්‍රණයක් පැවතීම වගකීමේ සංකල්පය තුළින් ව්‍යුත්පන්න වේ. වගවීම යනු තමන්ට ඇති වගකීම නොපිරිහෙලා ඉටු කිරීමට තමා (රාජ්‍ය පාලකයන් හා රාජ්‍ය සේවකයන්) තුළ ඇති අවංක කැපවීම හා බැඳීම වේ.

(4) විනිවිදභාවය

රාජ්‍යයේ මූල්‍ය කටයුතු පිළිබඳව සහ අනෙකුත් පරිපාලන කටයුතු පිළිබඳව පවතින විවෘතභාවය මීට අදාල වේ. රාජ්‍ය වියදම් පිළිබඳ තොරතුරු දැන ගැනීමටත් සහ අනෙකුත් පරිපාලන කටයුතු පිළිබඳ තොරතුරු දැනගැනීමටත් ජනතාවට අවකාශය විවෘත වීම විනිවිදභාවය යනුවෙන් අදහස් කරනු ලැබේ. රාජ්‍ය මූල්‍ය විගණනය මෙන්ම රාජ්‍ය පරිපාලනය අධීක්ෂණය කිරීම පිළිබඳ යාන්ත්‍රණයක් පැවතීම මගින් විනිවිදභාවය සාර්ථක විය හැක.

(5) ප්‍රතිචාරාත්මක බව

ජනතාවගේ ඉල්ලීම්වලට, ආශාවන්ට හා අපේක්ෂාවන්ට පාලකයින් සවන් දිය යුතු අතර ඒවා සැලකිල්ලට ගෙන සෑම අදහසක්ම නියෝජනය වන පරිදි අවසාන වශයෙන් ප්‍රතිපත්ති සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතු බව මෙයින් අදහස් වේ.

(6) සමමිතිකභාවය

මෙයින් අදහස් කරන්නේ පාලන කාර්යයේ දී පොදු එකඟතාවකින් කටයුතු කිරීම ය. එනම් ප්‍රතිවිරුද්ධ කණ්ඩායම් අතර එකඟතාවක් ඇති කර ගැනීම ය.

(7) කාර්යක්ෂමතාව හා ඵලදායීතාව

ආණ්ඩුව සහ එහි අනුබද්ධ ආයතන වෙත පැවරී ඇති කාර්යභාරය විධිමත් ලෙස, ප්‍රමාදයකින් තොරව මෙන්ම ගුණාත්මකභාවයෙන් යුක්තව ක්‍රියාවට පරිවර්තනය කිරීම කාර්යක්ෂමතාව යනුවෙන් අදහස් කෙරේ. මේ සඳහා විශේෂඥ දැනුම අත්‍යවශ්‍ය වන අතර මනා ලෙස ගොඩනගන ලද ව්‍යුහයන් පැවතිය යුතු වේ. ඵලදායීතාවය යනුවෙන් අදහස් කරන්නේ සම්පත් නිසි පරිදි කළමනාකරණය කරමින් අපතේ යාම වළකාලමින් ද ඒවායින් උපරිම ප්‍රයෝජන ගැනීම වේ.

(8) සාධාරණත්වය

සමාජ ධනය සාධාරණ ලෙස බෙදී යාම මින් අදහස් කෙරේ. ඒ අනුව සෑම ජන කොටසකගේම අවශ්‍යතා සපුරාලිය හැකි පරිදි රාජ්‍ය ආදායම වියදම් කළ යුතු ය.

පොදුවේ ගත් කල්හි යහ පාලනය යනු වංචා දූෂණවලින් තොර සුළු ජන කොටස්වල අවශ්‍යතා ද සපුරාලන, වඩාත් පුළුල් ජනතා සහභාගිත්වයක් සහිත පාලන ක්‍රමයක් ක්‍රියාවට නැංවීමට උපකාරීවන දේශපාලන සංකල්පයක් වේ. එමගින් ආර්ථික සංවර්ධනය වේගවත් වන අතර සමාජ සුබසාධනය ඉහළ නංවයි.

යහපාලනය පිළිබඳ සංකල්පය මතුපිටින් ඉතාමත්ම ජනප්‍රිය සංකල්පයක් ලෙස ඉස්මතු වී තිබුණ ද ආසියානු, අප්‍රිකානු හා ලතින් ඇමෙරිකානු කලාපවල රාජ්‍යයන්හි එම සංකල්පය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම අපහසු කාර්යයක් වී තිබේ. මක්නිසාදයත් එම කලාපවල පවතින අඩු දියුණු දේශපාලන ක්‍රමයන් ආශ්‍රිතව සංවර්ධිත දේශපාලන සංස්කෘතියක් නොපවතින බැවිනි.

**(iii)** ජනමාධ්‍ය

අරමුණ : **ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමය තුළ ජනමාධ්‍යයේ ක්‍රියා කලාපය කුමක් විය යුතුද යන්න පිළිබඳව අපේක්ෂකයන්ගේ දැනුම පරීක්ෂා කර බැලීම**

**පිළිතුරෙහි අන්තර්ගත විය යුතු වැදගත් කරුණු**

(අ) ජනමාධ්‍ය යනු කුමක්ද අර්ථකථනය කිරීම (ලකුණු **02**)
(ආ) ජනමාධ්‍ය : ක්‍රියා කලාපය (ලකුණු **06**)

(ඇ) නිගමනය : **ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය පවත්වාගෙන යාම සඳහා ජනමාධ්‍ය අත්‍යවශ්‍යම දෙයක් වන බව** (ලකුණු **02**)

තාක්ෂණයේ දියුණුවත් සමඟ වර්ධනය වූ ජනසන්නිවේදනයේ එක් මූලිකාංගයක් ලෙස ජනමාධ්‍ය හඳුනාගත හැක. ජනමාධ්‍යයේ විවිධ ප්‍රබේධ පවතී. එනම් පුවත්පත්, පත්‍රිකා, පෝස්ටර්, ගුවන් විදුලිය, රූපවාහිනී, අන්තර්ජාලය යනාදී වශයෙනි.

ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමවල ඉතාමත් ම බලපෑම් සහගත දේශපාලන විචල්‍යයන් වශයෙන් වඩාත් පුළුල් භූමිකාවක් ජනමාධ්‍යවලට හිමි වී තිබේ. ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමවල ජනමාධ්‍යයේ භාවිතය නිදහස් හා ස්වාධීන වීම අත්‍යවශ්‍ය දෙයකි. එමගින් ප්‍රජාතන්ත්‍රවාදී පාලනයේ යහපැවැත්ම ඇති වන්නේ ය. ජනමාධ්‍ය හඳුන්වනු ලබන්නේ ප්‍රජාතන්ත්‍රවාදයේ මුර බල්ලෙක් වශයෙනි.

ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමවල ජනමාධ්‍යයේ කාර්ය වන්නේ ප්‍රවෘත්ති සහ තොරතුරු වාර්තාකරණය පමණක් නොවේ. මීට වඩා පුළුල් කාර්යභාරයක් එමගින් අපේක්ෂා කරනු ලැබේ. එම කාර්යභාරය කුමක් ද?

මූලික වශයෙන් ගත් කල මහජන මතය සංවිධානය කිරීමේ සහ හැසිරවීමේ කාර්ය ජනමාධ්‍ය විසින් ඉටු කරනු ලැබේ. එය පවතින රජයට පක්ෂපාතීව හෝ විපක්ෂව හෝ සිදු කළ හැක. එමගින් දේශපාලන සමාජයෙහි මහජන මතය සංවිධානය වීම හා හැසිරීම සිදුවනු ඇත. විශේෂයෙන්ම මැතිවරණවලදී ඡන්දදායකයාගේ වරණය කෙරෙහි බලපාන ආකාරයෙන් මත හැසිරවීමට ජනමාධ්‍ය ක්‍රියා කිරීම කැපී පෙනෙන ලක්ෂණයකි. එමගින් ප්‍රජාතන්ත්‍රවාදී පාලනයේ පැවැත්ම තහවුරු වනු ඇත.

ජනමාධ්‍ය යනු දේශපාලන සමාජානුයෝජන ක්‍රියාවලියෙහි එක් ප්‍රධාන කාරකයක් වේ. දේශපාලන සමාජානුයෝජනය යනුවෙන් හඳුන්වන්නේ තමන් ජීවත්වන දේශපාලන ක්‍රමයට පුද්ගලයා හුරු කිරීමේ හෙවත් අනුගත කිරීමේ ක්‍රියාදාමය යි. සමාජයේ දේශපාලන ආකල්ප ගොඩනැගීම එම ආකල්ප වෙත ජනතාව නැඹුරු කිරීම දේශපාලන ක්‍රමයේ මූලිකාංග ජනතාවට හඳුන්වා දීම, දේශපාලන ක්‍රමයේ ක්‍රියාකාරිත්වය සඳහා ජනතාව නැඹුරු කරවීම යනාදී කටයුතු ජනමාධ්‍ය විසින් ඉටු කරනු ලැබේ.

සමාජයේ මිනිස් නිදහස හා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම උදෙසා මැදිහත්වීම ජනමාධ්‍යයේ තවත් කාර්යයකි. එම කාර්ය දේශපාලන පක්ෂ අභිබවමින් ඉටු කිරීමට වර්තමානය වන විට ජනමාධ්‍යවලට හැකි වී තිබේ.

ආණ්ඩුවේ ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියේ දී ජනතාවගේ ඉල්ලීම්, ආශාවන්, අපේක්ෂාවන් හා විරෝධතාවන් ආණ්ඩුව කරා රැගෙන යන විචල්‍යයක් වශයෙන් ද ජනමාධ්‍ය හඳුනා ගැනීමට පුළුවන.

ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයන් හි ආණ්ඩු පිහිටුවීම හා ආණ්ඩු පෙරලා දැමීම සම්බන්ධයෙන් ජනතාව පෙළගැස්වීම සඳහා ජනමාධ්‍ය ප්‍රබල ලෙස මැදිහත් වීමට පියවර ගනී. මෑත කාලයේ මැදපෙරදිග කලාපයේ පැතිරගිය 'අරාබි වසන්තය' සමස්ත මැදපෙරදිග කලාපයෙහි ප්‍රබල විපර්යාසයක් ඇති කරන ලදි. එම ක්‍රියාදාමය හැසිර වූ ප්‍රමුඛතම බලවේගය වූයේ ජනමාධ්‍ය යි.

මහජනතාවගේ දේශපාලන හා සමාජ දැනුම වර්ධනය කිරීමේ ලා පුළුල් දායකත්වයක් ජනමාධ්‍ය විසින් දරනු ලැබේ. ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයෙහි තිරසාර පැවැත්ම සඳහා ජනතාවගේ දේශපාලන දැනුම ඉහළ මට්ටමක පැවතීම අත්‍යවශ්‍ය වෙයි.

මහත්වරුන්ගේ දේශපාලන ක්‍රීඩාවට පහසුකම් සැපයීම ජනමාධ්‍යයේ තවත් කාර්යයකි. දේශපාලනය යනු ප්‍රතිවිරුද්ධ කණ්ඩායම් අතර ඇතිවන බල අරගලය වේ. ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමවල එම බල අරගලය ඇති වන්නේ සංවාදශීලී ලෙසය. එනම් ප්‍රතිවිරුද්ධ ප්‍රතිපත්ති අතර ඇතිවන විවෘත ගැටුමක් ලෙසය. මෙහිදී එම වාද විවාදයන් ජනතාව හමුවට ගෙනයාම සඳහා ආධාරකයක් ලෙස ජනමාධ්‍ය කටයුතු කරයි.

ඉහත දැක්වූ කාර්යයන් නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා සමාජයෙහි නිදහස තහවුරු වී තිබිය යුතුය. ජනමාධ්‍යවලට නිදහසේ ක්‍රියාකිරීමට අවස්ථාව උදා වන්නේ ද එම වාතාවරණය තුළ ය. විශේෂයෙන්ම මූලික නීතිය මගින් භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස තහවුරු කර තිබිය යුතු ය. ලෝකයේ දියුණු ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමවල ඉතාමත්ම පුළුල් මාධ්‍ය නිදහසක් තහවුරු කර තිබේ. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ යහපැවැත්ම සඳහා එය අත්‍යවශ්‍ය කොන්දේසියක් වී තිබේ.

එහෙත් අඩු දියුණු දේශපාලන ක්‍රමයන් හි දේශපාලන අධිකාරිය හා නිදහස් මාධ්‍ය අතර පවතින්නේ ප්‍රතිවිරුද්ධ සම්බන්ධයකි. දේශපාලන අධිකාරියේ අයුතු ක්‍රියාවන් විවේචනය කිරීමේ දී මාධ්‍ය දැඩි ලෙස මර්දනය කිරීමට දේශපාලන අධිකාරිය කටයුතු කරයි. මෙසේ ජනමාධ්‍ය මර්දනය කිරීම මගින් ජනතාවගේ ආණ්ඩු විරෝධය යටපත් කර දැමීමට දේශපාලන අධිකාරිය උත්සාහ කරයි.

ඒකාධිපති පාලන ක්‍රමයන් හි මෙන්ම සමාජවාදී පාලන ක්‍රමයන් හි ද ජනමාධ්‍ය නිදහස ප්‍රබල ලෙස සීමා කරනු ලැබේ. එවැනි පාලන ක්‍රමයන් හි සියලුම ජනමාධ්‍යයන් රාජ්‍යයේ පාලනයට යටත් කරනු ලැබේ. එමගින් ආණ්ඩු විරෝධී මහජන මතය මුළුමනින්ම යටපත් කෙරේ. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රම යටතේ ද රාජ්‍යයේ අයිතිය යටතේ ක්‍රියාත්මක වන ජනමාධ්‍ය ආයතන පැවතිය හැක. එහිදී සිදු වන්නේ ද අපක්ෂපාතීව තොරතුරු වාර්තා කිරීමට කිරීමට එම මාධ්‍ය කටයුතු කිරීම නොව රජයට පක්ෂග්‍රාහී ලෙස තොරතුරු වාර්තා කිරීම ය.

නිදහස් මාධ්‍ය පිළිබඳව අවධානය යොමු කිරීමේ දී පෙනී යන්නේ ජනමාධ්‍ය ආයතනවලින් බොහොමයක්ම ධනපති පන්තියේ ප්‍රාග්ධන ආයෝජනයෙන් ක්‍රියාත්මක වන බවය. එබැවින් එම ජනමාධ්‍ය ක්‍රියා කරන්නේ අවසාන විග්‍රහයේදී ප්‍රාග්ධන ආයෝජකයින්ගේ දේශපාලන න්‍යාය පත්‍රයන්ට අනුකූල බව ප්‍රකාශ කළ හැක.

**(iv)** **දේශපාලන පක්ෂ**

**අරමුණ : ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය තුළ දේශපාලන පක්ෂවල අවශ්‍යතාව සහ එහි ක්‍රියා කලාපය කුමක්ද යන්න පිළිබඳව අපේක්ෂකයන්ගේ දැනුම පරීක්ෂා කර බැලීම**

**පිළිතුරෙහි අන්තර්ගත විය යුතු වැදගත් කරුණු**

(අ) දේශපාලන පක්ෂ අර්ථකථනය කිරීම **(ලකුණු 02)**

(ආ) දේශපාලන පක්ෂ කාර්යයන් හා ක්‍රියා කලාපය **(ලකුණු 06)**

(ඇ) නිගමනය : **දේශපාලන පක්ෂ හා ප්‍රජාතන්ත්‍රවාදය අන්‍යෝන්‍ය වශයෙන් වෙන්කළ නොහැකි බව සහ තරඟකාරී දේශපාලන පක්ෂ ක්‍රමයකින් තොරව ප්‍රජාතන්ත්‍රවාදයට පැවතිය නොහැකි බව.** **(ලකුණු 02)**

'නූතන ප්‍රජාතන්ත්‍රවාදයේ අපූර්වතම සොයා ගැනීම' යනුවෙන් දේශපාලන පක්ෂ හඳුන්වනු ලැබේ. තරඟකාරී දේශපාලන පක්ෂ නොමැතිව නූතන ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කළ නොහැක. එහෙයින් දේශපාලන පක්ෂ සහ නූතන ප්‍රජාතන්ත්‍රවාදය අතර පවතින්නේ ප්‍රබල සම්බන්ධයකි. එනම් නූතන ප්‍රජාතන්ත්‍රවාදය සහ දේශපාලන පක්ෂ එකම කාසියක දෙපැත්තක් බඳු වේ. එසේ වුවද වර්තමානයේ දී ප්‍රජාතන්ත්‍රවාදී රටවල පමණක් නොව සමාජවාදී මෙන්ම ඒකාධිපති රටවල ද දේශපාලන පක්ෂ ක්‍රියාත්මක වේ.

දේශපාලන පක්ෂ පිළිබඳව පොදු නිර්වචනයක් නොමැති අතර එකිනෙකට ප්‍රතිවිරුද්ධ මත දෙකක් ඉදිරිපත් වී තිබේ. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී මතය අනුව 'දේශපාලන පක්ෂයක් යනු සංවිධානය වූ මහජන මතය වේ.' මාක්ස්වාදී මතය අනුව 'දේශපාලන පක්ෂයක් යනු සමාජ පන්තියක උපකරණයක් වේ.' දේශපාලන පක්ෂ පිළිබඳව ඒකීය නිර්වචනයක් නොමැති බව මින් පැහැදිලි වේ.

නූතන ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමවල මහජනතාව සහ ආණ්ඩුව අතර සම්බන්ධතාවය ඇති කරන පුරුක ලෙස දේශපාලන පක්ෂ හඳුනා ගැනීමට පුළුවන. දේශපාලන පක්ෂවල ප්‍රමුඛ වැදගත්කම මෙය වේ.

දේශපාලන පක්ෂවල මූලික අරමුණ වන්නේ ආණ්ඩු බලය අත්පත් කර ගැනීම හා එම බලය හැසිරවීම ය. සමාජයේ අනෙකුත් කිසිදු ස්වේච්ඡා සංවිධානයක එම අරමුණ දක්නට නොලැබේ.

දේශපාලන පක්ෂවලට අනන්‍ය වූ සංවිධාන ව්‍යුහයක් පවතී. එම ව්‍යුහය පිරමීඩාකාර ව්‍යුහයකි. එම පිරමීඩයෙහි මුදුන් ලක්ෂය පක්ෂ නායකත්වය යි. පිරමීඩයෙහි තිරස් අක්ෂය පක්ෂ සාමාජිකත්වය වේ. පක්ෂ පිරමීඩයේ මුදුනේ සිට බිම් මට්ටම දක්වා විවිධ මට්ටම්වල පක්ෂ සංවිධාන ගොඩ නැගී තිබේ. පක්ෂ නායකත්වය විසින් තීරණ ගනු ලබන අතර එම තීරණ පක්ෂයේ බිම් මට්ටම දක්වා ගමන් කරයි. පක්ෂයේ විවිධ මට්ටම්වල නායකයින් සහ සාමාජිකයින් එම තීරණවලට හිස නැමිය යුතු ය. පක්ෂයේ ඉහළ සිට පහළ දක්වා සියලුම සාමාජිකයින් දැඩි විනයකට යටත් කරනු ලැබේ. එමගින් පක්ෂ නායක ආධිපත්‍ය දැඩි ලෙස ඉස්මතු වීම සිදු වී ඇත. රොබට් මිචෙල් නම් දේශපාලන විද්‍යාඥයා මෙය හැඳින්වූයේ 'කතිපයාධිකාරය පිළිබඳ අයෝමය නීති' ලෙස ය.

සෑම දේශපාලන පක්ෂයකටම එයටම උරුම වූ දේශපාලන මතවාදයක් පවතී. එම මතවාදය ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී හෝ සමාජවාදී හෝ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී හෝ විය හැක. එමෙන්ම දේශපාලන පක්ෂවල ප්‍රතිපත්ති සහ වැඩපිළිවෙළ අන්තර්ගතය වන අතර පක්ෂයක ස්වභාවය තීරණය වන්නේ එය පදනම් වී ඇති සමාජ පන්ති ස්ථරය මුල් කරගෙන ය.

**දේශපාලන පක්ෂවල කාර්යයන්**

- විසිරී ඇති මහජන මතය සංවිධානය කිරීම

  අපහැදිලි සහ අවුල් සහගත ජනතා කැමැත්ත ඒකාග්‍ර කිරීම දේශපාලන පක්ෂ විසින් සිදු කරනු ලැබේ. මැතිවරණවලදී ඡන්දදායකයින් නිශ්චිත දේශපාලන අරමුණක් කරා යොමු කරවීමට දේශපාලන පක්ෂ කටයුතු කරයි.

- සමාජ බලය අධිකාරී බලය බවට පත්කිරීම

  ජනතාව සහ ආණ්ඩුව සම්බන්ධ කිරීම හෙවත් ජනතා බලය ආණ්ඩු බලය බවට පරිවර්තනය කිරීම සිදු කරන්නේ දේශපාලන පක්ෂ විසිනි. ප්‍රජාතන්ත්‍රවාදය යටතේ දේශපාලන බලයෙහි අවසාන හිමිකරුවා වන්නේ මහජනතාව යි. එහෙත් ජනතාව සතු එම බලය අධිකාරී බලයක් නොවන අතර ජනතා බලය ආණ්ඩුව කරා රැගෙන ගොස් එම බලය අධිකාරී බලයක් බවට පත් කිරීමට දේශපාලන පක්ෂ කටයුතු කරයි.

- මිනිස් නිදහස හා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

රජය විසින් හෝ වෙනයම් සංවිධානයක් විසින් හෝ සමාජයේ මිනිස් නිදහස හා අයිතිවාසිකම් උල්ලංඝනය කරයි නම්, මිනිස් නිදහස හා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා මැදිහත් වෙමින් මහජනතාව සංවිධානය කරමින් දැඩි බලපෑමක් සිදු කිරීම විශේෂයෙන්ම විරුද්ධ පක්ෂයේ කාර්ය වේ. ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමවල ජනතාවගේ මුරබල්ලා ලෙස ක්‍රියාත්මක වන්නේ විරුද්ධ පක්ෂය යි.

- මහජනතාවගේ දේශපාලන අවබෝධය පුළුල් කිරීම

ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක යථා පැවැත්ම සඳහා ජනතාවගේ දේශපාලන අවබෝධය ඉහළ මට්ටමක පැවතිය යුතුය. දේශපාලන පක්ෂවලට සම්බන්ධ වීමෙන් දේශපාලන වශයෙන් ලබා ගන්නා අත්දැකීම් තුළින් ද පක්ෂ අභ්‍යන්තරයේ සිදු කෙරෙන අධ්‍යාපන කටයුතුවලින් ද පක්ෂ නිකුත් කරන දේශපාලන විග්‍රහයන් ඇතුලත් විවිධ ලිපි ලේඛන මගින් ද පක්ෂවල රැස්වීම් සහ දේශන ඇසුරින් ද මහජනතාවගේ දේශපාලන දැනුම වර්ධනය වනු ඇත.

- නායකයින් පුහුණු කිරීම

ජාතික මට්ටමේ දේශපාලන නායකයින් හා රාජ්‍ය තාන්ත්‍රිකයින් පුහුණු කිරීම හා නිර්මාණය කිරීම දේශපාලන පක්ෂ විසින් සිදු කරනු ලැබේ. දේශපාලන පක්ෂවල පහළ මට්ටමේ සිට නායකත්වය දක්වා ගමන් කිරීමේ දී ලැබෙන අත්දැකීම් සහ දැනුම උපයෝගී කරගෙන ජාතික මට්ටමේ නායකයෙකු බවට පත්වීමේ අවස්ථාව ඕනෑම පක්ෂ සාමාජිකයෙකුට හිමි වේ.

**3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්‍ෂණ, නිගමන හා යෝජනා :**




B කොටසින් වැඩිම අයදුම්කරුවන් පිරිසක් තෝරා ගෙන ඇත්තේ මෙම ප්‍රශ්නයයි. එම සංඛ්‍යාව මුළු අයදුම්කරුවන්ගෙන් 64% කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20 ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 45%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 29%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 19%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 7%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 16 හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 07%ක් වන අතර ලකුණු 05 හෝ ඊට අඩුවෙන් ලබාගත් පිරිස 45% කි. එමෙන්ම අයදුම්කරුවන්ගෙන් 48%ක්ම 06 - 15 අතර ලකුණු ලබා ගෙන ඇත.




මෙම ප්‍රශ්නය කොටස් 4කින් සමන්විත වන අතර ඉන් (ii) කොටසේ පහසුතාව 43% ක් වේ. එය වැඩි ම පහසුතාව වේ. ඉතිරි කොටස්වල පහසුතා මට්ටම 40%ට අඩු ය. පහසුතාව අඩු ම කොටස (i) වේ. එහි පහසුතාව 24% කි.

මෙම ප්‍රශ්නය කොටස් හතරකින් යුක්තය. ඒවායින් දෙකක් තෝරාගෙන පිළිතුරු ලිවිය යුතු විය. එක් කොටසකට හිමි ලකුණු ප්‍රමාණය 10ක් වේ. මෙම ප්‍රශ්නය අපේක්ෂකයින්ගෙන් 64%ක්ම තෝරාගෙන තිබුණි.

**I කොටස**

මෙම කොටස අඩු ම පහසුතාව දක්වා ඇති කොටස වන අතර එය 24%කි. අත්තනෝමතික හිතුවක්කාරී පාලනයකට එරෙහි ක්‍රියාත්මක වන සංරෝධකයක් ලෙස සිවිල් සමාජයේ වැදගත්කම අවධාරණය කිරීමට අපේක්ෂකයින්ට ඇති දැනුම පරීක්ෂා කිරීම මෙම ප්‍රශ්නයේ අරමුණ විය. නමුත් අපේක්ෂකයින් සාර්ථක පිළිතුරක් ගොඩ නැගීමට අපොහොසත් වී ඇත. සිවිල් සමාජය පිළිබඳව සංකල්පය පැරණි වුවද ඒ පිළිබඳව අපේක්ෂකයින්ගේ දැනුම හා අවබෝධය ප්‍රමාණවත් නොවූ බව මෙයින් පෙනී යන්නේ ය. මෙම මාතෘකාවට අදාලව සිවිල් සමාජයේ වගකීම හා ක්‍රියාකාරිත්වය පිළිබඳව නිදසුන් මගින් ප්‍රායෝගික දැනුම වර්ධනය කිරීමට කටයුතු කිරීමෙන් මෙම තත්ත්වය මග හරවා ගත හැකි ය.

**II කොටස**

මෙය මෙම ප්‍රශ්නයේ වැඩිම පහසුතාව දැක් වූ කොටස වේ. එය 43%ක් වේ. පසුගිය ප්‍රශ්න පත්‍රවල සඳහන් වූ ප්‍රශ්නයක් වීමත්, ජනමාධ්‍ය තුළ මෙම ප්‍රශ්නයට අදාළ කරුණු නිරන්තරයෙන් සාකච්ඡා කිරීමත්, එම කරුණු ශිෂ්‍ය ප්‍රජාවට සම්ප්‍රේෂණය වීමත් යනාදිය මෙම කොටසේ පහසුතාවය ඉහළ යාමට හේතුව ලෙස දැක්විය හැකිය. එහෙත් මෙම කොටසේ අපේක්ෂකයන් දක්වා ඇති දුර්වලතාව වන්නේ යහපාලන සංකල්පයේ මූලික සාධක විධිමත්ව සාකච්ඡා කොට නොතිබීම වේ. යහපාලන සංකල්පයේ ප්‍රායෝගික ක්‍රියාකාරිත්වය දේශපාලන සමාජයට බද්ධ කොට නිදසුන් මගින් පැහැදිලි කර මෙම තත්ත්වය මග හරවා ගත හැකිය.

**III කොටස**

මෙම කොටසේ පහසුතා මට්ටම 31%ක් වේ. මෙම ප්‍රශ්නයේ ජනමාධ්‍ය භාවිතය ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයට කෙතරම් වැදගත් වන්නේ ද? යන්න පිළිබඳව අපේක්ෂකයන්ට අවබෝධ කර ගැනීමට නොහැකි වී තිබේ. ජනමාධ්‍යයේ කාර්යභාරය හා වගකීම පිළිබඳ සිසුන් අතර විවාද තරඟ, කථික තරඟ පැවැත්වීම මගින් සිසු සාධන මට්ටම පෝෂණය කළ හැකිය.

**IV කොටස**

මෙම කොටස බොහෝ අවස්ථාවලදී ඇගයීමට ලක් කළ ප්‍රශ්නයක් වුවද එහි පහසුතාව වූයේ 35%කි. දේශපාලන පක්ෂවල කාර්යයන් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයට යොදා ගැනීම සඳහා අවශ්‍ය දැනුම සිසුන්ට නොමැති බව දක්නට ලැබිණි. දේශපාලන පක්ෂවල කාර්යයන් පිළිබඳව පිළිතුරු ලිවිය හැකි ආකෘතික දැනුම සාර්ථකව ගොඩ නැගීමට අපහසු වීම මෙහි දුර්වලතාවයට හේතු වේ.

දේශපාලන පක්ෂ කාර්යයන් පිළිබඳව දැනුම, කුසලතා වර්ධනයට අවශ්‍ය ව්‍යුහගත රචනා ලිවීම පක්ෂ භූමිකා පිළිබඳ නිදසුන් දැක්වීම මගින් දැනුම වර්ධනයට යොදා ගත හැකි වේ.

මෙම කොටසේ දැක්වෙන මාතෘකාව නිරන්තරයෙන්ම පාහේ ප්‍රශ්න සැකසීම සඳහා යොදා ගැනෙන පහසු තැනක් වුවද දක්වා තිබෙන පහසුතා මට්ටම වූයේ 35%ක ප්‍රතිශතයක්ය. පිළිතුරු පරීක්ෂාවේදී පෙනී ගියේ දේශපාලන පක්ෂවල කාර්යයන් පිළිබඳ අවශ්‍ය දැනුම විභාග අපේක්ෂකයින් බහුතරයකට නොමැති බවයි. මෙම මාතෘකාව සම්බන්ධයෙන් ලියවී ඇති පාඨ ග්‍රන්ථ විශාල ප්‍රමාණයක් තිබෙන අතර මෙම පාඨ ග්‍රන්ථ හදාරා අවශ්‍ය දැනුම වර්ධනය කර ගැනීමට සිසුන් පෙළඹවීම ගුරුවරුන් විසින් කළ යුතුය.

## 4 ප්‍රශ්නය

4. පහත දැක්වෙන ඒවායින් ඕනෑම **දෙකක්** පිළිබඳව සාකච්ඡා කරන්න.
   (i) ඇමෙරිකා එක්සත් ජනපදයේ ආණ්ඩුක්‍රමය තුළ විධායක බලය ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් පවතින සංවරණ
   (ii) ඉන්දියාවේ හෝ මහා බ්‍රිතාන්‍යයේ දේශපාලන විධායකය පත් කිරීම සහ තනතුරින් ඉවත් කිරීම හා සම්බන්ධ ක්‍රියාදාමය
   (iii) රාජ්‍ය ප්‍රතිපත්තිවල ස්වභාවය හෝ අන්තර්ජාතික දේශපාලනය තුළ රාජ්‍යයන්ගේ ජාතික ආශාවන්

**(i) ඇමෙරිකා එක්සත් ජනපදයේ ආණ්ඩුක්‍රමය තුළ විධායක බලය ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් පවතින සංවරණ**

**අරමුණ :** ඇමෙරිකානු ජනාධිපති ධූරය ලෝකයේ බලවත්ම විධායකය ලෙස සැලකුව ද විධායක බලය ක්‍රියාවට නැංවීම සංවරණය කිරීම මගින් ප්‍රජාතන්ත්‍රවාදී ජනාධිපති ධූරයක් ගොඩනගා තිබෙන ආකාරය පිළිබඳ අපේක්ෂකයන්ගේ අවබෝධය පරීක්ෂා කර බැලීම

**පිළිතුරෙහි අන්තර්ගත විය යුතු වැදගත් කරුණු**

(අ) විධායක බලතල පිළිබඳ අවබෝධය **(ලකුණු 02)**
(ආ) විධායක බලතල සංවරණය කිරීම සඳහා තිබෙන විධික්‍රම **(ලකුණු 06)**

(ඇ) නිගමනය : **ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමය හා යහපාලනය අතර සම්බන්ධතාවය ඇමෙරිකානු ආණ්ඩුක්‍රමය තුළ විධායක බලය සංවරණය කිරීම හා තුලනය කිරීම හරහා විධායකය ආඥාදායකත්වයක් බිහිවීම සීමා කර ඇති ආකාරය** **(ලකුණු 02)**

ඇමෙරිකා එක්සත් ජනපදයේ වර්තමානයේ දී ක්‍රියාත්මක වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නීතිගත වූයේ වර්ෂ 1789 දී ය. ව්‍යවස්ථා සම්පාදනය පිළිබඳ යෝජනා ඉදිරිපත් වූයේ වර්ෂ 1787 දී රැස් වූ ෆිලඩෙල්ෆියා සමුළුව මගිනි. ෆිලඩෙල්ෆියා සමුළු නියෝජිතයෝ ඒකාධිපතිත්වයට මෙන්ම මහජන ස්වාධිපත්‍යයට ද එක ලෙස බිය වූහ. ඇමෙරිකානු ජනපදවාසීන් බ්‍රිතාන්‍ය මව් රාජ්‍යයේ යටත්වැසියන්ව සිටියදී ඒකාධිපති පාලනයෙන් ලැබූ පීඩාකාරී අත්දැකීම් හේතු කොටගෙන මෙසේ ෆිලඩෙල්ෆියා සමුළු නියෝජිතයින් ඒකාධිපතිත්වයට බිය වූ අතර, ඔවුන් ධනපති පන්තියේ නියෝජිතයින් වූ බැවින් මහජනයාගේ බලයට ද බිය වූ බව දැක්විය හැක.

මේ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදකයින්ට මූලික වශයෙන් අවශ්‍ය වූයේ ඒකාධිපතිවාදය වළක්වා නිදහස තහවුරුවන ආකාරයේ මෙන්ම මහජන ස්වාධිපත්‍ය ඉස්මතු නොවන ආකාරයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමට ය. ඒ සඳහා ෆෙඩරල් ආණ්ඩුවේ ව්‍යුහය මොන්ටෙස්ක්‍යුගේ බලතල බෙදීමේ න්‍යාය මත ගොඩනගමින් එම ව්‍යුහයේ ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණ යන ආයතන අතර සංවරණ තුලන මූලධර්ම ආදේශ කිරීමට පියවර ගන්නා ලදි.

**ඇමෙරිකා එක්සත් ජනපදයේ ෆෙඩරල් ආණ්ඩුවේ ව්‍යුහය පහත සඳහන් පරිදි වේ.**

- ව්‍යවස්ථාදායකය - කොංග්‍රස් සභාව (නියෝජිත මන්ත්‍රී මණ්ඩලය සහ සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය)
- විධායකය - ජනාධිපති
- අධිකරණය - ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රමුඛ ෆෙඩරල් උසාවි

ෆෙඩරල් ආණ්ඩුවේ ඉහත සඳහන් ආයතන එකිනෙකින් ස්වාධීන කිරීම සඳහා ආණ්ඩුවේ නීති සම්පාදනය, නීති විධානය සහ විනිශ්චය යන කාර්යයන් පිළිවෙළින් ඒ ඒ ආයතනය වෙත වෙන් වෙන් වශයෙන් පැවරීමත්, එක් ආයතනයක සාමාජිකයින්ට අනෙක් ආයතනයක සාමාජිකත්වය හිමි නොවන ආකාරයේ විධිවිධාන සැලසීමත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සිදු කරන ලදී. මෙසේ ආණ්ඩුවේ බලතල බෙදීම සිදු කෙරුණි.

දෙවනුව ආණ්ඩුවේ ආයතන තුනෙහි බලතල අතර සමබරතාවය ඇති කිරීමටත් අනෙක් අතින් එක් ආයතනයක බලතලවලින් අනෙක් ආයතනයක බලය සංවරණය කිරීම සඳහා ව්‍යවස්ථාවෙහි විධිවිධාන සලසන ලදී.

මෙහිදී අවධානය යොමු කෙරෙන්නේ ෆෙඩරල් ආණ්ඩුවේ විධායකයේ ප්‍රධානියා වන ජනාධිපතිවරයා අත්තනෝමතිකභාවයට පත්වීම වැළැක්වීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි ඇතුළත් කරන ලද සංවරණයන් පිළිබඳව ය.

**කොංග්‍රසයේ බලතලවලින් ජනාධිපතිගේ බලය සංවරණය කිරීම සඳහා පැන වූ විධිවිධාන**

ජනාධිපතිවරයාගේ හමුදා කටයුතු හා මුදල් කටයුතු පාලනය කිරීම සඳහා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය වෙත පවරා ඇති බලතල අනුව, ජනාධිපතිවරයාගේ හමුදා මෙහෙයුම් සඳහා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයෙහි අනුමැතිය මූලික වශයෙන් ලබාගත යුතු අතර, ජනාධිපතිවරයාගේ හමුදා මෙහෙයුම් අවලංගු කිරීමේ බලය කොංග්‍රස් සභාව වෙත හිමි වේ. එමෙන් ම ජනාධිපතිවරයාගේ වාර්ෂික අයවැය ලේඛනය මූලික වශයෙන් නියෝජිත මන්ත්‍රී මණ්ඩලයෙන් අනුමත විය යුතු අතර, වාර්ෂික අයවැය ලේඛනයෙහි ඕනෑම සංශෝධනයක් හෝ වෙනසක් සිදු කිරීමට නියෝජිත මන්ත්‍රී මණ්ඩලය ඇතුළු කොංග්‍රස් සභාවට බලය තිබේ.

ජනාධිපතිවරයාගේ විදේශ ගිවිසුම් සම්බන්ධයෙන් වන බලතල සහ විදේශ තානාපතිවරුන්, රජයේ උසස් නිලධාරීන් හා උසස් අධිකරණ විනිශ්චයකාරවරුන් වැනි උසස් තනතුරු සඳහා පුද්ගලයින් පත් කිරීමේ බලතල පාලනය කිරීම සඳහා සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය වෙත ව්‍යවස්ථාවෙන් බලතල පවරා තිබේ. මේ අනුව ජනාධිපතිවරයාගේ විදේශ ගිවිසුම් සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයෙහි 2/3 බහුතර ඡන්දයකින් සම්මත විය යුතු අතර, ජනාධිපතිවරයාගේ ඕනෑම විදේශ ගිවිසුමක් අවලංගු කිරීමේ බලය සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයට පවතී. එමෙන් ම විදේශ තානාපතිවරුන්, රජයේ උසස් නිලධාරීන් පත් කිරීම හා උසස් අධිකරණ විනිශ්චයකාර පදවි සඳහා පුද්ගලයින් පත්කිරීමේ බලය ජනාධිපතිවරයාට තිබුන ද ඒ සම්බන්ධයෙන් සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයේ අනුමැතිය (2/3) ලබා ගැනීමට ජනාධිපතිවරයාට සිදු වේ. මෙහිදී එම තනතුරු සඳහා ජනාධිපතිවරයා ඉදිරිපත් කරන ඕනෑම නාම යෝජනාවක් ප්‍රතික්ෂේප කිරීමේ බලය සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයට පවතී.

ජනාධිපතිවරයාගේ අබලතාවක් හෝ අනිසි හැසිරීමක් මුල් කරගෙන දෝෂාභියෝග යෝජනාවක් මගින් ජනාධිපති ධූරයෙන් පහ කිරීමේ බලය ද කොංග්‍රසයට පවතී. (දෝෂාභියෝග යෝජනා ඉදිරිපත් කිරීමේ බලය නියෝජිත මන්ත්‍රී මණ්ඩලය වෙත ද, එම යෝජනා විභාග කොට තුනෙන් දෙකේ බහුතරයකින් සම්මත කොට ජනාධිපතිවරයා, ධූරයෙන් නෙරපා හැරීමේ බලය සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය වෙතද පවතී) මෙසේ කොංග්‍රස් මණ්ඩලයේ බලතලවලින් ජනාධිපතිවරයාගේ බලය සංවරණය කරනු ලැබේ.

**අධිකරණයෙහි බලතලවලින් ජනාධිපතිධූරයේ බලය සංවරණය කිරීම සඳහා පැන වූ විධිවිධාන**

ජනාධිපතිවරයාගේ විධායක ක්‍රියාවන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනිව ක්‍රියාත්මක වේ නම් නීතිය පසිඳලීම මගින් ජනාධිපතිවරයාගේ එම අනිසි ක්‍රියා පාලනය කිරීමේ බලය ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පවතී.

ජනාධිපතිවරයාට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ ෆෙඩරල් අධිකරණවල නඩු පැවරීමේ බලය ව්‍යවස්ථාව මගින් පුරවැසියන්ට පිරිනමා තිබේ.

ඉහත සඳහන් පරිදි එක්සත් ජනපද ෆෙඩරල් ආණ්ඩුවේ විධායක බලය සඳහා වූ සංවරණ ව්‍යවස්ථාවෙහි ඇතුළත් කර තිබුනද 19 ශතවර්ෂයේ අගභාගයේ පටන් ක්‍රමානුකූලව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතැම් විධිවිධාන තම වාසියට හරවා ගනිමින් ද, ව්‍යවස්ථාවට පරිබාහිර උපක්‍රම උපයෝගී කර ගනිමින් ද, කොංග්‍රසය වෙත හා අධිකරණය වෙත ව්‍යවස්ථාවෙන් පැවරූ සංවරණ යටපත් කර දමා ස්වකීය බලතල ඉස්මතු කර ගැනීමට ජනාධිපතිවරයාට හැකි වී තිබේ.

මේ අනුව ජනාධිපතිවරයාගේ හමුදා මෙහෙයවීමේ බලය සංවරණය කිරීම සඳහා කොංග්‍රසයේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය වෙත ව්‍යවස්ථාවෙන් පැවරූ බලතල යටපත් කිරීම පිණිස ජනාධිපති විසින් යුධ ඇවිලවීමේ උපක්‍රමය යොදා ගනී. එමගින් සතුරු හමුදාවකට එරෙහිව යුද්ධ කිරීමේ අවසරය කොංග්‍රසය වෙතින් ලබා ගැනීමට ජනාධිපතිට හැකි වී තිබේ. වර්තමානයේ දී ජනාධිපති යුධ මෙහෙයුම් සඳහා කොංග්‍රසයේ අනුමැතිය ලබා නොගෙන යුද්ධ ප්‍රකාශ කිරීමෙන් අනතුරුව ඒ සඳහා කොංග්‍රසයේ අනුමැතිය ඉල්ලා සිටී. එවැනි අවස්ථාවලදී එම ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට කොංග්‍රසයට නොහැකි වේ. මෙසේ උපායශීලීව ජනාධිපති යුධ බලය පිළිබඳ ඒකාධිකාරය තමන් අතට පත් කරගෙන තිබේ.

ජනාධිපතිවරයාගේ මූල්‍ය කටයුතු පාලනය කිරීමේ බලතල ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් කොංග්‍රසයෙහි නියෝජිත මන්ත්‍රී මණ්ඩලය වෙත පිරිනමා තිබේ. ඒ අනුව ජනාධිපතිවරයා ඉදිරිපත් කරන වාර්ෂික අයවැය ලේඛනයෙහි කුමන සංශෝධන සිදු කළ ද කොංග්‍රසයෙන් අනුමත වී එය ජනාධිපතිවරයා විසින් ක්‍රියාත්මක කරනු ලැබීමේ දී කොංග්‍රසය සිදු කළ සංශෝධන කිසිවක් සැලකිල්ලට නොගෙන අයවැය ලේඛන පිළිබඳ කාර්යාංශය මාර්ගයෙන් ස්වකීය අභිමතය පරිදි අයවැය ලේඛනය ක්‍රියාත්මක කිරීමට ජනාධිපතිවරයාට අවකාශය පවතී. එහෙයින් එක්සත් ජනපදයේ මූල්‍ය කටයුතු හැසිරවීම පිළිබඳ පූර්ණ බලය ජනාධිපතිවරයා වෙත ආරෝපණය වී තිබේ.

ජනාධිපතිගේ විදේශ කටයුතු සංවරණය කිරීමේ බලතල කොංග්‍රසයේ සෙනෙට් මණ්ඩලය වෙත පවරා තිබුන ද උපක්‍රමශීලීව සෙනෙට් මණ්ඩලයේ එම බලතල යටපත් කරමින් විදේශ කටයුතු සම්පූර්ණයෙන් ම තමන් අතට පත් කර ගැනීමට ජනාධිපතිට හැකි වී තිබේ. ජනාධිපතිවරයාගේ විදේශ ගිවිසුම් සඳහා සෙනෙට් සභාවේ 2/3ක බහුතර අනුමැතිය අවශ්‍ය වේ. මෙහිදී ජනාධිපතිවරයාගේ ඕනෑම විදේශ ගිවිසුමක් අහෝසි කිරීමේ බලය සෙනෙට් සභාවට පවතී. එහෙයින් වර්තමානයේ දී ජනාධිපතිවරයා විදේශ ගිවිසුම්වලට නොඑළඹෙන අතර ඒ වෙනුවට ජනාධිපතිවරයා විසින් විදේශ රාජ්‍යයන් සමඟ සම්බන්ධතා පවත්වනු ලබන්නේ 'විධායක සම්මුති' හෙවත් 'විදේශ සම්මුති' මාර්ගයෙනි. විධායක සම්මුති සඳහා අවශ්‍ය කරන්නේ කොංග්‍රසයේ සාමාන්‍ය බහුතර අනුමැතියකි.

විදේශ තානාපතිවරුන් පිළිගැනීමට ජනාධිපතිවරයාට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පැවරී ඇති බලතල විදේශ රාජ්‍යයන් පිළිගැනීම සඳහා ඔහු උපක්‍රමශීලීව උපයෝගී කරගනී. මෙසේ ජනාධිපතිවරයාගේ විදේශ කටයුතු සංවරණය කිරීමට සෙනෙට් සභාවට පවතින බලතල මගහරිමින් විදේශ කටයුතු ක්‍රියාත්මක කිරීමේ බලය තම ධූරය වෙත ආරෝපණය කර ගැනීමට ජනාධිපතිවරයාට අවකාශය සැලසී තිබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් උසස් තනතුරු පිරිනැමීමේ බලතල ජනාධිපතිවරයා වෙත පවරා ඇති අතර, ඒ සඳහා සෙනෙට් සභාවේ අනුමැතිය ලබා ගත යුතු වේ. මෙහිදී විදේශ තානාපතිවරුන් සහ අධිකරණ විනිසුරන් පත් කිරීම සඳහා සෙනෙට් සභාවේ 2/3ක බහුතර අනුමැතිය අවශ්‍ය වේ. ජනාධිපතිවරයා විසින් උසස් තනතුරු සඳහා ඉදිරිපත් කරනු ලබන ඕනෑම නාම යෝජනාවක් ප්‍රතික්ෂේප කිරීමේ බලය සෙනෙට් සභාවට පවතී. ජනාධිපතිවරයා විසින් රජයේ උසස් නිලධාරීන් ලෙස නම් කරන පුද්ගලයින් එම තනතුරුවලට පත් කිරීම සම්බන්ධයෙන් කිසිදු විරෝධයක් පල කිරීමට සෙනෙට් මණ්ඩලය ක්‍රියා නොකරන අතර, තානාපතිවරුන් සහ විනිසුරන් පත් කිරීමේ දී පමණක් ජනාධිපතිවරයා ඉදිරිපත් කරන නාම යෝජනා පිළිබඳව පුළුල් සොයා බැලීමක් සිදු කරයි. විශේෂයෙන් ම විනිශ්චයකාරවරුන් පත් කිරීම සම්බන්ධයෙන් සෙනෙට් මණ්ඩලය වැඩි අවධානයක් යොමු කරයි. මේ අනුව විනිශ්චයකාරවරුන් පත් කිරීමට ජනාධිපතිවරයාට ඇති බලය පමණක් සෙනෙට් මණ්ඩලයේ සංවරණයට ලක්වන අතර අනෙකුත් තනතුරුවලට ජනාධිපති සිදු කරන පත්වීම් සම්බන්ධයෙන් එබඳු සංවරණයක් ඇති නොවේ.

ජනාධිපතිට එරෙහිව දෝශාභියෝග චෝදනා ඉදිරිපත් කොට සම්මත කිරීමේ බලය කොංග්‍රස් සභාවට හිමිවීම තුළින් ජනාධිපතිගේ අබලතාවන් හා අනිසි හැසිරීම් සංවරණය කිරීමට කොංග්‍රසයට හැකි වී තිබේ. දෝශාභියෝග සම්බන්ධයෙන් කොංග්‍රසය වෙත ඍජු බලපෑමක් සිදු කිරීමට ජනාධිපති කටයුතු නොකළද ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාරවරයා සමඟ ඇති සියුම් සම්බන්ධතාව උපයෝගී කරගෙන දෝශාභියෝග තීන්දුව තමන්ට වාසිදායක කරගැනීමට ජනාධිපතිට හැකි වී තිබේ.

මේ ආකාරයෙන් පැහැදිලි වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ජනාධිපතිගේ බලතල සංවරණය කිරීම සඳහා කොංග්‍රසය වෙත පැවරූ බලතල ඍජු ලෙස ද, අධිකරණය වෙත පැවරූ බලතල අදෘශ්‍යමාන ලෙස ද (විනිශ්චයකාරයින් පත් කිරීම තුළින් ඇති කරගනු ලබන අනියම් සම්බන්ධය උපයෝගී කරගෙන) යටපත් කර දැමීමට ජනාධිපති කටයුතු කරයි. එමගින් ජනාධිපති ධූරයේ බලතල පුළුල් ලෙස ඉස්මතු වී තිබේ.

**(ii) ඉන්දියාවේ හෝ මහා බ්‍රිතාන්‍යයේ දේශපාලන විධායකය පත් කිරීම සහ තනතුරින් ඉවත් කිරීම හා සම්බන්ධ ක්‍රියාදාමය**

**අරමුණ : කැබිනට් ආණ්ඩුක්‍රමයක දේශපාලන විධායකය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද සහ එය තේරී පත්වන්නේ කෙසේද සහ තනතුරෙන් ඉවත් කළ හැක්කේ කෙසේද යන්න පිළිබඳව අපේක්ෂකයන්ගේ දැනුම පරීක්ෂා කර බැලීම**

**පිළිතුරෙහි අන්තර්ගත විය යුතු වැදගත් කරුණු**

(අ) දේශපාලන විධායකය පත්වන ආකාරය **(ලකුණු 04)**
(ආ) දේශපාලන විධායකය තනතුරෙන් ඉවත් කරන ආකාරය **(ලකුණු 04)**

**(ඇ) නිගමනය : කැබිනට් ආණ්ඩුක්‍රමයක දේශපාලන විධායකය නියමිත නිල කාලයට පෙර ඉවත් කිරීමට ඇති හැකියාව හා ප්‍රජාතන්ත්‍රවාදීකරණයේ ස්ථාවරභාවය අතර පවතින සම්බන්ධතාවයේ ස්වරූපය (ලකුණු 02)**

**ඉන්දියාවේ දේශපාලන විධායකය**

ඉන්දියානු ෆෙඩරල් ආණ්ඩුක්‍රමය 1950 ජනවාරි 26 දින ක්‍රියාත්මක වූ අතර එම ආණ්ඩුක්‍රමය මූලික වශයෙන් වෙස්මිනිස්ටර් පන්නයේ ආණ්ඩුක්‍රමයක් විය. එනම් එය කැබිනට් ආණ්ඩුක්‍රමයක් විය. ඉන්දියාවේ අභිනව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පාදනය කළ මණ්ඩලයේ සභාපති වූයේ ආචාර්ය රාජේන්ද්‍ර ප්‍රසාද් ය. ව්‍යවස්ථා සම්පාදනය භාර අමාත්‍යවරයා වූයේ ආචාර්ය බී. එම්. අම්බෙද්කාර් ය. මොවුන් බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රම සම්ප්‍රදාය පිළිබඳව දැඩි කැමැත්තකින් පසු වූ බැවින් ඉන්දියාවේ අභිනව ආණ්ඩුක්‍රමයේ ව්‍යුහය වෙස්මිනිස්ටර් සම්ප්‍රදාය මත ගොඩනැගීමට තීරණය කරන ලදී.

ඉන්දියානු ෆෙඩරල් ආණ්ඩුවේ (මධ්‍ය ආණ්ඩුව) දේශපාලන විධායකය වන්නේ අගමැති ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලය යි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව මහා මැතිවරණයකින් පසු ෆෙඩරල් ආණ්ඩුවේ ද්විමාණ්ඩලික ව්‍යවස්ථාදායකය වන පාර්ලිමේන්තුවේ පහළ මන්ත්‍රී මණ්ඩලය වන ලෝක් සභාවේ (LOCK) බහුතර විශ්වාසය දිනා ගන්නා මන්ත්‍රීවරයා හෙවත් බහුතර පක්ෂයේ නායකයා නාමික විධායක ජනාධිපති විසින් අගමැති ධූරයට පත්කරනු ලැබිය යුතු ය. එහිදී ලෝක් සභාවේ බහුතර විශ්වාසය දිනා ගනු ලබන මන්ත්‍රීවරයා උභය මන්ත්‍රී මණ්ඩලවල (පහළ මන්ත්‍රී මණ්ඩලය වන ලෝක් සභාවේ හෝ ඉහල මන්ත්‍රී මණ්ඩලය වන රාජ්‍ය සභාවේ) සාමාජිකයෙක් විය යුතු ය. නිදසුන් වශයෙන් 2004 සිට 2014 දක්වා ඉන්දියාවේ කොංග්‍රස් පක්ෂ ආණ්ඩුවේ අගමැති ධූරය දැරූ මන්මෝහන් සිං රාජ්‍ය සභාවේ නියෝජිතයෙකු විය.

1977 පෙර ලෝක් සභාවේ බහුතරය අඛණ්ඩව ම කොංග්‍රස් පක්ෂය විසින් දිනා ගනු ලැබූ බැවින් අගමැති තෝරා පත්කිරීම සම්බන්ධයෙන් අර්බුදකාරී තත්ත්වයකට මුහුණ දීමට ජනාධිපතිවරයාට සිදු වූයේ නැත. එහෙත් 1977න් පසුව ලෝක් සභාවේ බහුතරය තනි දේශපාලන පක්ෂයකට හිමි නොවීම හේතු කොටගෙන අගමැති පත් කිරීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා අවිනිශ්චිත තත්ත්වයන්ට මුහුණ පෑවේය. එහෙයින් 1977න් පසු ලෝක් සභාවේ අලුත් සම්ප්‍රදායක් බිහිවිය. එනම් ජනාධිපති විසින් අගමැති ධූරයට මන්ත්‍රීවරයෙක් පත්කොට සති දෙකක් ගතවන අවස්ථාවේ දී අගමැතිවරයාට විශ්වාසය පළ කිරීමේ යෝජනාවක් ලෝක් සභාවේ මන්ත්‍රීන් අතරින් බහුතරයක් විසින් සම්මත කිරීමේ සම්ප්‍රදාය වේ.

මේ සම්බන්ධයෙන් දැක්විය හැකි කැපී පෙනෙන නිදසුනක් වන්නේ වර්ෂ 1996 දී පැවැත් වූ මහා මැතිවරණයෙන් පසු අගමැති ධූරයට පත් වූ අතල් බිහාර් වජ්පායිගේ ධූර කාලය දින 13කට සීමා වීමයි. එයට හේතුව වූයේ ලෝක් සභාවේ බහුතර ඡන්දයෙන් අගමැතිවරයාට විශ්වාසය පල කිරීමේ යෝජනාව පරාජයට පත්වීමයි.

අගමැති ධූරයේ දිවුරුම් දීමෙන් පසු අගමැතිවරයාගේ උපදෙස් පරිදි ජනාධිපති විසින් අමාත්‍ය මණ්ඩලයේ අනිකුත් සාමාජිකයින් පත්කරනු ලැබේ. එමෙන්ම අමාත්‍යවරුන් වෙත විෂයයන් පැවරීමද අගමැතිගේ උපදෙස් පරිදි ජනාධිපති විසින් සිදු කරනු ලැබේ. මීට අමතරව රාජ්‍ය ඇමතිවරුන් පත් කිරීමේදී ද ජනාධිපති අගමැතිවරයාගේ උපදෙස් ලබාගනී.

අමාත්‍ය මණ්ඩලයේ ඕනෑම ඇමතිවරයෙකු හෝ රාජ්‍ය ඇමතිවරයෙකු ඕනෑම අවස්ථාවක දී අදාල තනතුරින් ඉවත් කිරීම සඳහා ජනාධිපතිවරයාට උපදෙස් දීමේ බලය අගමැතිවරයාට තිබේ.

ලෝක් සභාවේ සැසිවාර ආරම්භයේ ජනාධිපතිවරයා විසින් පවත්වනු ලබන ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය පරාජයට පත් වුවහොත් හෝ විසර්ජන පනතක් ලෝක් සභාවේ පරාජයට පත් වුවහොත් හෝ ආණ්ඩුවට විරුද්ධ විශ්වාස භංග යෝජනාවක් ලෝක් සභාවේ සම්මත වුවහොත් හෝ අගමැති ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලය ඉල්ලා අස්විය යුතු ය.

ඉහත සඳහන් තත්ත්වයන් ඇති නොවුනහොත් ලෝක් සභාවේ නිල කාලය අවසන් වී මහා මැතිවරණයක් පවත්වා ඊළඟ අමාත්‍ය මණ්ඩලය පත්වීමෙන් පසු අගමැති ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලයට ස්වකීය ධූර අහිමි වේ. ඉන්දියානු ෆෙඩරල් ආණ්ඩුවේ දේශපාලන විධායකය තනතුරුවලින් ඉවත් වන්නේ මේ ආකාරයෙනි.

බ්‍රිතාන්‍යයේ දේශපාලන විධායකය

**ඉන්දියාවේ දේශපාලන විධායකය සම්බන්ධයෙන් දක්වා ඇති ලකුණු දීමේ ක්‍රියා පිළිවෙත මේ සම්බන්ධයෙන් ද අනුගමනය කරන්න.**

ලෝකයේ කැබිනට් ආණ්ඩුක්‍රමයේ ආදර්ශය ලෙස පිළිගැනෙන්නේ බ්‍රිතාන්‍ය ආණ්ඩු ක්‍රමය යි. එම ආණ්ඩු ක්‍රමය වෙස්ට්මිනිස්ටර් ආණ්ඩු ක්‍රමය ලෙසද හඳුන්වනු ලැබේ. බ්‍රිතාන්‍ය ආණ්ඩු ක්‍රමය දිගු කාලීන විකාශනයක ප්‍රතිඵලයක් වේ. එම ආණ්ඩු ක්‍රමයේ සියලුම මූලධර්ම සම්ප්‍රදායන් ලෙස ක්‍රියාත්මක වේ.

බ්‍රිතාන්‍ය ආණ්ඩු ක්‍රමයෙහි දේශපාලන විධායකය අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය වේ. මහා මැතිවරණයකින් පසු පාර්ලිමේන්තුවේ පහල මන්ත්‍රී මණ්ඩලය වන මහජන මන්ත්‍රී මණ්ඩලයෙහි බහුතර පක්ෂයේ නායකයා නාමික විධායක රාජ්‍ය නායිකාව වන රැජින විසින් අගමැති ධූරයට පත් කරනු ලැබේ. මෙහිදී මහජන මන්ත්‍රී මණ්ඩලයේ බහුතර පක්ෂයේ නායකයා පාර්ලිමේන්තුවේ උභය මන්ත්‍රී මණ්ඩලවල (මහජන මන්ත්‍රී මණ්ඩලයේ හෝ සාමි මන්ත්‍රී මණ්ඩලයේ) සාමාජිකයෙකු විය යුතුයි.

අගමැති වීමෙන් පසු අගමැතිගේ උපදෙස් පරිදි රැජින විසින් කැබිනට් මණ්ඩලයේ සාමාජික ඇමතිවරුන් පත් කරනු ලබන අතර, ඔවුන් වෙත විෂයයන් පැවරීම ද, අගමැති උපදෙස් පරිදි රැජින විසින් සිදු කරයි. මීට අමතරව කැබිනට් නොවන ඇමතිවරුන් සහ උප ඇමතිවරුන් පත් කිරීම ද අගමැතිගේ උපදෙස් පරිදි රැජින විසින් සිදු කරනු ලැබේ.

ඕනෑම අවස්ථාවක කැබිනට් ඇමතිවරයෙක් හෝ කැබිනට් නොවන ඇමතිවරයෙක් හෝ උප ඇමතිවරයෙක් හෝ තනතුරෙන් ඉවත් කිරීම සඳහා රැජිනට උපදෙස් දීමේ බලය අගමැතිවරයාට පවතී.

පාර්ලිමේන්තුවේ මහජන මන්ත්‍රී මණ්ඩලයේ සැසිවාර ආරම්භයේ දී රැජින විසින් පවත්වනු ලබන රාජාසන කථාව මහජන මන්ත්‍රී මණ්ඩලය තුළ පරාජයට පත් වුවහොත් හෝ ආණ්ඩුවේ විසර්ජන පනතක් පාර්ලිමේන්තුවේ පරාජයට පත් වුවහොත් හෝ ආණ්ඩුවට විරුද්ධ විශ්වාසභංග යෝජනාවක් පාර්ලිමේන්තුවේ පරාජයට පත් වුවහොත් හෝ අගමැති ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලය ඉල්ලා අස්විය යුතුය. එසේ නොවුනහොත් පාර්ලිමේන්තුවේ මහජන මන්ත්‍රී මණ්ඩලයේ නිල කාලය අවසන් වී එය විසුරුවා හැර මහා මැතිවරණයක් පවත්වා ඉන් පසු අභිනව අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයක් පිහිටුවීමත් සමඟ ඒ වන තෙක් ක්‍රියාත්මක වූ අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයේ තනතුරු අහෝසි වී යයි.

**(iii)** රාජ්‍ය ප්‍රතිපත්තිවල ස්වභාවය හෝ අන්තර්ජාතික දේශපාලනය තුළ රාජ්‍යයන්ගේ ජාතික ආශාවන්

අරමුණ : රාජ්‍ය ප්‍රතිපත්තිවල ස්වභාවය හෝ අන්තර්ජාතික දේශපාලනය තුළ රාජ්‍යයන්ගේ ජාතික ආශාවන් රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳව අපේක්ෂකයන්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කර බැලීම

**පිළිතුරෙහි අන්තර්ගත විය යුතු වැදගත් කරුණු**

(අ) රාජ්‍ය ප්‍රතිපත්තිය හැඳින්වීම **(ලකුණු 03)**
(ආ) රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාවට නැංවීමේ ක්‍රියාදාමය ජීවන චක්‍රය ඇසුරෙන් **(ලකුණු 05)**

**(ඇ) නිගමනය : ආණ්ඩුවක පැවැත්ම සම්බන්ධයෙන් රාජ්‍ය ප්‍රතිපත්තිවල ඇති බලපෑම (ලකුණු 02)**

**රාජ්‍ය ප්‍රතිපත්තිවල ස්වභාවය**

ආණ්ඩුව විසින් කුමක් කරනවාද? නැතිනම් කුමක් කිරීමට අදහස් කරනවාද? එසේත් නැතිනම් කුමක් නොකිරීමට තීරණය කර තිබෙනවාද? යන්න පෙන්වා දෙන ආණ්ඩුවේ තීන්දු, තීරණ හා ප්‍රතිපත්ති රාජ්‍ය ප්‍රතිපත්ති ලෙස හඳුන්වා දිය හැක. වෙනත් ආකාරයකට කියනවා නම් දේශපාලන බලය ක්‍රියාවට නංවන ආණ්ඩුව විසින් පවතින යම් තත්ත්වයක් තුළ පැනනැගී ඇති දේශපාලන, ආර්ථික හා සමාජ ප්‍රශ්න විසඳීම සඳහා සැලසුම් කර ඇති සහ ක්‍රියාවට නංවන ප්‍රතිපත්ති රාජ්‍ය ප්‍රතිපත්ති ලෙස හඳුන්වා දිය හැක. ඉතාම සරලව කියනවා නම් රාජ්‍ය ප්‍රතිපත්ති යනුවෙන් අදහස් කරන්නේ දේශපාලන සමාජයක් කාලීනව මුහුණදෙන දේශපාලන, ආර්ථික හා සමාජ ප්‍රශ්න විසඳීම ඉලක්ක කොටගෙන ආණ්ඩුව විසින් තීරණය කොට ක්‍රියාවට නංවන ප්‍රතිපත්තීන් ය.

රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාවට නැංවීම අතිශය සංකීර්ණ ක්‍රියාවලියක් වේ. මෙම ක්‍රියාවලිය පෙන්නුම් කරන්නේ රාජ්‍ය ප්‍රතිපත්ති ජීවන චක්‍රය මගිනි. එය පහත දැක්වේ.



රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා සම්බන්ධ පාර්ශවකරුවන් පහත සඳහන් පරිදි වේ.

(1) විධායකය
(2) ව්‍යවස්ථාදායකය
(3) පරිපාලන නිලධාරීන් සහ පරිපාලන ආයතන
(4) දේශපාලන පක්ෂ
(5) බලපෑම් කණ්ඩායම්
(6) වෙනත් සිවිල් සංවිධාන
(7) පුද්ගලයන්
(8) අධිකරණය - නීති අර්ථකථනය කිරීම හරහා
(9) ජනමාධ්‍ය

ඉහත දැක්වූ කරුණුවලින් පෙනී යන්නේ ආණ්ඩුවක ක්‍රියාකාරිත්වය සඳහා යහ පැවැත්ම සඳහා මෙන්ම ජනතාවගේ භෞතික පැවැත්ම සම්බන්ධයෙන්ද රාජ්‍ය ප්‍රතිපත්ති අතිශය බලපෑමක් කරන බවය. ආණ්ඩුවක සාර්ථක අසාර්ථකභාවය මැනිය හැකි එක් නිර්ණායකයක් වන්නේ ආණ්ඩුව මුහුණදෙන දේශපාලන, ආර්ථික හා සමාජ ප්‍රශ්න විසඳීම සඳහා ආණ්ඩුව විසින් රාජ්‍ය ප්‍රතිපත්ති නිර්මාණය කරන ආකාරය සහ ඒවා ක්‍රියාවට නංවන ආකාරයත් ඒ මගින් ලබා ගන්නා ප්‍රතිඵල කෙතරම් සාධනීය මට්ටමක් පෙන්නුම් කරනවාද යන්නයි.

**අන්තර්ජාතික දේශපාලනය තුළ රාජ්‍යයන්ගේ අරමුණු**

**අරමුණ : අන්තර්ජාතික දේශපාලනයේ ප්‍රධාන රඟුම්කරුවන් වන නිදහස් ස්වාධිපති ජාතික රාජ්‍යයන් අන්තර්ජාතික දේශපාලනයේ නියැලීමේ අරමුණු මොනවාද යන්න පිළිබඳව අපේක්ෂකයන්ගේ අවබෝධය පරීක්ෂා කර බැලීම**

**පිළිතුරෙහි අන්තර්ගත විය යුතු වැදගත් කරුණු**

(අ) අන්තර්ජාතික දේශපාලනයේ ස්වභාවය පිළිබඳ කෙටි හැඳින්වීමක් (ලකුණු **01**)
(ආ) රාජ්‍යයන්ගේ ජාතික අරමුණු (ලකුණු **07**)

**(ඇ) නිගමනය : දේශීය හා අන්තර්ජාතික වශයෙන් රාජ්‍යයන්ගේ පැවැත්මේ ඇති වැදගත්කම (ලකුණු 02)**

අන්තර්ජාතික සමාජය තුළ රාජ්‍යයන් අතර කෙරෙන්නා වූ දේශපාලනය අන්තර්ජාතික දේශපාලනය ලෙස හැඳින්වේ. රාජ්‍යයන් අන්තර්ජාතික දේශපාලනයේ යෙදෙන්නේ තම ජාතික ආශාවන් නැතිනම් තම ජාතික අභිලාෂයන් සපුරා ගැනීම සඳහා ය. අන්තර්ජාතික දේශපාලනය තුළ රාජ්‍යයන්ගේ හැසිරීම මුළුමනින්ම දේශීය දේශපාලන සමාජයක් තුළ මිනිසුන්ගේ භෞතික සමාජ හැසිරීමට සමාන වේ. මිනිසුන්ගේ භෞතික සමාජ හැසිරීමේ මූලික අරමුණු වන්නේ ධනය අයත් කර ගැනීම, බලය අයත් කර ගැනීම සහ ලිංගික ජීවිතයක් ගත කිරීම නම් එයාකාරයටම අන්තර්ජාතික දේශපාලනය තුළ රාජ්‍යයන්ගේ අරමුණු වන්නේ හැකිතාක් දුරට ධනය අයත් කර ගැනීම, බලය වර්ධනය කර ගැනීම සහ දේශ සීමා ව්‍යාප්ත කර ගැනීම ය. මෙම මූලික අරමුණු තුන හා සම්බන්ධ තවත් අරමුණු කිහිපයක් තිබේ. ඒවා පහත සඳහන් පරිදි වේ.

(1) ජාතික ආරක්ෂාව තහවුරු කර ගැනීම. මෙයින් අදහස් කරන්නේ දේශපාලන ස්වාධීනත්වය, දේශ සීමා ඒකාග්‍රතාවය සහ භූමියේ භෞතික පැවැත්ම ආරක්ෂා කර ගැනීම ය.
(2) ජාතික ආර්ථිකය ඉහළ නැංවීම
(3) ජාතික සුබසාධන මට්ටම ඉහල නැංවීම
(4) ජාතික මතවාදය ආරක්ෂා කර ගැනීම. මෙයින් අදහස් කරන්නේ දේශපාලන, ආර්ථික හා සමාජ සංවර්ධනය අයත් කර ගැනීම උදෙසා රාජ්‍ය විශ්වාස කරන සහ අනුගමනය කරන දේශපාලන හා ආර්ථික මතවාදය යි.

(5) රටේ ජාතික අභිමානය ආරක්ෂා කර ගැනීම. මෙය අතිශයින්ම වැදගත් වේ. හේතුව ජාතික අභිමානය නැති වූ විට රට අන්තර්ජාතික සමාජය තුළ කොන්වීමයි. මේ සෑම අරමුණක්ම රටකට ඉටුකර ගැනීමේ හැකියාව තිබෙන්නේ රට සතු ජාතික බලයේ ප්‍රමාණය මතය. එබැවින් සෑම රාජ්‍යයකම මූලික අරමුණ විය යුත්තේ රටේ ජාතික බලය හැකිතාක් වැඩිකර ගැනීම ය.

**4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




B කොටසේ ප්‍රශ්න අතුරින් අවම තෝරා ගැනීමක් ඇති ප්‍රශ්නය මෙය වේ. මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 10% ක් පමණි. මෙම ප්‍රශ්නයට ලකුණු 20 ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 40%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 28%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 24%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 8%ක් ද,

ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 16 හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 08% ක් වන අතර ලකුණු 05 හෝ ඊට අඩුවෙන් ලබාගත් පිරිස 40% කි. එමෙන් ම අයදුම්කරුවන්ගෙන් 52% ක් 06 - 15 අතර ලකුණු ලබා ගෙන ඇත.




මෙම ප්‍රශ්නය කොටස් 3කින් සමන්විත වේ. පහසුතාව වැඩිම කොටස (ii) වේ. එහි පහසුතාව 38%කි. (iii) කොටස පහසුතාව අඩුම කොටස වේ. එහි පහසුතාව 25%කි.

**I කොටස**

මෙම කොටසෙහි පහසුතා මට්ටම 30%කි. ඇමරිකා එක්සත් ජනපදයේ විධායකය ලොව බලවත් ම විධායකය ලෙස සැලකුව ද විධායක බලය ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් පවතින සංවරණ නිසා ප්‍රජාතන්ත්‍රවාදී ජනාධිපති ධූරයක් ගොඩ නගා ඇති ආකාරය පිළිබඳව සිසුන්ගේ දැනුම පරීක්ෂා කිරීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කර තිබිණි. මෙහිදී සිසුන් වැඩි ප්‍රමාණයක් විධායකයේ කාර්යයන් පිළිබඳව අදහස් ඉදිරිපත් කර තිබුන ද, එම බලය සංවරණය කිරීමේ ක්‍රමවේදයන් පිළිබඳව වැඩි අවධානයක් යොමු කර තිබුනේ සීමිත කොටසකි. එහෙත් ඒ පිළිබඳව ඔවුන්ගේ දැනුම හා අවබෝධය ප්‍රමාණවත් නොවී ය. මෙයට හේතුව වන්නේ ආණ්ඩුක්‍රම පිළිබඳව හැදෑරීමේ දී ආයතනවල බලය සහ කාර්යයන් සංවරණය කිරීම පිළිබඳව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අඩු අවධානයක් යොමු කිරීම විය හැකි ය. එම නිසා ආණ්ඩුක්‍රමයන්හි විධායකයට හිමිවන බලතල සහ කාර්යයන් සහ එම කාර්යයන් සංවරණය කිරීම යන අංශයන් කෙරෙහි ද අවධානය යොමු කිරීම යෝග්‍ය වේ.

**II කොටස**

මෙම කොටසෙහි පහසුතා මට්ටම 38%කි. මෙම ප්‍රශ්නය අනු කොටස් දෙකකින් යුක්ත වේ. ඉන් එක් කොටසකින් ඉන්දියාවේ දේශපාලන විධායකයත්, දෙවන කොටසින් මහා බ්‍රිතාන්‍යයේ දේශපාලන විධායකයත් තනතුරට පත් කිරීම සහ තනතුරින් ඉවත් කිරීම පිළිබඳව අපේක්ෂකයින්ගේ දැනුම පරීක්ෂා කිරීම මෙහි අරමුණයි. එනම් කැබිනට් ක්‍රමයක විධායකය සහ එය පත් කිරීම සහ ඉවත් කිරීම පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම මෙහි අරමුණ වේ.

පිළිතුරු ලිවිය යුතු වන්නේ එක කොටසකට පමණකි. මෙහිදී අපේක්ෂකයන් වැඩි පිරිසක් දේශපාලන විධායකය පත් කරන ආකාරය පිළිබඳව කරුණු ඉදිරිපත් කර තිබුන ද දේශපාලන විධායකය තනතුරින් ඉවත් කිරීම පිළිබඳව කරුණු දැක්වීමට අසමත් වී තිබිණි. එමෙන්ම දේශපාලන විධායකයේ කාර්යයන් වලට අදාල නොවන කරුණු ද අපේක්ෂකයන් වැඩි ප්‍රමාණයක් ඉදිරිපත් කර තිබිණි. මෙහිදී අපේක්ෂකයන්ට ප්‍රශ්නයට අදාල වන පරිදි පිළිතුරු ඉදිරිපත් කිරීමේ හැකියාව අඩු බව පැහැදිලි වේ. මේ නිසා ප්‍රශ්නයෙන් අපේක්ෂා කරන පිළිතුර පමණක් ඉදිරිපත් කිරීම සඳහා අපේක්ෂකයන් දැනුවත් කිරීම වඩාත් යෝග්‍ය වේ.

**III කොටස**

මෙම කොටසෙහි පහසුතා මට්ටම 25%කි. රාජ්‍ය ප්‍රතිපත්තිවල ස්වභාවය හෝ අන්තර්ජාතික දේශපාලනය තුළ රාජ්‍යයන්ගේ ජාතික ආශාවන් පිළිබඳව අපේක්ෂකයන්ගේ දැනුම පරීක්ෂා කිරීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කර තිබිණි. මෙම ප්‍රශ්නය අනුකොටස් දෙකකින් යුක්ත වන අතර අපේක්ෂකයන් පිළිතුරු ලිවිය යුත්තේ ඉන් එක කොටසකට පමණි. මෙය අපේක්ෂකයන් අඩුවෙන්ම තෝරාගෙන තිබුණු ප්‍රශ්නයකි. මෙම ප්‍රශ්නය තෝරාගෙන සිටි සිසුන් අතරින් ද වැඩි ප්‍රමාණයක් රාජ්‍ය ප්‍රතිපත්ති සහ අන්තර්ජාතික දේශපාලනය පිළිබඳව නිවැරදි කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වී තිබිණ. විධිමත් අධ්‍යයනයකින් බැහැරව අවිධිමත් ලෙසින් පිළිතුරු සපයා තිබිණි. මෙයට හේතුව මෙම මාතෘකාවන් පිළිබඳව විෂය නිර්දේශය අවසානයේ සාකච්ඡා කරන නිසා අපේක්ෂකයන්ගේ උනන්දුව අඩු වී තිබීම ය. විෂය මාතෘකාවට අදාල කරුණු පන්ති කාමරය තුළ ඉගැන්වීමට ගුරුවරුන් වග බලා ගත යුතු ය.

## C කොටස

### 5 ප්‍රශ්නය

5. "ලංකාව වැඩවසම් ක්‍රමයෙන් ධනවාදයට පරිවර්තනය වීමේ ක්‍රියාදාමයට පදනම දැමුයේ කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණය මගිනි." ඔබ එකඟ වන්නේද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

**අරමුණ : කෝල්බෲක්-කැමරන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ශ්‍රී ලංකාව දේශපාලන, ආර්ථික හා සමාජීය වශයෙන් නවීකරණය වීම කෙරෙහි කරන ලද බලපෑම පිළිබඳව අපේක්ෂකයන්ගේ අවබෝධය පරීක්ෂා කර බැලීම**

**පිළිතුරෙහි අන්තර්ගත විය යුතු වැදගත් කරුණු**

(අ) කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණ **(ලකුණු 08)**

(ආ) ඒවායේ ප්‍රතිඵලය ලෙස ලංකාව වැඩවසම්වාදයෙන් ධනවාදයට පරිවර්තනය වූ ආකාරය **(ලකුණු 08)**

**(ඇ) නිගමනය : යහපත් හා අයහපත් ප්‍රතිඵල පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් (ලකුණු 04)**

කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණවල එක් අරමුණක් වූයේ ලංකාව තුළ වාණිජ හා ධනේශ්වර සමාජයක් නිර්මාණය කිරීම ය. නමුත් මේ සඳහා පැවති ප්‍රධාන ම බාධාව වූයේ ඒ වනවිට දිවයින තුළ පැවති වැඩවසම් ආර්ථික ක්‍රමය යි. සියවස් ගණනාවක් මුළුල්ලේ ලංකාව තුළ පැවති රාජාණ්ඩු පාලන ක්‍රමය යටතේ ලංකාවේ ආර්ථික ක්‍රමය ගොඩනැගී තිබුනේ වැඩවසම් ක්‍රමය පදනම් කරගෙන ය. මෙම ක්‍රමයේ මූලික ලක්ෂණය වූයේ ඉඩමට ශ්‍රමය බැඳ තබා තිබීම ය. මෙම හේතුවෙන් ශ්‍රමය සංචලනය නොවූවා පමණක් නොව නිදහසේ ශ්‍රමය විකිණීමට ද ශ්‍රමිකයින්ට නොහැකි විය. අනෙක් අතට ඉතාම දැඩි කුල ක්‍රමයක් පැවතීම කෙරෙහි ද වැඩවසම් ආර්ථික ක්‍රමය බලපෑවේ ය. ලංකාව තුළ වාණිජ හා ධනේශ්වර සමාජ ක්‍රමයක් ඇති කිරීමට නම් අනිවාර්යෙන් ම කළ යුතු දෙය වන්නේ නිදහස් ශ්‍රම වෙළෙඳපොළක් නිර්මාණය කිරීම බව තේරුම් ගන්නා කෝල්බෲක් ඒ කෙරෙහි පැවති ප්‍රධාන ම බාධකය වූ වැඩවසම් ක්‍රමය අහෝසි කිරීමට යෝජනා කළේ ය. මෙහි ප්‍රතිඵලය වූයේ ඉඩමට බැඳ තබා තිබුන ශ්‍රමය නිදහස් වීම ය. ඒ හා බැඳී තිබුන කුල ක්‍රමය අඩපණ වීමය. ශ්‍රමය නිදහසේ සංචලනය වීමට පටන් ගැනීම ය. නිදහස් ශ්‍රම වෙළෙඳපොළක් නිර්මාණය වීම ය. වැඩවසම් ක්‍රමයෙන් ධනවාදයට පරිවර්තනය වීමේ මූලික අඩිතාලම වැටීම ය.

ලංකාව තුළ වාණිජ හා ධනපති සමාජ ක්‍රමයක් නිර්මාණය කිරීමට එරෙහිව පැවති අනෙක් බාධකය ලෙස කෝල්බෲක් දුටුවේ ආයෝජන හැකියාව සහිත ශක්තිමත් ව්‍යවසායක පන්තියක් නොසිටීම සහ ඒ සඳහා අවශ්‍ය නිදහස් ආයෝජන පරිසරයක් නොතිබීම ය. දේශීය ව්‍යවසායක පන්තියක් මේ වනවිට බිහිවී නොතිබුනු අතර අනෙක් අතින් නිෂ්පාදනය හා වෙළෙඳාම පිළිබඳව පවත්වාගෙන ගිය රාජ්‍ය ඒකාධිකාරය හේතුවෙන් නිදහස් හා තරඟකාරී ව්‍යවසායක පරිසරයක් බිහිවීම වැලකී ගොස් තිබුණි. මෙම ප්‍රශ්නයට විසඳුම ලෙස කෝල්බෲක් දුටුවේ එක් අතකින් විදේශීය ආයෝජකයින්ට ලංකාවට පැමිණ නිදහසේ ආයෝජනය කිරීමට දොර විවෘත කිරීම ය. මේ සඳහා අවශ්‍යයෙන්ම කළයුතු දෙයක් ලෙස කෝල්බෲක් දුටුවේ කුරුඳු, කරදමුංගු සහ කෝපි යන වාණිජ වගාවන් ප්‍රධාන අනෙකුත් නිෂ්පාදන හා වෙළඳාම් ක්ෂේත්‍ර තුළ රජය පවත්වා ගෙනගිය රාජ්‍ය ඒකාධිකාරය අහෝසි කිරීම ය. එමගින් නිදහස් වෙළෙඳපොළ තරඟකාරිත්වයක් බිහිවිය හැකි බව තේරුම් ගන්නා කෝල්බෲක් යෝජනා කළේ වාණිජ ක්ෂේත්‍රය තුළ රාජ්‍ය පවත්වාගෙන ගිය වෙළෙඳ ඒකාධිකාරය අහෝසි කිරීමට ය.

ලංකාව තුළ වාණිජ හා ධනපති සමාජ ක්‍රමයක් ගොඩනගා එය ස්ථාවර පදනමක් යටතේ පවත්වාගෙන යාමට නම් දේශීය ධනපති පන්තියක පැවැත්මේ අවශ්‍යතාවය පිළිබඳව කෝල්බෲක් අවබෝධ කරගෙන සිටියේ ය. මේ සඳහා අවශ්‍ය පරිසරය ගොඩනැගීම පිණිස කෝල්බෲක් ඉංග්‍රීසි භාෂාව රාජ්‍ය භාෂාව කිරීමට සහ ස්වදේශිකයින්ට සිවිල් සේවයට ඇතුල් වීමට දොර විවෘත කිරීමට ද යෝජනා කළේ ය. මෙම මූලාශ්‍ර ඔස්සේ බිහිවන ස්වදේශික මධ්‍යම පන්තිය ධනේශ්වර ක්‍රමයේ වර්ධනය උදෙසා ව්‍යවසායකයින් ලෙස ක්‍රියා කරමින් දායක වනු ඇතැයි කෝල්බෲක් විශ්වාස කළේ ය.

මෙයාකාරයට බිහිවෙන ව්‍යවසායික පන්තියට තම ධනය ආයෝජනය කිරීම සඳහා අවශ්‍ය භූමිය සැපයීම පිළිබඳව මීළඟට කෝල්බෲක් අවධානය යොමු කළේ ය. මේ සඳහා රජය සතු කැලෑ ඉඩම් අඩු මුදලකට ව්‍යවසායකයින්ට විකිණිය යුතු බවට යෝජනා කෙරුණි. මීළඟට කෝල්බෲක් අවධානය යොමු කරන්නේ ව්‍යවසායක ශක්තීන් තිබුණද එම හැකියාවෙන් ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය මූල්‍ය ශක්තිය නොමැති අය කෙරෙහි ය. එම බාධකය මගහරවාලීම අරමුණු කොටගෙන තැන්පතු බැංකුවක් පිහිටුවීමට යෝජනා කරයි. මේවාට අමතරව රාජ්‍ය සේවකයින්ට ව්‍යවසායික කටයුතුවල නියැලීමට ඉඩදිය යුතු බවට ද ඔහු යෝජනා කළේ ය.

වාණිජ හා ධනපති සමාජ ක්‍රමයක් ලංකාව තුළ නිර්මාණය කිරීමට නම් ආර්ථික ප්‍රතිසංස්කරණ යෝජනා පමණක් ප්‍රමාණවත් නොවන බව තේරුම් ගත් කෝල්බෲක් ඒ සඳහා ලිබරල් දේශපාලන පරිසරයක් තිබිය යුතු බව පෙන්වා දුන්නේ ය. එම ලිබරල් දේශපාලන පරිසරය නිර්මාණය කිරීම සඳහා ඔහු විසින් ආණ්ඩුකාරයාගේ බලතල අඩු කිරීමටත්, විධායක සහ ව්‍යවස්ථාදායක සභා දෙකක් පිහිටුවීමටත්, ලංකාව එක්සත් රාජ්‍යයක් ලෙස සංවිධානය කිරීමටත්, පැවති පළාත් දහසය පහ දක්වා අඩු කොට ඒකීය පරිපාලන ක්‍රමයක් ගොඩ නැගීමටත් යෝජනා කළේ ය. කෝල්බෲක් යෝජනා තවදුරටත් ශක්තිමත් වූයේ කැමරන්ගේ අධිකරණ ප්‍රතිසංස්කරණ යෝජනා මගිනි.

ඉහතින් දැක්වූ යෝජනා සියල්ල එකට ගෙන සළකා බලන විට පෙනී යන්නේ ලාංකීය සමාජය තුළ චිරාත් කාලයක් මුළුල්ලේ මුල් බැසගෙන තිබූ වැඩවසම් ආර්ථික රටාවෙන් සමාජය මුදවාගෙන එය වාණිජ හා ධනේශ්වර සමාජ ක්‍රමයක් බවට පරිවර්තනය කිරීම සඳහා අවශ්‍ය අත්තිවාරම දැමුයේ කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණ යෝජනා මගින් වන බව ය.

**5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




C කොටසේ ප්‍රශ්න අතරින් 5 ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 38% කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20 ක් හිමි වේ.
ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 33%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 31%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 26%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 10%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 16 හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 10%ක් වන අතර ලකුණු 05 හෝ ඊට අඩුවෙන් ලබාගත් පිරිස 33%කි. එමෙන් ම අයදුම්කරුවන්ගෙන් 57%ක් ම 06 - 15 අතර ලකුණු ලබා ගෙන ඇත.




මෙම ප්‍රශ්නයට 38%ක පහසුතාවක් දක්වා ඇත.

දේශපාලන විද්‍යාව II ප්‍රශ්න පත්‍රයේ C කොටසේ දැක්වෙන I ප්‍රශ්නයේ අරමුණ වූයේ කෝල්බෲක් කැමරන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ශ්‍රී ලංකාවේ දේශපාලන, ආර්ථික හා සමාජයීය වශයෙන් නවීකරණය වීම කෙරෙහි කරන ලද බලපෑම පිළිබඳව විභාග අපේක්ෂකයින්ගේ අවබෝධය පරීක්ෂා කර බැලීම ය.

කෝල්බෲක් කැමරන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය හා එමගින් ශ්‍රී ලංකාව අත් කරගත් ප්‍රතිඵල පිළිබඳව කිහිප අවස්ථාවකදී ම ප්‍රශ්න ඉදිරිපත් කර තිබිණි. මෙවර ප්‍රශ්නයේ මුහුණුවර වෙනස් වුවද අපේක්ෂිත පිළිතුර පසුගිය ප්‍රශ්නවලට ලබා දුන් පිළිතුරුවලට බොහෝ සෙයින් සමාන විය. එනිසා මෙම ප්‍රශ්නය විභාග අපේක්ෂකයින්ට ඉතා පහසු ප්‍රශ්නයක් විය යුතුව තිබිණි.

මෙම ප්‍රශ්නය සඳහා වූ පහසුතාව 38%ක් වූ අතර, අපේක්ෂකයින්ගෙන් 33%ක් ලබා ගත් ලකුණු ප්‍රමාණය 0-5 අතර විය. විභාග අපේක්ෂකයින්ගෙන් හරි අඩකටත් වඩා එනම් 64%ක් ම ලකුණු 10ට අඩුවෙන් ලබා ඇත. මෙයින් පැහැදිලි වන්නේ කෝල්බෲක් කැමරන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගින් ශ්‍රී ලංකාව දේශපාලන, ආර්ථික හා සමාජයීය වශයෙන් නවීකරණය වූ ආකාරය පිළිබඳව අපේක්ෂකයින් තුළ පවතින අවබෝධය ප්‍රමාණවත් නොවන බව ය.

මෙම තත්ත්වය වළකා ගැනීම පිණිස ගත හැකි පියවර වන්නේ මෙම ප්‍රතිසංස්කරණය පිළිබඳ පන්ති කාමරය තුළ විධිමත් විශ්ලේෂණයක් කිරීම, එයට අදාළ පොත පත පරිශීලනය කරවීම, පසුගිය විභාගයන් හි දේශපාලන විද්‍යාව විෂය පිළිබඳ ලකුණු දීමේ පටිපාටි පරිහරණයට සිසුන් උනන්දු කරවීම ආදිය යි.

## 6 ප්‍රශ්නය

6. පහත දැක්වෙන ඒවායින් ඕනෑම දෙකක් විස්තර කරන්න.

(i) 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණවල සමාජ-ආර්ථික හා දේශපාලන ප්‍රතිඵල

(ii) රාජ්‍ය සේවයේ **හෝ** අධිකරණ සේවයේ ස්වාධීනත්වය පවත්වාගෙන යාම සඳහා සෝල්බරි ව්‍යවස්ථාව මගින් සැපයූ ව්‍යවස්ථාමය ආරක්ෂණ විධිවිධාන

(iii) අධිකරණ සේවය **හෝ** රාජ්‍ය සේවය පාලනය කිරීම සඳහා 1972 ව්‍යවස්ථාව මගින් සැපයූ ව්‍යවස්ථාමය විධිවිධාන

(iv) ජනාධිපතිවරයාගේ තත්ත්වය, බලතල හා කාර්යය සම්බන්ධයෙන් 19වන ව්‍යවස්ථා සංශෝධනයෙන් සිදු කළ වෙනස්කම්

**(i) ඩොනමෝර් ප්‍රතිසංස්කරණවල සමාජ-ආර්ථික හා දේශපාලන ප්‍රතිඵල**

අරමුණ : **1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ සමාජ, ආර්ථික හා දේශපාලන ප්‍රතිඵල පිළිබඳ අපේක්ෂකයන්ගේ දැනුම පරීක්ෂා කර බැලීම**

**පිළිතුරෙහි අන්තර්ගත විය යුතු වැදගත් කරුණු**

(අ) ඩොනමෝර් ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම **(ලකුණු 02)**

(ආ) ඒවායේ දේශපාලනික, ආර්ථික හා සමාජ ප්‍රතිඵල හොඳ හා නරක තුලනාත්මක අධ්‍යයනයක් **(ලකුණු 06)**

**(ඇ) නිගමනය : ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ ප්‍රතිඵල පිළිබඳ තක්සේරුව (ලකුණු 02)**

ලංකාව නිදහස ලැබීමට ප්‍රථමයෙන් සිදු කළ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අතුරින් මෙරට තුළ දේශපාලන, ආර්ථික හා සමාජ සංවර්ධනය කෙරෙහි ඉතාම ඇඩි බලපෑමක් කළ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය ලෙස 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය හඳුන්වා දිය හැක.

ඩොනමෝර් ප්‍රතිසංස්කරණවල සමාජ-ආර්ථික හා දේශපාලන ප්‍රතිඵල තේරුම් ගැනීමට නම් ප්‍රථමයෙන් කළ යුත්තේ එම ප්‍රතිසංස්කරණ මොනවාද යන්න සොයා බැලීම ය. ඩොනමෝර් කොමිසමේ ප්‍රධාන යෝජනා පහත සඳහන් පරිදි වේ.

(1) සර්වජන ඡන්ද බලය ප්‍රදානය කිරීම
(2) වාර්ගික නියෝජනය අහෝසි කිරීම
(3) ප්‍රාදේශීය නියෝජනය පුළුල් කිරීම
(4) 7/10 විධායක බලතල පවරා දීම
(5) විධායක කාරක සභා ක්‍රමය හඳුන්වා දීම
(6) රාජ්‍ය මන්ත්‍රණ සභාව හඳුන්වා දීම

මේ සෑම යෝජනාවක් ම ලංකාව තුළ සමාජ, ආර්ථික සහ දේශපාලන යන ක්ෂේත්‍රයන්හි විවිධ වෙනස්වීම් ඇතිවීම කෙරෙහි බලපෑ අතර එම වෙනස්කම් පහත සඳහන් ආකාරයට දැක්විය හැක.

(1) නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයට ජනතාව හුරු පුරුදු වීම

ප්‍රජාතන්ත්‍රවාදී ආකාරයට මැතිවරණ ක්‍රියාදාමය හරහා පාලකයන් පත්කර ගැනීමට හා වෙනස් කිරීමට ජනතාව පුරුදු වීම මෙයින් අදහස් වේ. ලංකාව තුළ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය ස්ථාපිත වී වර්ධනය වන්නේ මෙම පදනම මතය. මේ කෙරෙහි බලපෑවේ සර්වජන ඡන්ද බලය ප්‍රදානය කිරීම ය.

(2) වගකීමේ ආණ්ඩුක්‍රමයට හුරු පුරුදු වීම

සර්වජන ඡන්ද බලය ප්‍රදානය කිරීමේ තවත් ප්‍රතිඵලයක් ලෙස මෙය හඳුන්වා දිය හැක. දේශපාලනඥයින් ජනතාවට වගකීමට නැඹුරු වූයේ ඡන්දය ලබා ගැනීම සඳහා මැතිවරණවලදී ජනතාවට දෙන පොරොන්දු වගකීමකින් ඉටු නොකළහොත් ඊළඟ මැතිවරණයේ දී ජනතා සහය තමන්ට ලබා ගැනීමට නොහැකි වනවාය යන විශ්වාසය දේශපාලනඥයින්ගේ මනස තුළ මුල්බැස ගැනීම හේතුකොට ගෙනය.

(3) ජනතාවගේ දේශපාලන සහභාගීත්වය වර්ධනය වීම

සර්වජන ඡන්ද බලය ප්‍රදානය කිරීමේ ඉතාම වැදගත් ප්‍රතිඵලයක් ලෙස මෙය පෙන්වා දිය හැක. 1931ට පෙර ඡන්ද බලය හිමිව තිබුනේ රටේ මුළු ජනගහනයෙන් 204, 000ක් හෙවත් 4% ප්‍රමාණයකට පමණි. සර්වජන ඡන්ද බලය ප්‍රදානය කිරීමෙන් පසුව 1931 පැවැත් වූ ප්‍රථම මැතිවරණය සඳහා ලියාපදිංචි වූ මුළු ඡන්දදායක සංඛ්‍යාව 1, 577, 932ක් වූ අතර එයින් 57.96%ක් ඡන්දය ප්‍රකාශ කර තිබිණි. 1936දී පැවැත්වුන දෙවන මැතිවරණය සඳහා ලියාපදිංචි වූ ඡන්දදායක සංඛ්‍යාව 2, 451, 353ක් විය. එයින් 54.69%ක් ඡන්දය ප්‍රකාශ කර තිබුණි. මෙයින් පෙන්නුම් කරන එක් දෙයක් වන්නේ ජනතාවගේ දේශපාලන සහභාගීත්වය වේගයෙන් ඉහල යාම ය. දෙවැන්න වන්නේ දේශපාලන සමානාත්මතාවය ඇතිවීමේ පසුබිම නිර්මාණය වීම ය. තුන්වැන්න වන්නේ ජනතාව දේශපාලන වශයෙන් අවදිවීමක් හා පිබිදීමක් ඇති වී තිබෙන බව පෙන්නුම් කිරීම ය.

සිව්වැන්න වන්නේ ජනතාවගේ දේශපාලන සමාජානුයෝජනය ක්‍රියාදාමය වේගවත් වී තිබෙන බව ය. මෙහි ප්‍රතිඵලයක් වූයේ ජනතාවට ආණ්ඩුවට බලපෑම් කිරීමේ හැකියාව වැඩි වීම ය. මෙය කරනු ලැබුයේ ජනතා නියෝජිතයන් හරහා රාජ්‍ය මන්ත්‍රන සභාවට ඉදිරිපත් කරන පෙත්සම් මගිනි. එමගින් තම දුක් ගැනවිලි ඉදිරිපත් කිරීමට ජනතාවට හැකිවන අතර තමන්ගේ ප්‍රශ්න යම් ප්‍රමාණයකින් හෝ විසදා ගැනීමට ඔවුන්ට හැකියාව ලැබේ.

(4) දේශපාලන පක්ෂ බිහිවීමේ පදනම වැටීම

ඩොනමෝර් කොමිසම ස්වයංපාලන ආණ්ඩුක්‍රමයක් ලංකාවට නොදීම කෙරෙහි බලපෑ එක් හේතුවක් ලෙස දැක්වූයේ ඒ වනවිට ලංකාව තුළ දියුණු සංවිධානාත්මක දේශපාලන පක්ෂ ක්‍රමයක් නොතිබීම ය. එබැවින් ඩොනමෝර් කොමිසම ප්‍රදානය කළ ආණ්ඩුක්‍රමය ක්‍රියාවට නැංවීමට දේශපාලන පක්ෂ අවශ්‍ය නොවූවා පමණක් නොව එමගින් දේශපාලන පක්ෂ වර්ධනය වීම ද අධෛර්යමත් කළේ ය. එහෙත් ආණ්ඩුක්‍රමය ක්‍රියාත්මක වීමේදී ඡන්දදායකයන් සංවිධානය කිරීමේ අවශ්‍යතාව පැන නගින අතර මේ සඳහා තිබූ එකම විකල්පය වූයේ දේශපාලන පක්ෂ මත ඡන්දදායකයන් සංවිධානය කිරීම ය. මෙහි ප්‍රතිඵලය වූයේ ලංකාව තුළ දේශපාලන පක්ෂ සංවිධානය කිරීමේ ක්‍රියාදාමය ආරම්භ වීමය.

(5) පොදු ජාතිකත්වයක් වර්ධනය වීමට පදනම වැටීම

ලංකාව තුළ පොදු ජාතිකත්වයක් වර්ධනය වීම කෙරෙහි පැවති විශාලම බාධකය ලෙස ඩොනමෝර් කොමිසම දුටුවේ 1833දී කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ මගින් හඳුන්වා දුන් වාර්ගික නියෝජන ක්‍රමයයි. වාර්ගික නියෝජනය ජාතික සමගිය හා ජාතික එක්සත්භාවය විනාශ කරන පිළිකාවක් ලෙසයි ඩොනමෝර් කොමිසම දුටුවේ. මේ හේතුව මත ඩොනමෝර් කොමිසම යෝජනා කරනවා වාර්ගික නියෝජන ක්‍රමය අහෝසි කිරීමට. මෙමගින් රටේ ජාතික ඒකාග්‍රතාව ගොඩ නගා ගැනීමට හැකිවේ යැයි කොමිසම කල්පනා කළේ ය. නමුත් මේ අරමුණ එයාකාරයෙන්ම ඉටු වූයේ නැති බව විචාරක මතය වේ.

(6) නිදහස් ව්‍යාපාරය ශක්තිමත් ලෙස ඉදිරියට ගෙනයාමට පිටුවහලක් ලැබීම

ඩොනමෝර් යෝජනා යටතේ පිහිට වූ රාජ්‍ය මන්ත්‍රන සභාව එක් අතකින් මෙරට දේශපාලනඥයින්ට දේශපාලන හා පරිපාලන පුහුණුවක් ලබා ගැනීමට ප්‍රයෝජනවත් විය. අනෙක් අතින් එය තම අදහස්, විවේචන විරෝධතා ඉදිරිපත් කරන වේදිකාවක් ලෙස ප්‍රයෝජනවත් විය. නිදහස වෙනුවෙන් ලාංකීය නායකයන් නැගූ හඬ නොසලකා හරිමින් කටයුතු කිරීමට යටත් විජිත පාලකයින්ට නොහැකි විය.

(7) අනාගත නායකයින් පුහුණු කිරීමේ පදනම වැටීම

ඩොනමෝර් ප්‍රතිසංස්කරණ යටතේ හඳුන්වා දුන් සර්වජන ඡන්ද බලය, විධායක කාරක සභා ක්‍රමය, අමාත්‍ය මණ්ඩලය යනාදිය අභ්‍යන්තර වශයෙන් මෙරට නායකයන්ට විධායක කටයුතු පිළිබඳව මෙන්ම රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් පුහුණුවක් ලැබෙන අතර අනෙක් අතින් බාහිර වශයෙන් දේශපාලන බල අරගලයේ යෙදෙන ආකාරය ගැන මනා පුහුණුවක් ලැබේ. නිදහසෙන් පසු කාලය තුළ ලංකාවේ දේශපාලන බලය හැසිර වූ අය දෙස බැලීමේ දී මේ තත්ත්වය ඉතාම හොඳින් පෙනී යයි.

(8) සමාජ සජීවීකරණය වේගවත් වීම

මෙයින් අදහස් කරන්නේ සමාජයේ පීඩිත ජන කොටස් සර්වජන ඡන්ද බලය හේතු කොටගෙන අයත් කරගත් ශක්තිය යටතේ හිස එසවීමට පටන් ගැනීම ය. විශේෂයෙන් ම මෙරට ප්‍රබලව පැවති කුලවාදය දෙදරා යාම කෙරෙහි සර්වජන ඡන්ද බලය ඇඩි බලපෑමක් කළේ ය.

(9) සමාජ සුභසාධනය වේගවත් වීම

සර්වජන ඡන්ද බලය හේතු කොටගෙන දේශපාලනඥයන්ගේ පැවැත්ම ජනතාව මත රඳා පවතින තත්ත්වයකට පත්වන අතර එම හේතුවෙන් ජනතා සහය වැඩි වැඩියෙන් ලබා ගැනීමට නම් ජනතාවට වැඩි වැඩියෙන් සේවය කළ යුතු බව දේශපාලනඥයින් තේරුම් ගනී. මෙහි ප්‍රතිඵලය වූයේ දේශපාලනඥයින් එකිනෙකා පරයමින් ජනතාවට සේවය කිරීම සඳහා විවිධ සුභසාධන සේවාවන් පටන් ගැනීම ය. නිදහස් අධ්‍යාපනය ආරම්භ වීම, පාසැල් සිසුන්ට දිවා ආහාරය නොමිලයේ සැපයීමට පටන් ගැනීම, සෞඛ්‍යය සේවාවන් හා ප්‍රජා සෞඛ්‍යය සේවාවන් ව්‍යාප්ත වීම, යටිතල පහසුකම් වර්ධනය, කම්කරු සුභසාධන නීති රීති පැනවීම, ගොවි ජනපද ව්‍යාපාර ආරම්භ කිරීම යනාදී සුභ සාධක සේවාවන් රාශියක් මෙරට ඇරඹුනේ සර්වජන ඡන්ද බලය හේතු කොටගෙන ය.

(10) දේශීය දේශපාලනඥයින්ට විධායක බලතල ක්‍රියාවට නැංවීමට සහභාගී වීමට හැකිවීම

ඩොනමෝර් ප්‍රතිසංස්කරණ යටතේ 7/10ක විධායක බලතල ලාංකිකයින්ට පැවරූ අතර මෙමගින් විධායක බලතල ක්‍රියාවට නැංවීම සඳහා සහභාගී වීමටත්, අනාගත වගකීම් සහිත ආණ්ඩුවක කටයුතු කිරීම සඳහා ලාංකික නායකයින්ට පුහුණුව ලැබේ. ඉහතින් දැක්වූයේ ඩොනමෝර් ප්‍රතිසංස්කරණයන්හි වැදගත් සමාජ, ආර්ථික හා දේශපාලන ප්‍රතිඵලයන් ය. ඩොනමෝර් ප්‍රතිසංස්කරණයේ අයහපත් ප්‍රතිඵල ලෙස සැලකිය හැක්කේ විධායක කාරක සභා අතර ගැටුම් ඇතිවීම, අමාත්‍ය මණ්ඩලය තුළ සාමූහික වගකීම නොතිබීම, අමාත්‍ය මණ්ඩලය මෙහෙයවීමට නායකයෙකු නොසිටීම, පෞද්ගලික මන්ත්‍රීවරයාගේ තත්ත්වය අහිතකර ලෙස වර්ධනය වීම, ලාංකික නායකයින් සහ රාජ්‍ය නිලධාරීන් තිදෙනා අතර ගැටුම් ඇතිවීම යනාදිය වේ.

**(ii)** රාජ්‍ය සේවයේ හෝ අධිකරණ සේවයේ ස්වාධීනත්වය පවත්වාගෙන යාම සඳහා සෝල්බරි ව්‍යවස්ථාව මගින් සැපයූ ආරක්ෂණ විධිවිධාන

**රාජ්‍ය සේවය**

අරමුණ : **නිදහස් හා ස්වාධීන රාජ්‍ය සේවාවක් පවත්වාගෙන යාමට සෝල්බරි කොමිසම විසින් දැමූ පදනම පිළිබඳව සහ එහි වැදගත්කම පිළිබඳව අපේක්ෂකයන්ගේ දැනුම පරීක්ෂා කර බැලීම**

**පිළිතුරෙහි අන්තර්ගත විය යුතු වැදගත් කරුණු**

(අ) රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය ආරක්ෂා කොට පවත්වාගෙන යාම සඳහා යොදා ඇති ව්‍යවස්ථාමය විධිවිධාන **(ලකුණු 06)**

(ආ) එහි ප්‍රායෝගික ක්‍රියාකාරිත්වය **(ලකුණු 02)**

**(ඇ) නිගමනය : නිදහස් රාජ්‍ය සේවයක් අවශ්‍යම දෙයක් ද නැත්ද යන්න පිළිබඳව අපේක්ෂකයන්ගේ පෞද්ගලික තක්සේරුව (ලකුණු 02)**

රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය පවත්වාගෙන යාම සඳහා සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් යෙදූ මූලික විධිවිධානය වූයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව පිහිටුවා රාජ්‍ය සේවකයින් පත් කිරීම, මාරු කිරීම, අස් කිරීම හා ඔවුන් පිළිබඳ විනයානුකූල පාලනය පිළිබඳ බලතල එයට පැවරීම ය. (සෝල්බරි ව්‍යවස්ථාවේ 60 වන වගන්තිය)

සෝල්බරි ව්‍යවස්ථාවේ 58.1 වගන්තියේ දැක්වෙන ආකාරයට "අග්‍රාණ්ඩුකාරතුමා විසින් පත් කරනු ලබන පුද්ගලයින් තිදෙනෙකුගෙන් යුත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවක් තිබිය යුතු ය. මේ තිදෙනාගෙන් අඩු ගණනේ එක් කෙනෙකුවත් ගත වූ පස් වර්ෂ කාල පරිච්ඡේදය තුළ කවර වේලාවක දී වුවද කිසිම ආණ්ඩුවේ තනතුරක් හෝ අධිකරණ තනතුරක් හෝ නොදැරූ පුද්ගලයෙකු විය යුතු ය. අග්‍රාණ්ඩුකාරතුමා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයින්ගෙන් එක්කෙනෙකු එහි සභාපති වශයෙන් පත් කරනු ලැබේ.

සෙනෙට් සභිකයෙකු හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙස පත් නොකළ යුතු ය. රාජ්‍ය සේවයේ තනතුරක් දරන අයෙකු පත් කළහොත් පත් කළ දිනයේ සිට එම තැනැත්තා දරන ලද තනතුරින් ඉවත් විය යුතු ය. කොමිසමේ සාමාජිකයින්ගේ වැටුප් හා වෙනත් දීමනා පාර්ලිමේන්තුව විසින් තීරණය කොට ඒකාබද්ධ අරමුදලින් ගෙවිය යුතු ය.

කොමිසමේ සාමාජිකයින්ගේ නිල කාලය අවුරුදු පහකි. අවශ්‍ය නම් ස්ව කැමැත්තෙන් ඉල්ලා අස්විය හැක. ඕනෑම සාමාජිකයෙකු තනතුරින් පහ කිරීමේ බලය අග්‍රාණ්ඩුකාරයා සතු වේ. නමුත් ඒ සඳහා හේතු දැක්විය යුතු ය. අවශ්‍ය නම් සාමාජිකයින් යලි පත්කළ හැකි විය. කොමිෂන් සභාවට ලේකම්වරයෙකු සිටිය යුතු අතර කොමිෂන් සභාව විසින් ලේකම්වරයා පත් කළ යුතු ය.

රාජ්‍ය සේවා කොමිසමට පැවරුනේ අගමැතිගේ උපදෙස් මත අග්‍රාණ්ඩුකාරවරයා විසින් කරන පත් කිරීම් හැරුන විට රාජ්‍ය සේවයේ අනෙක් පත් කිරීම්, මාරු කිරීම්, අස් කිරීම් හා ඔවුන් පිළිබඳ විනයානුකූල පාලනය පිළිබඳ බලතල පමණි. අගමැතිවරයාගේ උපදෙස් මත අග්‍රාණ්ඩුකාරවරයා කරන ලද පත්කිරීම්වලට අග්‍රවිනිශ්චයකරු, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකරුවන්, අපරාධ සැසි කොමසාරිස්වරුන්, අමාත්‍යාංශ ලේකම්වරුන්, භාණ්ඩාගාරයේ ලේකම් සහ නියෝජ්‍ය ලේකම්, කැබිනට් ලේකම්, මැතිවරණ කොමසාරිස්, නීතිපති, අල්ලස් කොමසාරිස්, පළමු හා දෙවන ශ්‍රේණිවල තානාපතිවරු අයත් විය. ව්‍යවස්ථාවේ 60.1 වගන්තියට අනුව කොමිෂන් සභාවට පවරන ලද බලතල එහි අභිමතය පරිදි ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පල කරන නිවේදනයක් මගින් එහි අන්තර්ගත කොන්දේසිවලට යටත්ව ඕනෑම රාජ්‍ය නිලධරයෙකුට පැවරීමට කොමිසමට බලය තිබුණි. මේ යටතේ වාර්ෂික වැටුප රුපියල් 4080ට අඩු රාජ්‍ය සේවයේ තනතුරු සඳහා පත් කිරීමේ බලය කොමිසම විසින් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට පවරන ලදී. දෙපාර්තමේන්තු ප්‍රධානීන් එම බලතල ක්‍රියාවට නංවන ආකාරය පිළිබඳව යමෙකු සෑහීමට පත් නොවන්නේ නම් ඒ ගැන කොමිසමට අභියාචනා කළ හැකිවිය. කොමිසමේ තීරණය අවසාන තීරණය විය.

කොමිෂන් සභාවේ වැඩ කටයුතුවලට මැදිහත් වීම ව්‍යවස්ථාව මගින් තහනම් කර ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 56වන වගන්තිය මගින් අධිකරණ සේවා කොමිසම පිළිබඳව දක්වා ඇති මෙම නියමය රාජ්‍ය සේවා කොමිසමට ද අදාල බව ව්‍යවස්ථාවේ දක්වා ඇත. එම වගන්තියේ දැක්වෙන ආකාරයට; "තමාගේ රාජකාරි ඉෂ්ට කිරීමේ මිස නියම වශයෙන්වත් අනියම් වශයෙන්වත් තමා ම හෝ වෙන කෙනෙකු ලවා හෝ කොයියම් ආකාරයකින් වුවද අධිකරණ සේවා කොමිෂන් සභාවේ හෝ එහි සාමාජිකයෙකුගේ යම් තීරණයක් සම්බන්ධයෙන් ඒ කොමිෂන් සභාව නොහොත් ඒ සාමාජිකයා කෙරෙහි බලපෑමක් කරන්නා වූ හෝ බලපෑමට තැත් කරන්නා වූ සෑම පුද්ගලයා ම වරදකට වරදකාරයා වන අතර මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරිපිට සංක්ෂිප්ත නඩු විභාගයකින් පසු ඔහු වරදකාරයා බැව් ඔප්පු වුවහොත්, රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට හෝ එක් අවුරුද්දකට නොවැඩි කාලයක් බන්ධනාගාර ගත කරනු ලැබීම යන මේ දඬුවම් දෙකටම හෝ ඔහු යටත් වන්නේ ය."

ඉහතින් දැක්වූයේ රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අන්තර්ගත කොට තිබූ ආරක්ෂණ විධි විධානයන් ය. මෙම විධි විධාන එයාකාරයෙන්ම ක්‍රියාත්මක වූවායැයි කිව නොහැක. හේතුව සමහර අවස්ථාවලදී දේශපාලනඥයින් ඇඟිලි ගැසීම ය.

**අධිකරණ සේවයේ ස්වාධීනත්වය**

** ** ඉහත දැක්වූ රාජ්‍ය සේවය පිළිබඳව ලකුණු දීමේ පටිපාටිය මේ සඳහා ද යොදා ගන්න.**

සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 52, 53, 54, 55 සහ 56 යන වගන්ති මේ සම්බන්ධයෙන් වැදගත් වේ. 52 වන වගන්තියෙන් දක්වන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයේ ස්වාධීනත්වය හා සම්බන්ධ විධි විධානයන් ය. ඒවා පහත සඳහන් පරිදි වේ.

**(1)** 52.1 අග්‍රාණ්ඩුකාරවරයා විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍රවිනිශ්චයකරු, කනිෂ්ඨ විනිශ්චයකාරවරුන් සහ අපරාධ අධිකරණ කොමසාරිස්වරුන් පත් කළ යුතු ය.

**(2)** 52.2 ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකරුවන් ස්වකීය කල්ක්‍රියාව මනාව පවතින තාක් තම තනතුර දරන්නේ ය. සෙනෙට් සභාවේ සහ නියෝජිත මන්ත්‍රණ සභාවේ සන්දේශයක් පිට අග්‍රාණ්ඩුකාරතුමාට හැර අන් කවරෙකුට වත් ඔවුන් සේවයෙන් පහ කළ නොහැක.

**(3)** 52.3 ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකරුවන් විශ්‍රාම ගන්නා වයස අවුරුදු 62 කි. එසේ වුවද වයස අවුරුදු 62 පිරුණු ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයෙකුට තවත් දොළොස් මසකට වැඩි නොවන කාල පරිච්ඡේදයක් තුළ රාජකාරි කිරීමට ඉඩ දීමට අග්‍රාණ්ඩුකාරතුමාට පුළුවන.

**(4)** 52.4 ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ වැටුප් පාර්ලිමේන්තුවෙන් තීරණය කොට ඒකාබද්ධ අරමුදලෙන් ගෙවිය යුතු ය. සේවා කාලය තුළදී වැටුප් අඩු නොකළ යුතු ය. (52.6 වගන්තිය)

පහල අධිකරණවල ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සපයා ඇති ප්‍රතිපාදන දෙකක් දැකිය හැක. මෙයින් එකක් වන්නේ අධිකරණ සේවා කොමිෂන් සභාව පිහිටුවීම ය. දෙවැන්න අධිකරණ සේවා කොමිෂන් සභාවේ කාර්යයන්ට ඇඟිලි ගැසීම දඬුවම් ලැබිය යුතු වරදක් බවට පත් කිරීම ය. මේ හා සම්බන්ධ ව්‍යවස්ථාමය විධි විධාන පහත සඳහන් පරිදි වේ.

**(1)** 53.1 අග්‍රවිනිශ්චයකාරතුමාගෙන් ද, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයෙකුගෙන් ද, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයෙකුව සිටින හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයෙකුව සිටි තවත් පුද්ගලයෙකුගෙන් ද යුක්ත වන අධිකරණ සේවා කොමිෂන් සභාවක් තිබිය යුතු ය. මෙහි සභාපති අග්‍රවිනිශ්චයකාරතුමා විය යුතුය. මේ කොමිෂන් සභාවේ සභාපති හැර සෙසු සාමාජිකයෝ අග්‍රාණ්ඩුකාරතුමා විසින් පත් කළ යුත්තාහ.

**(2)** 53.2 සෙනෙට් සභිකයෙකු හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වන කිසිම පුද්ගලයෙකු අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙකු වශයෙන් පත් නොකළ යුතු ය. එබඳු අයෙකු විසින් අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකත්වය නොදැරිය යුතු ය.

**(3)** 53.3 මේ වගන්තියේ (5) වැනි උප වගන්තියේ විධි විධානවලට යටත්ව, සභාපති හැර අධිකරණ සේවා කොමිෂන් සභාවේ හැම සාමාජිකයාම තම තනතුරින් කලින් ඉල්ලා අස් වුවහොත් හෝ මෙහි පහත විධි විධාන සලසා ඇති ආකාරයට ඒ තනතුරෙන් පහ කරනු ලැබුවොත් හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයෙකුව සිට ඒ තනතුර අවසන් වුවහොත් මිස, තමා පත් කරනු ලැබූ දිනයේ සිට පස් අවුරුදු කාල පරිච්ඡේදයක් ඒ තනතුර දැරිය යුතුවාක් හැර නැවත පත් කරනු ලැබීමට ද සුදුසු වන්නේ ය.

**(4)** 53.4 ඉදිරිපත් කෙරෙන යම්කිසි හේතුවක් පිට, අධිකරණ සේවා කොමිෂන් සභාවේ ඕනෑම සාමාජිකයෙකු එම තනතුරින් පහ කිරීමට අග්‍රාණ්ඩුකාරතුමාට පුළුවන.

**(5)** 53.5 අධිකරණ සේවා කොමිෂන් සභාවේ ඕනෑම සාමාජිකයෙකුට තම කාර්යයන්ගෙන් නිවාඩු දීමටත්, එවැනි නිවාඩු කාලයක් තුළ අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙකු වීමට සුදුසුකම් ඇති පුද්ගලයකු තාවකාලික සාමාජිකයෙකු වශයෙන් පත් කිරීමටත් අග්‍රාණ්ඩුකාරතුමාට පුළුවන.

**(6)** 53.6 අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙකු වශයෙන් යම් පුද්ගලයෙකු පත් කර ඇති කල්හි පාර්ලිමේන්තුවෙන් තීරණය කෙරෙන යම් වැටුපක් හෝ දීමනාවක් ඔහුට ගෙවිය හැකි ය. එවැනි පුද්ගලයෙකුට ගෙවිය හැකි ඕනෑම වැටුපක් හෝ දීමනාවක් ඒකාබද්ධ අරමුදලෙන් ගෙවිය යුතුවාත් හැර ඒ වැටුප හෝ දීමනාව ඔහුගේ නිල කාලය ඇතුලත දී අඩු නොකළ යුතුද වන්නේ ය.

**(7)** 54 අධිකරණ සේවා කොමිෂන් සභාවට, ඒ කොමිෂන් සභාවෙන් පත් කෙරෙන ලේකම් කෙනෙකු සිටිය යුතු ය.

**(8)** 55.1 අධිකරණ නිලධාරීන් පත් කිරීම, මාරු කිරීම, අස් කිරීම හා ඔවුන් පිළිබඳ විනයානුකූල පාලනය යන මේ කටයුතු අධිකරණ සේවා කොමිෂන් සභාව කෙරෙහි මෙයින් පවරනු ලැබේ.

**(9)** අග්‍රාණ්ඩුකාරතුමා වෙත තමාගේ අත්සන සහිතව ලියවිල්ලක් යවා තම තනතුරින් ඉල්ලා අස් වීමට ඕනෑම අධිකරණ නිලධාරියෙකුට පුළුවන.

**(10)** අධිකරණ සේවා කොමිෂන් සභාවේ කටයුතුවලට මැදිහත් වීම දඬුවම් ලැබිය යුතු වරදක් වේ. එවැනි චෝදනාවකට වරදකරු වන අයකු රුපියල් දහසක දඩයකට හෝ වසරක සිර දඬුවමකට හෝ ඒ දෙකටම යටත් කළ හැක.

**(iii)** අධිකරණ සේවය හෝ රාජ්‍ය සේවය පාලනය කිරීම සඳහා 1972 ව්‍යවස්ථාව මගින් සැපයූ ව්‍යවස්ථාමය විධිවිධාන

**(අ) අධිකරණ සේවය**

**අරමුණ : අධිකරණ සේවය දේශපාලන විධායකය යටතට පත්කර ගැනීම උදෙසා 1972 ව්‍යවස්ථාවේ යෙදූ විධිවිධාන සහ එහි ප්‍රතිඵල පිළිබඳව අපේක්ෂකයන්ගේ දැනුම පරීක්ෂා කර බැලීම**

**පිළිතුරෙහි අන්තර්ගත විය යුතු වැදගත් කරුණු**

(අ) අධිකරණ සේවය පාලනය කිරීම සඳහා 1972 ව්‍යවස්ථාවේ යෙදූ විධි විධාන අධිකරණ සේවා උපදේශක මණ්ඩලය හා අධිකරණ සේවා විනය මණ්ඩලය **(ලකුණු 04)**

(ආ) අධිකරණයේ ස්වාධීනත්වය කෙරෙහි එයින් වූ යහපත් හෝ අයහපත් බලපෑම් **(ලකුණු 04)**

**(ඇ) නිගමනය : දේශපාලන විධායකයේ පාලනයට අධිකරණය පත් කිරීම සුදුසු දෙයක් ද, නුසුදුසු දෙයක් ද යන්න පිළිබඳව අපේක්ෂකයාගේ තක්සේරුව (ලකුණු 02)**

1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ අධිකරණ සේවය පාලනය කිරීම සඳහා යොදා තිබූ විධි විධානවල ස්වභාවය තේරුම් ගැනීමට නම් ප්‍රථමයෙන්ම අවධානය යොමු කළ යුත්තේ ශ්‍රී ලංකා ජනරජයේ පරමාධිපත්‍ය බලය ගොඩනගා තිබූ ආකාරය සහ එය ක්‍රියාවට නැංවූ ආකාරය යන කරුණ වෙතය. ව්‍යවස්ථාවේ 3 වන වගන්තියේ දැක්වෙන ආකාරයට; "ශ්‍රී ලංකා ජනරජයේ පරමාධිපත්‍යය ජනතාව කෙරෙහි පිහිටා ඇත්තේ ය. ඒ පරමාධිපත්‍යය අත්හළ නොහැක්කේ ය. අන් සතු කළ නොහැක්කේ ය. ව්‍යවස්ථාවේ 4 වන වගන්තියේ දැක්වෙන ආකාරයට; " ජනතාවගේ පරමාධිපත්‍ය ක්‍රියාත්මක වන්නේ තෝරාපත් කරගනු ලබන ජනතා නියෝජිතයන්ගෙන් සමන්විත ජාතික රාජ්‍ය සභාවක් මගිනි." ව්‍යවස්ථාවේ 5 වන වගන්තියට අනුව; "ජාතික රාජ්‍ය සභාව ජනරජයේ උත්තරීතර ආයතනය වන්නේ ය. ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ක්‍රියාත්මක කරන්නේ ද, රටේ ආරක්ෂාව ඇතුළුව ජනතාවගේ විධායක බලය ජනාධිපතිවරයා සහ අමාත්‍ය මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරන්නේද, නීතිය අනුව ජාතික රාජ්‍ය සභාව විසින් ක්‍රියාත්මක කළ හැකි ස්වකීය බලතල වරප්‍රසාද සම්බන්ධයෙන් විනා ජනතාවගේ අධිකරණ බලය නීතියෙන් ප්‍රතිෂ්ඨාපිත අධිකරණ සහ වෙනත් ආයතන මාර්ගයෙන් ක්‍රියාත්මක කරන්නේ ද ජාතික රාජ්‍ය සභාවයි."

මෙම වගන්ති පරීක්ෂා කර බැලීමේ දී පැහැදිලිවම පෙනී යන කරුණක් වන්නේ 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ අධිකරණ සේවය පාලනය කිරීම ඍජුව ම දේශපාලන බලය හසුරුවන විධායකය හා ව්‍යවස්ථාදායකය යටතට පත් කර ඇති බව ය. මේ බව තවදුරටත් පැහැදිලි වන්නේ අධිකරණ සේවය පාලනය කිරීම සඳහා ව්‍යවස්ථාව තුළ අන්තර්ගත කර ඇති අනෙක් වගන්ති විමසීමේ දී ය. 1972 ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කළ අධිකරණ ක්‍රමය ඉහළ සහ පහළ යනුවෙන් කොටස් දෙකකින් යුක්ත විය. මෙයින් ඉහළ කොටස අභියාචනා මහාධිකරණය සහ ශ්‍රේෂ්ඨාධිකරණය යන අධිකරණ දෙකෙන් සමන්විත විය. මෙම අධිකරණ දෙකේ සහ ඒ හා සමාන අධිකරණ කාර්යයන් කරන වෙනත් අධිකරණ ජාතික රාජ්‍ය සභාව විසින් පිහිටු වුවහොත් ඒවායේ ද විනිශ්චයකරුවන් සහ අධිකරණ ආඥා පනතේ දැක්වෙන අපරාධ අධිකරණ කොමසාරිස්වරුන් පත් කරන්නේ ජනාධිපතිවරයා විසිනි. එහෙත් මේ සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට ස්වාධීනව කටයුතු කළ හැකිද යන ප්‍රශ්නය මතු වේ. හේතුව ජනාධිපතිවරයා එම තනතුරුවලට පුද්ගලයින් පත් කිරීම අගමැතිවරයාගේ උපදෙස් පරිදි සිදු කිරීමත්, එම හේතුවෙන් අගමැතිවරයාගේ අදහස්වලට ඇහුම්කන් දීමට ජනාධිපතිවරයාට සිදු වීමත්ය. අනෙක් අතට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 27.1 වගන්තියට මෙහිදී අවධානය යොමු කළ යුතුය.

එහි දැක්වෙන ආකාරයට; "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වෙනත් විධිවිධාන ඇතොත් මිස අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් අනුව හෝ අමාත්‍යවරයෙකුට පැවරී ඇති යම්කිසි කාර්යයක් සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට උපදෙස් දීමට අග්‍රාමාත්‍යවරයා විසින් ඒ අමාත්‍යවරයාට බලය පවරා ඇත්තේ නම් එකී කාර්යය සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ උපදෙස් අනුව හෝ ජනාධිපතිවරයා සෑම අවස්ථාවකම ක්‍රියා කළ යුත්තේය."

මෙම වගන්තියෙන් ඉතාම හොඳින් ම පැහැදිලි වන්නේ ජනාධිපතිවරයා තම බලතල ක්‍රියාවට නැංවිය යුත්තේ කෙසේද යන්න ය. පත් කිරීම සම්බන්ධයෙන් මෙම දුර්වලතාව තිබුන ද පත් කළ පසු මෙම විනිශ්චයකරුවන්ට අවුරුදු 63ක් දක්වා සේවය කළ හැක. ඉවත් කළ හැක්කේ විෂමාචාරය මත ජාතික රාජ්‍ය සභාවෙන් සම්මත කරන යෝජනාවක් අනුව ජනාධිපතිවරයාට පමණි.

පහල උසාවිවල අධිකරණ නිලධාරීන් පිළිබඳව කටයුතු කිරීම සඳහා ව්‍යවස්ථාවේ 125.1 වගන්තිය යටතේ අධිකරණ සේවා උපදේශක මණ්ඩලය සහ 127.1 වගන්තිය යටතේ අධිකරණ සේවා විනය මණ්ඩලය නමින් මණ්ඩල දෙකක් ව්‍යවස්ථාව මගින් පිහිටුවා සංස්ථාපනය කරන ලදි. මෙයින් අධිකරණ සේවා උපදේශක මණ්ඩලය සමාජිකයින් පස් දෙනෙකුගෙන් සමන්විත වන අතර, එහි සභාපතිවරයා වන්නේ මුල් අධිකරණයේ ජ්‍යෙෂ්ඨ විනිශ්චයකරු ය. අනෙක් සාමාජිකයන් පත් කරන්නේ ජනාධිපතිවරයා විසිනි. එයින් දෙදෙනෙකු ව්‍යවස්ථාවේ 124 වන වගන්තියේ (අ) සහ (ආ) උප වගන්තිවල දැක්වෙන අධිකරණ නිලධාරීන් විය යුතු ය. සභාපතිවරයා හැරුන විට සාමාජිකයන්ගේ නිල කාලය අවුරුදු සතරකි. වැටුප් හෝ දීමනා ජාතික රාජ්‍ය සභාවෙන් තීරණය කොට ඒකාබද්ධ අරමුදලෙන් ගෙවිය යුතු ය. සභාපතිවරයා හැරුන විට අනෙක් සාමාජිකයන් හේතු දැක්වීමෙන් තොරව ඉවත් කිරීමේ බලය ජනාධිපතිවරයා සතු වේ.

අධිකරණ සේවා උපදේශක මණ්ඩලයේ කාර්ය වන්නේ;

(අ) 124 වන වගන්තියේ දැක්වෙන අධිකරණ නිලධාරීන් බඳවා ගැනීමේ සහ පත් කිරීමේ කාර්යය පටිපාටිය පිළිබඳ රීති සෑදීම සඳහා සහ අධිකරණ සේවා උපදේශක මණ්ඩලයේ කාර්යයන් ඉටු කිරීම සඳහා අදාළ රීති සෑදීම සඳහා අමාත්‍ය මණ්ඩලයට උපදෙස් දීම

(ආ) 124 වන වගන්තියේ දැක්වෙන විනිශ්චයකාරවරයන් සහ රාජ්‍ය නිලධාරීන් පත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම. මෙහිදී නිර්දේශ කරන අයගේ නාම ලේඛනයක් මෙන්ම ඉල්ලුම්කරුවන්ගේ නාම ලේඛනයක් ද උපදේශක සභාව විසින් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු ය.

නිර්දේශ කළ නම් අතුරින් ඕනෑම අයෙකු පත් කිරීමේ බලය අමාත්‍ය මණ්ඩලය සතු විය. එමෙන් ම නිර්දේශ නොකළ වෙනත් ඉල්ලුම්කරුවෙකු වුවද පත් කිරීමේ බලය අමාත්‍ය මණ්ඩලය සතු විය. නමුත් ඒ පිළිබඳ වාර්තාවක් අමාත්‍ය මණ්ඩලය විසින් ජාතික රාජ්‍ය සභාවට ඉදිරිපත් කළ යුතු ය.

සාමාජිකයන් තිදෙනෙකුගෙන් අධිකරණ සේවා විනය මණ්ඩලය සමන්විත වේ. සභාපතිවරයා වන්නේ මුල් අධිකරණයේ ජ්‍යෙෂ්ඨ විනිශ්චයකරු ය. සභාපති විසින් නම් කරන එම අධිකරණයේ තවත් විනිශ්චයකාරවරුන් දෙදෙනෙක් අනෙක් සාමාජිකයන් වේ. නිල කාලය අවුරුදු සතරකි. සාමාජිකයන්ගේ වැටුප් හා වෙනත් දීමනා ජාතික රාජ්‍ය සභාවෙන් තීරණය කොට ඒකාබද්ධ අරමුදලෙන් ගෙවිය යුතු ය. සේවා කාලය තුළදී ගෙවීම් අඩු කළ නොහැක. 124 වන වගන්තියේ දැක්වෙන විනිශ්චයකරුවන් සහ අනෙක් රාජ්‍ය නිලධාරීන්ගේ මාරුවීම් සහ සේවයෙන් පහ කිරීම පිළිබඳ බලතල ක්‍රියාවට නැංවීම විනය මණ්ඩලයේ කාර්ය වන්නේ ය. මාරු කිරීම් පිළිබඳ තෘප්තිමත් නොවන්නේ නම් ඒ ගැන අමාත්‍ය මණ්ඩලයට අභියාචනා කළ හැක. ඉවත් කිරීමක් නම් ඒ පිළිබඳ වාර්තාවක් අධිකරණ අමාත්‍යවරයා හරහා අමාත්‍ය මණ්ඩලයට ද ජාතික රාජ්‍ය සභාවේ කථානායකවරයාට ද ඉදිරිපත් කළ යුතුය. ජාතික රාජ්‍ය සභාවේ බහුතර ඡන්දයෙන් සම්මත කරන යෝජනාවක් මගින් අදාල ඉවත් කිරීම ක්‍රියාවට නැංවිය හැක.

ව්‍යවස්ථාවේ 131 (1) සහ (2) වගන්ති මගින් විනය මණ්ඩලයේ කාර්යයන්ට සහ යුක්තිය පසිඳලීමේ කාර්යයට මැදිහත් වීම දඬුවම් ලැබිය යුතු වරදක් ලෙස දක්වා ඇත.

ඉහත දැක්වූ කරුණුවලින් පෙනී යන්නේ අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා යම් යම් ආවරණ ව්‍යවස්ථාවේ තිබුනද ඒවා ඉක්මවා යමින් අධිකරණය විධායකයේ පාලනය යටතට පත් කර ඇති බව ය.

(අ) රාජ්‍ය සේවය

1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සිදු කළ වෙනස්කමක් වූයේ රාජ්‍ය සේවය පාලනය කිරීම දේශපාලන විධායකය යටතට පත් කිරීම ය. කලින් පැවති සෝල්බරි ව්‍යවස්ථාව යටතේ රාජ්‍ය සේවය නිදහස් හා අපක්ෂපාතී සේවාවක් ලෙස පවත්වාගෙන යාම සඳහා ස්වාධීන කොමිෂන් සභාවක් යටතට පත් කර තිබූ අතර එමගින් රාජ්‍ය සේවයේ පත් කිරීම්, උසස් කිරීම්, මාරු කිරීම් සහ සේවයෙන් පහ කිරීම් සිදු කළේ ය. මේ තත්ත්වය 1972 ව්‍යවස්ථාව යටතේ සම්පූර්ණයෙන් ම වෙනස් කරන අතර, ඒ වෙනුවට රාජ්‍ය සේවයේ කටයුතු පාලනය කිරීම අමාත්‍ය මණ්ඩලයට පවරා ගන්නා අතර, අමාත්‍ය මණ්ඩලයට සහය වීම පිණිස මණ්ඩල දෙකක් පිහිටුවන ලදී. එම මණ්ඩල දෙක වන්නේ රාජ්‍ය සේවා උපදේශක මණ්ඩලය සහ රාජ්‍ය සේවා විනය මණ්ඩලයයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 106.1 වගන්තියේ දැක්වෙන ආකාරයට; “රාජ්‍ය නිලධාරීන් පත් කිරීම, මාරු කිරීම සහ සේවයෙන් පහ කිරීම සම්බන්ධයෙන් ද, රාජ්‍ය නිලධාරීන්ගේ විනය පාලනය සම්බන්ධයෙන් ද, වගකීම අමාත්‍ය මණ්ඩලයට භාර වන්නේ ය. එකී කරුණු පිළිබඳව ජාතික රාජ්‍ය සභාවට උත්තර දීමට ද අමාත්‍ය මණ්ඩලය බැඳී සිටින්නේ ය.” ව්‍යවස්ථාවේ 106.2 සහ 106.3 වගන්ති මගින් ඉහත දැක්වූ තත්ත්වය තවදුරටත් තහවුරු කරයි. 106.2 වගන්තියේ දැක්වෙන ආකාරයට; “රාජ්‍ය නිලධාරීන් පත් කිරීම, මාරු කිරීම සහ සේවයෙන් පහ කිරීම පිළිබඳ බලතල ද රාජ්‍ය නිලධාරීන්ගේ විනය පාලනය පිළිබඳ බලතල ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධි විධානයන්ට යටත්ව අමාත්‍ය මණ්ඩලය සතු වන්නේ ය.”

106.3 වගන්තියේ දැක්වෙන ආකාරයට; “රාජ්‍ය නිලධාරීන් පත් කිරීම, මාරු කිරීම, සේවයෙන් පහ කිරීම හා ඔවුන්ගේ විනය පාලනය යන මේ කරුණු පිළිබඳ බලතල ක්‍රියාත්මක කිරීමේ පටිපාටිය ද එකී බලතල පවරා දීමේ පටිපාටිය ද ඇතුළුව රාජ්‍ය සේවය පිහිටුවීම රාජ්‍ය නිලධාරීන් බඳවා ගැනීමේ පටිපාටි නියම කිරීම සහ රාජ්‍ය නිලධාරීන්ගේ පැවැත්ම පිළිබඳ රීති මාලා නියම කිරීම ද යනාදී රාජ්‍ය නිලධාරීන්ට අදාල සියලු ම කරුණු පිළිබඳව විධිවිධාන සැලසීම හා ඒ කරුණු නිශ්චය කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධි විධානයන්ට යටත්ව අමාත්‍ය මණ්ඩලය විසින් කරනු ලබන්නේ ය.” මෙම වගන්තිවලින් මනාව පැහැදිලි වන්නේ රාජ්‍ය සේවාව පිහිටුවීමේ සිට ඒ හා සම්බන්ධ සෑම දෙයක් සඳහා ම අදාල බලය අමාත්‍ය මණ්ඩලයට පවරාගෙන ඇති බව ය.

රාජ්‍ය සේවා උපදේශක මණ්ඩලය සහ රාජ්‍ය සේවා විනය මණ්ඩලය පිහිටවූයේ ඉහත දැක්වූ කාර්යයන් කරගෙන යාම සඳහා අමාත්‍ය මණ්ඩලයට සහය වීම පිණිස ය. මණ්ඩල දෙක ම සමන්විත වන්නේ සිව් අවුරුදු නිල කාලයක් සඳහා ජනාධිපතිවරයා විසින් පත් කරන සාමාජිකයන් තිදෙනෙකුගෙනි. එයින් එක් අයෙකු ජනාධිපතිවරයා විසින් සභාපති ධූරයට පත් කළ යුතු ය. මණ්ඩල දෙකට ම ලේකම්වරුන් සිටින අතර ඔවුන් පත් කරන්නේ ද ජනාධිපතිවරයා විසිනි. සාමාජිකයන්ගේ වැටුප් හා දීමනා ජාතික රාජ්‍ය සභාවෙන් තීරණය කොට ඒකාබද්ධ අරමුදලින් ගෙවිය යුතු ය. හේතු නොදන්වා ඕනෑම සාමාජිකයෙකු ඕනෑම අවස්ථාවක තනතුරින් ඉවත් කිරීමේ බලය ජනාධිපතිවරයා සතු වේ.

රාජ්‍ය සේවා උපදේශක මණ්ඩලයේ කාර්යය වූයේ 113(1), 113(2) සහ 114 යන වගන්තිවල සඳහන් රාජ්‍ය නිලධාරීන් පත් කිරීම සඳහා විෂයභාර ඇමතිවරයා විසින් උපදේශක මණ්ඩලය විමසූ විට ඇමතිවරයාට අදාල උපදෙස් දීම හෝ නිර්දේශ සැපයීම ය. ඇමතිවරයා එම නිර්දේශ අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කළ පසු අමාත්‍ය මණ්ඩලය විසින් පත්වීම කරනු ලැබේ.

රාජ්‍ය සේවා විනය මණ්ඩලයේ කාර්යය වූයේ රාජ්‍ය නිලධාරීන් සේවයෙන් පහ කිරීම හෝ විනය පාලනය පිළිබඳ කරුණක දී අමාත්‍ය මණ්ඩලයට එම කාර්යය කිරීම සඳහා විෂය භාර ඇමතිවරයා විසින් නිර්දේශ කරන විට ඒ හා අදාළ කරුණු පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස් සැපයීම හෝ නිර්දේශ ඉදිරිපත් කිරීම ය.

රාජ්‍ය නිලධාරීන් මාරු කිරීම හා සම්බන්ධ බලතල සෘජුවම අමාත්‍ය මණ්ඩලය විසින් ක්‍රියාත්මක කළේය. අමාත්‍ය මණ්ඩලයට අවශ්‍ය නම් එම බලතල නිසි කොන්දේසිවලට යටත්ව විෂයභාර අමාත්‍යවරුන්ට පැවරිය හැකි විය.

ඉහත දැක්වූයේ රාජ්‍ය සේවය පාලනය කිරීම සඳහා 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ දක්වා තිබුන විධිවිධානයන් ය. විධිවිධාන පරීක්ෂා කිරීමේ දී පැහැදිලිවම පෙනී යන්නේ 1972 ව්‍යවස්ථාව යටතේ රාජ්‍ය සේවය හා සම්බන්ධ සෑම කාර්යයක්ම සහ බලතලයක්ම සෘජුවම දේශපාලන විධායකය යටතට පවරා ගෙන තිබූ බව ය.

**(iv)** ජනාධිපතිවරයාගේ තත්ත්වය, බලතල හා කාර්යය සම්බන්ධයෙන් 19වන ව්‍යවස්ථා සංශෝධනයෙන් සිදු කළ වෙනස්කම්

අරමුණ : **1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ගොඩ නැගූ ජනාධිපති නිලය ආඥාදායකත්වයෙන් බේරාගෙන ප්‍රජාතන්ත්‍රවාදයට ගැළපෙන ලෙස සකස් කිරීම සඳහා 19වන ව්‍යවස්ථා සංශෝධනය කොතෙක් ප්‍රයෝජනවත් වනවාද යන්න පිළිබඳව අපේක්ෂකයන්ගේ අවබෝධය මැන බැලීම**

**පිළිතුරෙහි අන්තර්ගත විය යුතු වැදගත් කරුණු**

(අ) ජනාධිපති තනතුරේ තත්ත්වය, බලතල හා කාර්යය සම්බන්ධයෙන් 19වැනි ව්‍යවස්ථා සංශෝධනයෙන් ඇති කළ සංවරණ **(ලකුණු 06)**

(ආ) එම සංවරණ 18 වැනි ව්‍යවස්ථා සංශෝධන සමග සැසඳීමේ දී එම ප්‍රතිසංස්කරණවල පවතින සාධනීය ලක්ෂණ **(ලකුණු 02)**

(ඇ) **නිගමනය** : 19 වැනි සංශෝධනය යටතේ යොදා ඇති සංවරණ ප්‍රමාණවත්ද නැද්ද යන්න පිළිබඳව අපේක්ෂකයාගේ පෞද්ගලික තක්සේරුව **(ලකුණු 02)**

නිදහස් ශ්‍රී ලංකාවේ දෙවන සමූහාණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව 1978 දී ක්‍රියාත්මක කරනු ලැබී ය. ව්‍යවස්ථාව මගින් ප්‍රංශ ආණ්ඩුක්‍රමයේ ආදර්ශයෙන් දෙමුහුන් විධායක ක්‍රමයක් ස්ථාපිත කෙරුණි. එය අර්ධ ජනාධිපති ක්‍රමය හෙවත් ජනාධිපති - කැබිනට් ක්‍රමයක් විය. මේ අනුව දේශපාලන විධායකය බවට පත්වූයේ ජනාධිපති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයකි. 1978 ව්‍යවස්ථාව මගින් ජනාධිපති ධුරය වටා සංකේන්ද්‍රණය වූ බලය හේතු කොටගෙන මෙරට දේශපාලන ක්‍රමය තුළ ව්‍යවස්ථානුකූල ඒකාධිපතිත්වයක් නිර්මාණය විය. එහි ප්‍රතිඵලය වූයේ එක් අතකින් සමාජය තුළ මිනිස් නිදහස හා අයිතිවාසිකම් යටපත් වීම සහ අනික් අතින් දූෂණය හා වංචාව වර්ධනය වීමට පටන් ගැනීම ය.

එහෙයින් මුල් අවධියේ පටන් ම 1978 ව්‍යවස්ථාවට එරෙහිව ප්‍රබල විවේචන එල්ල වූ අතර ජනාධිපති ධුරයේ බලතල සීමා කිරීම පිළිබඳ කතිකාව දිග හැරෙන්නට පටන් ගත්තේ ඒ අනුව ය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 වන සංශෝධනය වර්ෂ 2001 ඔක්තෝම්බර් මාසයේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහනය කිරීම මගින් ජනාධිපති ධුරයේ ඇතැම් බලතල හා කාර්යයන් සංවරණය කිරීමට විධිවිධාන පනවනු ලැබී ය. මූලික වශයෙන් එම සංශෝධනය මගින් රජයේ ඇතැම් උසස් තනතුරුවලට හා ඇතැම් කොමිෂන් සභාවලට පත්වීම් දීමේ ජනාධිපතිවරයා සතු අභිමතානුසාරී බලය සංවරණය කිරීමට විධිවිධාන සලසන ලදී.

එහෙත් වර්ෂ 2010 සැප්තැම්බර් මාසයේ දී සම්මත කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වන සංශෝධනය මගින් 17 වැනි ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කළා පමණක් නොව, මෙතෙක් පැවති ජනාධිපති ධුරයට පත්වීමේ වාර දෙකේ සීමාව ද අහෝසි කරන ලදී. එමගින් ජනාධිපති ධුරයේ ව්‍යවස්ථානුකූල ආඥාදායකත්වය ආවරණය කිරීම සඳහා ඉතිරිව පැවති අවසාන සැරසිල්ල ද ගිලිහී ගියේ ය. ජනාධිපති ධුරයේ ආඥාදායක භාවය හා එමගින් සමාජයේ ප්‍රජාතන්ත්‍රවාදය අහෝසිවීමේ තර්ජනය පිළිබඳ ප්‍රශ්නය මුල් කරගෙන 18 වන සංශෝධනය කෙරෙහි ප්‍රබල විවේචනයක් එල්ල විය. ජනාධිපති විධායක ක්‍රමය සම්පූර්ණයෙන් ම අහෝසි කිරීම හෝ එහි බලතල සීමා කිරීම පිළිබඳ කතිකාව නැවත වතාවක් දේශපාලන කරලියට අවතීර්ණ වූයේ මෙම වාතාවරණය තුළ ය. 19 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් ජනාධිපති ධුරයේ බලතල හා කාර්යයන් සංවරණය කිරීමේ ක්‍රියාමාර්ගය සිදු වූයේ මේ ආකාරයෙනි.

### ජනාධිපතිවරයාගේ තත්ත්වය

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ජනාධිපතිවරයාගේ තත්ත්වයෙහි කිසිදු වෙනසක් සිදු කරනු නොලැබී ය. මුල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 30 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපතිවරයා රජයේ ප්‍රධානියා ද, විධායකයේ ප්‍රධානියා ද, ආණ්ඩුවේ ප්‍රධානියා ද, සන්නද්ධ සේවාවන්හි සේනාධිනායකවරයා ද වන්නේ ය. ජනාධිපතිවරයා වෙත පිරිනමන ලද මෙම තත්ත්වය 19 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් ද නොවෙනස්ව ජනාධිපතිවරයා වෙත පිරිනැමී ය.

මුල් ව්‍යවස්ථාවෙහි 30 (2) ව්‍යවස්ථාවට අනුව ජනරජයේ ජනාධිපතිවරයා ජනතාව විසින් තෝරා පත් කරගත යුත්තේ ය. ජනාධිපතිවරයා සාවුරුදු කාලයක් ධූරය දරන්නේ ය. මෙම විධිවිධානය 19 වන ව්‍යවස්ථා සංශෝධනයෙහි 30 (2) ව්‍යවස්ථාව මගින් වෙනස් කරන ලදී. ඒ අනුව ජනාධිපතිවරයාගේ ධූර කාලය වසර පහකට සීමා කර තිබේ.

මුල් ව්‍යවස්ථාවෙහි 31 (2) ව්‍යවස්ථාවට අනුව ජනතාව විසින් දෙවරක් ජනාධිපති ධූරයට තෝරා පත් කරගනු ලැබූ කිසිම තැනැත්තෙක් ඉන් පසුව එම ධූරයට ජනතාව විසින් තෝරා පත් කරගනු ලැබීමට සුදුස්සෙක් නොවන්නේ ය. ජනාධිපති ධූරයට පත්වීමේ මෙම වාර දෙකේ සීමාව වර්ෂ 2010 සැප්තැම්බර් මාසයේ දී සම්මත කරන ලද 18 වන ව්‍යවස්ථා සංශෝධනයෙහි 31 (2) (ආ) ව්‍යවස්ථාව මගින් අවලංගු කරන ලදී. මේ අනුව යම් පුරවැසියෙකුට ඕනෑම වාර ගණනක් ජනතා ඡන්දයෙන් ජනාධිපති ධූරයට පත්වීමේ අවස්ථාව උදාවිය. එහෙත් 19 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් 18 වන සංශෝධනයේ 31 (2) (ආ) ව්‍යවස්ථාව අවලංගු කරමින් යලිත් වරක් මුල් ව්‍යවස්ථාවෙහි 31 (2) ව්‍යවස්ථාව නීතිගත කරන ලදී. එමගින් යම් පුද්ගලයෙකුට ජනාධිපති ධූරයට තේරී පත්වීමට හැකි වාර ගණන දෙකකට සීමා විය.

### ජනාධිපතිවරයාගේ බලතල හා කාර්යය

මුල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි ජනාධිපතිවරයාගේ බලතල හා කාර්යයන් සඳහන් වී තිබෙන්නේ 33 වෙනි සහ 34 වෙනි ව්‍යවස්ථාවල ය. 19 වන සංශෝධනය මගින් මුල් ව්‍යවස්ථාවේ 33 ව්‍යවස්ථාව සම්පූර්ණයෙන් ම අවලංගු කොට නව 33 වෙනි ව්‍යවස්ථාවක් ඇතුලත් කර තිබේ. ඒ අනුව,

33 (1) ජනාධිපතිවරයාගේ කාර්යය විය යුත්තේ,

- (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුගමනය කරන බවට ද ආරක්ෂා කරන බවට ද වගබලා ගැනීම
- (ආ) ජාතික ප්‍රතිසංධානය හා ඒකාබද්ධතාවය ප්‍රවර්ධනය කිරීම
- (ඇ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සහ VII (අ) ව්‍යවස්ථාවේ සඳහන් ආයතනවල නිසි ක්‍රියාකාරිත්වය පහසු කරලීම සහ
- (ඈ) මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් මත නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම් හා ජනමත විචාරණ පැවැත්වීම සඳහා උචිත වාතාවරණ නිර්මාණය කිරීම තහවුරු වන්නේ ය.

ඉහත සඳහන් කාර්යයන් මුල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි ජනාධිපතිවරයා වෙත පැවරී තිබුනේ නැත.

19 වැනි ව්‍යවස්ථා සංශෝධනයේ 32 (3) අනුව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරයා ස්වකීය ධූරයෙහි බලය ප්‍රකාර මාස තුනකට එක් වරක් පාර්ලිමේන්තුවට සහභාගි විය යුත්තේ ය. මෙය 18 වැනි ව්‍යවස්ථා සංශෝධනයෙහි 3 (1) අනුව්‍යවස්ථාවෙහි ද ඇතුලත් විය. එම විධිවිධානය මුල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි ඇතුළත් වූයේ නැත.

19 වැනි ව්‍යවස්ථා සංශෝධනයෙහි 33 (2) ව්‍යවස්ථාව මගින් ජනාධිපතිවරයාට පවරා ඇති බලතල හා කාර්යයන් මුල් ව්‍යවස්ථාවෙහි 33 ව්‍යවස්ථාවේ සඳහන්ව තිබුණි. එයට අමතරව 19 වන සංශෝධනයේ 33 (2) ව්‍යවස්ථාවට ඇතුලත් කර තිබූ (ඉ) ඡේදයෙහි ජනාධිපති නීතිඥයින් පත් කිරීමේ බලය මීට පෙර ජනාධිපතිවරයාට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පවරා නොතිබුණි.

මුල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් අග්‍රවිනිශ්චයකාරවරයා සහ ශ්‍රේෂ්ඨාධිකරණ නිශ්චයකාරවරයන්, අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ එහි අනෙකුත් නිශ්චයකාරවරයන්, අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති හැර අනෙකුත් සාමාජිකයින්, නීතිපති, විගණකාධිපති, පොලිස්පති, ඔම්බුඩ්ස්මන් සහ පාර්ලිමේන්තු මහ ලේකම් යන තනතුරු සඳහා පත්වීම් සිදු කිරීමේ බලය හිමි වූයේ ජනාධිපතිවරයාට ය. එහෙත් එම බලය 19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 41 ඇ (1) අනුව්‍යවස්ථාව මගින් ජනාධිපතිවරයාට අහිමි කර තිබේ. එම අනුව්‍යවස්ථාවෙහි දැක්වෙන පරිදි ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට කරන ලද නිර්දේශයක් මත එම සභාව විසින් අනුමත කර ඇත්නම් මිස, කිසිම ධූරයකට (ඉහතින් සඳහන් කර ඇති) ජනාධිපතිවරයා විසින් කිසිදු තැනැත්තෙකු පත් කරනු නොලැබිය යුත්තේ ය. මේ ආකාරයෙන් ඉහත දැක්වූ උසස් තනතුරුවලට පත්වීම් කිරීමට මෙතෙක් ජනාධිපතිවරයාට තිබූ බලය සංවරණය කර තිබේ.

මුල් ව්‍යවස්ථාවේ VIII පරිච්ඡේදය (19) වන ව්‍යවස්ථා සංශෝධනය මගින් සම්පූර්ණයෙන් ම අවලංගු කර ඇති අතර, ඒ වෙනුවට නව විධිවිධාන හඳුන්වා දී තිබේ. 19 සංශෝධනයෙහි ඇතුළත් VIII පරිච්ඡේදයෙහි විධිවිධාන අතුරින් මුල් ව්‍යවස්ථාවෙහි සඳහන් නොවන සංශෝධිත විධිවිධාන පහත සඳහන් පරිදි වේ.

මුල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුව අමාත්‍ය මණ්ඩලය පත් කිරීමේ දී අමාත්‍යවරුන් අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයින් නොවන අමාත්‍යවරුන් හා නියෝජ්‍ය අමාත්‍යවරුන් පත් කිරීම පිළිබඳ සංඛ්‍යාත්මක සීමාවක් පනවා නොතිබුණි. එහෙත් 19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 46 (1) ව්‍යවස්ථාව මගින් ඒ සම්බන්ධයෙන් සීමා පනවා තිබේ. මේ අනුව,

46 (1) (අ) අමාත්‍ය මණ්ඩලයේ මුළු අමාත්‍යවරයන් සංඛ්‍යාව 30 නොඉක්මවිය යුතු ය.

(ආ) අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයින් නොවන අමාත්‍යවරයන්ගේ හා නියෝජ්‍ය අමාත්‍යවරයන්ගේ සංඛ්‍යාවේ එකතුව 40 නොඉක්මවිය යුතු ය.

එහෙත් ජාතික ආණ්ඩුවක් පිහිටුවන අවස්ථාවක ඉහත සඳහන් අමාත්‍යවරයන් සංඛ්‍යාව කොපමණදැයි තීරණය කළ යුත්තේ පාර්ලිමේන්තුව විසින් බව 19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 46 (4) ව්‍යවස්ථාවේ සඳහන් වේ.

මුල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 47 ව්‍යවස්ථාවට අනුව අමාත්‍යවරයන් හා නියෝජ්‍ය අමාත්‍යවරයන් ඉවත් කිරීමේ අභිමතානුසාරී බලය ජනාධිපතිවරයාට පැවතිය ද එම බලය 19 වන සංශෝධනයේ 46 (3) ව්‍යවස්ථාවෙන් ජනාධිපතිවරයාට අහිමි කර තිබේ. මෙහිදී ඇමතිවරුන් ඉවත් කිරීමේ බලය ජනාධිපතිවරයාට ලැබෙන්නේ අගමැතිගේ උපදෙස් මත පමණි.

මුල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 47 ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරයාගේ අභිමතය පරිදි අගමැතිවරයා ධූරයෙන් ඉවත් කළ හැකි ය. නව සංශෝධනයේ 46 (2) ව්‍යවස්ථාවට අනුව ස්වකීය අත්සනින් ජනාධිපතිවරයා වෙත යවන ලිපියකින් ඉල්ලා අස් වුවහොත් හෝ තවදුරටත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු නොවුවහොත් හෝ මිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ යම් තාක් කල් අමාත්‍ය මණ්ඩලය පවත්නේ ද ඒ තාක් කල් අගමැතිවරයා ස්වකීය ධූරය දරන්නේ ය. මේ අනුව ජනාධිපතිගේ අභිමතය පරිදි අගමැති ධූරයෙන් ඉවත් කිරීමේ බලය අහෝසි කර තිබේ.

ඉහත සඳහන් විධිවිධාන අනුව අගමැති සහ අමාත්‍ය මණ්ඩලය සම්බන්ධයෙන් මෙතෙක් ජනාධිපතිවරයා වෙත පැවති බලතල ඉවත් කර තිබෙන අතර එමගින් අගමැතිවරයාගේ බලය පුළුල් වී තිබේ.

මුල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70 (1) ව්‍යවස්ථාවට අනුව මහ මැතිවරණයක් අවසන් වී වසරක් ගත වූ පසු පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ අභිමතානුසාරී බලය ජනාධිපතිවරයාට පැවතුණි. 19 වන සංශෝධනයේ 70 (1) ව්‍යවස්ථාව මගින් මුල් ව්‍යවස්ථාවේ ඉහත විධිවිධානය අහෝසි කර ඇති අතර ජනාධිපතිවරයාගේ අභිමතය පරිදි පාර්ලිමේන්තුව විසුරුවා හැරිය හැක්කේ පාර්ලිමේන්තුවේ ප්‍රථම රැස්වීමෙන් අවුරුදු හතරක් සහ මාස හයක කාලයක් අවසන් වීමෙන් පසුව ය.

මෙමගින් පාර්ලිමේන්තුවේ අත්තනෝමතිකභාවය ඉස්මතු විය හැකි ය. එමෙන්ම ජනාධිපති සහ පාර්ලිමේන්තුව අතර අඛණ්ඩ ගැටුමකට ද එය හේතු විය හැක.

මුල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 85 (2) වගන්තියට අනුව පාර්ලිමේන්තුව විසින් ප්‍රතික්ෂේප ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය නොවන පනතක් ජනමත විචාරණයකට ලක්කර අනුමැතිය ලබා ගැනීමෙන් ක්‍රියාත්මක කිරීමට ජනාධිපතිවරයාට බලය පැවතිණි. එම බලය 19 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් ඉවත් කර තිබේ.

මුල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 92 (අ) ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිධූර අපේක්ෂකයකුගේ වයස් සීමාව අවුරුදු 30ක් විය. එහෙත් නව සංශෝධනය මගින් එම වයස් සීමාව අවුරුදු 35ක් දක්වා වැඩිකර තිබේ.

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 35 (1) ව්‍යවස්ථාව මගින් ජනාධිපතිවරයාට එරෙහිව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන වගන්තිය යටතේ මූලික අයිතිවාසිකම් නඩුවක් පැවරිය හැකි බව පිළිගෙන තිබේ.

**6 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




C කොටසේ ප්‍රශ්න අතුරින් වැඩිම තෝරා ගැනීමක් ඇත්තේ 6 වන ප්‍රශ්නය වන අතර එය 72% කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20 ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 38%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 32%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 24%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 6%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 16 හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 06% ක් වන අතර ලකුණු 05 හෝ ඊට අඩුවෙන් ලබාගත් පිරිස 38% කි. එමෙන්ම අයදුම්කරුවන්ගෙන් 56%ක් ම 06 - 15 අතර ලකුණු ලබා ගෙන ඇත.




මෙම ප්‍රශ්නය කොටස් 4කින් සමන්විත වන අතර ඉන් පහසුතාව වැඩි ම කොටස (i) වේ. එහි පහසුතාව 43% කි. පහසුතාව අඩු ම කොටස (iii) වන අතර එහි පහසුතාව 36% කි.

මෙම ප්‍රශ්නයට කොටස් 4ක් ඇති අතර ඉන් පහසුතාව වැඩිම කොටස (i) වේ. එහි පහසුතාව 43%කි. පහසුතාව අඩුම කොටස (iii) වන අතර එහි පහසුතාව 36%කි.

මෙම ප්‍රශ්නය කොටස් හතරකින් යුක්ත වන අතර ඉන් තෝරා ගත් කොටස් දෙකකට පමණක් පිළිතුරු ලිවිය යුතුය. ප්‍රශ්න පත්‍රයේ B හා C කොටස් දෙකෙන් වැඩිම අපේක්ෂකයන් සංඛ්‍යාවක් විසින් තෝරා ගත් ප්‍රශ්නය මෙය වේ. එය තෝරාගත් අපේක්ෂකයින් ප්‍රමාණය 72%කි. ලකුණු 16 - 20 අතර ලබා ගත් සංඛ්‍යාව 6%කි. මෙහි පළමුවන කොටස පමණක් පහසුතාව 40% ඉක්මවා ඇත.

**I කොටස**

මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමේ අරමුණ වූයේ 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ සමාජ, ආර්ථික හා දේශපාලන ප්‍රතිඵල පිළිබඳව අපේක්ෂකයින්ගේ දැනුම පරීක්ෂා කර බැලීම ය. මෙහි පහසුතාව 43%කි. බොහෝ අපේක්ෂකයින් ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ යෝජනා පැහැදිලි කර තිබුන ද එම යෝජනා මගින් ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලනය යන ක්ෂේත්‍රයන්හි වූ විවිධ වෙනස් වීම් පිළිබඳව පැහැදිලි කර තිබුනේ නැත. සෑම වසරක ම අසන ලද ප්‍රශ්නයක් වුවද ඉහළ ලකුණක් ලබා ගැනීම සඳහා අවශ්‍ය දැනුම ප්‍රමාණවත්ව නොතිබූ බව එයින් පැහැදිලි විය. පන්ති කාමරය තුළ ඩොනමෝර් යෝජනා හා ඒ තුළින් ඇති වූ සමාජ, ආර්ථික, දේශපාලන වෙනස්වීම් පිළිබඳව උදාහරණ සහිතව සාකච්ඡා කිරීමෙන් මේ පිළිබඳව විභාග අපේක්ෂකයන්ගේ දැනුම වර්ධනය කළ හැකි ය.

**II කොටස**

මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමේ අරමුණ වූයේ නිදහස් හා ස්වාධීන රාජ්‍යය සේවාවක් පවත්වාගෙන යාමට සෝල්බරි කොමිසම විසින් දැමූ පදනම පිළිබඳව හා එහි වැදගත්කම පිළිබඳව අපේක්ෂකයින්ගේ දැනුම පරීක්ෂා කර බැලීමය.

මෙහි පහසුතාව 40%කි. රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම, අධිකරණ සේවයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා යන කොටස් දෙකම අපේක්ෂකයන් සමබරව තෝරාගෙන තිබුණි. රාජ්‍ය සේවය හා අධිකරණ සේවය පිළිබඳව අපේක්ෂකයන් පිළිතුරු ලියා තිබුන ද, සෝල්බරි ව්‍යවස්ථාව මගින් සපයා තිබූ ව්‍යවස්ථාමය විධි විධාන දක්වා නොතිබිණි. එසේම එම විධි විධාන ඒවායේ ස්වාධීනත්වය රැකීමට කෙතරම් දුරට ප්‍රමාණවත් වී දැයි පැහැදිලි කළ යුතුව තිබිණි.

පන්ති කාමරය තුළ මේ පිළිබඳව ඉගැන්වීමේ දී රාජ්‍ය සේවය හා අධිකරණ සේවයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා ව්‍යවස්ථාවෙන් සැපයූ ආරක්ෂණ විධි විධාන පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබා දීමට කටයුතු කිරීම තුළින් මේ අඩුපාඩුව මග හරවා ගත හැකිවේ.

**III කොටස**

6 වන ප්‍රශ්නයේ අඩුම පහසුතාවක් දක්වන කොටස මෙය වන අතර එම ප්‍රමාණය 36%කි. මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමේ අරමුණ වූයේ අධිකරණ සේවය දේශපාලන විධායකය යටතට පත්කර ගැනීම උදෙසා 1972 ව්‍යවස්ථාවේ යෙදූ විධි විධාන සහ එහි ප්‍රතිඵල පිළිබඳව අපේක්ෂකයින්ගේ දැනුම පරීක්ෂා කර බැලීම ය.

අධිකරණ සේවය හා රාජ්‍ය සේවය පාලනය කිරීම සඳහා ව්‍යවස්ථාවෙන් යොදා තිබූ විධි විධාන පිළිබඳ කොටස් දෙකම සමබරව අපේක්ෂකයින් තෝරාගෙන තිබුණි. එම පිළිතුරුවල අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා ව්‍යවස්ථාවේ තිබූ ආවරණ දක්වා තිබුණ ද, ඒවා ඉක්මවා යමින් අධිකරණය විධායකයේ පාලනයට යටත් කර තිබූ බව දක්වා නොතිබිණි.

**IV කොටස**

මෙම කොටසේ පහසුතා මට්ටම 38%කි. මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමේ අරමුණ වූයේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ගොඩ නැගූ ජනාධිපති ධුරය ආඥාදායකත්වයෙන් බේරාගෙන ප්‍රජාතන්ත්‍රවාදයට ගැළපෙන ලෙස සකස් කිරීම සඳහා 19වන ව්‍යවස්ථා සංශෝධනය කොතෙක් දුරට ප්‍රයෝජනවත් වනවා ද යන්න පිළිබඳව අපේක්ෂකයින්ගේ අවබෝධය මැනීම ය.

අපේක්ෂකයන් මෙම කොටසට පිළිතුරු සැපයීමේ දී 1978 ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරයාගේ බලතල හා කාර්යයන් දක්වා තිබුන ද, 19වන ව්‍යවස්ථා සංශෝධනයෙන් සිදු කළ වෙනස්කම් පිළිබඳව අවධානය යොමු කර තිබුනේ නැත. බොහෝ පිළිතුරුවල දක්නට ලැබුනේ ජනාධිපතිවරයාගේ බලතල හා කාර්යයන් පිළිබඳවයි.

ඉදිරිපත් කර තිබූ පිළිතුරු ද සාර්ථක නොවීය. එයට හේතුව 19වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත වී ඉතා කෙටි කාලයක් තුළ මෙම මාතෘකාව ප්‍රශ්න පත්‍රයට එක් කිරීම තුළින් ගුරු සිසු දෙපක්ෂයටම ප්‍රමාණවත් දැනුමක් ලබා ගැනීමට අවශ්‍ය සන්නිවේදනයක් නොලැබීමත් ය.

මේ තත්ත්වය මග හරවා ගැනීමට 19වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පමණක් නොව කාලීනව සිදුවන වෙනත් දේශපාලන ප්‍රතිසංස්කරණ පිළිබඳව ගුරු සිසු දෙපාර්ශවයට ම සම්ප්‍රේෂණය වීමේ වැඩමුළු පැවැත්වීම මගින් නව දැනුම පන්ති කාමරයට ගෙන ආ හැකි ය.

## 7 ප්‍රශ්නය

7. පහත දැක්වෙන ඒවායින් **ඕනෑම දෙකක්** විස්තර කරන්න.

(i) ආණ්ඩුකරණය තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ කාර්යභාරය
(ii) මානව හිමිකම් කඩවීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම සඳහා 1978 ව්‍යවස්ථාව යටතේ ගොඩ නැගූ යාන්ත්‍රණය
(iii) රාජ්‍ය සේවයේ අල්ලස් හා දූෂණය මර්දනය කිරීම සඳහා වර්තමාන ආණ්ඩුව ගෙන ඇති පියවර
(iv) අධිකරණයේ ස්වාධීනත්වය පවත්වාගෙන යාම සඳහා 1978 ව්‍යවස්ථාව මගින් සපයා ඇති ආරක්ෂණ විධිවිධාන

**(i)** ආණ්ඩුකරණය තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ කාර්යභාරය

අරමුණ : **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ කාර්යභාරය පිළිබඳවත් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයට එමගින් ලැබෙන දායකත්වය කොපමණ ද යන්න පිළිබඳවත් අපේක්ෂකයන්ගේ දැනුම මැන බැලීම**

**පිළිතුරෙහි අන්තර්ගත විය යුතු වැදගත් කරුණු**

(අ) ව්‍යවස්ථා සභාවේ සංයුතිය **(ලකුණු 02)**
(ආ) ව්‍යවස්ථා සභාවේ කාර්යයන් **(ලකුණු 06)**

**(ඇ) නිගමනය : ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව රාජ්‍යයේ හා පොලීසියේ ස්වාධීනත්වය තහවුරු කොට පවත්වාගෙන යාමට ප්‍රයෝජනවත් වන ප්‍රමාණය පිළිබඳව අපේක්ෂකයාගේ පෞද්ගලික තක්සේරුව (ලකුණු 02)**

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයාට පවරා තිබුන විධායක මට්ටමේ පත් කිරීම් සහ ස්වාධීන කොමිෂන් සභාවලට කරන පත් කිරීම් පිළිබඳ බලතල 1978 සිට බලයට පත් වූ සෑම ජනාධිපතිවරයෙක් විසින් ම හිතුවක්කාරී සහ අත්තනෝමතික ලෙස භාවිතයට ගන්නා ආකාරය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයේ සිට ම දැකිය හැකි විය. මෙහි ප්‍රතිඵලය වූයේ එක් අතකින් රාජ්‍ය සේවයේ ඉතාම වැදගත් ආයතන පද්ධතිය දේශපාලනීකරණය වීම හේතුවෙන් ඒවායේ ස්වාධීනත්වය විනාශ වී යාම ය. අනික් අතින් එම ආයතන පද්ධතියෙන් ජනතාවට සිදුවිය යුතු සේවාව නිසියාකාරව නොලැබී යාම ය. මෙම තත්ත්වය සංවරණය කිරීම සඳහා 2001 ඔක්තෝම්බර් 03 දින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද 17වන සංශෝධනය යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පිහිටවූයේ ය. නමුත් 2010 සැප්තැම්බර් 08 දින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද 18වන සංශෝධනය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අහෝසි කළේ ය. එය යළි ස්ථාපිත කරන්නේ 2015 මැයි 15 දින ක්‍රියාවට නැංවූ 19වන ව්‍යවස්ථා සංශෝධනය මගිනි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පහත දැක්වෙන ආකාරයට සාමාජිකයින් දස දෙනෙකුගෙන් සමන්විත වේ.

(අ) අගමැතිවරයා
(ආ) කථානායකවරයා
(ඇ) විරුද්ධ පක්ෂයේ නායකවරයා
(ඈ) ජනාධිපතිවරයා විසින් පත් කරන එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු
(ඉ) අගමැතිවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකයා විසින් නම් කරන ලදුව ජනාධිපතිවරයා විසින් පත් කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දෙදෙනෙක් සහ සිවිල් සාමාජිකයින් තිදෙනෙක්
(ඊ) අගමැති සහ විරුද්ධ පක්ෂයේ නායකයා අයත් නොවන පාර්ලිමේන්තුව නියෝජනය කරන අනෙක් දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් සාමූහිකව යෝජනා කරන ජනාධිපති විසින් පත් කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්

කථානායකවරයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභාපතිවරයා වන්නේ ය. මූලසුන දැරිය යුත්තේ ඔහු විසිනි. කථානායකවරයා නැතිවිට අගමැතිවරයා ද, ඔහුද නොමැති විට විරුද්ධ පක්ෂයේ නායකයා විසින් ද මූලසුන දැරිය යුතු ය. ගණපූරණය සඳහා අවශ්‍ය වන්නේ සාමාජිකයින් පස් දෙනෙක් පමණි. සභාව අඩුම වශයෙන් මාසයකට දෙවතාවක් රැස්විය යුතු ය. අවශ්‍යතාවන් අනුව ඕනෑම වාර ගණනක් රැස්වීම් පැවැත්විය හැකි ය.

සභාපතිවරයාගේ අණ පරිදි ලේකම්වරයා විසින් රැස්වීම් කැඳවිය යුතු ය. සභාවේ තීරණ ඒකමතිකව ගත යුතු ය. එසේ නොහැකි වූ විට පැමිණ සිටින සංඛ්‍යාවෙන් අඩුම වශයෙන් පස් දෙනෙකුගේ අනුමතියෙන් ගත යුතු ය. මූලසුන දරන්නාට විශේෂ ඡන්දයක් නැත. නමුත් සම ඡන්ද අවස්ථාවකදී තීරක ඡන්දයක් හිමි වේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ කාර්යභාරය දෙයාකාර වේ.

(1) සමහර පත්කිරීම් සඳහා ජනාධිපතිවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීම. මෙයට අයත් වන්නේ පහත දැක්වෙන කොමිෂන් සභාවල සභාපතිවරුන් සහ සාමාජිකයින් පත් කිරීම ය.

(අ) මැතිවරණ කොමිෂන් සභාව
(ආ) රාජ්‍ය සේවා කොමිෂන් සභාව
(ඇ) ජාතික පොලිස් කොමිෂන් සභාව
(ඈ) විගණන සේවා කොමිෂන් සභාව
(ඉ) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

(ඊ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව
(උ) මුදල් කොමිෂන් සභාව
(ඌ) ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව
(එ) සීමා නිර්ණය කොමිෂන් සභාව

සභාපති තනතුර සඳහා නම් තුනක් නිර්දේශ කළ යුතු ය. නිර්දේශ ඉදිරිපත් කළ දින සිට දින 14ක් ගත වීමට ප්‍රථමයෙන් ජනාධිපතිවරයා අදාල පත්වීම් කළ යුතු ය. එසේ නොකරන්නේ නම් නියමිත දින ගණන ඉක්ම වූ විට නිර්දේශ කිරීම් ස්වයංක්‍රීයවම ක්‍රියාත්මක වේ. මෙවැනි තත්ත්වයක් තුළ සභාපති තනතුරට පත්වන්නේ නිර්දේශ කළ නම් තුනේ මුලට නම සඳහන් තැනැත්තා ය.

(2) සමහර පත්කිරීම් සඳහා ජනාධිපති විසින් ඉදිරිපත් කරන නිර්දේශවලට අනුමැතිය දීම. එසේ කරන පත් කිරීම් පහත සඳහන් පරිදි වේ.

(අ) අග්‍රවිනිශ්චයකාරවරයා සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්
(ආ) අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්
(ඇ) අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයා හැර අනෙක් සාමාජිකයින් (අග්‍රවිනිශ්චයකාරවරයා හැරුන විට අනෙක් පත්කිරීම් සඳහා අග්‍රවිනිශ්චයකරුගේ අදහස් විමසිය යුතු ය.)
(ඈ) නීතිපතිවරයා
(ඉ) විගණකාධිපතිවරයා
(ඊ) පොලිස්පතිවරයා
(උ) පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා
(ඌ) පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතිය නොමැතිව මේ කිසිදු තනතුරකට පත් කිරීමට ජනාධිපතිවරයාට බලය නැත. ඉහතින් දැක්වූයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ කාර්යභාරය යි. එයින් පෙනී යන්නේ ආණ්ඩුකරණය තුළ සමහර විධායක බලතල ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව බල හවුල්කාරිත්වයක් යටතේ ක්‍රියා කරන බව ය.

**(ii)** මානව හිමිකම් කඩවීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම සඳහා 1978 ව්‍යවස්ථාව යටතේ ගොඩ නැගූ යාන්ත්‍රණය

අරමුණ : **1978 ව්‍යවස්ථාවෙන් ප්‍රදානය කර ඇති මානව හිමිකම් භුක්ති විඳීම සවිබල ගැන්වීම සඳහා ව්‍යවස්ථාවෙන් නිර්මාණය කර ඇති යාන්ත්‍රණයේ ස්වභාවය පිළිබඳව අපේක්ෂකයන්ගේ දැනුම පරීක්ෂා කර බැලීම**

**පිළිතුරෙහි අන්තර්ගත විය යුතු වැදගත් කරුණු**

(අ) ශ්‍රේෂ්ඨාධිකරණය, මානව හිමිකම් කොමිසම හා ඔම්බුඩ්ස්මන් වෙත ඇති බලතල හා කාර්යයන් **(ලකුණු 06)**

**(ආ) නිගමනය : මේ යාන්ත්‍රණය මානව හිමිකම් සුරක්ෂිත කොට පවත්වාගෙන යාම සඳහා කොතරම් දුරට යෝග්‍ය වනවා ද තක්සේරු කිරීම (ලකුණු 04)**

මානව හිමිකම් කඩවීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම සඳහා 1978 ව්‍යවස්ථාවෙන් ගොඩ නගා ඇති යාන්ත්‍රණය කොටස් තුනකින් සමන්විත වේ. ඒවා නම්,

(1) ශ්‍රේෂ්ඨාධිකරණය
(2) මානව හිමිකම් කොමිසම
(3) පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්වරයා

**(1) ශ්‍රේෂ්ඨාධිකරණය**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 118 වන වගන්තියේ (ආ) උප වගන්තිය මගින් මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වූ අධිකරණ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට පවරා ඇත. 126 (1) වගන්තියේ දැක්වෙන ආකාරයට iii වැනි පරිච්ඡේදයෙන් හෝ iv පරිච්ඡේදයෙන් ප්‍රකාශ කොට පිළිගන්නා ලද යම් මූලික අයිතිවාසිකමක් නැතහොත් භාෂා අයිතිවාසිකම යම් විධායක හෝ පරිපාලන ක්‍රියාවක් මගින් කඩ කිරීම හෝ කඩ කිරීමට ආසන්නව පැවතීම හා සම්බන්ධ කවර වූ හෝ ප්‍රශ්නයක් විභාග කොට තීරණය කිරීමේ තනි හා අනන්‍ය අධිකරණ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට ඇත්තේ ය.

ඉහත දැක්වූ කවර හෝ ක්‍රියාවකින් මූලික අයිතිවාසිකමක් හෝ භාෂා අයිතිය කඩ වූ විට එයින් හානියක් වූ තැනැත්තාට එසේ වූ දිනයේ සිට මාසයක් ගත වීමට පෙර තමන් විසින් හෝ නීතිඥයෙකු මාර්ගයෙන් සහනයක් හෝ පිහිටක් ලබා දෙන ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයට ඉල්ලීමක් කළ හැක. ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රථමයෙන් ම කරනුයේ ඉල්ලීමට අවසර දිය යුතුද නැද්ද යන්න සළකා බැලීම ය. මෙම පූර්ව විභාග කිරීම කරනු ලබන්නේ විනිශ්චයකාරවරුන් දෙදෙනෙකු විසිනි. අවසර දුනහොත් ඉල්ලීම විභාග කළ යුතු අතර, මාස දෙකක් ඇතුලත දී තීන්දුව ප්‍රකාශයට පත් කළ යුතු ය.

මෙම යාන්ත්‍රණයේ අඩුපාඩු කිහිපයක් ද විචාරකයින් පෙන්වා දේ. එකක් වන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයට යාමට දී ඇති කාලය ප්‍රමාණවත් නොවන බවය. දෙවැන්න වන්නේ ඒ සඳහා විශාල මුදල් ප්‍රමාණයක් අවශ්‍ය බවය. තුන්වැන්න වන්නේ මූලික අයිතිවාසිකම් පිළිබඳව ජනතාවට ප්‍රමාණවත් අවබෝධයක් නොමැති බැවින් එම පහසුකම නිසිලෙස ප්‍රයෝජනයට ගැනීමට ජනතාව උනන්දු නොවන බවය.

**(2) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

1996 අංක 21 ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ ප්‍රතිපාදන අනුව පිහිටුවා ඇත. සාමාජිකයින් පස් දෙනෙකුගෙන් සමන්විත වන අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කෙරේ. කොමිෂන් සභා පනතේ 10 සහ 11 වගන්තිවලින් කොමිෂන් සභාවේ බලතල හා කාර්යයන් දක්වා ඇත. එම කාර්යයන්ගෙන් එකක් වන්නේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම හෝ උල්ලංඝනය කිරීමට ආසන්නව තිබීම සම්බන්ධයෙන් වූ පැමිණිලි පිළිබඳ විභාග කිරීම සහ පනතෙන් සලසා ඇති විධිවිධානවලට අනුකූලව සමථයට පත් කිරීමේ හා සමගි කිරීමේ මාර්ගයෙන් ඒවා විසඳීම සඳහා විධිවිධාන සැලැස්වීමය. පනතේ 14 වන වගන්තිය අනුව කොමිෂන් සභාව විසින් එහි මෙහෙයවීමෙන් හෝ අතෘප්තියට පත් තැනැත්තෙකු හෝ තැනැත්තන් සමූහයක් වෙනුවෙන් ක්‍රියා කරන තැනැත්තෙකු විසින් කොමිෂන් සභාව වෙත කරන ලද පැමිණිල්ලක් මත,

(අ) විධායක හෝ පරිපාලන ක්‍රියාවක් මගින් හෝ
(ආ) 1979 අංක 48 දරණ තස්ත්‍රවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත යටතේ යම් තැනැත්තෙකු විසින් සිදු කරන ලද වරදක් සංස්ථාපනය කරන ක්‍රියාවක ප්‍රතිඵලයක් වශයෙන් අතෘප්තියට පත් එම තැනැත්තාගේ හෝ එම තැනැත්තන් සමූහයේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් පිළිබඳ චෝදනාවක් කොමිෂන් සභාව විසින් විමර්ශනය කළ හැකි ය.

විමර්ශනයක දී මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් හෝ ආසන්න උල්ලංඝනය වීමක් හෙළිදරව් වී නොමැති නම් ඒ බව වාර්තාගත කළ යුතු අතර ඒ බව දින 30ක් ඇතුළත පැමිණිල්ල කළ තැනැත්තාට දැන්විය යුතු ය.

විමර්ශනයක දී මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් හෝ එසේ වීමට ආසන්න තත්ත්වයක් පවතී නම් එය සමථය කිරීමට හෝ සමගි කිරීමට බලය තිබෙන අතර ඒ සඳහා සමථකරුවන් හෝ සමගිකරුවන් පත් කිරීමට කොමිසම ක්‍රියා කළ යුතු ය. සමගි කිරීම මගින් අදාල කරුණ නිරාකරණය කළ හැකි නම් එය බලාත්මක කිරීම සඳහා නියෝග නිකුත් කිරීමේ බලය කොමිසමට හිමි වේ. සමථ කිරීම අපහසු වූ විට කොමිසමට පහත සඳහන් පියවර ගත හැක.

(අ) මානව අයිතිවාසිකම හෝ අයිතිවාසිකම් උල්ලංඝනය කළ තැනැත්තාට හෝ තැනැත්තන්ට එරෙහිව නඩු පවරන ලෙස හෝ වෙනත් අධිකරණ ක්‍රියාමාර්ග ගන්නා ලෙස අදාල බලධාරී ආයතනවලට නිර්දේශ කිරීම

(ආ) මානව අයිතිවාසිකම් පිළිබඳව ක්‍රියාකිරීමේ අධිකරණ බලය සහිත අධිකරණයකට ඍජුව ම කරුණ යොමු කිරීම

(ඇ) උල්ලංඝනය කිරීම හෝ එසේ කිරීම දිගටම සිදුවීම වැළැක්වීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස අදාළ බලධාරීන්ට නිර්දේශ ඉදිරිපත් කිරීම

(ඈ) මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය වීම හෝ එසේවීමට ආසන්න වීම කෙරෙහි බලපෑ ක්‍රියාව හෝ නොකර හැරීම නැවත සලකා බලන ලෙස හෝ නිවැරදි කරන ලෙස නිර්දේශ කිරීම

(ඉ) මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය වීම හෝ ආසන්න වී තිබීම කෙරෙහි බලපාන තීරණය නැවත සලකා බලන ලෙස හෝ නිවැරදි කරන ලෙස නිර්දේශ කිරීම

(ඊ) මූලික අයිතිවාසිකම උල්ලංඝනය වීම හෝ එසේවීමට ආසන්න වීම කෙරෙහි හේතු සාධක වූ තීරණය, නිර්දේශය, ක්‍රියාව හෝ නොකර හැරීම කෙරෙහි බලපෑවේ යම් ක්‍රියා පිළිවෙතක් ද එය වෙනස් කරන ලෙස නිර්දේශ කිරීම

(උ) මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය වීම හෝ එසේවීමට ආසන්න වීම කෙරෙහි බලපෑ තීරණය, නිර්දේශය, ක්‍රියාව හෝ නොකර හැරීම කෙරෙහි බලපෑ හේතු සාධක දැක්විය යුතු බවට නියම කිරීම

ඉහත දැක්වූ ආකාරයට නිර්දේශ කිරීමක් කළ විට එම නිර්දේශයේ පිටපත් අතෘප්තියට පත් තැනැත්තාට, අදාළ ආයතනයේ ප්‍රධානියාට සහ ආයතනය භාර ඇමතිවරයාට යැවිය යුතු ය. මෙයාකාරයට නිර්දේශ ඉදිරිපත් කළ පසු එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අදාල බලධාරියා හෝ ආයතනය ගත් පියවරවල් ගැන නියමිත කාලයක් තුළදී කොමිසමට වාර්තා කරන ලෙස නියම කිරීමේ බලය කොමිසම සතු වේ. කොමිසමේ නියෝගය නොසළකා හැර ඇති විටක හෝ ගෙන ඇති පියවරවල් ප්‍රමාණවත් නොවන බව කොමිසමට පෙනී යන්නේ නම් කොමිසම විසින් ඒ පිළිබඳ වාර්තාවක් ජනාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතු අතර ජනාධිපතිවරයා විසින් එම වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිසමේ ක්‍රියාකාරිත්වය දෙස බලන විට කැපී පෙනෙන ලක්ෂණ දෙකක් හඳුනාගත හැක.

(1) වින්දිතයා හෝ වින්දිත පාර්ශවය විසින්ම කොමිසමට පැමිණිලි ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවීම. ඒ වෙනුවෙන් වෙනත් අයෙකුට වුවද පැමිණිල්ලක් ඉදිරිපත් කළ හැකි වීම.

(2) ඉහත දැක්වූ 1979 තස්ත්‍රවාදය වැළැක්වීමේ පනත හා සම්බන්ධ මූලික අයිතිවාසිකම් කඩවීමක් පිළිබඳව සම්බන්ධ රාජ්‍ය නොවන පෞද්ගලික පාර්ශවයකට එරෙහිව වුවද පරීක්ෂණයක් පැවැත්වීමේ බලය කොමිසමට තිබීම.

(3) පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මාන්)

1978 දෙවන ජනරජ ව්‍යවස්ථාවෙන් හඳුන්වා දෙන ලදි. ව්‍යවස්ථාවේ 156 (1) වගන්තියේ දැක්වෙන ආකාරයට, "පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් ධූරය ඇති කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් නීතියෙන් විධිවිධාන සැලැස්විය යුත්තේ ය. රජයේ නිලධරයන් විසින් සහ රාජ්‍ය සංස්ථාවල, පළාත් පාලන ආයතනවල හා එවැනි වෙනත් ආයතනවල නිලධරයන් විසින් සිදු කරනු ලබන මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම සහ වෙනත් අසාධාරණ ක්‍රියා ගැන කරනු ලබන පැමිණිලි හෝ චෝදනා ඒ නීතියේ විධිවිධානවලට අනුකූලව හා යටත්ව පරීක්ෂා කර බලා වාර්තා කිරීමේ කාර්යභාරය පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා වෙත පැවරෙන්නේ ය." ඒ අනුව පාර්ලිමේන්තුව විසින් 1981 පරිපාලනය පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් පනත පනවන ලදී. 1994 අංක 26 දරණ පනතින් මුල් පනත සංශෝධනය කළේ ය.

ඔම්බුඩ්ස්මන් පත් කරන්නේ ජනාධිපතිවරයා විසිනි. ඒ ඔහු විසින් කරන නිර්දේශය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් අනුමත කිරීමෙන් පසුව ය. මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ඔම්බුඩ්ස්මන්වරයාට හිමි වී තිබෙන විශේෂ බලතල දෙකක් පෙන්වා දිය හැක.

(1) මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය වීමක් නොවන්නා වූ වෙනත් අසාධාරණ සහ අයුක්ති සහගත කටයුත්තක් රාජ්‍යයට හෝ රාජ්‍යයට අනුබද්ධිතව සිදුවන විටදී මැදිහත් වීමට ඇති බලය

(2) යම් තීරණයක්, නිර්දේශයක්, ක්‍රියාවක් හෝ නොකර හැරීමක් රිට් ආඥාවකින් හෝ වෙනත් අන්‍යාකාරයකින් ප්‍රශ්න නොකළ යුතු යැයි යම් නීතියක සඳහන් වන විට පවා එය නොතකා කටයුතු කිරීමට ඇති බලය

මූලික අයිතිවාසිකමක් කඩවීමක් හෝ වෙනත් අයුක්තියක් සිදු කිරීම පිළිබඳ පැමිණිල්ල ඔම්බුඩ්ස්මන්වරයාට දෙයාකාරයකින් ඉදිරිපත් කළ හැක.

(1) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හරහා මහජන පෙත්සම් කාරක සභාවට ඉදිරිපත් කරන පෙත්සමක් මහජන පෙත්සම් කාරක සභාව විසින් ඔම්බුඩ්ස්මාන්වරයාට ඉදිරිපත් කිරීම මගින්

(2) පීඩාවට පත් වූ තැනැත්තා හෝ තැනැත්තන් විසින් සෘජුව ම ඔම්බුඩ්ස්මන්වරයාට ඉදිරිපත් කිරීම මගින්

මෙයාකාරයට ඉදිරිපත් කරන පැමිණිල්ලක් හෝ චෝදනාවක් මගින් රාජ්‍ය හෝ රාජ්‍යයට අනුබද්ධ ආයතනයක් හෝ ආයතනයක නිලධාරියෙකු විසින් මූලික අයිතිවාසිකමක් කඩකිරීමක් හෝ වෙනත් අයිතිවාසිකමක් කඩ කිරීමක් හෝ වෙනත් අයුක්තියක් කර ඇතැයි අනාවරණය වන බව ඔම්බුඩ්ස්මන්වරයාගේ මතය වන්නේ නම් ඔහු විසින් ඒ පිළිබඳව පරීක්ෂා කොට වාර්තා කළ යුතු ය. පරීක්ෂණය පැවැත්වීමට ප්‍රථමයෙන් ඒ බව අදාල ආයතන ප්‍රධානියාට ලිඛිතව හෝ වාචිකව සිද්ධිය සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කළ හැක. අවශ්‍ය නම් වාචික ලිඛිත සාක්ෂි ලබාගත හැක. ඔම්බුඩ්ස්මාන් තම පරීක්ෂණයේ දී පහත දැක්වෙන කරුණු සළකා බැලිය යුතු ය.

(1) යම් මූලික අයිතිවාසිකමක් කඩකර තිබේ ද? නැතිනම් කඩවීමට ආසන්න වී තිබේ ද?

(2) පරීක්ෂණයට විෂය වූ තීරණය, නිර්දේශය, ක්‍රියාව හෝ නොකර හැරීම ;

(අ) නීතියට පටහැනි ද?

(ආ) සිද්ධිය හෝ නීතිය පිළිබඳව වූ වැරදීමක් මත සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් පදනම් වූයේ ද?

(ඇ) **(1)** අසාධාරණ, අයුක්ති සහගත, පීඩාකාරී හෝ නොමනා වෙනස්කම් කිරීමක් වූයේ ද?

**(2)** නැතිනම් වෙනත් ආකාරයකින් සාවද්‍ය වූයේ ද?

(ඈ) අසාධාරණ, අයුක්ති සහගත, පීඩාකාරී හෝ නොමනා වෙනස්කම් කිරීමක් වන්නා වූ හෝ විය හැකි ව්‍යවහාරයකට අනුකූල වූයේ ද?

(ඉ) අභිමතයක් ක්‍රියාත්මක කිරීමේදී

**(1)** නොමනා කාර්යයක් සඳහා හෝ අදාල නොවන හේතු මත හෝ අදාල නොවන කරුණු සැළකිල්ලට ගෙන හෝ වැදගත් කරුණු සැළකිල්ලට නොගෙන සිදු කරන ලද්දේ ද?

**(2)** හේතු දැක්විය යුතුව තිබිය දී හේතු දැක්වීමක් නොමැතිව කරන ලද්දේ ද?

(ඊ) අසාධාරණ ලෙස ප්‍රමාද වීම, උදාසීනතාවය හෝ නොසැළකිල්ල නිසා සිදු වූයේ ද?

ඉහත දැක්වූ නිශ්චය කිරීම හෝ කිරීම් ඒ සඳහා හේතු සහිතව අදාළ ආයතනයේ ප්‍රධානියාට, එම ආයතනය භාර අමාත්‍යවරයාට සහ මහජන පෙත්සම් කාරක සභාවට වාර්තා කළ යුතු ය. මූලික අයිතිවාසිකමක් කඩ වී ඇත්නම් හෝ වෙනත් අයුක්තියක් සිදු වී ඇත්නම් හෝ එසේ වීමට ඉඩ තිබේ නම් ඒ සඳහා ගතයුතු පියවර නිර්දේශ කිරීමේ බලය ඔහුට ඇත. නිර්දේශය ක්‍රියාත්මක කළාද නැත්ද යන්න පිළිබඳව වාර්තාවක් ජනාධිපතිට සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය. ඔම්බුඩ්ස්මන් පරීක්ෂණ පවත්වන්නේ අප්‍රසිද්ධියේ ය.

**(iii) රාජ්‍ය සේවයේ අල්ලස් හා දූෂණය මර්දනය කිරීම සඳහා වර්තමාන ආණ්ඩුව ගෙන ඇති පියවර**

**අරමුණ : රාජ්‍ය සේවය වසා පැතිර පවතින අල්ලස් දූෂණ හා වංචා සහ එය ලාංකික සමාජයට බලපා ඇති ආකරය පිළිබඳව අපේක්ෂකයන්ගේ දැනුම පරීක්ෂා කර බැලීම**

**පිළිතුරෙහි අන්තර්ගත විය යුතු වැදගත් කරුණු**

(1) අල්ලස් දූෂණ සහ වංචා මර්දනය කිරීම සඳහා දැනට ගෙන ඇති පියවර **(ලකුණු 06)**
(2) ඒවායේ සාර්ථක අසාර්ථකභාවය පිළිබඳ තුලනාත්මක තක්සේරුවක් **(ලකුණු 04)**

තුන්වන ලෝකයේ රටවල්වල ආර්ථික සංවර්ධනය අඩාල වීම සම්බන්ධයෙන් බලපා ඇති ප්‍රධානම හේතුවක් ලෙස ලෝක බැංකුව පෙන්වා දෙන්නේ රාජ්‍ය අංශයේ පවතින බරපතල වංචාව, අල්ලස, දූෂණය හා නාස්තිය යි. වර්තමාන ආණ්ඩුව බලයට පත්වීමට පෙර පැවති ජනාධිපතිවරණයේ දී සහ පාර්ලිමේන්තු මැතිවරණයේ දී ජනතාවට දුන් මැතිවරණ පොරොන්දුවක් වූයේ බලයට පත් වූ පසු රාජ්‍ය අංශයේ අල්ලස හා දූෂණය නැති කිරීම සඳහා ඉතාම දැඩි පියවර ගන්නා බවය. ඒ අනුව පහත දැක්වෙන පියවර මේ දක්වා ගෙන ඇත.

(අ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිසම ශක්තිමත් කිරීම

(ආ) බරපතල මූල්‍ය වංචා විමර්ශනය කිරීමේ විශේෂ ජනාධිපති කොමිසම පිහිටුවීම

(ඇ) මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය (පොලිස්) පිහිටුවීම

(ඈ) ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව පිහිටුවීම

(ඉ) විගණන සේවා කොමිෂන් සභාව පිහිටුවීම

(ඊ) පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කමිටුවේ සභාපති තනතුර විපක්ෂයේ මන්ත්‍රීවරයෙකුට ලබා දීම

(උ) පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් කාරක සභාවේ සභාපති තනතුර විපක්ෂයේ මන්ත්‍රීවරයෙකුට ලබා දීම

(ඌ) තොරතුරු දැන ගැනීමේ පනත නීතිගත කිරීම

(එ) විගණන පනත පාර්ලිමේන්තුවේ සම්මතයට ගෙන ඒමට සූදානම් කිරීම

**(iv)** අධිකරණයේ ස්වාධීනත්වය පවත්වාගෙන යාම සඳහා 1978 ව්‍යවස්ථාව මගින් සපයා ඇති ආරක්ෂණ විධිවිධාන

අරමුණ : **ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක් තුළ අධිකරණයේ ස්වාධීනත්වයේ වැදගත්කම හා එය ආරක්ෂා කොට පවත්වාගෙන යාම සඳහා 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් යොදා ඇති ව්‍යවස්ථාමය විධිවිධාන පිළිබඳව අපේක්ෂකයන්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කර බැලීම**

**පිළිතුරෙහි අන්තර්ගත විය යුතු වැදගත් කරුණු**

(අ) යොදා ඇති ව්‍යවස්ථා විධිවිධාන **(ලකුණු 08)**

(ආ) ඒවා ප්‍රමාණවත් ද නැත්ද යන්න පිළිබඳ විග්‍රහයක් **(ලකුණු 02)**

අධිකරණයේ ස්වාධීනත්වය යනුවෙන් අදහස් කරන්නේ විධායකයේ සහ ව්‍යවස්ථාදායකයේ බලපෑම්වලින්, මැදිහත්වීම්වලින් සහ ඇඟිලි ගැසීම්වලින් තොරව ස්වාධීනව, නිදහස්ව සහ අපක්ෂපාතීව යුක්තිය විනිශ්චය කිරීමට අධිකරණයට ඇති හැකියාවයි. මේ සම්බන්ධයෙන් වැදගත් වන්නේ විනිශ්චයකරුවන් පත් කරන ආකාරය, සේවයේ සුරක්ෂිතභාවය සහ සේවයෙන් ඉවත් කරන ආකාරය යන කරුණු තුනයි. මෙම කරුණු තුන ආරක්ෂා කිරීම සඳහා 1978 ව්‍යවස්ථාවෙන් සපයා ඇති විධිවිධාන මොනවාද යන්න මීළඟට සලකා බැලිය යුතු ය. ලංකාවේ අධිකරණය ඉහළ සහ පහළ වශයෙන් කොටස් දෙකක් යටතේ සංවිධානය කර ඇත. ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනාධිකරණය ඉහල අධිකරණයට අයත් වේ. මහාධිකරණය, දිස්ත්‍රික් උසාවි, මහේස්ත්‍රාත් උසාවි සහ වෙනත් උසාවි පහල අධිකරණයට අයත් වේ. අධිකරණ පද්ධතියේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා 1978 ව්‍යවස්ථාව මගින් සපයා ඇති ආරක්ෂණ විධිවිධාන පහත සඳහන් පරිදි වේ.

**(අ) ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනාධිකරණය**

මෙම උසාවි දෙක ස්ථාපිත කර තිබෙන්නේ රටේ මූලික නීතිය මගිනි. එනම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගිනි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 119 (1) වගන්තියට අනුව ශ්‍රේෂ්ඨාධිකරණය අග්‍රවිනිශ්චයකරු ප්‍රධාන තවත් විනිශ්චයකරුවන් 6 ට නොඅඩු සහ 10 ට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත වේ. මේ අනුව ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකරුවන්ගේ අවම සංඛ්‍යාව 7ක් වන අතර උපරිම සංඛ්‍යාව 11ක් වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 137 වන වගන්තියට අනුව අභියාචනාධිකරණය සමන්විත වන්නේ සභාපති විනිශ්චයකරුගෙන් සහ 6 ට නොඅඩු 11ට නොවැඩි විනිශ්චයකරුවන් සංඛ්‍යාවකින්ය. මේ අනුව අභියාචනාධිකරණයේ විනිශ්චයකරුවන්ගේ අවම සංඛ්‍යාව 7ක් වන අතර උපරිම සංඛ්‍යාව 12ක් වේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 වන වගන්තියට අනුව අග්‍රවිනිශ්චයකාරවරයා ද අභියාචනාධිකරණයේ සභාපතිවරයා ද ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ අනෙක් සෑම විනිශ්චයකාරවරයෙක් ද ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතියට යටත්ව ස්වකීය අත්සන යටතේ වූ අධිකාර පත්‍රයක් මගින් පත් කරනු ලැබේ. ව්‍යවස්ථාවේ 41 ඇ (4) වගන්තියට අනුව ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන් සහ අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ අනෙක් අභියාචනාධිකරණ විනිශ්චයකරුවන් පත් කිරීමේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අග්‍රවිනිශ්චයකරුගේ අදහස් විමසිය යුතු ය. විනිශ්චයකරුවන් තනතුරේ වැඩ බාරගත යුත්තේ ජනාධිපතිවරයා ඉදිරියේ කරන දිවුරුම් දීමකින් පසුව ය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 (2) වගන්තියට අනුව ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ සෑම විනිශ්චයකරුවෙක් ම යථා පැවැත්මෙන් සිටින තාක් ධූරය දරන්නේ ය. ධූරයෙන් ඉවත් කළ හැක්කේ විෂම පැවැත්ම හෝ දුබලතාව යන කරුණු දෙක මත පමණි. ඉවත් කිරීම කළ යුත්තේ අදාල චෝදනාව හෝ චෝදනා මත පාර්ලිමේන්තුව පවත්වන පරීක්ෂණයකින් පසුව පාර්ලිමේන්තුවේ නොපැමිණි මන්ත්‍රීවරුන් ද ඇතුළුව මුළු මන්ත්‍රී සංඛ්‍යාවෙන් භාගයකට වැඩි බහුතරයකින් සම්මත කරන යෝජනාවක් මත ජනාධිපතිවරයා විසිනි. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන යෝජනාව කථානායකවරයා විසින් බාර ගත යුත්තේ යෝජනාව තුළ අදාල චෝදනාව පිළිබඳව සම්පූර්ණ විස්තරයක් අන්තර්ගත වන්නේ නම් සහ යෝජනාවට අඩුම වශයෙන් පමණි. පාර්ලිමේන්තුවේ මුළු මන්ත්‍රීවරුන් සංඛ්‍යාවෙන් තුනෙන් එකක්වත් අත්සන් තබා තිබුණහොත් පමණි. මෙයාකාරයට තනතුරින් ඉවත් නොකළහොත් ව්‍යවස්ථාවේ 107 (5) වගන්තියට අනුව ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකරුවන් වයස අවුරුදු 65ක් වූ විට සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකරුවන් වයස අවුරුදු 63ක් වූ විට විශ්‍රාම යා යුත්තේ ය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108 (1) වගන්තියට අනුව ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකරුවන්ගේ වැටුප් පාර්ලිමේන්තුවෙන් තීරණය කොට ඒකාබද්ධ අරමුදලින් ගෙවිය යුතු ය. වැටුප් හෝ විශ්‍රාම වැටුප සේවයට පත් කිරීමෙන් පසුව අඩු නොකළ යුතු ය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හෝ වෙනත් ලිඛිත නීතියකින් හෝ ජනාධිපතිවරයාගේ ලිඛිත කැමැත්ත මත දෙන ලද අවසරයකින් තොරව වැටුප් ලබන හෝ නොලබන වෙනත් යම් ධූරයක් දැරීම හෝ නැතිනම් ලාභ හෝ වේතනයක් ලබන වෙනත් යම් තනතුරක් දැරීම ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණ විනිශ්චයකරුවන්ට තහනම් වේ. (110.2 වගන්තිය) එමෙන්ම ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විනිශ්චයකාර තනතුරක් දැරූ අයෙකු ජනාධිපතිවරයාගේ ලිඛිත කැමැත්ත නොමැතිව කවර වූ හෝ අධිකරණයක, විනිශ්චය අධිකාරයක හෝ ආයතනයක නීතීඥවරයෙකු ලෙස පෙනී සිටීම, උත්තරවාද ඉදිරිපත් කිරීම, ක්‍රියා කිරීම හෝ වෘත්තියෙහි යෙදීම නොකළ යුතු ය.

**පහල උසාවි**

මෙම උසාවි පද්ධතියට අයත් වන්නේ ශ්‍රී ලංකාවේ මහාධිකරණය, දිස්ත්‍රික් උසාවි, මහේස්ත්‍රාත් උසාවි සහ වෙනත් විශේෂිත කරුණු සඳහා පිහිටුවා ඇති වෙනත් අධිකරණ ආයතනයන් ය. මේවා අතුරින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විශේෂයෙන් සඳහන් වන්නේ මහාධිකරණය ගැන පමණි. (111.1 වගන්තිය) නීතිපතිවරයා විමසීමෙන් පසුව අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන නිර්දේශ මත ජනාධිපතිවරයා විසින් මහාධිකරණ විනිශ්චයකරුවන් පත් කරනු ලැබේ. (111.2.අ වගන්තිය) මහාධිකරණ විනිශ්චයකරුවන්ගේ විනය පාලනය ජනාධිපතිවරයා යටතේ පවතින අතර විශ්‍රාම යාමට ප්‍රථමයෙන් ඔවුන් තනතුරුවලින් ඉවත් කළ හැක්කේ අධිකරණ සේවා කොමිෂන් සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයාට පමණි. (111.2.ආ වගන්තිය) මහාධිකරණ විනිශ්චයකරුවන්ගේ විශ්‍රාමික වයස් සීමාව සහ වැටුප් හා වෙනත් දීමනා පාර්ලිමේන්තුව විසින් තීරණය කළ යුතුය. මහාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ ස්ථාන මාරුවීම් ඇතුළුව අනෙක් පහල උසාවිවල අධිකරණ නිලධරයන් සහ උපලේඛනගත රජයේ නිලධරයන් පත් කිරීම, උසස් කිරීම, ස්ථාන මාරු කිරීම, සේවයෙන් පහ කිරීම සහ විනය පාලනය කිරීම පිළිබඳ බලතල ක්‍රියාවට නංවන්නේ අධිකරණ සේවා කොමිෂන් සභාව විසිනි. (111.ඌ වගන්තිය) අධිකරණ සේවා කොමිෂන් සභාව සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත වන අතර අග්‍රවිනිශ්චයකරු නිල බලයෙන්ම එහි සභාපති වේ. අනෙක් සාමාජිකයින් දෙදෙනා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතියට යටත්ව ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබේ. සාමාජිකයින්ගේ නිල කාලය අවුරුදු තුනකි. සාමාජිකයින්ගේ දීමනා පාර්ලිමේන්තුව තීරණය කොට ඒකාබද්ධ අරමුදලින් ගෙවිය යුතුය. කොමිෂන් සභාව සද්භාවයෙන් කරන කටයුතුවලට එරෙහිව නඩු පැවරිය නොහැක. කොමිෂන් සභාවේ වැඩකටයුතුවලට ඇඟිලි ගැසීම හෝ මැදිහත් වීම දඬුවම් ලැබිය හැකි වරදක් වන අතර එවැනි චෝදනාවකට වරදකරු වන අයෙකුට රුපියල් ලක්ෂයක දඩයකට හෝ තුන් අවුරුදු සිර දඬුවමකට හෝ ඒ දෙකටම යටත් කළ හැක.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111. ඇ.1 වගන්තිය මගින් අධිකරණ නිලධාරීන් බලපෑම්වලට යටත් නොවිය යුතු බව දක්වා තිබෙන අතර යම් අයෙකු අධිකරණ කටයුතුවලට බලපෑම් කොට එවැනි චෝදනාවකට ජූරි සභාවක් නොමැතිව මහාධිකරණය ඉදිරියේ පවත්වන නඩු විභාගයකින් පසුව වැරදිකරු වුවහොත් මහාධිකරණය සුදුසු යැයි සිතන දඩයකට හෝ සිර දඬුවමකට යටත් කළ හැක. එවැනි තැනැත්තෙකුට ඉදිරි වසර හතක කාලයක් තුළ පවත්වන කිසිඳු මැතිවරණයක දී ඡන්දය ප්‍රකාශ කිරීම තහනම් වේ.

ඉහතින් දැක්වූයේ අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සපයා ඇති ආරක්ෂණ විධිවිධානයන් ය.

**7 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




7 ප්‍රශ්නය තෝරා ගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 32% ක් පමණි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20 ක් හිමි වේ. ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 69%ක් ද, ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 17%ක් ද, ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 10%ක් ද, ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 4%ක් ද, ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 16 හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 04% ක් වන අතර ලකුණු 05 හෝ ඊට අඩුවෙන් ලබාගත් පිරිස 69% කි. එමෙන් ම අයදුම්කරුවන්ගෙන් 27%ක් ම 06 - 15 අතර ලකුණු ලබා ගෙන ඇත.




මෙම ප්‍රශ්නයට කොටස් 04ක් ඇති අතර ඉන් පහසුතාව වැඩි ම කොටස (iv) වී ඇති අතර එහි පහසුතාව 35% කි. පහසුතාව අඩු ම කොටස (iii) වේ. එහි පහසුතාව 16% කි. ඉතිරි කොටස් 3ට ම ලබා ඇති පහසුතාව 49%ට අඩු ය.

මෙම ප්‍රශ්නය කොටස් හතරකින් යුක්ත ය. ඒවායින් ඕනෑම කොටස් දෙකක් තෝරාගෙන පිළිතුරු ලිවිය යුතු ය. එක් කොටසකට ලකුණු 10ක් බැගින් කොටස් දෙකකට ලකුණු 20කි. මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇති අපේක්ෂකයින් සංඛ්‍යාව 32%කි. ඔවුන්ගෙන් 69%ක් ලබා ගත් ලකුණු ප්‍රමාණය 0 - 5 අතර වේ. 16 - 20 අතර ලකුණු ලබාගෙන ඇත්තේ 4%කි. මෙම ප්‍රශ්නයේ සෑම කොටසකම පහසුතාව 40%ට වඩා පහළ මට්ටමක පවතී.

**I කොටස**

මෙම කොටසේ පහසුතාව 21%කි. මෙම ප්‍රශ්නයේ අරමුණ වන්නේ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ කාර්යභාරය පිළිබඳ දැනුම විමසීම වේ. මෙම මාතෘකාව 19වන සංශෝධන මගින් ස්ථාපිත කළ නව මාතෘකාවක් වීම හේතු කොටගෙන ඒ පිළිබඳව අපේක්ෂකයන්ට දැනුම ලබා ගැනීමට ඇති මාධ්‍යයන්ගේ ඌණතාවය හා විෂය නිර්දේශයේ අවසානයේ පවතින මාතෘකාවක් වීම දැනුම අඩු වීමට හේතුවිය හැකි ය.

කාලීන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පිළිබඳ කුතුහලයක් ඇති කිරීම හා පුවත්පත්, සඟරා, ලිපි ලේඛන එකතුවක් සැකසීමට සිසුන් පන්ති කාමරය තුළ යොමු කිරීමෙන් දැනුම වර්ධනයට උපකාරී වේ.

**II කොටස**

මෙම කොටසේ පහසුතාව 28%කි. මෙම ප්‍රශ්නයේ අරමුණ වන්නේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ප්‍රදානය කර ඇති මානව හිමිකම් භුක්ති විඳීම සවිබල ගැන්වීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් නිර්මාණය කර ඇති යාන්ත්‍රණයේ ස්වභාවය පිළිබඳව අපේක්ෂකයින්ගේ දැනුම පරීක්ෂා කිරීමයි.

මෙම මාතෘකාව කීප වරක්ම ඇගයීමට ලක් කළද මානව අයිතිවාසිකම් යාන්ත්‍රණය පිළිබඳව සමාජගත වී ඇති දැනුම අඩු මට්ටමක පැවතීම හා ඒ කෙරෙහි සමාජය තුළ පවතින උනන්දුව හීන වීම අපේක්ෂකයන්ට ප්‍රායෝගිකව දැනුම ලබා ගැනීමට අවස්ථා අඩුවීමට හේතු විය හැකි ය.

මානව අයිතිවාසිකම් ආරක්ෂණ යාන්ත්‍රණය පිළිබඳව අවබෝධය වර්ධනය කිරීමේ වැඩමුළු, සම්මන්ත්‍රණ, සාකච්ඡා සංවිධානය කිරීමෙන් දැනුම වර්ධනය කළ හැකි ය.

**III කොටස**

මෙම කොටසේ පහළ ම පහසුතාවය පැවති මාතෘකාව වේ. එය 16%කි. මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමේ අරමුණ වූයේ රාජ්‍ය සේවය වසා පැතිර පවතින අල්ලස් දූෂණ හා වංචා සහ එය ලාංකීය සමාජයට බලපා ඇති ආකාරය පිළිබඳව අපේක්ෂකයින්ගේ දැනුම පරීක්ෂා කිරීමයි. රාජ්‍ය සේවය තුළ දීර්ඝ කාලයක් තිස්සේ පවතින අල්ලස් දූෂණ අක්‍රමිකතා හා ඒ පිළිබඳව විමර්ශනය කිරීමේ යාන්ත්‍රණය ක්‍රියාත්මකව නොතිබූ අතර, මෑත කාලීනව පිහිට වූ මෙම ආයතන පිළිබඳ අපේක්ෂකයින්ගේ දැනුම ප්‍රමාණවත් නොවීම පිළිතුර අසාර්ථක වීමට හේතු විය.

ප්‍රායෝගික දේශපාලනය දැනුම වර්ධනය කිරීමට ව්‍යාපෘති සැකසීම, පුවත්පත් ලිපි, දේශපාලන සංවාද, පොත් පත්‍රිකා, වෙබ් අඩවි පරිශීලනයට යොමු කිරීම මගින් නව දැනුම ලබා දිය හැකිය.

**IV කොටස**

මෙම කොටසේ පහසුතාවය 35%කි. මෙම ප්‍රශ්නයේ අරමුණ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක් තුළ අධිකරණයේ ස්වාධීනත්වයේ වැදගත්කම හා එය ආරක්ෂා කොට පවත්වාගෙන යාම සඳහා 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් යොදා ඇති ව්‍යවස්ථාමය විධි විධාන පිළිබඳ අපේක්ෂකයින්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කර බැලීමයි.

අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳව අපේක්ෂකයන්ට දැනුම ඇතත් එය විධිමත්ව ඉදිරිපත් කිරීමට නොහැකි වීම පිළිතුර අසාර්ථක වීමට හේතු වී තිබිණි. විනිශ්චයකාරවරුන් පත් කිරීම, මාරු කිරීම, ඉවත් කිරීම, වැටුප් ගෙවීම, වෙනත් තනතුරු දැරීමට ඇති ව්‍යවස්ථා විධි විධාන පිළිබඳව තොරතුරු පත්‍රිකාවක් සකස් කොට සාකච්ඡා කිරීම තුළින් දැනුම වර්ධනය කරගත හැකි ය.

## 8 ප්‍රශ්නය

8. පහත දැක්වෙන ඒවායින් ඕනෑම **දෙකක්** පිළිබඳව අදහස් දක්වන්න.

(i) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහලේකම්වරයාගේ කාර්යභාරය
(ii) අන්තර්ජාතික මානව හිතවාදී නීතිය වර්ධනය කිරීමෙහිලා අන්තර්ජාතික රතුකුරුස කමිටුවේ කාර්යභාරය
(iii) මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම පිළිබඳව අන්තර්ජාතික ක්ෂමා ආයතනයේ කාර්යභාරය
(iv) වර්තමාන ජාතික ආණ්ඩුව යටතේ ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ මූලික ලක්ෂණ

**(i)** එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහලේකම්වරයාගේ කාර්යභාරය

අරමුණ : **එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහලේකම්වරයාගේ කාර්යභාරය පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කර බැලීම**

**පිළිතුරෙහි අන්තර්ගත විය යුතු වැදගත් කරුණු**

(අ) නිලයට ඇති වැදගත්කම **(ලකුණු 02)**
(ආ) නිලයට අයත් කාර්යයන්, වගකීම් **(ලකුණු 06)**
(ඇ) ඒවා ඉටු කරන ආකාරය පිළිබඳ අපේක්ෂකයන්ගේ පෞද්ගලික දැනුම මත කෙරෙන විග්‍රහයක් **(ලකුණු 02)**

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධාන විධායක නිළධාරියා වන්නේ මහලේකම්වරයා ය. එක්සත් ජාතීන්ගේ සංවිධානය ලෝකය තුළ සංකේතවත් කරන්නේත්, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ පරමාදර්ශ ලෝකයට ප්‍රකාශ කරන්නේත්, ලෝක ජනතාවගේ අවශ්‍යතාවන් ලෝකයට ප්‍රකාශ කරන්නේත් මහලේකම්වරයා විසිනි. ඔහු විසින් ඉටු කරන කාර්යයන් පහත සඳහන් පරිදි වේ.

(අ) ප්‍රධාන පරිපාලන නිළධාරියා හැටියට සංවිධානයේ පරිපාලන කටයුතු මෙහෙයවීම.
(ආ) ආරක්ෂක මණ්ඩලය, මහා මණ්ඩලය, ආර්ථික හා සමාජ කවුන්සිලය සහ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ වෙනත් ආයතන විසින් පවරන වෙනත් කාර්යයන් කිරීම.
(ඇ) අන්තර්ජාතික සාමයට සහ සුරක්ෂිතතාවට තර්ජනයක් වනවායැයි ඔහු විසින් සිතන ඕනෑම කරුණක් පිළිබඳව ආරක්ෂක මණ්ඩලයේ අවධානය යොමු කරවීම.
(ඈ) සාමාජික රාජ්‍යයන්ගේ අවශ්‍යතාවන් පිළිබඳව සැලකිලිමත් වීම.
(ඉ) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විවිධ ආයතන වල සැසිවාරවලට සහභාගි වීම, ලෝක නායකයින් සහ වෙනත් ඉහලපෙලේ රාජ්‍ය නිළධාරීන් මුණගැසීම හා ඔවුන්ට උපදෙස් දීම, ලෝකය වටා සංචාරය කරමින් සාමාජික රාජ්‍යයන්ගේ ජනතාව සමග සම්බන්ධතා වර්ධනය කර ගැනීම හා අන්තර්ජාතික වශයෙන් වැදගත් වන කරුණු පිළිබඳව ලබා ගැනීම.
(ඊ) ලේකම්වරයා තම වෘත්තීය තුළින් අයත් කරගෙන ඇති 'යහසාධන පරිචය' (Good offices)

**(ii)** අන්තර්ජාතික මානව හිතවාදී නීතිය වර්ධනය කිරීමෙහිලා අන්තර්ජාතික රතුකුරුස කමිටුවේ කාර්යභාරය

අරමුණ : **අන්තර්ජාතික මානව හිතවාදී නීතිය වර්ධනය කිරීම උදෙසා අන්තර්ජාතික රතුකුරුස කමිටුවේ ක්‍රියා කලාපය පිළිබඳව අපේක්ෂකයන්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කර බැලීම**

**පිළිතුරෙහි අන්තර්ගත විය යුතු වැදගත් කරුණු**

(අ) අන්තර්ජාතික රතුකුරුස කමිටුව පිළිබඳ හැඳින්වීමක් **(ලකුණු 02)**
(ආ) අන්තර්ජාතික මානව හිතවාදී නීතිය වර්ධනය කිරීම සඳහා එය ක්‍රියාත්මක වන ආකාරය
**(ලකුණු 06)**

**නිගමනය**
(ඇ) එම ක්‍රියා කලාපයේ සාර්ථක අසාර්ථකභාවය පිළිබඳ ඇගයීමක් **(ලකුණු 02)**

1949 දී අත්සන් කරන ලද ජිනීවා සම්මුති හතරෙන් සහ 1977 දී අත්සන් කළ ව්‍යතිරේඛ සම්මුති දෙකෙන් අන්තර්ජාතික රතු කුරුස සංවිධානය අන්තර්ජාතික මානව හිතවාදී නීතියේ භාරකරුවා බවට පත් කර තිබේ. මේ අනුව අන්තර්ජාතික මානව හිතවාදී නීතිය වර්ධනය කිරීමෙහි ලා අන්තර්ජාතික රතු කුරුස කමිටුවේ කාර්යභාරය පහත සඳහන් පරිදි වේ.

- ජිනීවා ගිවිසුම් හතර සහ ව්‍යතිරේඛ ගිවිසුම් දෙක අත්සන් කර නොමැති රාජ්‍යයන්ට ඒවාට අත්සන් කරලීම සඳහා පොළඹවාලීමට කටයුතු කිරීම.
- අධ්‍යාපනික වැඩ සටහන් වෙනත් එවැනි ක්‍රියාකාරකම් මගින් අන්තර්ජාතික මානව හිතවාදී නීතිය ගැන ලෝක ජනතාව දැනුම්වත් කිරීමට කටයුතු කිරීම.
- අන්තර්ජාතික මානව හිතවාදී නීතියේ සහ අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතියේ මූලධර්ම පදනම් කරගෙන යුද්ධ හා වෙනත් අවි ගැටුම් වලින් විපතට පත් අයගේ අයිතිවාසිකම් ගැන රාජ්‍යයන් සහ ජනතාව දැනුම්වත් කිරීමට කටයුතු කිරීම.
- අන්තර්ජාතික මානව හිතවාදී නීතිය ප්‍රවර්ධනය කිරීමට සහ ක්‍රියාත්මක කරවීමට උපදේශන සේවා සැපයීම.

**(iii)** මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම පිළිබඳව අන්තර්ජාතික ක්ෂමා ආයතනයේ කාර්යභාරය

****(8) (ii)** කොටසට ලකුණු දීමේ ක්‍රියා පටිපාටිය මෙම කොටසට ද අනුගමනය කරන්න.

අන්තර්ජාතික ක්ෂමා ආයතනයේ තේමා පාඨය වන්නේ; 'ලෝකයේ සෑම තැනකම සියලුම දෙනා විසින් අයිතිවාසිකම් භුක්ති විඳිය යුතු බවය'. මේ අනුව මෙම අරමුණ සපුරා ගැනීම සඳහා අන්තර්ජාතික ක්ෂමා ආයතනය පහත සඳහන් ආකාරයට ක්‍රියාත්මක වේ.

- මානව හිමිකම් පිළිබඳව පර්යේෂණ පැවැත්වීම සහ ඒ ගැන රාජ්‍යයන් සහ ලෝක ජනතාව දැනුවත් කිරීමට කටයුතු කිරීම.
- මානව හිමිකම් අවභාවිතයට එරෙහිව සටන් කිරීම.
- කෲර අමානුෂික වද හිංසා පමුණුවන්නන් නීතිය ඉදිරියට ගෙන ඒමට කටයුතු කිරීම.
- මර්දනකාරී නීති වෙනස් කරවාලීම සඳහා ක්‍රියා කිරීම.
- අර්බුද වලදී සිදුවන මානව හිමිකම් කඩවීම් සහ අන්තර්ජාතික නීතිය කඩවීම් පිළිබඳ වාර්තා එක්රැස් කිරීම සහ ඒවා නිසි බලධාරීන්ට යොමු කිරීම.
- අර්බුද වලට මැදිවී ජීවිතය බේරාගත් අයට යුක්තිය ඉටුකර ගැනීම සඳහා සහය වීම.
- යුද්ධ ගැටුම් වලදී සිවිල් ජනතාව ආරක්ෂා කර ගැනීම සඳහා සහය වීම.
- අන්තර්ජාතික අවි වෙළඳාම් ගිවිසුම ක්‍රියාත්මක කරලීමට සහය වීම.
- බහුජාතික සමාගම් වල මානව විරෝධී ක්‍රියාවන්ට එරෙහිව කටයුතු කිරීම.
- මරණ දඬුවමට එරෙහිව ක්‍රියා කිරීම.

**(iv)** වර්තමාන ජාතික ආණ්ඩුව යටතේ ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ මූලික ලක්ෂණ

**අරමුණ : වර්තමාන ජාතික ආණ්ඩුව අනුගමනය කරන විදේශ ප්‍රතිපත්තියේ මූලික ලක්ෂණ පිළිබඳව අපේක්ෂකයින්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කර බැලීම**

**පිළිතුරෙහි අන්තර්ගත විය යුතු වැදගත් කරුණු**

(අ) විදේශ ප්‍රතිපත්තිය හඳුනා ගැනීම, වැදගත්කම, අවශ්‍යතාව සහ රටකට විදේශ ප්‍රතිපත්තියක් නොමැතිව අන්තර්ජාතික සමාජය තුළ පැවතිය නොහැකි බව **(ලකුණු 02)**
(ආ) වර්තමාන ආණ්ඩුව අනුගමනය කරන විදේශ ප්‍රතිපත්තියේ මූලික ලක්ෂණ **(ලකුණු 06)**
(ඇ) අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වී තිබේද? නැත්ද? යන්න **(ලකුණු 02)**

රාජ්‍යයන් තම ජාතික ආශාවන් බාහිර වශයෙන් ප්‍රකාශ කරන්නේ විදේශ ප්‍රතිපත්තිය මගිනි. ආණ්ඩුවක කාර්යයන් අතුරින් ඉතාම වැදගත් එක් කාර්යයක් වන්නේ රටේ විදේශ ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම ය. අන්තර්ජාතික දේශපාලනය තුළ රාජ්‍යයන්ගේ ජාතික බලය වර්ධනය කර ගැනීම සඳහා මෙන්ම රටේ නම්බුව, ප්‍රතිරූපය සහ කීර්තිය වර්ධනය කර ගැනීම සඳහා ද විදේශ ප්‍රතිපත්තිය අතිශයින්ම වැදගත් වේ. එමෙන්ම අන්තර්ජාතික වශයෙන් ආණ්ඩුවේ විශ්වාසනීයත්වය වර්ධනය කර ගැනීම සඳහා ද විදේශ ප්‍රතිපත්තිය ඉතාම දැඩිලෙස බලපානු ලැබේ. විධිමත් සහ නිශ්චිත ලෙස සකසන ලද විදේශ ප්‍රතිපත්තියක් නොමැතිව රාජ්‍යයන්ට අන්තර්ජාතික දේශපාලනය තුළ අරමුණු සහගතව හැසිරිය නොහැක. බාහිර සම්බන්ධතා පවත්වා ගෙන යාම සඳහා රාජ්‍යයකට විදේශ ප්‍රතිපත්තියක් තිබීම අවශ්‍යම දෙයක් වන අතර විධිමත් ලෙස සකසන ලද විදේශ ප්‍රතිපත්තියක් නොමැති රාජ්‍යයක් විචාරකයින් හඳුන්වා දී තිබෙන්නේ මාලිමාවක් නොමැති නෞකාවක් ලෙසට ය. මෙයින් අදහස් කරන්නේ මාලිමාවක් නොමැති නෞකාවක් මහ සයුර මැද අතරමං වී ඉබාගාතේ පාවී ගොස් අවසානයේ විනාශ වන්නේ යම්සේද එයාකාරයටම විදේශ ප්‍රතිපත්තියක් නොමැති රාජ්‍යයක් අන්තර්ජාතික දේශපාලනය තුළ අතරමං වී අවසානයේදී විනාශ වී යන බව ය. රටකට විදේශ ප්‍රතිපත්තියේ ඇති වැදගත්කම ඉහත දැක්වූ කරුණු වලින් පැහැදිලි වේ. එම නිසයි රටක දේශපාලනය අධ්‍යයනය කිරීමේදී විදේශ ප්‍රතිපත්තිය අධ්‍යයනය කිරීම අවශ්‍යයෙන්ම කළ යුතු දෙයක් වන්නේ. මෙම නියතිය ශ්‍රී ලංකාවට ද එක සේ අදාළ වේ. එම නිසයි ශ්‍රී ලංකාවේ දේශපාලනය අධ්‍යයනය කිරීමේදී සමකාලීනව පවතින ආණ්ඩුවේ විදේශ ප්‍රතිපත්තිය අධ්‍යයනය කිරීම කළ යුතු දෙයක් වන්නේ.

වර්තමාන ආණ්ඩුව අනුගමනය කරන විදේශ ප්‍රතිපත්තිය දෙස බැලීමේ දී ප්‍රධාන ලක්ෂණ තුනක් හඳුනාගත හැක.

1. අන්තර්ජාතික සමාජය තුළ රටේ ජාතික නම්බුව නැතිනම් රටේ කීර්තිය ගොඩ නගා ගැනීම සඳහා ක්‍රියා කිරීම.

2. රට මුහුණ දී තිබෙන බරපතල ආර්ථික අර්බුදයෙන් රට බේරා ගෙන ආර්ථික සංවර්ධනය වේගවත් කිරීම සඳහා විදේශීය ආයෝජන ප්‍රාග්ධනය සහ තාක්ෂණය ලබා ගැනීම සඳහා ක්‍රියා කිරීම.

3. වාර්ගික යුද්ධයේ අවසාන අදියරේ සිදු වී ඇතැයි ප්‍රකාශ වන මානව අයිතිවාසිම් උල්ලංඝනය වීම් ගැන අන්තර්ජාතික සමාජයෙන් සහ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් කවුන්සිලයෙන් එල්ල වී තිබෙන බරපතල යුද්ධ අපරාධ චෝදනා නිරාකරණය කර ගැනීම සඳහා ක්‍රියා කිරීම.

මෙම අරමුණු සාධනය කර ගැනීම සඳහා එක් අතකින් ආණ්ඩුව අන්තර්ජාතික සමාජයේ සෑම රාජ්‍යයක් සමගම මෙන්ම වැදගත් සෑම අන්තර්ජාතික සංවිධානයක් සමගම මිත්‍රශීලී රාජ්‍ය උපාය සම්බන්ධතා පවත්වා ගෙන යාමට කටයුතු කරන ආකාරය දැකිය හැක. මේ හරහා රටේ නම්බුව හා කීර්තිය අයත් කර ගැනීමට ආණ්ඩුව දැඩි උනන්දුවක් දක්වන ආකාරය දැකිය හැක. මේ පදනම මතයි ආණ්ඩුව බටහිර මෙන්ම බටහිර නොවන රාජ්‍යයන් සමග ද එක හා සමාන මට්ටමෙන් රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා පවත්වා ගෙන යාමට කටයුතු කරන්නේ.

දෙවනුව, ආර්ථික අරමුණු උදෙසා ආණ්ඩුව ක්‍රියාවට නංවන්නේ ආර්ථික රාජ්‍යතාන්ත්‍රික සම්බන්ධතා මූලික කොට ගත් ප්‍රතිපත්තියකි. ඒ අනුව එම අරමුණ ඉටුකර ගැනීම සඳහා ආර්ථික නිශ්චායක උපරිම ආකාරයෙන් උපක්‍රමශීලීව භාවිතා කිරීමට ආණ්ඩුව කටයුතු කරන ආකාරය දැකිය හැක. මෙම උපායක්‍රමයේ එක් ලක්ෂණයක් වන්නේ ඒ තුළ යම් ප්‍රමාණයකට නව ලිබරල්වාදී ආර්ථික දෘෂ්ටියේ මූලෝපායන් ගැබ්ව තිබීම ය. දෙවැන්න වන්නේ, එම සම්බන්ධතා ද්වි-පාර්ශ්වික සම්බන්ධතා මත පවත්වා ගෙන යාමට ප්‍රමුඛස්ථානයක් දීම ය. තුන්වැන්න වන්නේ එම ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේදී ලෝක බලතුලනයේ ස්වභාවය සහ ලෝක ආර්ථික උපනතීන් පරෙස්සමෙන් සැළකිල්ලට ගැනීම ය. එම නිසයි ආණ්ඩුව ඇමෙරිකාව ප්‍රධාන බටහිර රටවල්, රුසියාව, චීනය මෙන්ම ඉන්දියාව සමගද එක හා සමාන ආකාරයෙන් රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා පවත්වා ගෙන යාමට කටයුතු කරන්නේ.

යුද්ධ අපරාධ චෝදනා සම්බන්ධයෙන් ආණ්ඩුව අනුගමනය කරන ප්‍රතිපත්තියේ මූලික ලක්ෂණය වන්නේ රටේ දේශපාලන නිදහස, ජනතා පරමාධිපතිත්වය සහ ජාතික ඒකාග්‍රතාව යන මූලික කරුණු වලට හානියක් නොවන අයුරින් අන්තර්ජාතික සමාජය සමග සම්බන්ධතා පවත්වා ගෙන යාම ය. යුද්ධ අපරාධ විනිශ්චය කිරීම සඳහා අධිකරණයක් පිහිටුවීමට පියවර ගැනීම, අතුරුදහන් වූ පුද්ගලයින් පිළිබඳව සොයා බැලීම සඳහා කාර්යාලයක් පිහිටුවීමට පියවර ගැනීම සහ තොරතුරු දැනගැනීමේ පනත ක්‍රියාවට නැංවීම යනාදී ක්‍රියාවන් මගින් ආණ්ඩුව යම් ප්‍රමාණයකට අන්තර්ජාතික සමාජයේ විශ්වාසය දිනා ගැනීමට සමත් වී ඇත.

අවසාන වශයෙන් කිව හැක්කේ ඉහත දැක්වූ අරමුණු සම්පූර්ණයෙන් ම දිනා ගැනීම සඳහා ආණ්ඩුවට තව බොහෝ දුර යා යුතු බව ය.

**8 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




C කොටසින් අඩුම තෝරා ගැනීමක් ඇති 8වන ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 13%ක් පමණි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20 ක් හිමි වේ. ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 77%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 16%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 6%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 1%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 16 හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 01%ක් වන අතර ලකුණු 05 හෝ ඊට අඩුවෙන් ලබාගත් පිරිස 77% කි. එමෙන්ම අයදුම්කරුවන්ගෙන් 22%ක් ම 06 - 15 අතර ලකුණු ලබා ගෙන ඇත.




මෙම ප්‍රශ්නයට කොටස් 04 ක් ඇති අතර ඉන් පහසුතාව වැඩිම කොටස (ii) වේ. එහි පහසුතාව 19% කි. පහසුතාව අඩුම කොටස (iii) වේ. එහි පහසුතාව 15% කි.

මෙම ප්‍රශ්නය කොටස් හතරකින් යුක්ත වන අතර ඉන් ප්‍රශ්න දෙකකට පිළිතුරු අපේක්ෂා කෙරිණි. එක් කොටසක පිළිතුරකට ලකුණු 10 බැගින් ලබා දීමට තීරණය කර තිබිණි. මෙම ප්‍රශ්නය තෝරා ගත් අපේක්ෂකයින් ප්‍රමාණය 20%කටත් වඩා අඩු විය. මෙම ප්‍රශ්නයට පිළිතුරු ලියූ අපේක්ෂකයින් අතරින් වැඩිම ලකුණු ලබා තිබුනේ එහි පළමුවන කොටසට ය. එය 70% ඉක්මවා තිබිණි. එහෙත් හතරවන කොටස සඳහා ලබා ගත් ලකුණු ප්‍රමාණය ඉතා පහළ මට්ටමක විය. එය 2%ක් පමණ වූවකි.

**I කොටස**

මෙම ප්‍රශ්නයේ පහසුතාවය 16%කි. එක්සත්ජාතීන්ගේ සංවිධානයේ මහලේකම්වරයාගේ කාර්යභාරය පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම සහ අවබෝධය පරීක්ෂා කිරීම මෙතුලින් අපේක්ෂා කරනු ලබයි. මෙම කොටසට පිළිතුරු සපයා තිබුනේ විභාග අපේක්ෂකයින්ගෙන් 20%කටත් අඩු ප්‍රමාණයකි. ඔවුන් ලියා ඇති පිළිතුරු සම්බන්ධයෙන් ද විධිමත් දැනුමක් නොමැති බව පැහැදිලි වේ.

මෙයට හේතුවක් වන්නේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී එක්සත්ජාතීන්ගේ සංවිධානය සහ එහි කාර්යයන් පිළිබඳව වැඩි අවධානයක් යොමු කළද මහලේකම්වරයා වැනි තනතුරු පිළිබඳව අවධානය යොමු කිරීම අඩු වීමයි. මෙම ගැටළුව විසඳීම සඳහා අන්තර්ජාතික සංවිධාන පිළිබඳව සිදු කරන ඉගැන්වීම් ක්‍රියාවලියේ දී එම ආයතනවල ප්‍රධාන තනතුරු වෙත හිමිවන කාර්ය, බලතල හා තත්ත්වයන් පිළිබඳව වැඩි අවධානයක් යොමු කිරීම වඩාත් සුදුසු වේ.

**II කොටස**

මෙම කොටසෙහි පහසුතාවය 19%කි. මෙතුළින් අන්තර්ජාතික මානව හිතවාදී නීතිය වර්ධනය කිරීමෙහි ලා අන්තර්ජාතික රතු කුරුස කමිටුවේ කාර්යභාරය පිළිබඳව අපේක්ෂකයන්ගේ දැනුම සහ අවබෝධය පරීක්ෂා කිරීම අපේක්ෂා කරනු ලබයි. මෙම කොටසට වැඩි අපේක්ෂකයන් ප්‍රමාණයක් පිළිතුරු සපයා තිබුණි. නමුත් මෙහිදී ද අපේක්ෂකයන් වැඩි ප්‍රමාණයක් පන්ති කාමරය තුළ ලබා ගත් දැනුමෙන් බැහැරව බාහිර සමාජය තුළින් ලද දැනුම ඉදිරිපත් කර තිබිණි. අපේක්ෂකයන් ඉදිරිපත් කර ඇති පිළිතුරු තුළ නිවැරදි කරුණු ද සඳහන්ව තිබිණි. වැඩි ප්‍රමාණයක් වැරදි සහගත සහ අවිධිමත් කරුණු ඉදිරිපත් කර තිබිණි.

මෙබඳු තත්ත්වයක් ඇතිවීම සඳහා විෂය නිර්දේශයේ මුලින් සඳහන් මාතෘකාවලට වඩා අවසන් මාතෘකා කෙරෙහි සිසුන් තුළ ඇති උනන්දුව අඩු වීමත් පන්ති කාමරයෙන් බැහැර වූ අධ්‍යයනයන්වලට ඇති උනන්දුව වැඩි වීමත් බලපානු ලබයි.

මෙම ගැටළුව පාලනය කිරීම සඳහා රාජ්‍යය සංවිධාන සහ රාජ්‍යය නොවන සංවිධාන පිළිබඳව සංවාද සහ විවාද වැඩසටහන් තුළින් අපේක්ෂකයන්ගේ දැනුම වර්ධනය කළ හැකි අතරම උනන්දුව ද වර්ධනය කළ හැකි වෙයි.

**III කොටස**

මෙම ප්‍රශ්නය තුළ සිසුන් අඩුවෙන් ම පිළිතුරු සපයා ඇත්තේ මෙම කොටසට ය. මෙම කොටසෙහි පහසුතාවය 15%කි. මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම පිළිබඳව අන්තර්ජාතික ක්ෂමා ආයතනයේ කාර්යභාරය පිළිබඳව අපේක්ෂකයන්ගේ දැනුම පරීක්ෂා කිරීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කර තිබිණි.

මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇති අපේක්ෂකයන් අතරින් ද නිවැරදි පිළිතුරු සපයා තිබුණේ අඩු සංඛ්‍යාවකි. එයට හේතුවක් වී ඇත්තේ අන්තර්ජාතික සංවිධාන පිළිබඳව පාඩම් මාලාවක් වශයෙන් අධ්‍යයනය කිරීම සඳහා සිසුන් තුළ ඇති උනන්දුව සහ මෙම මාතෘකාවන් පිළිබඳව පරිශීලනය කිරීමට ලිපි ලේඛන ද අඩු වීමයි.

මේ පිළිබඳව සිසුන්ගේ උනන්දුව වැඩි කිරීම සඳහා පුස්තකාල පරිහරණයට අපේක්ෂකයන් යොමු කිරීම විභාග අපේක්ෂකයන් කණ්ඩායම් කර අන්තර්ජාතික සංවිධාන පිළිබඳව තොරතුරු පත්‍රිකා සකස් කිරීමට සැලැස්වීම වැනි ක්‍රියාවන් තුළින් අපේක්ෂකයන්ගේ උනන්දුව වැඩි කරගත හැකි වෙයි.

**IV කොටස**

මෙම කොටසෙහි පහසුතාවය 16%කි. මෙම කොටසට පිළිතුරු සපයා ඇති අපේක්ෂකයන් ශ්‍රී ලංකාවේ වර්තමාන ජාතික ආණ්ඩුව පිළිබඳව තොරතුරු ඉදිරිපත් කිරීමට වැඩි වශයෙන් උනන්දු වී ඇත. විදේශ ප්‍රතිපත්තිය පිළිබඳව ඉදිරිපත් කර ඇති තොරතුරුවල නිරවද්‍යතාවය නම් හීන වෙයි.

මෙයට හේතුව වන්නේ සිසුන්ට පන්ති කාමරය තුළදී වත්මන් ආණ්ඩුවේ දේශපාලන ක්‍රියාකාරිත්වය පිළිබඳව නිවැරදි අවබෝධයක් නොලැබී තිබීමයි. ඉගැන්වීම් ක්‍රියාවලියේ දී විෂය නිර්දේශයේ සඳහන්ව ඇති මාතෘකාවලට පමණක් සීමා කිරීමයි. මෙම තත්ත්වය පාලනය කර ගැනීම සඳහා කාලීන දේශපාලන තොරතුරු පිළිබඳව සිසුන් තුළ ඇති උනන්දුව විධිමත් අයුරින් හැඩ ගැස්වීම කෙරෙහි අවධානය යොමු කිරීම යෝග්‍ය වෙයි.

### 2.2.3 II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




දේශපාලන විද්‍යාව II ප්‍රශ්න පත්‍රයේ A කොටසේ පහසුතා දර්ශකය 22%ක් තරම් පහළ අගයක් ගෙන ඇත. මෙම කොටසෙහි ප්‍රශ්න සකස් වී ඇත්තේ නිශ්චිත පිළිතුරු අපේක්ෂිත පදනමෙහි ය. පහසුතා දර්ශකය පහත වැටීමෙන් පෙනී යන්නේ සිසුන් ප්‍රශ්නයකට නිශ්චිත ව, නිවැරදි ව පිළිතුරු දීමට අසමත් බවය. මෙයට විසඳුම වන්නේ විෂය නිර්දේශයේ අන්තර්ගත කරුණු පිළිබඳව නිශ්චිත පිළිතුරු අපේක්ෂා කළ හැකි මාතෘකා සොයා බලා, එවැනි මාතෘකා ආශ්‍රිත ව කෙටි ප්‍රශ්න නිර්මාණය කරමින් පන්ති කාමරය තුළදී අඛණ්ඩ ව සිසුන් අභ්‍යාසවල යෙදවීමට ක්‍රියා කිරීමයි.

දේශපාලන විද්‍යාව ප්‍රශ්න පත්‍රයේ B හා C කොටස්වලින් අපේක්ෂා කරනු ලැබුවේ රචනා මාදිලියේ පිළිතුරු ය. ඒ පිළිබඳ විමසීමේ දී පැහැදිලි වූයේ B කොටසේ පහසුතා දර්ශකය 37%ක්ද C කොටසේ පහසුතා දර්ශකය 35%ක් ද බවයි. විභාග අපේක්ෂකයන්ගේ විෂය දැනුම පුළුල් නොවීම එම දැනුම දේශපාලනයේ ප්‍රායෝගික ක්‍රියාකාරිත්වය සමඟ බද්ධ කරගෙන ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සිදු නොවීම ලේඛන කුසලතාව අවම මට්ටමක පැවතීම මෙයට හේතුවයි. සමහර සිසුන් තුළ දැනුම පැවතිය ද එය ප්‍රශ්නයට උචිත ලෙස හසුරුවමින් පිළිතුරු ලිවීමට අසමත් වීම පහසුතා දර්ශකය පහළ යාමට හේතු වී ඇත.

පිළිතුරු පත් පරීක්ෂාවේදී පෙනී ගියේ සමහර මාතෘකා පිළිබඳ සිසුන් තුළ දැනුමක් හා අවබෝධයක් පැවතියත් ඒවා සංවිධානාත්මකව ඉදිරිපත් කිරීමේ හැකියාව නොතිබුණු බවයි. මෙයට විසඳුම වන්නේ මාසයකට කළ යුතු අභ්‍යාස ප්‍රමාණයක් නියම කර, එය නිසි පරිදි ක්‍රියාත්මක වන්නේදැයි ගුරු උපදේශකවරුන් මාර්ගයෙන් හෝ වෙනත් අධීක්ෂණ නිලධාරියෙකු මගින් අධීක්ෂණය කරවීම ය.

## III කොටස

# 3. පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා :

## 3.1 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු :

**පොදු උපදෙස් :**

* ප්‍රශ්න පත්‍රයේ ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගත යුතු ය. එනම් එක් එක් කොටසින් කොපමණ ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සැපයිය යුතු ද, කුමන ප්‍රශ්න අනිවාර්ය ද, කොපමණ කාලයක් ලැබේ ද, කොපමණ ලකුණු ලැබේ ද, යන කරුණු පිළිබඳ ව සැලකිලිමත් විය යුතු අතර ප්‍රශ්න හොඳින් කියවා නිරවුල් අවබෝධයක් ඇති කර ගෙන ප්‍රශ්න තෝරා ගත යුතු ය.

* I පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී වඩාත් නිවැරදි එක් පිළිතුරක් තෝරා ගත යුතු ය. තව ද පැහැදිලි ව එක් කතිර ලකුණක් පමණක් යෙදිය යුතු ය.

* II පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී සෑම ප්‍රධාන ප්‍රශ්නයක් ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතු ය.

* නිවැරදි හා පැහැදිලි අත් අකුරුවලින් පිළිතුරු ලිවිය යුතු ය.

* අයදුම්කරුගේ විභාග අංකය සෑම පිටුවක ම අදාළ ස්ථානයේ ලිවිය යුතු ය.

* ප්‍රශ්න අංක, කොටස් හා අනුකොටස් නිවැරදි ව ලිවිය යුතු ය.

* නිශ්චිත කෙටි පිළිතුරු ලිවීමට අවශ්‍ය අවස්ථාවල දී දීර්ඝ විස්තර ඇතුළත් නොකිරීම මෙන් ම විස්තරාත්මක පිළිතුරු සැපයිය යුතු අවස්ථාවල දී කෙටි පිළිතුරු සැපයීම ද නොකළ යුතු ය.

* ප්‍රශ්නය අසා ඇති ආකාරය අනුව තර්කානුකූලව හා විශ්ලේෂණාත්මකව කරුණු ඉදිරිපත් කළ යුතු ය.

* II වන ප්‍රශ්න පත්‍රයට පිළිතුරු ලිවීමේ දී ප්‍රධාන ප්‍රශ්නය යටතේ ඇති අනුකොටස් සියල්ල හොඳින් කියවා බලා එක් එක් අනුකොටසට අදාළ ඉලක්කගත පිළිතුර පමණක් ලිවිය යුතු ය.

* ගැටලුවලට පිළිතුරු සැපයීමේ දී ඇති කාලය නිසි පරිදි කළමනාකරණය කර ගැනීමට වග බලා ගත යුතු ය.

* පිළිතුරු ලිවීමේ දී රතු සහ කොළ පාට පෑන් භාවිත කිරීමෙන් වැළකිය යුතු ය.

**විශේෂ උපදෙස්**

- ★ එක් එක් පාඩමේ සියලුම ප්‍රධාන කොටස් සහ අනු අංශ ඇතුළත්වන පරිදි මාතෘකා සහ අනු මාතෘකා සකස් කර ගත යුතු ය.

- ★ පිළිතුරු ලිවීමේදී සංවිධානාත්මකව එය ගොඩනගා ගත යුතු ආකාරය පැහැදිළි කර දිය යුතු ය.

  නිදසුන් - ප්‍රවේශය, පිළිතුරට අදාළ කරුණු සහ නිගමනය යන ඒවා ඇතුළත්වන ආකාරයෙන් පිළිතුරු සකස් කර ගැනීමට සිසුන් යොමු කිරීම සහ ඒ සඳහා ලකුණු දීමේ පටිපාටියේ පිළිතුරු සංවිධානය කර ඇති ආකාරය භාවිතයට ගත යුතු ය.

- ★ ඒ ඒ මාතෘකාවලට අදාළ කරුණු පැහැදිළි කිරීමේදී ප්‍රායෝගික වශයෙන් භාවිතයට ගැනුණු සහ භාවිතයේ පවතින දේශපාලන ක්‍රියාකාරකම් හා සිදුවීම් විෂයානු බද්ධව පැහැදිළි කර දිය යුතු ය.

- ★ පිළිතුරු ලිවීමේදී එක් එක් න්‍යායන් හා සම්බන්ධ නිර්වචන නිවැරදිව මතක තබා ගැනීමට සිසුන් යොමු කළ යුතු ය.

- ★ විෂයයට අදාළ චින්තකයින්/ දාර්ශනිකයින්, න්‍යාය හා මතවාද පිළිබඳ සිසුන්ගේ දැනුම නිශ්චිත කළ යුතු ය.

- ★ මැතිවරණ නියෝජන ක්‍රම හා සම්බන්ධ පිළිතුර ලිවීමේදී අදාළ සංඛ්‍යා ලේඛන භාවිතයට ගැනීමට යොමු කළ යුතු ය.

- ★ දේශපාලන විද්‍යාවේ II පත්‍රය හා අදාළ මාතෘකා ඉගැන්වීමේදී අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා, ව්‍යවස්ථා සංශෝධන කියවීමට සිසුන් යොමු කළ යුතු ය.

- ★ පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර ආශ්‍රිතව සිසුන් ලවා අභ්‍යාස කරවා පුහුණුවක් ලබා දිය යුතු ය.

### 3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා :

ඉගැනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය තුළින් ප්‍රතිඵල සංවර්ධනය සඳහා,

අ.පො.ස. (උ.පෙළ) දේශපාලන විද්‍යාව ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු ලිවීමට, එම විෂය පිළිබඳව සිසුන් තුළ ඇති අවබෝධය ප්‍රමාණවත් නොවන බව දක්නට ඇත. ප්‍රශ්න තේරුම් නොගැනීම, දුර්වල පිළිතුරු සැපයීම කෙරෙහි ඍජුවම බලපා ඇත.

සිසු පිළිතුරු තුළින් පහත දුර්වලතා දෘෂ්‍යමාන විය.

- ප්‍රශ්නය නිසි ලෙස අවබෝධ කර නොගැනීම
- කටපාඩම් කරගත් පිළිතුරක් ලියා දැක්වීම
- උදෘත මතක තබා නොගැනීම හා ව්‍යවස්ථාමය වගන්ති ගිලිහී තිබීම
- බාහිර පොත පත ඇසුරින් කරුණු රැස් කිරීමට උනන්දු නොවීම
- පිළිතුරු ඉදිරිපත් කිරීමේදී විචාරශීලීව කරුණු ලියා නොදැක්වීම
- විෂය කරුණක් තහවුරු කර ගැනීමට, තවත් විෂය කරුණක් සම්බන්ධ කර නොගැනීම
- කරුණු ඉදිරිපත් කිරීමේදී නිරවුල් අවබෝධය නොමැති වීමෙන් විශ්වාසනීයත්වය පිළිතුරු තුළ දක්නට නොමැති වීම
- අදාළ කරුණු පමණක් තෝරා බේරා නොගැනීම
- ප්‍රශ්නයකට පිළිතුරු ලිවීමේදී පිළිතුරෙහි ගලා යාම, දුර්වල මට්ටමක පැවතීම
- න්‍යාය සහ භාවිතය අතර වෙනස හඳුනා නොගැනීම

උක්ත දුර්වලතා මග හරවා ගැනීමට,

දේශපාලන විද්‍යාව උගන්වන ගුරුවරයා දේශපාලන විද්‍යාව පිළිබඳ පුළුල් අවබෝධයකින් ද, යාවත්කාලීන වූ දැනුමකින් ද යුතුව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ නිරත වීම ඉතා වැදගත් ය. දේශපාලන විද්‍යාව ඉගැන්වීමේදී විෂයෙහි අභිමතාර්ථ සහ ඉගෙනුම් ඵලය පිළිබඳව සිසුන් දැනුවත් කිරීම ඉතා වැදගත් ය. දේශපාලන විද්‍යාව විෂයය සම්බන්ධ සංකල්ප, පාරිභාෂිත පද නව විෂය ප්‍රවනතා හඳුනා ගැනීම කෙරෙහි සිසුන්ට මග පෙන්වීම අවශ්‍ය වේ. විශේෂයෙන්ම පාඨ ග්‍රන්ථ පරිහරණයට පෙළඹවීම, පිළිතුරු ලිවීම හා සිසුන් සහභාගි කර ගනිමින් මණ්ඩල ක්‍රමයට පිළිතුරු පත් ඇගයීම හා ප්‍රතිපෝෂණය ලබා දීම යෝග්‍ය ය.

තව දුරටත් පහත සඳහන් යෝජනා කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

- නිරන්තරයෙන් නිර්මාශීලී ප්‍රශ්න සකස් කර, ප්‍රශ්නයේ අරමුණු හා අභිමතාර්ථ විමසමින් අභ්‍යාසයේ යෙදවීම
- නිර්මාණශීලී ලෙස පිළිතුරු ලිවීම සඳහා සිසුන් පෙළඹවීම
- කියවීම සඳහා පාඨ ග්‍රන්ථ ලබා ගැනීමට පෙළඹවීම, විශේෂයෙන් ම ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා (1972/ 1978 ව්‍යවස්ථා සංශෝධන සහිතව)
- මැතිවරණ වාර්තා සහ දේශපාලන ක්‍රියාකාරකම් සහිත ලිපිලේඛණ එකතුවක් පවත්වාගෙන යාමට සිසුන් පෙළඹවීම
- සිසුන් අතර දේශපාලන විද්‍යාව විෂයට අදාළව විවාද තරඟ පැවැත්වීම
- න්‍යායාත්මක ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමේදී ප්‍රායෝගික උදාහරණ අවශ්‍ය පරිදි යොදා ගැනීම සහ ප්‍රායෝගික ප්‍රශ්න සඳහා අදාළ පරිදි න්‍යායන් භාවිතයට සිසුන් යොමු කරවීම
- පෞද්ගලිකව විශ්වාසනීයත්වය තහවුරු කර ගත් කරුණු පිළිතුරු සඳහා භාවිතයට හුරු කරවීම
- අනවශ්‍ය විස්තර හා අදාළ නොවන කරුණු පිළිතුරු සඳහා ලිවීමෙන් කාලය අපතේ යන බව අවබෝධ කරවීම හා අදාළ කරුණු පමණක් ලිවීමට හුරු කරවීම
- පිළිතුරු ප්‍රවේශය, කරුණු හා නිගමනය සහිතව නිම කිරීමට පෙළඹවීම
- න්‍යායට සහ භාවිතය අතර වෙනසක් පවතින බව උදාහරණ සහිතව තහවුරු කරවීම

ගුරුවරයා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුර සිසුන් නිතර ඇගයීමට භාජනය කිරීම මගින් ඉගෙනුම් ඉගැන්වීම් හැකියා - නොහැකියා හා ප්‍රවණතා පිළිබඳව අවබෝධ කරගත හැකි ය. එයින් පන්ති කාමරය තුළදීම අවශ්‍ය පරිදි ප්‍රතිපෝෂණ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට ගුරුවරයාට සැලසුම් කර ගත හැකි වේ.